# ‘වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම’ නමැති ශිල්ප ක්‍රමය

යොදා ගත යුතු ආකාරය පිළිබඳ
මාර්ගෝපදේශකයක්

**රික් ඩේවිස් සහ ජෙස් ඩාර්ට්**
**විසිනි**

එක්සත් රාජධානියේ කෙයාර් ඉන්ටර්නැෂනල්, ඕස්ට්‍රේලියාවේ ඔක්ස්ෆෑම් කමියුනිටි ඒඩ් බෝර්ඩ්, දකුණු ඕස්ට්‍රේලියානු ආණ්ඩුවේ ලර්නින්ග් ටු ලර්න්, ඔක්ස්ෆෑම් නිව් සීලන්ඩ්, එක්සත් රාජධානියේ ක්‍රිස්ටියන් ඒඩ්, එක්සත් රාජධානියේ ඒක්ස්චේන්ජ්, ඩෙන්මාර්කයේ අයිබිස්, ඩෙන්මාර්කයේ Mellemfolkeligt Samvirke (MS), ඇමරිකා එක්සත් ජනපදයේ ලූතරන් වර්ල්ඩ් රිලීෆ් යන ආයතනවලින් අරමුදල් සම්පාදනය කරන ලදි

1.00 වන සංස්කරණය - 2005 අප්‍රේල්

# පටුන


**කෙටි යෙදුම්** 4

**පෙරවදන: මෙම මාර්ගෝපදේශකයේ ව්‍යුහය** 5

**ස්තුති** 8

**පළමු වන පරිච්ඡේදය: ශිල්ප ක්‍රමය පිළිබඳ සංක්ෂිප්ත දළ විශ්ලේෂණයක්** 9

සංක්ෂිප්තව ගත් විට වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යනු කුමක් ද? 9
නමක ඇතුළත් වන්නේ මොනවා ද? 9
ශිල්ප ක්‍රමය පිළිබඳ කතා පුවත 10
ක්‍රියාත්මක කිරීමේ පියවරයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් 11
සාරය 13
අරමුණ 13
ශිල්ප ක්‍රමය යොදා ගත යුතු සහ යොදා නො ගත යුතු අවස්ථා 14
වැඩි දුර තොරතුරු ලබා ගැනීමට යා යුතු තැන 16

**දෙවන පරිච්ඡේදය: ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පියවර දහයක්** 17

1 වන පියවර: පටන් ගන්නා සහ ඕනෑකම මතු කර ගන්නා ආකාරය 17
2 වන පියවර: වෙනස් වීම බලපෑ ක්ෂේත්‍ර අර්ථදැක්වීම 20
3 වන පියවර: වාර්තාකරණ කාල සීමාව අර්ථදැක්වීම 25
4 වන පියවර: අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් රැස් කිරීම 26
5 වන පියවර: කතා පුවත් අතුරින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත තේරීම 33
6 වන පියවර: තේරීම් ක්‍රියා දාමයේ ප්‍රතිඵල පිළිබඳව ප්‍රතිපෝෂණ සැපයීම 39
7 වන පියවර: කතා පුවත්වල සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම 41
8 වන පියවර: ප්‍රමාණාත්මකව ප්‍රකාශයට පත් කිරීම 44
9 වන පියවර: දෙවන විශ්ලේෂණය සහ පසු නිරීක්ෂණය 44
10 වන පියවර: පද්ධතිය සංශෝධනය කිරීම 51

**තුන් වන පරිච්ඡේදය: ගැටලු සමථයකට පත් කිරීම** 53

සහභාගිකයන් වෙතින් ප්‍රකාශයට පත් වන උත්සුකතා 53
අනෙකුන් වෙතින් ප්‍රකාශයට පත් වන උත්සුකතා 58

**හතර වන පරිච්ඡේදය: ක්‍රියා දාමය ඵලදායී තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය වන හැකියාවන් ගොඩ නැඟීම** 62

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමයේ 'නායකයන්ගේ' හැකියාවන් ගොඩ නැඟීම 62
ක්‍රියා දාමය තුළ පූර්ණ වශයෙන් සහභාගි විය හැකි වන පරිදි කාර්ය මණ්ඩලයේ හැකියාවන් ගොඩ නැඟීම 63
අවශ්‍ය වන සම්පත් සහ කාලය පිළිබඳව බැරෑරුම්ව සිතා බැලීම 65

**පස් වන පරිච්ඡේදයः නිරීක්ෂණ සහ ඇගයීම් සැකැස්මක් තුළ දී ශිල්ප ක්‍රමය යොදා ගැනීම** 67

වැඩ සටහන් චක්‍රය තුළ දී ශිල්ප ක්‍රමය යොදා ගැනීම 67
ශිල්ප ක්‍රමය නිරීක්ෂණය සහ ඇගයීම ලෙස 67
ශිල්ප ක්‍රමය සුවිශේෂ නිරීක්ෂණ ස්වරූපයක් ලෙස 67
ශිල්ප ක්‍රමය වැඩ සටහන් ඇගයීම ලෙස 70
ශිල්ප ක්‍රමය සහ සංවිධානීය ඉගෙනීම 73
වැඩ සටහන් තුළ පවතින ශිල්ප ක්‍රමයේ වෙනත් යොදා ගැනීම් 74

**හය වන පරිච්ඡේදයः ශිල්ප ක්‍රමය තුළ ගැබ් වන වලංගුතාව සහ හඬ** 77

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය වලංගු ශිල්ප ක්‍රමයකි 77
අර්ථවත් නියැදිකරණය 79
ශිල්ප ක්‍රමය තුළ පවත්නා පක්ෂපාතීකම 80
ශිල්ප ක්‍රමය තුළ පවතින හඬ සහ බලය පිළිබඳ ගැටලු 81

# කෙටි යෙදුම්

| | |
|---|---|
| ඒඩීබී | ආසියානු සංවර්ධන බැංකුව (Asian Development Bank - ADB) |
| ඒඩීආර්ඒ | ඕස්ට්‍රේලියාවේ ඇඩ්වෙන්ටිස්ට් සංවර්ධන සහ සහන නියෝජ්‍යායතනය (Adventist Development and Relief Agency, Australia - ADRA) |
| ඒකේආර්එස්පී | අගා ඛාන් ග්‍රාමීය සහායක වැඩ සටහන (Aga Khan Rural Support Program - AKRSP) |
| ඕස්ඒඩ් | (AusAID) |
| බීඒඩීඑස්පී | ඝානාවේ බ්‍රොන්ග් අහාෆෝ ග්‍රාමීය දිස්ත්‍රික්ක සහායක ව්‍යාපෘතිය (Brong Ahafo Rural District Support Project, Ghana - BADSP) |
| කෙයාර් | එක්සත් රාජධානියේ කෙයාර් ජාත්‍යන්තරය (CARE International, United Kingdom) |
| සීසීඩීබී | බංග්ලාදේශයෙහි සංවර්ධනය සඳහා වූ ක්‍රිස්තියානි කොමිසම (Christian Commission for Development in Bangladesh - CCDB) |
| සීආර්එස් | කතෝලික සහන සේවය (Catholic Relief Services - CRS) |
| ඩීඑෆ්අයිඩී | එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ දෙපාර්තමේන්තුව (Department for International Development, UK - DFID) |
| අයිඩීඑස්එස් | ඕස්ට්‍රේලියාවේ ජාත්‍යන්තර සංවර්ධන සහායක සේවය (International Development Support Services, Australia - IDSS) |
| එම් ඇන්ඩ් ඊ | නිරීක්ෂණය සහ ඇගයීම (monitoring and evaluation - M&E) |
| එම්එස් | ඩෙන්මාර්කයේ Mellemfolkeligt Samvirke (MS), Denmark |
| එම්එස්සී | වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම (එම්එස්සී) නමැති ශිල්ප ක්‍රමය (most significant change [MSC] technique) |
| එන්ජීඕ | රාජ්‍ය නොවන සංවිධානය (non-governmental organization - NGO) |
| ඕසීඒඒ | ඕස්ට්‍රේලියාවේ ඔක්ස්ෆැම් ප්‍රජා ආධාර මණ්ඩලය (Oxfam Community Aid Board, Australia - OCAA) |
| ඕඑන්ඉසෙඩ්බී | නව සීලන්ත ඔක්ස්ෆැම් (Oxfam New Zealand - ONZB) |
| එස්සී කතා පුවත් | අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් (Significant change stories - SC stories) |
| වීඑස්ඕ | විදේශීය ස්වේච්ඡා සේවය (Voluntary Service Overseas - VSO) |

# පෙරවදනː මෙම මාර්ගෝපදේශකයේ ව්‍යුහය

මෙම ප්‍රකාශනය කණ්ඩායම් දෙකක් ඉලක්ක කර ගනී. එකක් නම්, සාමාජීය වෙනස් වීමක් ඇති කිරීම සඳහා වූ තම වැඩ සටහන් සහ ව්‍යාපෘතීන් නිරීක්ෂණය කිරීමට සහ ඇගයීමට සහායක් වශයෙන් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යොදා ගැනීමට බලාපොරොත්තු වන, සංවිධාන, ප්‍රජා කණ්ඩායම්, ශිෂ්‍යයන් සහ විද්වතුන් ය. අනෙක් කණ්ඩායම නම්, එම ශිල්ප ක්‍රමය යොදා ගත හැක්කේ කෙසේ ද යන්න පිළිබඳව තව දුරටත් ඉගෙනීමට බලාපොරොත්තු වන, සංවිධාන, ප්‍රජා කණ්ඩායම්, ශිෂ්‍යයන් සහ විද්වතුන් ය. මෙම ශිල්ප ක්‍රමය කෘෂිකර්මය, අධ්‍යාපනය හා සෞඛ්‍යය, සහ විශේෂයෙන් ම සංවර්ධන වැඩ සටහන් ඇතුළු විවිධ අංශ ගණනාවක දී යොදා ගත හැකි ය. එමෙන් ම එය විවිධාකාර වූ සංස්කෘතීන් තුළ දී ද යොදා ගත හැකි ය. විවිධ රටවල විවිධ සංවිධාන ශිල්ප ක්‍රමය යොදා ගෙන තිබේ. 2004 වසර වන විට, අප්‍රිකාවේ, ආසියාවේ, ලතින් ඇමරිකාවේ, යුරෝපයේ සහ ඕස්ට්‍රේලියාවේ රාජ්‍ය නොවන සංවිධාන සහ ආණ්ඩු යන දෙපාර්ශ්වය ම ශිල්ප ක්‍රමය යොදා ගෙන තිබිණ.

## මෙම මාර්ගෝපදේශකයේ ව්‍යුහය

හඳුන්වා දීමේ පරිච්ඡේදයෙන්, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය පිළිබඳ සංක්ෂිප්ත දළ විශ්ලේෂණයක් සම්පාදනය වේ. දෙවන පරිච්ඡේදයේ දී අපි, ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රායෝගික තතු ගැනත් ක්‍රියා දාමය පියවර දහයකට බෙදීම ගැනත් අවධානය යොමු කරන්නෙමු. තුන් වන පරිච්ඡේදයේ දී ප්‍රායෝගික ගැටලු සමථයකට පත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශකය ඉදිරිපත් කෙරෙන අතර, හතර වන පරිච්ඡේදය ශිල්ප ක්‍රමය ඵලදායීව යොදා ගැනීම හා සම්බන්ධ හැකියාවන් ගොඩ නැගීම පිළිබඳව විමසා බලයි. පස් වන පරිච්ඡේදයේ දී අපි, ශිල්ප ක්‍රමය වැඩ සටහන් චක්‍රය සමග ගැළපී ගන්නා ආකාරයත්, වැඩ සටහන වැඩි දියුණු කිරීමට ශිල්ප ක්‍රමයට දායක විය හැකි ආකාරයත් පරීක්ෂාවට ලක් කරන්නෙමු.

පස් වන පරිච්ඡේදයෙන් අනතුරුව අපි, තව දුරටත් න්‍යාය තුළට කිඳා බැස කරුණු පරීක්ෂා කරමු. න්‍යාය පිළිබඳ බලගතු අවබෝධයකින් තොරව වුව ද, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය සාර්ථක අයුරින් ක්‍රියාවට නැංවිය හැකි ය යන්න අපගේ විශ්වාසය යි. එබැවින්, ඔබට වුවමනා කරන්නේ ප්‍රායෝගික තතු දැන ගැනීමට නම්, එතැනින් නවතින්න! නමුත්, න්‍යාය සමග පොර බඳන්නට කැමති පාඨකයන් සම්බන්ධයෙන් කතා කරන්නේ නම්, හය වන සහ හත් වන පරිච්ඡේදවල දී, ශිල්ප ක්‍රමයේ වලංගුතාව සහ එය අනෙක් පිවිසුම් (approaches) සහ දැනුම් ගවේෂණ න්‍යායන් (ඥාන විභාගයන් - epistemologies) සමග ගැළපී ගන්නා ආකාරය පරීක්ෂාවට ලක් කරන බව කිව යුතු ය. අවසන් පරිච්ඡේද දෙක ශිල්ප ක්‍රමය විකාශනය වූ ආකාරය පිළිබඳ වැදගත් කරුණු විස්තර කරයිː එනම්, එය පටන් ගත්තේ කොතැනින් ද, එය මීළඟට යොමු වනු ඇත්තේ කොයිබට ද යන්න විස්තර කරයි.

ශිල්ප ක්‍රමය විවිධ ආකාරවලට යොදා ගත හැකි ය. මෙම මාර්ගෝපදේශකයේ ව්‍යුහය තුළින් පිළිබිඹු වන්නේ, ඒ ඒ ආකාරවලට අදාළ ඕනෑඑපාකම් පිරිමසන්නට අප දරන උත්සාහය යි. පළමු වතාවට ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කරන්නට තෝරා ගන්නා අයට සැපයෙන ප්‍රායෝගික සහායක් බවට, මාර්ගෝපදේශකය පත් කරන්නට අපට වුවමනා යි. එහෙත්, දැනට මත් ශිල්ප ක්‍රමය යොදා ගැනීම පිළිබඳ අත්දැකීම් ලබා ඇති මුත්, ශිල්ප ක්‍රමය සම්බන්ධ තමන්ගේ අවබෝධය පුළුල් කර ගන්නට, හෝ තමන් එය යොදා ගන්නා ආකාරය වැඩි දියුණු කර ගන්නට වුවමනා කරන අයට ප්‍රයෝජනයට ගත හැකි, තොරතුරු සහ විශ්ලේෂණ සම්පාදනය කරන්නට ද අපට වුවමනා යි. එමෙන් ම, වෘත්තිකයන්ගේ අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කරන්නට ද අපට වුවමනා යි. ඊට අමතරව, ශිල්ප ක්‍රමය පිළිබඳව, සහ ඒ හා සම්බන්ධිත සහභාගී (participatory) සහ ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයන් පිළිබඳව, පර්යේෂණ කරන්නවුන්ගේ ඕනෑඑපාකම් ආමන්ත්‍රණය කරන්නටත් අපි බලාපොරොත්තු වන්නෙමු.

## පාරිභාෂික වචන ගැන සඳහනක්

මෙම මාර්ගෝපදේශකය රචනා කිරීමේ දී, සංවර්ධන අංශය තුළත්, සංවර්ධිත ආර්ථිකයන්හි මහජන කටයුතු පිළිබඳ අංශය තුළත්, එක හා සමානව හොඳින් යොදා ගත හැකි වූ භාෂාවක් සොයා ගන්නට අපි සමහර අවස්ථාවල උත්සාහ දැරුවෙමු. ස්ථාවර භාවයේ නාමයෙන් අප තෝරා ගැනීම් කීපයක් කර තිබේ. ඔබ කටයුතු කරන වටාපිටාවට අනුව ඔබට අර්ථයක් ගෙන දෙන වචන බවට මේවා පත් කර ගැනීම ගැන සැලකිලිමත් වන ලෙස අපි ඔබ දිරිමත් කරන්නෙමු.

පළමුවෙන් ම, සාමාජීය වෙනස් වීමක් ඇති කිරීම සඳහා වූ වැඩ සටහන්වලට ඉලක්ක වන ජනයා හඳුන්වන්නේ කෙසේ ද යන්න තීරණය කරන්නට අපට සිදු විය. සංවර්ධන අංශයේ දී මෙම ජනයා බොහෝ විට හඳුන්වනු ලබන්නේ ප්‍රතිලාභීන් ලෙසිනි. සංවර්ධිත ආර්ථිකයන්හි මහජන කටයුතු පිළිබඳ අංශයේ දී ඔවුන් හඳුන්වනු ලබන්නේ, සේවාලාභීන්, සේවාවන් ප්‍රයෝජනයට ගන්නන් හෝ සහභාගිකයන් ලෙසිනි. මෙම ප්‍රකාශනය තුළ දී අපි ‘සහභාගිකයා’ යන වචනය යොදා ගත්තෙමු. එතැන අර්ථය පැහැදිලි ය. ඒ අතර ම, දෙවන වචනයක් ලෙස ‘ප්‍රතිලාභියා’ යන්න යොදා ගතිමු.

දෙවනුව, වැඩ සටහන, ව්‍යාපෘතිය සහ මැදිහත් වීම අතර තෝරා ගැනීමක් කරන්නට අපට අවශ්‍ය විය. මෙම ප්‍රකාශනයේ දී අප, ප්‍රමාණය නො සලකා, ආරම්භයක් සහ අවසානයක් සහිත සාමාජීය මැදිහත් වීම්වල සියලු ආකෘති ආවරණය කිරීමට ‘වැඩ සටහන’ යන වචනය තෝරා ගෙන තිබේ.

තෙවනුව, වැඩ සටහන්වලට අරමුදල් සපයන අය, එනම්, ආධාර දෙන්නන්, ආයෝජකයන්, අරමුදල් සපයන්නන් හෝ ගැනුම්කරුවන් වශයෙන් විවිධ අයුරින් හඳුන්වනු ලබන්නන් විස්තර කරන්නට අපට අවශ්‍ය විය. මෙම මාර්ගෝපදේශකයේ දී ‘අරමුදල් සපයන්නන්’ යන වචනය යොදා ගන්නට අපි එකඟ වීමු.

ප්‍රකාශයට පත් වී ඇති පතපොත තුළ සමහර විට ශිල්ප ක්‍රමය පිවිසුමක් ලෙසින් හඳුන්වනු ලැබේ. සමහර විට එය ක්‍රියා දාමයක් වශයෙන් හැඳින්වේ. එය ආකෘතියක් ලෙස පවා හඳුන්වා තිබේ. විශේෂඥයන් අපට දැනුම් දී තිබෙන්නේ එය නිරීක්ෂණය සහ ඇගයීම පිළිබඳ ශිල්ප ක්‍රමයක් බව යි. කෙසේ වෙතත්, ශිල්ප ක්‍රමයට විශේෂිත න්‍යායික පදනමක් පවතින නිසා, ඒ තුළින් පිවිසුමක් තුළ ගැබ් වන සමහර පැතිකඩ මූර්තිමත් වන බව ද අපි විශ්වාස කරන්නෙමු. මේ පිළිබඳව හත් වන පරිච්ඡේදයේ දී තව දුරටත් සාකච්ඡා කෙරේ.

## වගකීමෙන් නිදහස් වීමක්

මෙම ප්‍රකාශනය පදනම් වන්නේ, සාමාජීය වැඩ සටහන් නිරීක්ෂණය සහ ඇගයීම සම්බන්ධයෙන් රික් ඩේවිස් සහ ජෙස් ඩාර්ට් ලත් අත්දැකීම් මත ය. මෙම කටයුත්තේ නිරවද්‍යතාව සහතික කරන්නට අප හැම උත්සාහයක් ම දරන මුත්, මෙම ප්‍රකාශනයේ එන තොරතුරු තමන්ගේ අරමුණුවලට ගැළපෙන්නේ ද නැද්ද යන්න සම්බන්ධයෙන් මොන යම් හෝ තීන්දුවකට එළඹීම, පාඨකයන් සතු වගකීමක් වේ. මෙම තොරතුරුවල ගැළපීම, හෝ ඒවා යොදා ගැනීම නිසා අත් වන ප්‍රතිවිපාක සම්බන්ධයෙන් කිසිදු සහතිකයක් දෙන්නට, කිසිදු වගකීමක් භාර ගන්නට අපට නොහැකි ය.

## ප්‍රකාශන අයිතිය සහ බෙදා හැරීම

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය පිළිබඳ මාර්ගෝපදේශකයේ ප්‍රකාශන අයිතිය රික් ඩේවිස් සහ ජෙස් ඩාර්ට් යන කතුවරුන් සතු ය.

මාර්ගෝපදේශකය ලබා ගැනීමට ඇති අවස්ථාව හැකි තරම් පුළුල් කරන්නට අපි කැමැත්තෙමු. www.mande.co.uk/docs/MSCGuide.htm සහ www.clearhorizon.com.au යන අපගේ වෙබ් අඩවිවලින් මෙම ලියවිල්ල පීඩීඑෆ් ස්වරූපයෙන් නොමිලේ ලබා ගත හැකි ය. එමෙන් ම, අනුග්‍රාහකයන්ගේ වෙබ් අඩවිවලින් ද පීඩීඑෆ් පිටපත් පිටපත් කර ගැනීමේ හැකියාව ඔබට තිබේ.

මාර්ගෝපදේශකයේ දැනට පවතින ආකෘතියට අනුව එය සම්පූර්ණයෙන් ප්‍රතිනිෂ්පාදනය කරන්නේ ය, එම පිටපත් නොමිලේ ලබා ගැනීමට අවස්ථාව සලසන්නේ ය, ඒවා අලෙවි නොකරන්නේ ය, හෝ ඒවා මගින් ලාභ නොලබන්නේ ය යන කොන්දේසි මත මුද්‍රිත පිටපත් නිෂ්පාදනය කළ හැකි ය. මෙම මාර්ගෝපදේශකයේ කොටස් පමණක් ප්‍රතිනිෂ්පාදනය කරන්නට අවශ්‍ය තැන්වල දී, ඒ සඳහා අවසර ලබා ගැනීමට කරුණාකර අප අමතන්න.

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය පිළිබඳ මාර්ගෝපදේශකයේ පිටපත් අලෙවි කිරීමට කැමැත්තක් දක්වන තුන් වන පාර්ශ්වයන්, අවසර ලබා ගැනීම සඳහාත් අදාළ නියමයන් සහ කොන්දේසි තහවුරු කර ගැනීම සඳහාත් අප ඇමතිය යුතු ය.

**ප්‍රකාශන අයිතිය © ආර්.ජේ. ඩේවිස් සහ ජේ. ඩාර්ට් (2004)**

සියලු විමසීම් පහත දැක්වෙන ලිපිනයන් වෙත යොමු කරන්න:


| | |
|---|---|
| ආචාර්ය රික් ඩේවිස්<br><br>82, Bishops Rd, Trumpington,<br>Cambridge CB2, 2NH, United Kingdom<br><br>rick@mande.co.uk<br><br>දුරකථන අංකය: 44 (0) 1223 841 367<br><br>ජංගම දුරකථන අංකය: 44 (0) 7855 766 354<br><br>(විද්‍යුත් තැපෑලට) ෆැක්ස් යොමු කළ හැකි අංකය: 44 08701 640 239 | ආචාර්ය ජෙසිකා ඩාර්ට්<br><br>Clear Horizon, PO Box 341,<br>Hastings VIC 3915 Australia<br><br>jess@clearhorizon.com.au<br><br>දුරකථන/ෆැක්ස් අංකය: 61 (0) 3 5979 2957<br><br>ජංගම දුරකථන අංකය: 0425 735 530 |

# ස්තුති

පහත සඳහන් සංවිධාන සැපයූ නිර්ලෝභී අනුග්‍රහය නොවන්නට මෙම මාර්ගෝපදේශකය රචනා නොවනු ඇත.

| | |
|---|---|
| එක්සත් රාජධානියේ කෙයාර් ඉන්ටර්නැෂනල් (CARE International, United Kingdom) | www.careinternational.org.uk |
| ඕස්ට්‍රේලියාවේ ඔක්ස්ෆෑම් කමියුනිටි ඒඩ් බෝර්ඩ් (Oxfam Community Aid Board, Australia) | www.oxfam.org.au |
| දකුණු ඕස්ට්‍රේලියානු ආණ්ඩුවේ ලර්නින්ග් ටු ලර්න් (Learning to Learn, Government of South Australia) | www.learntolearn.sa.edu.au |
| ඔක්ස්ෆෑම් නිව් සීලන්ඩ් (Oxfam New Zealand) | www.oxfam.org.nz |
| එක්සත් රාජධානියේ ක්‍රිස්ටියන් ඒඩ් (Christian aid, United Kingdom) | www.christian-aid.org.uk |
| එක්සත් රාජධානියේ ඒක්ස්චේන්ජ් (Exchange, United Kingdom) | www.healthcomms.org |
| ඩෙන්මාර්කයේ අයිබිස් (Ibis, Denmark) | www.ibis.dk |
| Mellemfolkeligt Samvirke (MS), Denmark | www.ms.dk |
| ඇමරිකා එක්සත් ජනපදයේ ලූතරන් වර්ල්ඩ් රිලීෆ් (Lutheran World Relief, United States of America) | www.lwr.org |

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය භාවිතයට ගැනීම සම්බන්ධයෙන්, කතුවරයන් දෙදෙනා සතුව සැලකිය යුතු අත්දැකීමක් පවතී. එහෙත්, ශිල්ප ක්‍රමය භාවිතයට ගැනීම හා සම්බන්ධ අනෙකුත් ජනයාගේ අත්දැකීම් පිළිබඳව රචිත, ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවත්නා පතපොත ද මෙහි ලා යොදා ගැනීමට අපි උත්සාහ දැරුවෙමු. මෙම මාර්ගෝපදේශකය තුළ අළු පැහැයෙන් දක්වා තිබෙන්නේ එම පතපොතින් උපුටා ගත් කොටස් ය. මෙකී පතපොත ලියූ සියලු කතුවරුන්ගේ නම්, මාර්ගෝපදේශකය අවසානයේ එන නාමාවලියෙහි පෙළ ගස්වා තිබේ. ඒ හැමට තුති පුදන්නට අපි කැමැත්තෙමු.

එමෙන් ම, මෙම මාර්ගෝපදේශකයේ කෙටුම්පත කියවා බලා ඒ පිළිබඳව අදහස් පළ කිරීම සම්බන්ධයෙන්, කෙයාර් සංවිධානයේ ජේ ගවුල්ඩන්, ඕසීඒජ් සංවිධානයේ ඩෙබෝරා එල්කින්ග්ටන්, ඒඩීආර්ඒ සංවිධානයේ රොබින් කෙර්, අයිබිස් සංවිධානයේ සිල්කි මේසන් සහ ගිලියන් හොල්ම්ස්, ඩෙන්මාර්කයේ එම්එස් සංවිධානයේ පීටර් සිස්ගාර්ඩ් යන අයට තුති පළ කරන්නට ද අපි කැමැත්තෙමු.

# පළමු වන පරිච්ඡේදය: ශිල්ප ක්‍රමය පිළිබඳ සංක්ෂිප්ත දළ විශ්ලේෂණයක්

## සංක්ෂිප්තව ගත් විට වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යනු කුමක් ද?

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යනු, සහභාගී නිරීක්ෂණයේ සහ ඇගයීමේ ස්වරූපයකි. එය සහභාගී වනුයේ, වාර්තා කළ යුතු වෙනස් වීමේ ස්වරූපය කුමක් ද යන්න තීරණය කිරීම සහ දත්ත විශ්ලේෂණය යන අවස්ථා දෙකේ දී ම, බොහෝ ව්‍යාපෘති කොටස්කරුවන් ඊට සම්බන්ධ වන බැවිනි. වැඩ සටහන් චක්‍රය පුරා සිදු වන නිසාත්, වැඩ සටහන හසුරුවා ගැනීම සඳහා ජනයාට සහාය වන තොරතුරු සම්පාදනය කරන නිසාත්, එය නිරීක්ෂණ ස්වරූපයක් වෙයි. වැඩ සටහනේ සමස්ත සාර්ථකත්වය තක්සේරු කිරීම සඳහා සහාය කර ගත හැකි, බලපෑම් සහ ප්‍රතිඵල සම්බන්ධ දත්ත සම්පාදනය කරන නිසා එය ඇගයීමට දායක වෙයි.

ක්‍රියා දාමයට ප්‍රධාන වශයෙන් කටයුතු දෙකක් ඇතුළත් වෙයි. එකක් නම්, ක්ෂේත්‍ර මට්ටමෙන් මතු වී එන අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් එක්රැස් කිරීම යි. අනෙක නම්, පත් කරන ලද කොටස්කරුවන්ගේ මණ්ඩල හෝ කාර්ය මණ්ඩල මාර්ගයෙන්, මෙම කතා පුවත් අතුරින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත විධිමත් අයුරින් තෝරා ගැනීම යි. පත් කරන ලද කාර්ය මණ්ඩලය සහ කොටස්කරුවෝ, මුල දී වැඩ සටහනෙන් ඇති කළ බලපෑම 'සොයා යාම' මගින් සම්බන්ධ වෙති. වෙනස් වීම් මොනවා ද යන්න හසු කර ගත් පසු, විවිධාකාර ජනයා එකට වාඩි ගෙන කතා පුවත් හඬ නගා කියවන අතර, මෙම වාර්තාගත වෙනස් වීම්වල පවත්නා වටිනාකම පිළිබඳව නිතිපතාත්, බොහෝ විට සවිස්තරාත්මකවත් සාකච්ඡා පවත්වති. ශිල්ප ක්‍රමය සාර්ථක අයුරින් ක්‍රියාත්මක කෙරෙන විට, සමස්ත ජන කණ්ඩායම් ම වැඩ සටහනෙන් ඇති වන බලපෑම වෙත සිය අවධානය යොමු කරන්නට පටන් ගනිති.

## නමක ඇතුළත් වන්නේ මොනවා ද?

බිහි වූ තැන් පටන් මේ දක්වා කාලය තුළ ශිල්ප ක්‍රමයට නම් කීපයක් ම පැවතී තිබේ. ඒ එක් එක් නමෙන් ශිල්ප ක්‍රමයෙහි එකිනෙකට වෙනස් පැතිකඩ ගැන අවධාරණය විය.

### *දර්ශකවලින් තොරව නිරීක්ෂණයෙහි යෙදීම*

ශිල්ප ක්‍රමය, කලින් සකසා ගත් දර්ශක, විශේෂයෙන් ම ගණන් කිරීමට සහ මැනීමට සිදු වන දර්ශක භාවිතයට නො ගනියි.

### *'කතා පුවත්' පිවිසුම*

වෙනස් වීම පිළිබඳව අසනු ලබන අතිශය වැදගත් ම ප්‍රශ්නයට දෙන පිළිතුරු, බොහෝ විට ඉදිරිපත් වන්නේ කතා පුවත්වල ස්වරූපයෙනි. එනම්, කවුරුන් කුමක්, කවදා කළේ ද, එසේ කළේ ඇයි ද, සිදුවීම වැදගත් වන්නට බලපෑ හේතු මොනවා ද යන්න ගැන වූ කතා පුවත්වල ස්වරූපයෙනි (ඩාර්ට්, 1999a, 1999b).

### *නිරීක්ෂණය*

ශිල්ප ක්‍රමය පළමුව වර්ධනය කෙරුණේ, සංවර්ධන ආධාර වැඩ සටහනක දී සිදු වූ වෙනස් වීම් නිරීක්ෂණය කිරීමේ මාධ්‍යයක් වශයෙනි (ඩේවිස්, 1996). තක්සේරු කිරීමේ අරමුණු වෙනුවෙන් ද එය යොදා ගත හැකි යැයි අපි විශ්වාස කරමු.

### *බලපෑම් නිරීක්ෂණය*

සාම්ප්‍රදායික නිරීක්ෂණ ශිල්ප ක්‍රම විශාල වශයෙන් අවධානය යොමු කරන්නේ, ක්‍රියාකාරකම් සහ ප්‍රතිඵල නිරීක්ෂණය කිරීම කෙරෙහි ය. එහෙත්, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය අවධානය යොමු කරන්නේ, අතරමැදි ප්‍රතිඵල සහ බලපෑම් නිරීක්ෂණය කිරීම කෙරෙහි ය.

### *සංවිධානීය ඉගෙනීම සම්බන්ධ විකාශනවාදී පිවිසුම*

මෙය රික් විසින් ශිල්ප ක්‍රමයට දුන් මුල් නම යි. මුල් සැලැස්ම පෝෂණය කළ දැනුම් ගවේෂණ න්‍යාය එම නමින් පිළිබිඹු වේ (හත් වන පරිච්ඡේදය බලන්න).

2000 වසරේ දී, ***වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම*** නමැති ශිල්ප ක්‍රමය යන නම පිළිබඳව අපි එකඟතාවකට පැමිණීමු. පිවිසුමේ අතිශය මූලික පැතිකඩක් මෙමගින් මූර්තිමත් වේ: එනම්, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳව තොරතුරු රැස් කිරීම සහ ඒවා විධිමත් අයුරින් විශ්ලේෂණය කිරීම යි.

## ශිල්ප ක්‍රමය පිළිබඳ කතා පුවත

සංකීර්ණ සහභාගී ග්‍රාමීය සංවර්ධන වැඩ සටහනක, නිරීක්ෂණ සහ ඇගයීම් කටයුතුවලට සම්බන්ධිතව පැවති ඇතැම් අභියෝගවලට මුහුණ දී ඒවා ජය ගැනීමට දැරූ උත්සාහයක දී, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය නිපදවූයේ රික් ඩේවිස් විසිනි. බංග්ලාදේශයෙහි ක්‍රියාත්මක කළ, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිඵල යන දෙයාකාරයෙන් ම විවිධත්වයක් තිබූ මෙම වැඩ සටහන සංවිධානය කළේ, බංග්ලාදේශයෙහි සංවර්ධනය සඳහා වූ ක්‍රිස්තියානි කොමිසම (සීසීඩීබී) විසිනි. බංග්ලාදේශ රාජ්‍ය නොවන සංවිධානයක් වන එහි, 1996 දී 500කට වැඩි කාර්ය මණ්ඩලයක් සිටි අතර, එය ගම්මාන 785ක් තුළ 46,000ක් ජනයා සමග වැඩ කොට තිබිණ. ඍජු ප්‍රතිලාභීන්ගෙන් ආසන්න වශයෙන් සියයට 80ක් ස්ත්‍රීහු වූහ. ක්‍රියාකාරකම් විශාල පරිමාණයේ ඒවා විය. එමෙන් ම ක්‍රියාකාරකම්වලට කල් තබා නියම කොට ගත් අවසානයක් නොතිබිණ. මේ නිසා, ක්‍රියා දාමය සහ ප්‍රතිඵලය නිරීක්ෂණය කිරීම අරමුණු කර ගත්, මොන යම් ආකාරයක හෝ නිරීක්ෂණ පද්ධතියක් සැලසුම් කර ගැනීම සම්බන්ධයෙන්, බරපතළ ගැටලුවක් මතු කෙරිණ (ඩේවිස්, 1996).

රික් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය වර්ධනය කළේ, රාජ්‍ය නොවන ආධාර සපයන සංවිධානවල සංවිධානීය ඉගෙනීම පිළිබඳව සිදු කළ සිය ආචාර්ය උපාධිය සඳහා යෙදී ගත් ක්ෂේත්‍ර වැඩ කටයුතුවල කොටසක් ලෙස ය (ඩේවිස්, 1996). ශිල්ප ක්‍රමය සහ නිබන්ධය යන දෙක ම පෝෂණය වූයේ විකාශනවාදී දැනුම් ගවේෂණ න්‍යායකිනි. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යොදා ගැනීම සඳහා ඔබ මෙම පසුබිම් න්‍යාය දැන ගැනීම අවශ්‍ය නැති මුත්, හත් වන පරිච්ඡේදයේ දී ඔබට ඒ ගැන වැඩි දුර තොරතුරු සොයා ගත හැකි ය. ජෙස් සහ අනෙකුත් අය, රික් යොදා ගත් ඉදිරි දැක්මට වෙනස් වූ න්‍යායික ඉදිරි දැක්මවල පිහිටා සිටිමින්, ශිල්ප ක්‍රමය යොදා ගන්නා ආකාරය විශ්ලේෂණය කොට තිබේ ය යන කරුණ ද සටහන් කර තබා ගැනීම වටී. ඊට හේතුව, ශිල්ප ක්‍රමයට පදනම් වූ සැලැස්ම සමග මේ නම්‍යශීලී බව ගැළපීම යි.

ශිල්ප ක්‍රමය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ජෙස් ඕස්ට්‍රේලියාවේ දී ඉටු කළ කාර්ය භාරය ද ඇතුළුව, එය යොදා ගැනීම පිළිබඳ ඉතිහාසය සම්බන්ධ වැඩි දුර තොරතුරු 8 වන පරිච්ඡේදයේ දී දැන ගත හැකි ය.

**බංග්ලාදේශය - පස් වසරකට පසුව**
"මෙම වසර (2000) තුළ දී, අදාළ ජනයාගේ ජීවිත තුළ සිදු වූ ගුණාත්මක වෙනස් වීම් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම සඳහා සැලසුම් කළ වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම (එනම්, ශිල්ප ක්‍රමය) පිළිබඳ පද්ධතියක්, සීසීඩීබිය නොකඩවා පවත්වා ගෙන ගොස් තිබේ. 1995 අගෝස්තුවේ පටන් මෙම පද්ධතිය, නිතිපතා පවත්වා ගෙන ආ පීපීආර්ඩීපී නිරීක්ෂණ පද්ධතියේ කොටසක් ලෙස ක්‍රියාත්මක වී තිබේ. කෙසේ වුව ද, වත්මන් සැලසුම්කරණ කාල සීමාව අතරතුර දී, අනෙකුත් සියලු වැඩ සටහන් තුළ පද්ධතිය යොදා ගැනීමට සීසීඩීබිය බලාපොරොත්තු වෙයි. දෙන ලද කාල සීමාවක් තුළ, අදාළ ජනයාගේ ජීවිතවල සැබවින් ම සිදු වී ඇති වෙනස් වීම් කතා පුවත්වලින් පිළිබිඹු වන නිසා, වැඩ සටහන්වල නැඹුරුතාවන්හි/බලපෑම්වල සිදු වෙමින් පවතින වෙනස් වීම් නිරීක්ෂණය කිරීමේ දී පද්ධතිය අතිශයින් ප්‍රයෝජනවත් වන බව පෙනී යයි" *(සීසීඩීබිය, 2000:4, බංග්ලාදේශය).*

# ක්‍රියාත්මක කිරීමේ පියවරයන් පිළිබඳ දළ විශ්ලේෂණයක්

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම යනු මතු වෙමින් පවතින ශිල්ප ක්‍රමයකි. මෙම මාර්ගෝපදේශකය පුරා සාකච්ඡාවට ලක් වන බොහෝ සකසා ගැනීම් (adaptations) දැනට මත් එහි සිදු වී තිබේ. නවීකරණයන් වෙත පිවිසෙන්නට පෙර අපි, ශිල්ප ක්‍රමය 'පූර්ණ' වශයෙන් ක්‍රියාත්මක කළ හොත් එය කුමන ස්වරූපයක් අත් කර ගනී ද යන්න ගැන පුළුල් දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්නෙමු. අප මෙය විස්තර කොට තිබෙන්නේ පියවර දහයක් යොදා ගනිමිනි.

1. පටන් ගන්නා සහ ඕනෑකම මතු කර ගන්නා ආකාරය
2. වෙනස් වීම බලපෑ ක්ෂේත්‍ර (බලපෑම් ක්ෂේත්‍ර) අර්ථදැක්වීම
3. වාර්තාකරණ කාල සීමාව අර්ථදැක්වීම
4. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් රැස් කිරීම
5. කතා පුවත් අතුරින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත තේරීම
6. තේරීම් ක්‍රියා දාමයේ ප්‍රතිඵල පිළිබඳව ප්‍රතිපෝෂණ සැපයීම
7. කතා පුවත්වල සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම
8. ප්‍රමාණාත්මකව ප්‍රකාශයට පත් කිරීම
9. දෙවන විශ්ලේෂණය සහ පසු නිරීක්ෂණය
10. පද්ධතිය සංශෝධනය කිරීම.

ශිල්ප ක්‍රමයේ පළමු වන පියවරට සාමාන්‍යයෙන් ඇතුළත් වන්නේ, ශිල්ප ක්‍රමයට කොටස්කරුවන් මාලාවක් හඳුන්වා දී, සහභාගිත්වය සඳහා ඔවුන් තුළ පවතින ඕනෑකම සහ කැප වීම පෝෂණය කිරීම යි. ඊළඟ පියවර වන්නේ, නිරීක්ෂණය කළ යුතු වෙනස් වීම බලපෑ ක්ෂේත්‍ර මොනවා ද යන්න හඳුනා ගැනීම යි. තෝරා ගත් කොටස්කරුවන් විසින්, 'ජනයාගේ ජීවිතවල සිදු වූ වෙනස් වීම්' වැනි පුළුල් බලපෑම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම මීට ඇතුළත් ය. මෙම බලපෑම් ක්ෂේත්‍ර ක්‍රියාකාරිත්වය පිළිබඳ දර්ශක මෙන් නිශ්චිතව අර්ථදක්වා නැත. යොදා ගන්නන්ට අර්ථදක්වා ගැනීම සඳහා ඒවා සිතාමතා නිදහස්ව තබා තිබේ. තෙවන පියවර වන්නේ, මෙම බලපෑම් ක්ෂේත්‍ර තුළ සිදු වන වෙනස් වීම්, කොතරම් නිරන්තර භාවයකින් යුතුව නිරීක්ෂණය සිදු කළ යුතු ද යන්න තීරණය කිරීම යි.

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් රැස් කරනු ලබන්නේ, සහභාගිකයන් සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය වැනි, ක්‍රියා දාමයට වඩාත් ම සෘජුව සම්බන්ධ වන්නන් වෙතිනි. කතා පුවත් රැස් කරන්නේ සරල ප්‍රශ්නයක් ඇසීමෙනි: එනම්, *"ඔබේ අදහසේ හැටියට, පසු ගිය මාසය අතරතුර දී, වැඩ සටහන තුළ සිටින සහභාගිකයන්ට සම්බන්ධිතව සිදු වූ වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම කුමක් ද?"* යන්න වැනි ප්‍රශ්නයක් ඇසීමෙනි. මුලින් ම, ප්‍රතිචාර දක්වන්නෝ තමන්ගේ කතා පුවත් බලපෑම් ක්ෂේත්‍ර අනුව වර්ග කිරීමෙහි යොදවනු ලබති. මීට අමතරව, තමන් යම් විශේෂිත වෙනස් වීමක් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම විය යුතු යැයි සලකන්නේ කුමන හේතුවක් නිසා ද, යන්න වාර්තා කරන්නට ප්‍රතිචාර දක්වන්නෝ දිරිමත් කරනු ලබති.

අනතුරුව, සංවිධානයක් හෝ වැඩ සටහනක් තුළ සාමාන්‍යයෙන් පවතින අධිකාර තල (බලතල අනුව සැකසුණු නිලතල ව්‍යුහය - levels of authority) ඔස්සේ කතා පුවත් විශ්ලේෂණය කොට ඒවා තෝරනු ලැබේ. ධුරාවලියේ එක් එක් තලය, පහළින් තිබෙන තලයෙන් තමන් වෙත එවන ලද කතා පුවත් මාලාව සමාලෝචනයට ලක් කොට, එක් එක් බලපෑම් ක්ෂේත්‍රය තුළ සිදු වූ වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පෙන්නුම් කරන තනි කතා පුවතක් බැගින් තෝරා ගනු ලැබේ. අනතුරුව එක් එක් කණ්ඩායම, තමන් තෝරා ගත් කතා පුවත් වැඩ සටහන් ධුරාවලියේ ඊට ඉහළින් පිහිටි මට්ටම වෙත යවනු ලැබේ. මෙලෙස, විධිමත් වූත් විනිවිද පෙනෙන්නා වූත් ක්‍රියා දාමයක් ඔස්සේ කතා පුවත් සංඛ්‍යාව අඩු කරනු ලැබේ. මේ අනුව, හැම වතාවක දී ම කතා පුවත්වල තේරීමක් සිදු වේ. එමෙන් ම, ඒ හැම වතාවක දී ම, ඒවා තෝරා ගැනීමට යොදා ගනු ලබන මිනුම් දණ්ඩ සටහන් කොට ගෙන ඒ පිළිබඳ ඕනෑකමක් ඇති සියලු කොටස්කරුවන් වෙත ප්‍රතිපෝෂණය කෙරේ. ඒ අනුව, කලින් වටවලින් ලද ප්‍රතිපෝෂණ මගින්, කතා පුවත් රැස් කිරීමේ සහ තේරීමේ එක් එක් ඊළඟ වටය පෝෂණය වේ. සංවිධානය, සිය අවධානය යොමු වන දිසාව සටහන් කර ගෙන, ඒ අනුව එහි අවශ්‍ය සීරුමාරු කිරීම් සිදු කරයි. සිදුවීම් අගය කිරීමට එය යොදා ගන්නා මිනුම් දණ්ඩ කුමක් ද යන්න මේ තුළින් දැක ගත හැකි ය.

වසරක් වැනි කාල සීමාවක් තිස්සේ මෙම ක්‍රියා දාමය යොදා ගැනීමෙන් අනතුරුව ලියවිල්ලක් ඉදිරිපත් කරනු ලැබේ. ඒ කාල සීමාව තුළ දී, වෙනස් වීම බලපෑ එක් එක් ක්ෂේත්‍රයට අදාළව සංවිධානීය ධුරාවලියේ ඉහළ ම තලයේ දී තෝරා ගත් සියලු කතා පුවත් එහි ඇතුළත් කෙරේ. කතා පුවත් සමග, කතා පුවත් තෝරා ගැනීමට බලපෑ හේතු ද ඇතුළත් කරනු ලැබේ. මෙම ලියවිල්ලේ ඇතුළත් කතා පුවත් තක්සේරු කරන ලෙස වැඩ සටහන සඳහා අරමුදල් සපයන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. එහි දී ඔවුහු, තමන් අරමුදල් සැපයීමෙන් අත් කර ගැනීමට බලාපොරොත්තු වන ප්‍රතිඵලවල ස්වරූපය හොඳින් ම නියෝජනය වන ඒවා තෝරා ගනිති. තමන්ගේ තේරීම කෙරෙහි බලපෑ හේතු ලේඛනගත කරන ලෙස ද ඔවුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙම තොරතුරු වැඩ සටහන් කළමනාකරුවන් වෙත ප්‍රතිපෝෂණය කෙරේ.

අනතුරුව, විස්තර කරන ලද සිදුවීම් සිදු වූ ස්ථාන වෙත සංචාරය කොට, තෝරා ගත් කතා පුවත්වල සත්‍යාසත්‍යතාව පරීක්ෂා කර බැලිය හැකි ය. මෙහි අරමුණ දෙයාකාර යඃ එකක් නම්, කතා පුවත් නිවැරදිව සහ අවංකව වාර්තා කොට ඇද්ද යන්න පරීක්ෂා කොට බැලීම යි. අනෙක නම්, විශේෂ අර්ථාන්විත බවකින් යුතු යැයි දකිනු ලබන සිදුවීම් පිළිබඳව වඩා සවිස්තරාත්මක තොරතුරු එක්රැස් කර ගැනීමට අවස්ථාවක් සැපයීම යි. සංචාරය සිදු කරන්නේ සිදුවීම්වලින් යම් කලකට පසු නම්, සිදුවීම මුලින් ම වාර්තා කළ තැන් පටන් සිදු වී ඇති දේ තේරුම් ගැනීමේ අවස්ථාවක් ද එමගින් පිළිගැන්වේ.

ඊළඟ පියවර වන්නේ ප්‍රමාණාත්මකව ප්‍රකාශයට පත් කිරීම යි. එය පියවර දෙකකින් සිදු කළ හැකි ය. වෙනස් වීම පිළිබඳ කතා පුවතක් මුලින් විස්තර කෙරෙන විට, ගුණාත්මක තොරතුරු මෙන් ම ප්‍රමාණාත්මක තොරතුරු ද ඊට ඇතුළත් කරන්නට පුළුවන්කම තිබේ. සුවිශේෂ කාල සීමාවක් තුළ දී, එක් ස්ථානයක දී හඳුනා ගන්නා ලද වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම්, වෙනත් ස්ථානවල දී ද සිදු වී ඇත්තේ කොයි තරම් දුරකට ද යන්න ප්‍රමාණාත්මකව ප්‍රකාශයට පත් කරන්නට ද හැකියාව තිබේ. ප්‍රමාණාත්මකව ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එන ඊළඟ පියවර වන්නේ නිරීක්ෂණ පද්ධතිය ම නිරීක්ෂණයට ලක් කිරීම යි. සහභාගි වූයේ කවුරුන් ද යන්නත් අන්තර්ගතය කෙරෙහි ඔවුන් කළ බලපෑම කුමක් ද යන්නත් පරීක්ෂා කිරීම, සහ නානාවිධ වෙනස් වීම් ස්වරූප කොතරම් නිරතුරුව වාර්තා වී තිබේ ද යන්න විශ්ලේෂණය කිරීම, මීට ඇතුළත් කළ හැකි ය. අවසන් පියවර වන්නේ, ශිල්ප ක්‍රමය යොදා ගැනීමේත් එය යොදා ගත් ආකාරය විශ්ලේෂණය කිරීමේත් සෘජු ප්‍රතිඵලයක් වශයෙන් ඉගෙන ගත හැකි වූ දේ, සැලකිල්ලට ගත හැකි වන පරිදි ශිල්ප ක්‍රමයේ සැලැස්ම සංශෝධනය කිරීම යි.

# සාරය

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමයේ සාරය වන්නේ පහත දැක්වෙන ප්‍රශ්නයට සමාන ප්‍රශ්නයකි:

*'පසු ගිය මාසය දෙස ආපසු හැරී බැලීමෙන්, [වෙනස් වීම බලපෑ යම් විශේෂිත ක්ෂේත්‍රයක් තුළ ඇති වූ] වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම කුමක් වී යැයි ඔබ සිතන්නේ ද?'*

වෙනත් සහභාගිකයන් කණ්ඩායමක් පළමු ප්‍රශ්නයට ලැබුණු පිළිතුරු විභාග කරන විට, තවත් ඒ හා සමාන ප්‍රශ්නයක් මතු වේ:

*'මේ සියලු අර්ථාන්විත වෙනස් වීම් අතුරින් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම කුමක් වී යැයි ඔබ සිතන්නේ ද?'*

විවිධ පසුබිම්වලට අයත් බොහෝ සහභාගිකයන් වෙතින් රැස් කර ගත් සංකීර්ණ තොරතුරු විශාල සංඛ්‍යාවක් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ඇති කර ගැනීම සඳහා යොදා ගත හැකි සරල උපක්‍රමයක්, මෙම ක්‍රියා දාමයෙන් සම්පාදනය වේ.

අර්ථාන්විත වෙනස් වීම් සම්බන්ධයෙන් ඉහළ තලවල දී සිදු කළ තෝරා ගැනීම ගැන ඊට පහළින් ඇති එක් එක් තලවලට දැනුම් දීම, සමස්ත ක්‍රියා දාමයේ ම අත්‍යවශ්‍ය අංගයක් වේ. එක් එක් ඊළඟ වාර්තාකරණ කාල සීමාව තුළ දී සිදු කරන අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ සොයා බැලීම්වල දී, අවධානයෙහි යළි සීරුමාරු කිරීම් සිදු කර ගන්නට මෙය උපකාර වේ.

*1 වන රූප සටහන. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති තේරීම් ක්‍රියා දාමය (ලාඕසයේ ඒඩීආර්ඒ සංවිධානයෙන් නිදසුනක්)*



# අරමුණ

විවිධකාර සංවිධාන ගණනාවක් විසින් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති නිරීක්ෂණය ඉතා ම ප්‍රයෝජනවත් යැයි තේරුම් ගෙන තිබීමට හේතු කීපයක් තිබේ. ඒ අතරට පහත දැක්වෙන ඒවා ඇතුළත් වේ:

1. එය අනපේක්ෂිතව ඇති වන වෙනස් වීම් හඳුනා ගැනීමේ හොඳ උපක්‍රමයකි.

2. එය සංවිධානයක් තුළ පවත්නා වටිනාකම් පැහැදිලිව හඳුනා ගැනීමටත්, එම වටිනාකම්වලින් වඩාත් ම වැදගත් වන්නේ කුමන වටිනාකම ද යන්න ගැන ප්‍රායෝගික සාකච්ඡාවක් ඇති කිරීමටත් හොඳ ක්‍රමයකි. වඩාත් ම වැදගත් වන්නේ කුමන අර්ථාන්විත වෙනස් වීම ද යන්න ගැන ජනයා බැරෑරුම්ව කල්පනා කර බලන විටත්, සාකච්ඡා කරන විටත්, මෙම ප්‍රායෝගික සාකච්ඡාව සිදු වේ. මෙය සංවිධානයේ සියලු තලවල දී සිදු විය හැකි ය.

3. එය නිරීක්ෂණය පිළිබඳ යම් විශේෂ වෘත්තීමය නිපුණතාවන් අවශ්‍ය නොකරන, සහභාගී නිරීක්ෂණ ස්වරූපයකි. වෙනත් නිරීක්ෂණ පිවිසුම්වලට සන්සන්දනාත්මකව සලකා බලන කල, විවිධ සංස්කෘතීන් සමග අදහස් හුවමාරු කර ගැනීම පහසු කරන්නකි. දර්ශකය කුමක් දැයි පැහැදිලි කිරීමේ අවශ්‍යතාවක් නැත. වැදගත් විණැයි තමන් සිතන සිදුවීම් සම්බන්ධ කතා පුවත් පවසන්නට හැම දෙනාට ම පුළුවන්කම තිබේ.

4. එක් වෙනස් වීමක් අනෙකට වඩා වැදගත් යැයි තමන් විශ්වාස කරන්නේ කුමක් නිසා ද යන්න පැහැදිලි කරන්නට ජනයාට සිදු වන නිසා, එය දත්ත රැස් කිරීම මෙන් ම විශ්ලේෂණය ද දිරිමත් කරයි.

5. එයට දත්ත විශ්ලේෂණයට සහ බලපෑම සංකල්පගත කිරීමට සම්බන්ධ කාර්ය මාණ්ඩලික හැකියාවන් ගොඩ නගන්නට පිළිවන.

6. සංවිධානීය, සාමාජීය සහ ආර්ථික වර්ධනයන් තනි ඉලක්කමකට හකුළුවා දක්වමින්, ඕනෑවට වඩා සරල චිත්‍රයක් සම්පාදනය කරනවා වෙනුවට, සිදු වෙමින් පවතින්නේ කුමක් ද යන්න පිළිබඳව සාරවත් චිත්‍රයක් සම්පාදනය කරන්නට ඊට හැකියාව තිබේ.

7. ඇගයිය යුත්තේ මෙවන් ප්‍රතිඵල යැයි කල් තබා අර්ථදක්වා ගත් ප්‍රතිඵලවලින් තොර, පහළ සිට ඉහළට සිදු වෙමින් පවතින මුල පිරීම් නිරීක්ෂණයට සහ ඇගයීමට එය යොදා ගත හැකි ය.

**මියැන්මාරය - ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ඍජුව ම ප්‍රතිඵලවලට ඇහුම්කන් දෙයි**
"ඉදිරිපත් වූ කතා පුවත්වලින් ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ද මහත් සතුටට පත් විය. මේ දේවල්වලට ඇහුම්කන් දෙන්නට ඔවුන්ට කිසි දා අවස්ථාවක් ලැබී නොතිබුණාක් මෙන් විය!" *(ගිලියන් ෆ්ලෙවර්, 2004, කෙයාර්හි එච්අයිවී/ඒඩ්ස් වැඩ සටහනේ උපදේශිකාවකි).*

# ශිල්ප ක්‍රමය යොදා ගත යුතු සහ යොදා නො ගත යුතු අවස්ථා

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය සමහර වැඩ සටහන් තත්ත්වයන්ට වඩා හොඳින් ගැළපෙයි. (ඇතැම් විට, එන්නත් කිරීම වැනි) පහසුවෙන් අර්ථදක්වන ලද ප්‍රතිඵල සහිත සරල වැඩ සටහනක දී, ප්‍රමාණාත්මක නිරීක්ෂණය ප්‍රමාණවත් විය හැකි ය. එමෙන් ම, නිසැකව ම ඒ සඳහා වැය වනු ඇත්තේ ශිල්ප ක්‍රමයට වඩා අඩු කාලයකි. කෙසේ වුවත් අනෙක් වැඩ සටහන් තත්ත්වයන්හි දී, සම්මත නිරීක්ෂණ සහ ඇගයීම් මෙවලම්වලින් ප්‍රමාණවත් තරම් දත්ත නොසැපයෙන්නට ඉඩ තිබේ. එනම්, වැඩ සටහනෙන් ඇති වූ

බලපෑම් පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීමට සහ ඉගෙනීම පෝෂණය කර ලීමට ප්‍රමාණවත් වන තරම් දත්ත නොසැපයෙන්නට ඉඩ තිබේ. එලෙස සාම්ප්‍රදායික පිවිසුම් මගින් නිසි පරිදි අවශ්‍යතාවන් නොසැපිරෙන, එහෙත් ශිල්ප ක්‍රමය යොදා ගැනීමෙන් සැලකිය යුතු වාසියක් අත් කර ගත හැකි වැඩ සටහන් ස්වරූප අතරට, පහත දැක්වෙන වැඩ සටහන් ඇතුළත් වේ:

- සංකීර්ණ වූත්, විවිධ සහ දෘශ්‍යමාන ප්‍රතිඵල ඇති කරන්නා වූත් වැඩ සටහන්
- බොහෝ සංවිධානීය තල සහිත වීම නිසා විශාල වූ වැඩ සටහන්
- සාමාජීය වෙනස් වීම ගැන අවධානය යොමු කරන වැඩ සටහන්
- ආචාර ධර්ම අතින් සහභාගී ස්වරූපයක් ගන්නා වැඩ සටහන්
- ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ සහභාගිකයන් නැවත නැවත හමු වී සැලසුම් කරන වැඩ සටහන්
- සම්මත නිරීක්ෂණ පද්ධති යොදා ගැනීමේ දී දුෂ්කරතාවන්ට මුහුණ දෙන වැඩ සටහන්
- (පවුල් උපදේශනය වැනි) කුඩා ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට අතිශය පෞද්ගලික මට්ටමින් සේවා සපයන වැඩ සටහන්.

සංවිධානයක් තුළ සිදු කරන නිරීක්ෂණ සහ ඇගයීම් කටයුතු අරමුණු කීපයකට ප්‍රයෝජනවත් විය හැකි ය. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය අනෙක්වාට වැඩියෙන් සමහර අරමුණු ආමන්ත්‍රණය කරයි. අපගේ අත්දැකීම අනුව, වගකීම් සහගත භාවය ගැන නො ව, **ඉගෙනීම** ගැන අවධානය යොමු කරන නිරීක්ෂණ කටයුතුවලට ශිල්ප ක්‍රමය ගැළපේ. ජනයාගේ ජීවිත සම්බන්ධයෙන් කළ මැදිහත් වීමක බලපෑම් සොයා බලන්නට ඔබ ඕනෑකමක් දක්වන විට ද, වෘත්තීමය නොවන අයගේ අදහස් ඇතුළත් කර ගැනීමට ඔබ උනන්දු වන විට ද, එය සුදුසු මෙවලමක් වේ. එමෙන් ම, තමන් කළ වැඩ කටයුතුවලින් ඇති වූ බලපෑම හසු කර ගැනීමත් විශ්ලේෂණය කිරීමත් සම්බන්ධ තමන්ගේ හැකියාවන්, වැඩි දියුණු කර ගැනීම සඳහා කාර්ය මණ්ඩලයට සහාය වන්නට ද ශිල්ප ක්‍රමයට පුළුවන්කම තිබේ.

ප්‍රතිලාභ මගින්, ශිල්ප ක්‍රමය සඳහා දැරූ පිරිවැය සාධාරණීකරණය නොවන්නට ඉඩ ඇති සමහර උදාහරණ ද තිබේ. පහත දැක්වෙන දෑ ආමන්ත්‍රණය කිරීම සඳහා ශිල්ප ක්‍රමය යොදා ගැනීමට හැකියාව පවතින මුත්, එම අරමුණු ම ඊට වඩා අඩු කාලයකින් සපුරා ගත හැකි වෙනත් ක්‍රම පැවතිය හැකි ය:

- අපේක්ෂා කළ වෙනස් වීම් හසු කර ගැනීම
- ජනයා අතර සබඳතා පිළිබඳ හොඳ කතා පුවත් සකස් කිරීම
- සම්පූර්ණ කරන ලද වැඩ සටහනක් පිළිබඳව ප්‍රත්‍යවලෝකනාත්මක ඇගයීමක් සිදු කිරීම
- සහභාගිකයන් පොදුවේ ලත් අත්දැකීම අවබෝධ කර ගැනීම
- වගකීම් සහගත භාවය හා සම්බන්ධ අරමුණු සැපිරීම උදෙසා ඇගයීම් වාර්තාවක් සකස් කිරීම
- ඉක්මන් සහ අඩු පිරිවැයක් සහිත ඇගයීමක් සම්පූර්ණ කිරීම.

සමහර වැඩ සටහන් තත්ත්වයන්, ශිල්ප ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා වඩාත් උපකාර වේ. අපගේ අත්දැකීම අනුව, ශිල්ප ක්‍රමයට ප්‍රධාන වශයෙන් ශක්තිය ලබා දෙන දෑ අතුරින් කීපයක් මෙසේ යඃ

- සාර්ථක වන දේ ගැන මෙන් ම, වරදින දේ ගැන ද සාකච්ඡා කිරීමට ඉඩ ලැබෙන සංවිධානීය සංස්කෘතියක්
- මනා පහසුකම්කාරක නිපුණතාවන් සහිත නායකයන් (එනම්, ශිල්ප ක්‍රමය යොදා ගැනීම ප්‍රවර්ධනය කළ හැකි ජනයා)
- වෙනස් යමක් අත්හදා බැලීමේ කැමැත්තක්
- පිවිසුම් චක්‍ර කීපයක් පවත්වා ගෙන යා හැකි කාලයක්
- කොටස්කරුවන් වෙත නිතිපතා ප්‍රතිපෝෂණ ලබා දීමේ හැකියාව ඇති කරන යටිතල පහසුකම්
- ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ කැප වීම.

**ඇමරිකා එක්සත් ජනපදය - කුඩා, පෞද්ගලික මට්ටමේ වැඩ සටහන්වලට වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යොදා ගැනීම**
"... මෙම වැඩ සටහන මගින් සම්පාදනය කෙරෙන සේවාවන් ඉහළින් ම පෞද්ගලික ය. අතිශය වෙනස් අවශ්‍යතාවන් සහ නිපුණතාවන් සහිත පවුල් වැඩ සටහන වෙත පැමිණෙති. ප්‍රගතියක් අත් කර ගත් පවුල් සංඛ්‍යාව ප්‍රලේඛනය කරන්නට අපි බැඳී සිටින්නෙමු. එහෙත්, එක් එක් පවුල සම්බන්ධයෙන් ගත් කල, ප්‍රගතිය පිළිබඳ අර්ථදැක්වීම එකිනෙකට වෙනස් ය. මෙය, වෙනස් වීම පිළිබඳ කවර හෝ පිළිගත් මිනුමක් යොදා ගැනීම අතිශය දුෂ්කර දෙයක් බවට පත් කරන්නකි. මෙම සියලු කාරණා නිසා, අපි වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති පිවිසුම විමසා බලන්නට පටන් ගෙන ඇත්තෙමු" *(ජූලි රෙයිනි, 2001, පවුල් සාක්ෂරතාව පිළිබඳ වැඩ සටහන).*

# වැඩි දුර තොරතුරු ලබා ගැනීමට යා යුතු තැන

මෙම මාර්ගෝපදේශකයේ ඇතුළත් වන ලිපිලේඛන නාමාවලිය පිළිබඳ කොටස තුළ, වැඩි දුර කියවීම සම්බන්ධ යොමු කිරීම් සහ ඉඟි කිරීම් මාලාවක් ඇතුළත් වේ.

නව ආකාරයේ යොදා ගැනීම් සහ වර්තමානයේ යොදා ගන්නන්ගේ අත්දැකීම් ද ඇතුළු ශිල්ප ක්‍රමය සම්බන්ධ තොරතුරු වෙත දිගින් දිගට ම ප්‍රවේශ වීම සඳහා, http://groups.yahoo.com/group/mostsignificantchanges යන වෙබ් අඩවියෙහි ඇති වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම සම්බන්ධ තැපැල් ලැයිස්තුවට සම්බන්ධ වීමට ඔබ කැමති වනු ඇත. රික් 2000 වසරේ දී ස්ථාපනය කළ මෙය දැන් සාමාජිකයන් 200කට වැඩි සංඛ්‍යාවකින් සමන්විත ය. 1993 වසරේ සිට වර්තමානය දක්වා, විවිධාකාර සංවිධාන සහ රටවල් තුළ ශිල්ප ක්‍රමය යොදා ගත් සහ යොදා ගන්නා ආකාරය පිළිබඳ තොරතුරු අඩංගු වන, ලිපිගොනු අංශයක් තැපැල් ලැයිස්තුව තුළ තිබේ.

**අතීතය ගැන ඉක්මනින් ඉගෙනීම - 'ෆෝචූන්' සඟරාව**
"හැම දාක ම ඔබ සිදු වන්නට යන දේ කලින් දැන සිටියේ නම්, ඔබට විස්මිත දේවල් කරන්නට පුළුවන්කම තිබිණ. උමතු සහගත අයුරින් පොහොසත් වීම, දේශපාලන ක්‍රියාදාමයට බලපෑම් කිරීම යනාදි දේ කරන්නට ඔබට පුළුවන්කම තිබිණ. පුදුමයට කරුණ වන්නේ, බොහෝ ජනයා තමන්ගේ ම ව්‍යාපාරය තුළ ඊයේ සිදු වූයේ මොනවා ද යන්න ගැන වත් නො දැන සිටීම යි. ඒ නිසා, බොහෝ ව්‍යාපාර වටහා ගනිමින් සිටින්නේ, හැකි තරම් ඉක්මනින් ඊයේ සිදු වූයේ මොනවා ද යන්න සොයා ගත හොත්, තරගකාරිත්වය අතින් දැවැන්ත වාසියක් අත් කර ගන්නට තමන්ට හැකියාව තිබේ ය යන්න යි" *(ස්ටීව් ජොබ්ස්, 1994:23).*

# දෙවන පරිච්ඡේදය: ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පියවර දහයක්

*මෙම පරිච්ඡේදයේ දී අපි, පහත දැක්වෙන පියවරයන් යොදා ගනිමින් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කරන්නෙමු:*

1. *පටන් ගැනීම: නායකයන් තීරණය කිරීම සහ පිවිසුමට හුරුපුරුදු වීම*
2. *'වෙනස් වීම බලපෑ ක්ෂේත්‍ර' මොනවා ද යන්න තීරණය කිරීම*
3. *වාර්තාකරණ කාල සීමාව අර්ථදැක්වීම*
4. *වෙනස් වීම් පිළිබඳ කතා පුවත් රැස් කිරීම*
5. *සංවිධානීය ධුරාවලිය ඇතුළත කතා පුවත් සමාලෝචනය කිරීම*
6. *සමාලෝචන ක්‍රියා දාමය සම්බන්ධයෙන් කොටස්කරුවන්ට නිතිපතා ප්‍රතිපෝෂණ සැපයීම*
7. *අවශ්‍ය වුව හොත් කතා පුවත්වල සත්‍යාසත්‍යතාව පරීක්ෂා කර බැලීමේ ක්‍රියා දාමයක් ආරම්භ කිරීම*
8. *ප්‍රමාණාත්මකව ප්‍රකාශයට පත් කිරීම*
9. *කතා පුවත් පිළිබඳ සාමූහික දෙවන විශ්ලේෂණයක් සිදු කිරීම*
10. *වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ ක්‍රියා දාමය සංශෝධනය කිරීම.*

තනි තනි පියවරයන් සවිස්තරාත්මකව දක්වන්නට පෙර අප, මූලික වන්නේ කුමන පියවරයන් ද අනුමැතිය ලැබී ඇත්තේ කුමන පියවරයන්ට ද යන්න සලකා බැලීම ප්‍රයෝජනවත් ය. ශිල්ප ක්‍රමයේ පියවර දහය අතර ඇති හතර, පහ සහ හය යන පියවරවලින්, ක්‍රියා දාමය කුමක් ද යන්න මූලික වශයෙන් අර්ථදැක්වෙන්නේ යැයි අපි විශ්වාස කරමු:

- අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් රැස් කිරීම (හතර වන පියවර)
- අඩු ගණනේ කොටස්කරුවන්ගේ එක් කණ්ඩායමක් වත් මෙම කතා පුවත්වලින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත තේරීම (පස් වන පියවර)
- තෝරා ගත්තේ අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කුමන කතා පුවත් ද, ඒවා තෝරා ගත්තේ ඇයි ද යන්න පිළිබඳව අදාළ කොටස්කරුවන්ට ප්‍රතිපෝෂණ සැපයීම (හය වන පියවර).

අනෙක් පියවරයන් ඇතුළත් කර ගන්නේ ද නැද්ද යන්න රඳා පවතින්නේ, සංවිධානීය තත්ත්වයන් සහ ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කරන්නේ කුමන අරමුණකින් ද යන්න මත ය.

## 1 වන පියවර: පටන් ගන්නා සහ ඕනෑකම මතු කර ගන්නා ආකාරය

ඇතැම් විට අතිශය කලකිරවනසුලු පියවර වන්නේ පටන් ගැන්ම යි. ශිල්ප ක්‍රමයේ වලංගුතාව සම්බන්ධයෙන් සමහර විට ජනයා තුළ සැක ඇති විය හැකි ය. ශිල්ප ක්‍රමය සඳහා බොහෝ කාලයක් ගත වේ යැයි ඔවුන් බිය විය හැකි ය.

තනි පුද්ගලයෙකු හෝ කුඩා කණ්ඩායමක් තුළ ශිල්ප ක්‍රමය සම්බන්ධයෙන් ඕනෑකමක් ඇති කිරීම බොහෝ විට උද්‍යෝගයක් දනවන කටයුත්තක් වෙයි. ප්‍රධාන ජනයා සහ කණ්ඩායම් සංචාරයේ යෙදී ඔවුන් හමුවේ ක්‍රමවේදය විදහා පෑම මීට ඇතුළත් කළ හැකි ය. වෙනත් වැඩ සටහන්වලින් ගත් කතා පුවත් ඉදිරිපත් කොට නිදර්ශනාත්මක වාර්තා ගෙන හැර පාන්නට

එය බොහෝ විට උදව් වේ. ගෙන යා යුතු පණිවුඩය වන්නේ, ශිල්ප ක්‍රමය සරල ක්‍රමවේදයක් ය යන්න සහ ක්‍රියාත්මක කිරීමට පහසු ය යන්න යි. බොහෝ වෘත්තිකයන්ට ශිල්ප ක්‍රමය පසුපස පවතින න්‍යාය අවබෝධ කර ගන්නට අවශ්‍ය නොවනු ඇත.

ඔබට ශිල්ප ක්‍රමය සම්බන්ධයෙන් ඕනෑකමක් දල්වා ගැනීමට වුවමනා නම්, ඔබ ශිල්ප ක්‍රමයේ අරමුණත්, ඔබේ සංවිධානය තුළ එය ඉටු කරනු ඇති කාර්ය භාරය පිළිබඳවත්, පැහැදිලිකමක් ඇති කර ගැනීම අවශ්‍ය ය (හතර වන පරිච්ඡේදය බලන්න). වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යනු, නිරීක්ෂණය සහ ඇගයීම සඳහා තනිව යොදා ගත හැකි ශිල්ප ක්‍රමයක් නොවන බව අපි අවධාරණය කරමු (හය වන පරිච්ඡේදය බලන්න).

ශිල්ප ක්‍රමය පිළිගැනීමට සහ යොදා ගැනීමට ඉඩ ඇති, එමෙන් ම න්‍යාය පිළිබඳව වැඩි දුර දැන ගැනීමට වුවමනා කරන අය වෙනුවෙන්, හත් වන පරිච්ඡේදයෙන් කරුණු පැහැදිලි කෙරේ. එහි දී, ශිල්ප ක්‍රමයට පදනම් වූ අදහස් විදහා දක්වා, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති පිවිසුම අනෙකුත් පිවිසුම්වලින් වෙනස් වන්නේ කෙසේ ද සහ ඇයි ද යන්න පෙන්නුම් කරනු ලැබේ.

## පිවිසුම පැහැදිලි කිරීමට උපමා කතා

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යොදා ගැනීම සඳහා මුල පුරන්නට යන පුද්ගලයා ඔබ නම්, එය පැහැදිලි කිරීමට උපමා කතාවක් යොදා ගැනීම උදව්වක් විය හැකි ය. අපගේ ප්‍රියතම උපමා කතා මේවා ය.

### *පුවත්පත*

(පුවත්පත්වල සමහර කොටස් තුළින් සොයා ගත හැකි මුත්) පුවත්පතක් කරන්නේ සිය පිටු සහ 'දර්ශක' පිටු තුළින් ඊයේ සිදු වූ වැදගත් සිදුවීම් සාරාංශගත කිරීමක් නො වේ. එය කරන්නේ සිත් ගන්නාසුලු සිදුවීම් පිළිබඳ පුවත් කතා සිය ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම යි. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය බලපෑම් ක්ෂේත්‍ර යොදා ගන්නා අයුරින් ම, පුවත්පත් (විදේශීය පුවත්, දේශීය පුවත්, මූල්‍ය පුවත්, ක්‍රීඩා, විවේකය යනාදි) විවිධ විෂය ක්ෂේත්‍රයන් යටතේ ව්‍යුහගත කරනු ලැබේ. වඩාත් ම වැදගත් කතා පුවත් මුල් පිටුවේ පළ වන අතර, මේවා අතරින් වඩාත් ම වැදගත් කතා පුවත සාමාන්‍යයෙන් මුල් පිටුවේ ඉහළ කොටසේ පළ වෙයි.

### *මාලු රැන*

සාමාජීය වෙනස් වීම පිළිබඳ වැඩ සටහනක් තුළ, තරමක් වෙනස් දිසාවන්ට පිහිනන බොහෝ සහභාගිකයෝ (මාලුවෝ) සිටිති. ඒ හැම කෙනෙකුට ම පෞද්ගලික වටිනාකම් පවතින මුත් අරමුණ පොදු වූවකි. තනි තනි මාලුවන්ට එකිනෙකා සමග අදහස් හුවමාරු කර ගන්නට ශිල්ප ක්‍රමය උදව් වෙයි: *'අපට ඇත්තට ම යන්න ඕන කොතැනට ද? අපි මෝරුන්ගෙන් ඉවතට පීනලා අපේ බිත්තර දාන්න සුදුසු ආරක්ෂිත ස්ථානයකට යනව ද, නැත් නම් ඉස්සෙල්ල ආහාර හොයා ගෙන යනව ද?'* සියලු මාලුන්ට ආසන්න වශයෙන් එක ම දිසාවට පිහිනා යාමට, එනම් යහපත් නොවූ දෙයින් ඉවත් වී යහපත් දේ වෙත පිහිනා යාමට සහාය වීම සඳහා, ශිල්ප ක්‍රමය අදහස් හුවමාරුව යොදා ගනියි. පොදුවේ අගය කොට සලකන ගමනාන්තයක් වෙත මසුන් රැනක් ලෙස පිහිනා යාමට එය ඔවුන්ට සහාය වෙයි.

සංවිධානය පිළිබඳ තවත් උපමා කතාවක් නම්, තමන්ට යාමට වුවමනා කරන දිසාවන්ට දිගැදෙන, තමන් අකමැති ප්‍රදේශවලින් ඉවත් වන, තමන් අවට පරිසරයෙන් ලැබෙන සංඥාවන් පදනම් කොට ගෙන මෙම සියල්ල සිදු කරන, **ඇමීබාවෙකු** ලෙස සංවිධානය සැලකීම යි.

### *නිවාඩුවක මතක සටහන්*

විදේශයක ගත කළ නිවාඩුවකින් ඔබගේ මතකයෙහි රැඳී පවතින්නේ මොනවා ද? ඔබට මතක තිබෙන්නේ සාමාන්‍ය දේවල් ද, නැත් නම් අසිරිමත් වූත් භයානක වූත් දේවල් ද? අමතක නොවන සිදුවීම් පිළිබඳව අවධානය යොමු කිරීමට ජන කණ්ඩායම්වලට සහාය වන ශිල්ප ක්‍රමය, අසිරිමත් දේවල් වැඩිපුරත් භයානක දේවල් අඩුවෙනුත් මුදුන් පමුණුවා ගැනීම

සඳහා ඒවා යළි පෙළ ගස්වා ගැනීමට දරන උත්සාහයට සහාය වන්නට, මෙම සිදුවීම් යොදා ගනියි. අවධානය ඉගෙනීම වෙත යොමු වන විට, අප සාමාන්‍ය අත්දැකීම්වලට වඩා වැඩි යමක් හසු කර ගැනීම අවශ්‍ය වෙයි.

### *අවන්හල් මෙනු පත*

ශිල්ප ක්‍රමය, සිදු වෙමින් පවතින්නේ කුමක් ද යන්න පිළිබඳව එක් විස්තර කිරීමක් පමණක් ඉදිරිපත් කරනවා නො වේ. එය වැඩ සටහනක් මුද්‍රිත පමුණුවා ගනිමින් සිටින්නේ කුමක් ද යන්න ගැන, ක්ෂණික බැලුම් හෙළීම් මාලාවක් ම ඉදිරිපත් කරයි. අවන්හල් මෙනු පතකින් ආහාර තෝරා ගන්නා ආකාරයට බෙහෙවින් ම සමාන වූ ආකාරයකින්, මෙම ක්ෂණික බැලුම් හෙළීම් අතරින් තෝරා ගැනීමක් කරන්නට කොටස්කරුවන්ට හැකියාව තිබේ. තෝරා ගැනීම් පෞද්ගලික කැමැත්ත මත පදනම් වෙයි. තෝරා ගැනීමට උත්සාහ කොට, අනතුරුව ඔබේ තෝරා ගැනීම සඳහා බලපෑ හේතු ප්‍රකාශයට පත් කරන ලෙස, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති අවන්හලේ දී ඔබෙන් ඉල්ලා සිටිනු ලැබේ. අවන්හල සතුව සිටින්නේ ඉතා ඉක්මනින් ප්‍රතිචාර දක්වන නායක අරක්කැමියෙකි. එනිසා, ඔබේ මේසය කරන තෝරා ගැනීම්, මීළඟ ගනුදෙනුකරුවන් කණ්ඩායමට සංශෝධිත මෙනු පතක් ඉදිරිපත් කරන්නට ඔහු පොළඹවනු ඇත.

## පිවිසුමට හුරුපුරුදු වීම

අප අත්දැකීමෙන් ඉගෙන ගෙන ඇති සැබවින් ම වැදගත් වන තවත් පාඩමක් වන්නේ, කුඩාවට පටන් ගත යුතු ය යන්න යි. පළමුව කුඩා පරිමාණයකින් නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කොට අත්හදා බැලීමෙන් තොරව, දැවැන්ත වූත් සංකීර්ණ වූත් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීමේ පද්ධතියක් ක්‍රියාත්මක කරන්නට යාම අවදානම් සහගත ව්‍යායාමයකි. එක් එක් සංවිධානීය තත්ත්වයන් එකිනෙකට වෙනස් වන නිසා, ඔබේ විශේෂිත සංවිධානයට ගැළපෙන අයුරින් ශිල්ප ක්‍රමය හැඩ ගස්වා ගන්නට සිදු වනු ඇත. එය, ප්‍රතිඵලයක් ලැබෙන්නේ කුමකින් ද නොලැබෙන්නේ කුමකින් ද යන්න සොයා බැලීම සඳහා, නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව ඇති කරයි.

ශිල්ප ක්‍රමය නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන විට, ඔබේ සංවිධානය තුළ සිටින, එහි හැකියාව පිළිබඳව වඩාත් ම සැලකිල්ලක් සහ උද්‍යෝගයක් දක්වන ජනයාගෙන් සහ අංශවලින් පටන් ගන්නට උත්සාහ කරන්න.

## නායකයන්ගේ කාර්ය භාරය

නියමු ව්‍යාපෘතිය සම්පූර්ණ කළ පසුව, ප්‍රමාණවත් ඕනෑකමක් දැල්වී පවතින විට, ඔබේ සංවිධානයට ශිල්ප ක්‍රමය හොඳින් ම සුදුසු වන්නේ කොතැන දී ද යන්න ගැන සොයා බලන්නට පටන් ගන්න. මෙම මුල් අදියරවල දී පවා, ශිල්ප ක්‍රමය මගින් උනන්දු කෙරෙන, ශිල්ප ක්‍රමයට නායකත්වය දිය හැකි, ක්‍රියා දාමය තුළ දී පොළඹවන්නන් ලෙස ක්‍රියා කරන ප්‍රධාන ජනයා කවුරුන් ද යන්න හඳුනා ගැනීම ප්‍රයෝජනවත් ය. සංවිධානය පුරා ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කරන ආකාරය සැලසුම් කිරීමේ දී මෙම ජනයා සම්බන්ධ කර ගත හැකි ය. නො වැළැක්විය හැකි ලෙස මතු වන ප්‍රශ්නවලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ඇති කර ගැනීම සඳහා, ඔවුන්ට ශිල්ප ක්‍රමය පිළිබඳව දැවැන්ත අවබෝධයක් අවශ්‍ය වනු ඇත.

මෙම නායකයන්ට පහත දැක්වෙන දෑ කළ හැකි ය:

- ජනයා උනන්දු කිරීම සහ පෙළඹවීම
- ශිල්ප ක්‍රමය ගැන අසන ප්‍රශ්නවලට පිළිතුරු දීම
- අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීම සඳහා පහසුකම් සැපයීම
- අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් රැස් කිරීම සඳහා ජනයා දිරිමත් කිරීම
- ප්‍රතිපෝෂණය සිදු වන බව සහතික කිරීම

- කතා පුවත් රැස් කොට, සංවිධානය කොට, සමාලෝචන රැස්වීම්වලට යැවෙන බව සහතික කිරීම

- අවශ්‍ය තැන්වල දී රහස්‍ය භාවය සහතික කරන විධිමත් ප්‍රකාශ නිකුත් කිරීම.

> **ශාන්තිකර දූපත් - ආධාර දෙන්නන්ගේ පිළිගැනීම දිනා ගැනීම**
> "නිරීක්ෂණ සහ ඇගයීම් පද්ධතිය සූදානම් කිරීමේ දී, අයිඩීඑස්එස් සංවිධානය, ආධාර දෙන්නන්ගේ අවශ්‍යතාවන් සැපිරීමේ යහපත් ප්‍රතිපත්තිය අනුගමනය කළේ ය. අනුමැතිය ලැබීමත් සමග, ඕස්ඒඩ් සංවිධානය වෙනුවෙන් සැපිරිය යුතු වූ අවශ්‍යතාවන්ගෙන් ඔබ්බට ගිය අතිරේක අංගයක් ලෙස, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති පිවිසුම යෝජනා කෙරිණ ... තාර්කික සැකැස්ම (logframe) පදනම් කර ගන්නා සම්මත පිවිසුමට ආදේශකයක් වශයෙන් ශිල්ප ක්‍රමය යෝජනා කොට තිබුණේ නම්, එවන් සහායක් නොලැබෙනු ඇතැයි අයිඩීඑස්එස් සංවිධානය කල්පනා කරයි. වසරක් තිස්සේ ක්‍රියාත්මක කිරීමෙන් පසුව, ඕස්ඒඩ් සංවිධානය ද අයිඩීඑස්එස් සංවිධානයේ හැකියාව මැන බැලිය හැකි තත්ත්වයකට පත්ව තිබුණි. අයිඩීඑස්එස් සංවිධානයේ පිවිසුමට අනුකූලව වැඩ සටහන ක්‍රියාත්මක කරන්නට එය අදහස් කළේ ය" *(කැරන් වින්ටර්ෆෝඩ්, 2003, අයිඩීඑස්එස්).*

# 2 වන පියවර: වෙනස් වීම බලපෑ ක්ෂේත්‍ර අර්ථදැක්වීම

## වෙනස් වීම බලපෑ ක්ෂේත්‍ර යනු මොනවා ද?

බලපෑම් ක්ෂේත්‍ර යනු, යොදා ගත හැකි අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වලට සම්බන්ධ, පුළුල් වූත් බොහෝ විට එතරම් පැහැදිලි නොවූත් ප්‍රභේදයකි. සීසීඩීබීයේ දී, බලපෑම් ක්ෂේත්‍ර හතරකට අදාළ අර්ථාන්විත වෙනස් වීම් සොයා බලන ලෙස ශිල්ප ක්‍රමයේ සහභාගිකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබුණි:

- ජනයාගේ ජීවිතවල ගුණාත්මක භාවයට සම්බන්ධිතව සිදු වන වෙනස් වීම්

- සංවර්ධන ක්‍රියාකාරකම් තුළ දී ජනයාගේ සහභාගිත්වයේ ස්වභාවය තුළ සිදු වන වෙනස් වීම්

- ජනයාගේ සංවිධානවල සහ ක්‍රියාකාරකම්වල ස්ථාවර භාවයට සම්බන්ධිතව ඇති වන වෙනස් වීම්

- වෙනත් මොන යම් හෝ වෙනස් වීම්

වෙනස් වීම බලපෑ ක්ෂේත්‍රයක් යනු දර්ශකයක් නො වේ. යහපත් දර්ශක SMART (ප්‍රඥා සම්පන්න, එනම්, සුවිශේෂ [specific], මිනිය හැකි [measurable], මුදුන් පමුණුවා ගත හැකි [achievable], අදාළ [relevant] සහ නියමිත කාල සීමාවකට අයත් [time-bound]) විය යුතු යැයි කියනු ලැබේ. සැම දෙනා ම එක ම ආකාරයට අර්ථදක්වන තත්ත්වයක් ඇති වනු පිණිස, දර්ශක නිර්වචනය කිරීම අවශ්‍ය ය. අනෙක් අතට, අදාළ බලපෑම් ක්ෂේත්‍රය තුළ වෙනස් වීමක් සිදු වන්නේ කුමක් මගින් ද යන්න ගැන විවිධ අර්ථදැක්වීම් ඇති කර ගන්නට මහජනයාට ඉඩකඩ ලැබෙන පරිදි, වෙනස් වීම බලපෑ ක්ෂේත්‍ර සිතාමතා නොපැහැදිලිව තබනු ලැබේ.

## බලපෑම් ක්ෂේත්‍ර යොදා ගත යුතු ආකාරය

වෙනස් වීම බලපෑ ක්ෂේත්‍ර යොදා ගැනීම තුළ ක්ෂණික ප්‍රායෝගික වටිනාකමක් ගැබ් වෙයි. හඳුනාගැනීමට පහසු වන, එක එකක් අනුපිළිවෙළින් විශ්ලේෂණය කළ හැකි වන ආකාරයේ පංගුවලට, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් විශාල සංඛ්‍යාවක් කාණ්ඩගත කරන්නට එය සංවිධානවලට සහාය වෙයි. කල් තබා බලපෑම් ක්ෂේත්‍ර තීරණය කර ගැනීමේ වාසිය වන්නේ, එතරම් අණ පැනවීමක් නො කොට, තමන් සෝදිසි කර බැලිය

යුතු වෙනස් වීම් ස්වරූපය සම්බන්ධයෙන් කතා පුවත් රැස් කරන ජනයාට යම් මග පෙන්වීමක් සම්පාදනය කරන්නට, ඊට හැකියාව පැවතීම යි.

කල් තබා තීරණය කර ගන්නා ලද බලපෑම් ක්ෂේත්‍ර භාවිතයට ගත යුතු වීම කෙරෙහි බලපාන දෙවන හේතුවක් වනුයේ, තමන් ප්‍රකාශයට පත් කළ අරමුණු කරා පෙරට යමින් සිටින්නේ ද, නැද්ද යන්න වාර්තා කර ගැනීමෙහි ලා සහායක් වශයෙන් ශිල්ප ක්‍රමය යොදා ගන්නට, බොහෝ සංවිධානවලට වුවමනා කිරීම යි. නිදසුනක් ලෙස, (ජීවිතයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම මගින්) තමන්ගේ ප්‍රජාවන් තුළ සිදු කරන සංවර්ධන ක්‍රියාකාරකම්වලට ක්‍රියාකාරීව සහභාගි විය හැකි වන පරිදි, බංග්ලාදේශයේ වෙසෙන දිළිඳු ප්‍රජාවන්ගේ දිළිඳු භාවය අඩු කරන්නටත්, එම ක්‍රියාකාරකම් සහ ඒවාට සහාය දෙන සංවිධාන ස්ථාවර භාවයට පත් කරන්නටත් සීසීඩීබීයට වුවමනා කළේ ය. එහෙත්, සීසීඩීබීය විශ්වාස කළේ, සෑම දේශීය ප්‍රජාවක් ම තනි තනිව මෙම අරමුණු වඩා සවිස්තරාත්මකව අර්ථදැක්විය යුතු බව යි. ඒ නිසා, ඇතැම් විට සියලු ප්‍රජාවන් සම්බන්ධයෙන් පොදුවේ යොදා ගත නොහැකි විය හැකි, වෙනස් වීම් පිළිබඳ ඉතා සුවිශේෂ දර්ශක යොදා ගනිමින් මෙම වර්ධනයන් නිරීක්ෂණය කරන්නට ඔවුන්ට වුවමනා නො වී ය. එනිසා ඔවුහු, ජනයාගේ ජීවිතවල ගුණාත්මක භාවයට, ජනයාගේ සහභාගිත්වයේ ස්වභාවයට, සහ ජනයාගේ සංවිධානවල සහ ක්‍රියාකාරකම්වල ස්ථාවර භාවයට සම්බන්ධිත, වෙනස් වීම් පිළිබඳ පොදු ප්‍රභේදයන් (බලපෑම් ක්ෂේත්‍ර) තුනක් යොදා ගත්හ.

## 'විවෘත නිරීක්ෂණය' නමැති බලපෑම් ක්ෂේත්‍රය

සමහර තැන්වල දී, විවිධ ස්වරූපවලට අයත් වෙනස් වීම් වාර්තා කර ගන්නට සංවිධාන බලපෑම් ක්ෂේත්‍ර යොදා ගනී. එවැනි තැන්වල දී, 'වෙනත් මොන යම් හෝ ස්වරූපයක වෙනස් වීමක්' නමැති බලපෑම් ක්ෂේත්‍රය ප්‍රයෝජනවත් විවෘත ප්‍රභේදයක් වේ. නම් කරන ලද බලපෑම් ක්ෂේත්‍රවලට නොගැළපෙන අර්ථාන්විත වෙනස් වීම් වාර්තා කර ගන්නට, එය සහභාගිකයන්ට ඉඩ සලසා දෙයි. මෙය, තමන් ජීවත් වන තත්ත්වයට අදාළ යැයි තමන් සිතන දේවල් ගැන අවධානය යොමු කරන්නට, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් රැස් කරන්නන්ට වැඩි නිදහසක් ලබා දෙයි.

## සෘණාත්මක වෙනස් වීම්

සෘණාත්මක අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳව නිශ්චිත අවධානයක් යොමු කරන බලපෑම් ක්ෂේත්‍රයක් නියම කර ගත යුතු ද නැද්ද යන්න, ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කරන සංවිධාන හමුවේ පවතින එක් තෝරා ගැනීමකි. අපගේ අත්දැකීමෙන් හැඟෙන්නේ, බලපෑම් ක්ෂේත්‍ර ස්වරූප තුළට වැටෙන අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වලින් සියයට 90ත් 95ත් අතර ප්‍රමාණයක් නැඹුරු වන්නේ, ධනාත්මක වෙනස් වීම් වෙත බව යි. කෙසේ වුව ද, ධනාත්මක වෙනස් වීම් සේ ම සෘණාත්මක වෙනස් වීම් ද වාර්තා කළ යුතු යැයි, වැඩ සටහන හසුරුවන්නන් කොතරම් පැහැදිලිව සංඥා කරන්නේ ද යන්න මත මෙම සංඛ්‍යාව විවිධ වේ. එමෙන් ම, සෘණාත්මක වෙනස් වීම් වාර්තා කළ පසු, ඒවා ඒත්තු ගෙන, ඒවාට කොතරම් දුරට ධනාත්මකව ප්‍රතිචාර දක්වන්නේ ද යන්න මත ද එය රඳා පවතී.

සමහර සංවිධාන, සෘණාත්මක කතා පුවත් සඳහා ම සුවිශේෂ වූ බලපෑම් ක්ෂේත්‍රයක් සකසා ගෙන තිබේ. ඒ අනුව, සෘණාත්මක කතා පුවත් සොයා යාමේ පැහැදිලි අවශ්‍යතාවක් නිර්මාණය වේ. ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියාහි සිදු කළ, කිරි පට්ටි කර්මාන්තය පුළුල් කිරීමේ දැවැන්ත වැඩ සටහනක් වූ ටාගට් 10 සම්බන්ධ උදාහරණයේ දී, මෙම අතිරේක බලපෑම් ක්ෂේත්‍රය හඳුන්වන ලද්දේ 'පාඩම් ඉගෙනීම' යන නමිනි. මෙය සෘණාත්මක වෙනස් වීම් පැවතීම සම්බන්ධයෙන් ධනාත්මක හැරීමක් ඇති කළ අතර, එවන් සිදුවීම්වලින් වටිනාකමක් උකහා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කළේ ය. 'වැඩි දියුණු කළ යුතු (සෘණාත්මක) ක්ෂේත්‍රයක් පිළිබිඹු කරන වෙනස් වීම්' යන නමින් හඳුන්වන ලද අතිරේක බලපෑම් ක්ෂේත්‍රයක් යොදා ගනිමින්, ලාඕසයේ ඒඩීආර්ඒ සංවිධානය මීට සමාන පිවිසුමක් ගත්තේ ය.

## බලපෑම් ක්ෂේත්‍රවල ස්වරූප

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යොදා ගන්නා බොහෝ සංවිධාන, තනි පුද්ගලයන්ගේ ජීවිතවල සිදු වන වෙනස් වීම් පිළිබඳව අවධානය යොමු කොට තිබේ.

සමහර උදාහරණවල දී මෙය මෙසේ සිදු වූයේ, වැඩ සටහනේ ප්‍රධාන අරමුණු යොමු වී තිබුණේ තනි පුද්ගලයන් වෙත බැවිනි. තවත් හේතුවක් නම්, ජනයාගේ ජීවිතවලට අවධානය යොමු කිරීමෙන්, ක්‍රියාකාරකම් සහ ප්‍රතිඵල පිළිබඳව අවධානය යොමු කරන, ප්‍රමාණාත්මක සහ දර්ශක මත පදනම් වූ නිරීක්ෂණ පද්ධති යොදා ගැනීම පිළිබඳ ගැටලුව විසඳා ගත හැකි වීම යි.

කෙසේ වුව ද, සීසීඩීබීය ද ඇතුළු ශිල්ප ක්‍රමය යොදා ගන්නා සමහර සංවිධාන, එක් විශ්ලේෂණ ඒකකයකට වැඩි ගණනක් කෙරෙහි අවධානය යොමු කරන, එනම් තනි තනි පුද්ගලයන්ට වැඩි සංඛ්‍යාවක් කෙරෙහි අවධානය යොමු කරන, බලපෑම් ක්ෂේත්‍ර යොදා ගෙන තිබේ. සීසීඩීබීය, මහජන **ආයතනවල** ස්ථාවර භාවය සම්බන්ධයෙන් ඇති වන අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳව විමසා බැලූ අතර, ඩෙන්මාර්කයේ එම්එස් සංවිධානය, **සංවිධානීය** ක්‍රියාකාරිත්වය පිළිබඳව විමසා බැලී ය. ඕස්ට්‍රේලියාවේ ලෑන්ඩ්කෙයාර් සහායක වැඩ සටහන (Landcare support program) වැනි අනෙකුත් සංවිධාන, සමස්ත **ප්‍රජාවන්** හෝ **ප්‍රතිපත්ති** සම්බන්ධයෙන් ඇති වන වෙනස් වීම් පිළිබඳව අවධානය යොමු කරන බලපෑම් ක්ෂේත්‍ර ඇතුළත් කොට ගෙන තිබේ. ඔක්ස්ෆෑම් නිව් සීලන්ඩ් සංවිධානය, **හවුල්කාරිත්වයන්** සම්බන්ධයෙන් ඇති වන වෙනස් වීම් විමසා බැලී ය. මින් බොහොමයක් මහජනයා කේන්ද්‍ර කොට ගත් බලපෑම් ක්ෂේත්‍ර වෙයි. ඒවා, වියුක්ත ක්‍රියා දාමයන් පිළිබඳව අවධානය යොමු කරන බලපෑම් ක්ෂේත්‍රවලට වඩා වැඩියෙන් සහභාගිකයන් විසින් අවබෝධ කර ගන්නට ඉඩ තිබේ යැයි අපි විශ්වාස කරමු.

> **මොසැම්බික් රාජ්‍යය- මනෝභාවයන්ට සම්බන්ධිත බලපෑම් ක්ෂේත්‍ර යොදා ගැනීමේ දී මුහුණ දුන් දුෂ්කරතාව**
> "සමහර බලපෑම් ක්ෂේත්‍ර අනෙක්වාට වඩා පහසුවෙන් ග්‍රහණය කර ගනු ලැබේ ... නිදසුනක් ලෙස, 'අන්තර් සංස්කෘතික සහයෝගිතාව' නමැති බලපෑම් ක්ෂේත්‍රය පහදා දීම දුෂ්කර විය. මොසැම්බික්හි දී, බොහෝ විට එය කිසි ම හුරුපුරුදු බවක් පළ නොකළේ ය. එම්එස් සංවිධානය, ඩෙන්මාර්ක වැසියන් හවුල්කරුවා සමග එකට තබමින් කාර්ය මාණ්ඩලික වැඩ සටහනක් ක්‍රියාත්මක කරන නිසා, මෙය තරමක මවිතයට කරුණක් විය. ප්‍රකාශයට පත් කොට ඇති එක් අරමුණක් වන්නේ, දේශ සීමා හරහා සහයෝගිතාව ඇති වීම උනන්දු කිරීම යි ..." *(පීටර් සිස්ගාර්ඩ්, 2002:10).*

## බලපෑම් ක්ෂේත්‍ර කොපමණ සංඛ්‍යාවක් යොදා ගත යුතු ද?

අපගේ අත්දැකීම අනුව, බලපෑම් ක්ෂේත්‍ර තුනත් පහත් අතර සංඛ්‍යාවක් යනු හසුරුවා ගැනීමට පහසු සංඛ්‍යාවකි. බලපෑම් ක්ෂේත්‍ර සංඛ්‍යාව සීමා කරන සාධකය වන්නේ, එක් එක් බලපෑම් ක්ෂේත්‍රය සාකච්ඡාවට ලක් කිරීම සම්බන්ධයෙන් කොපමණ කාලයක් වැය කරන්නට සහභාගිකයන් කැමති වන්නේ ද යන්න යි. කුමන හෝ එක් රැස්වීමක් තුළ දී, සියලු බලපෑම් ක්ෂේත්‍ර තුළ ඇති වූ වෙනස් වීම් සමාලෝචනයට ලක් කිරීම සඳහා පැය දෙකකට වඩා වැඩි කාලයක් ගත වුව හොත්, ක්‍රියා දාමය කාලය කා දමන්නක් යැයි සහභාගිකයන්ට හැඟෙන්නට ඉඩ තිබේ.

## බලපෑම් ක්ෂේත්‍ර අත්‍යවශ්‍ය ම ද?

බලපෑම් ක්ෂේත්‍ර අත්‍යවශ්‍ය ම නො වේ. මුලින් බලපෑම් ක්ෂේත්‍රවලට වර්ග කිරීමකින් තොරව, සමූහයක් ලෙස අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් රැස් කරන්නටත් විශ්ලේෂණය කරන්නටත් හැකියාව තිබේ (ඉදිරියේ එන පස් වන පියවර බලන්න). උත්සුක වන බලපෑම් ක්ෂේත්‍ර පදනම් කර ගනිමින් මග පෙන්වීමක් ලබා නො දී, පිටතට ගොස් අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳව සොයා බලන ලෙස සහභාගිකයන්ගෙන් ඉල්ලා සිටිය හැකි ය. වඩා කුඩා සංවිධානවල දී, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් ස්වල්පයක් විභාග කරන්නට ඉඩ තිබේ. එවැනි සංවිධානවල දී, බලපෑම් ක්ෂේත්‍රවලින් තොරව වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති පිවිසුම යොදා ගැනීම වැඩි පහසුවක් විය හැකි ය.

වීඑස්ඕ වැනි සංවිධානවල දී, ඕනෑ ම ස්වරූපයකට අයත් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් හඳුනා ගෙන ප්‍රලේඛනය කරන ලෙස, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයෙන් ඉල්ලා සිටිනු ලැබේ. රට තුළ පවතින කාර්යාලයේත් එක්සත් රාජධානියේ පවතින වීඑස්ඕ

මූලස්ථානයේත් උත්සුකතාවන් මත පදනම්ව කතා පුවත් බලපෑම් ක්ෂේත්‍රවලට වර්ග කරනු ලබන්නේ, කතා පුවත් රට තුළ පවතින කාර්යාලීය මට්ටමට ළඟා වූ විට පමණකි.

බලපෑම් ක්ෂේත්‍ර තුළට කතා පුවත් වර්ග කරන්නට සංවිධානයක් තුළ සිටින මධ්‍යම සහ ඉහළ මට්ටමේ කාර්ය මණ්ඩලයට ඉඩ ලබා දීමෙන්, සමහර අමතර ප්‍රතිලාභ ඇති වේ. බලපෑම් ක්ෂේත්‍ර කේන්ද්‍රගත කොට තිබෙන්නේ සංවිධානීය අරමුණු වෙත නම්, තේරීම සම්බන්ධයෙන් ගන්නා තීරණ මගින්, එම කාර්ය මණ්ඩලය එම අරමුණුවල අදහස අර්ථදක්වන ආකාරය සංවිධානයේ අවශේෂ කාර්ය මණ්ඩලයට කියැවේ.

**ගුජරාටය - වර්ග කිරීම විවාදය කැටුව එයි**
"මෙම රැස්වීම්වල දී, සටහන් කර ගන්නා ලද වෙනස් වීම් ශීර්ෂ පාඨ තුනක් යටතේ වර්ග කොට, මූලස්ථාන මට්ටම වෙත යවනු ලැබිණ. සමස්ත ව්‍යායාමය තුළ දී ම කාර්ය මාණ්ඩලිකයන් සමූහය දැවැන්ත උද්‍යෝගයෙන් යුතුව සහභාගි වූ අතර, වෙනස් වීම් වර්ග කිරීම සම්බන්ධයෙන් විවාද ඇති විය" *(බැරී අන්ඩර්වුඩ්, 1996, ඒකේආර්එස්පී).*

ක්ෂේත්‍ර මට්ටමේ දී, විශේෂයෙන් ම, වැඩ සටහනේ සහභාගිකයන් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවත් හඳුනා ගැනීමට සහ තේරා ගැනීමට සම්බන්ධ කෙරෙන තැන දී, බලපෑම් ක්ෂේත්‍ර සුවිශේෂ වශයෙන් සඳහන් කිරීමකින් තොරව පටන් ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය. ඒ වෙනුවට, ප්‍රතිලාභීන් විසින් මතු කර ගන්නේ සහ අගය කරන්නේ කවර වර්ගයකට අයත් කතා පුවත් ද යන්න තේරුම් ගෙන, අනතුරුව ඒවා සුදුසු බලපෑම් ක්ෂේත්‍රවලට බෙදන්න. නැත් නම් ප්‍රතිලාභීන් ලවා එසේ කරවන්න. ශිල්ප ක්‍රමය යොදා ගන්නා සංවිධානයට, තමන්ගේ ම අරමුණු මගින් වෙනුවට සහභාගිකයන් විසින් එය මෙහෙයවනු ලැබීම වුවමනා කරන්නේ කොයි තරම් දුරකට ද යන්න මත, ක්‍රියා දාමය මෙසේ ඉදිරියට ගෙන යන්නේ ද නැද්ද යන්න පිළිබඳ තීරණය රඳා පවතී.

**දකුණු ඕස්ට්‍රේලියාව - කල් තබා සකස් කර ගත් බලපෑම් ක්ෂේත්‍ර නියම නොකිරීමට තීරණය කිරීම**
"වගකීම් සහගත භාවය පිළිබඳ අරමුණු සපුරා ලීම උදෙසා යම් විශේෂ ආකාරවල සාක්ෂ්‍ය සපයා ගන්නට, ව්‍යාපෘතියට අවශ්‍යතාවක් තිබේ. ක්‍රියා දාමය අර්ථදක්වන්නට අප ගත් උත්සාහයන් තුළ දී, අප අත්දැක තිබුණු එක් මුල් කාලීන විවාදයක් වූයේ, මෙම අවශ්‍යතාවන්ට සරි ලන වෙනස් වීම බලපෑ ක්ෂේත්‍ර නියම කළ යුතු ද නැද්ද යන්න යි (බංග්ලාදේශයේ දී, ඩේවිස්ගේ වැඩ කටයුතු තුළ එවැනි බලපෑම් ක්ෂේත්‍ර පැවතිණ). ක්‍රියා දාමය තුළ නිසගයෙන් ම ඉගෙනීමේ ක්‍රියා දාමයක් ගැබ්ව තිබේ. ඊට ප්‍රමුඛතාව ලබා දෙන්නට අපට වුවමනා විය. එනිසා, ව්‍යාපෘතියට සම්බන්ධ වීම තුළින් අර්ථාන්විත වෙනස් වීම පිළිබඳව තමන් ලබා ගත් අත්දැකීම් මත පදනම් වී, 'ඉගෙනුම් කව' තුනෙන් සෑම එකක දී ම සහභාගිකයන් මෙම බලපෑම් ක්ෂේත්‍ර වෙත ළඟා වන්නේ නම්, සහභාගිකයන් ඒවා වඩා අරුත්බර බව තේරුම් ගනු ඇතැයි අපි තීරණය කළෙමු" *(රොසී ලෙ කෝර්නු සහ තවත් අය, 2003).*

## බලපෑම් ක්ෂේත්‍රවල අවධානය යොමු විය යුත්තේ කුමකට ද?

වෙනස් වීම බලපෑ ක්ෂේත්‍ර පැවතිය යුත්තේ, ශිල්ප ක්‍රමය යොදා ගන්නා සංවිධානය විසින් ඇති කෙරෙන වෙනස් වීම් සම්බන්ධයෙන් පමණක් ද? එසේ නැත් නම්, ඊට අනෙකුත් මිනිසුන්, සංවිධාන විසින් හෝ පොදුවේ ඇති වන බලපෑම් මගින් ඇති කෙරෙන වෙනස් වීම් ද ඇතුළත් කළ යුතු ද? මෙය බොහෝ විට මතු වන එක් ප්‍රශ්නයකි. නිදසුනක් ලෙස, තනි පුද්ගලයන්ගේ සහභාගිත්වය වැඩි වීමෙන්, නිදහසේ සමාගමයේ යෙදීමට ඇති අයිතියට අදාළ ආණ්ඩුවේ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වෙනසක් ඇති විය හැකි ය. සංවිධානයේ ම ක්‍රියාකාරකම්වලට සම්බන්ධිතව කිසිදු වෙනසක් ඇති නො විය හැකි ය. එසේ වුවත්, බොහෝ සමාජයන් තුළ දී, කලින් කී ආකාරයේ වෙනස් වීම අර්ථාන්විත යැයි සැලකෙනු ඇත.

භාවිතයේ දී, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යොදා ගන්නා බොහෝ අය අවධානය යොමු කොට ඇත්තේ, ඔවුන්ගේ සංවිධාන කරමින් සිටින දෙයෙහි ඍජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන වෙනස් වීම් කෙරෙහි ය. කෙසේ වුව ද, බොහෝ සංවිධාන දැනටත් ලෝකය තේරුම් ගන්නේ ඉතා පටු අයුරින් ය කියාත්, අර්ථාන්විත වෙනස් වීම් කුමන හේතුවක් නිසා පැන නැගුණ ද ඒවා හඳුනා ගැනීම හිතකර වේ ය කියාත් කියන තර්කයකුත් තිබේ.

මෙම විකල්පයන් එකිනෙක ගැටී, එකකින් අනෙක බැහැර වන තත්ත්වයක් ඇති වීම අවශ්‍ය නො වේ. ශිල්ප ක්‍රමයේ එක් යොදා ගැනීමක් තුළින්, වෙනස් වීම් ස්වරූප දෙක ම හඹා යන්නට හැකි විය යුතු ය. බලපෑම් ක්ෂේත්‍ර එකක් හෝ වැඩි ගණනක්, සංවිධානයේ වැඩ කටයුතු මගින් ඇති වූ වෙනස් වීම්වලට අදාළ විය හැකි ය. ඒ අතරවාරයේ, සංවිධානය විසින් ඇති නොකරන ලද හෝ බලපෑමක් නොකරන ලද වෙනස් වීම් පිළිබඳව, වෙනත් බලපෑම් ක්ෂේත්‍රයක් යොදා ගෙන සුවිශේෂ වශයෙන් විමසා බැලිය හැකි ය.

එසේ කිරීම, 'ව්‍යාපෘතිය පිටතට යාමේ' සහ 'සන්දර්භය ඇතුළට ගැනීමේ' ඉදිරි දැක්මක් ලෙස ක්‍රිස් රොකේ (1999) විස්තර කර ඇති දේ සම්පාදනය කර ගන්නට උදව් වනු ඇත.

**ඔීසීජ්ජ් සංවිධානය- බලපෑම් තක්සේරුවලින් පාඩම්**
"මෙම සුවිශේෂ සොයා ගැනීම්වලට සම්බන්ධිතව පැවති දේ වූයේ, අතිශය සාර්ථක ප්‍රජා සංවර්ධන වැඩ සටහන් පවා, තමන් ස්ථානගත වී සිටින තත්ත්වය පිළිබඳව දැනුවත් විය යුතු ය යන පුළුල් නිරීක්ෂණය යි ... නිදසුනක් ලෙස, බල ගැන්වීම සම්බන්ධයෙන් දැවැන්ත සාර්ථකත්වයක් අත් කර ගෙන සිටි කසල එකතු කිරීමේ යෙදෙන ස්ත්‍රීහු කණ්ඩායමක් මුහුණ දුන් තත්ත්වය ගත හැකි ය. මෙම බල ගැන්වීම, ඔවුන්ගේ සේවා සහ ජීවන තත්ත්වයන්ට සම්බන්ධිත අර්ථාන්විත වෙනස් වීම් ඇති වීමට හේතු වී තිබුණි. එසේ වුව ද, තමන්ගේ නගරය තුළ කසල කළමනාකරණය පෞද්ගලීකරණය කිරීමට කළ යෝජනාවක් මගින්, තමන්ගේ ජීවනෝපායන් තර්ජනයට ලක් වන තත්ත්වයකට ඔවුහු මුහුණ දෙමින් සිටියහ. නාගරික කසල කළමනාකරණ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඇති වූ මෙම වෙනස මගින්, බල ගැන්වීම සම්බන්ධයෙන් අත් කර ගෙන තිබූ බලගතු ප්‍රතිඵලවලට වළ කැපෙන්නට ඉඩ තිබුණි. මෙම ස්ත්‍රීන්ගේ අයිතීන් ආමන්ත්‍රණය කරන්නට, කසළ කළමනාකරණය පිළිබඳව පුළුල් අභිදේශන ව්‍යාපාරයක් අවශ්‍ය විය හැකි ය" *(ලින්ඩා කෙලී, පැට්රික් කිල්බි, නාලිනී කාසිනාදන්, 2004).*

## බලපෑම් ක්ෂේත්‍ර තීරණය කිරීමට සම්බන්ධ විය යුත්තේ කවුරුන් ද?

සමහර සංවිධාන තුළ දී, සුවිශේෂ අරමුණු ලුහුබැඳ යාමට පවතින බැඳීම් නිසා, වැඩ සටහනේ අරමුණු මත පදනම්ව ගොඩ නගා ගත් බලපෑම් ක්ෂේත්‍ර යොදා ගන්නට මග පෑදිය හැකි ය. ඒවා දැනට මත් ප්‍රචලිත වී, කාර්ය මණ්ඩලය සහ සේවාලාභීන් ඒවාට නතු වී සිටිනවා විය හැකි ය. බලපෑම් ක්ෂේත්‍ර තෝරා ගැනීමට වැඩි නිදහසක් ඇති තැන්වල දී, සුදුසු බලපෑම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා සහභාගී ක්‍රියා දාමයක් යොදා ගන්නට පිළිවන. එය, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමය සහ එහි ප්‍රතිඵල සම්බන්ධයෙන් වඩා උද්‍යෝගී ඕනෑකමක් ඇති කර ගන්නට සියලු සහභාගිකයන් දිරිමත් කරන්නක් බවට පත් විය හැකි ය.

## බලපෑම් ක්ෂේත්‍ර වර්ධනය කිරීම හා සම්බන්ධ විවිධ ශිල්ප ක්‍රම

ඉහල සිට පහළට හෝ පහළ සිට ඉහළට සිදු වන ක්‍රියා දාමයක් මගින් බලපෑම් ක්ෂේත්‍ර හඳුනා ගත හැකි ය. එනම්, සංවිධානයක ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් හෝ ප්‍රතිලාභීන් විසින්, හෝ අනෙක් කොටස්කරුවන් ද අඩංගු කර ගත් පුළුල් ක්‍රියා දාමයක් මගින් වුවත්, බලපෑම් ක්ෂේත්‍ර හඳුනා ගන්නට හැකියාව තිබේ. සීසීඩීබීය පිළිබඳ උදාහරණයේ දී, වඩාත් ම ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල පහක් අතරෙහි සිදු කළ උපදෙස් විමසීම් තුළින්, රික් බලපෑම් ක්ෂේත්‍ර හතරක් හඳුනා ගත්තේ ය. ටාගට් 10 පිළිබඳ උදාහරණයේ දී, වැඩ සටහනේ කොටස්කරුවන් 150 දෙනෙකුගෙන් කළ උපදෙස් විමසීම් තුළින්, වෙනස් වීම බලපෑ ක්ෂේත්‍ර

හතරක් හඳුනා ගන්නට ජෙස්ට හැකි විය. එහි දී ඔහු ඒ සඳහා යොදා ගත්තේ ඩෙල්ෆි ශිල්ප ක්‍රමය[1] යි. ඩෙල්ෆි ශිල්ප ක්‍රමය යනු, යළි යළිත් ප්‍රශ්න මාලාවන් ඉදිරිපත් කිරීමේ සහ ප්‍රතිපෝෂණ සැපයීමේ පිවිසුමක් යොදා ගන්නා, අන්තර් ක්‍රියාකාරී (තැපැල් මාර්ගික) පර්යේෂණ ස්වරූපයකි. එමගින් බලාපොරොත්තු වන්නේ, ඒකමතික භාවය යම් අපේක්ෂිත මට්ටමක් කරා ළඟා වන තෙක්, කලින් පැවති අදහස් සංශෝධනය කරන්නට සහභාගිකයන්ට අවස්ථාවක් සම්පාදනය කිරීම යි. එනම්, අනෙකුත් සහභාගිකයන්ගේ ප්‍රතිචාර මත පදනම් වී කලින් ඇති කර ගෙන තිබුණු අදහස් සංශෝධනය කරන්නට සහභාගිකයන්ට අවස්ථාවක් සම්පාදනය කිරීම යි.

**වික්ටෝරියාවඃ බලපෑම් ක්ෂේත්‍ර වර්ධනය කිරීම සඳහා පහළ සිට ඉහළට පිවිසුමක්**

"ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියාහි උතුරුමැද කලාපයේ, ලෑන්ඩ්කෙයාර් ප්‍රදේශයේ දී, බලපෑම් ක්ෂේත්‍රවලින් තොරව, සම්මුඛ සාකච්ඡාමය ක්‍රියා දාමයක් හරහා, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් 140කට වැඩි ගණනක් රැස් කරන ලදි. අනතුරුව, මෙම ක්‍රියා දාමය සඳහා ස්ථාපනය කොට තිබූ මෙහෙයුම් කමිටුවක් විසින් මෙම කතා පුවත් බෙදා වෙන් කරන ලදි. පළමුව මෙම කණ්ඩායම, වෙනස් වීම පිළිබඳ කාරණාවට අදාළ නොවූ, හෝ ප්‍රමාණවත් විස්තර නොතිබූ කවර හෝ කතා පුවතක් පැවතියේ නම් ඒවා ඉවත් කළේ ය. ඉන් පසුව ඔවුහු සමාන ප්‍රතිඵල සහිත කාණ්ඩවලට (බලපෑම් ක්ෂේත්‍රවලට) ඉතිරි කතා පුවත් වර්ග කළහ. වෙනස් වීම පිළිබඳ බලපෑම් ක්ෂේත්‍ර හතක් ලබා ගනිමින් අපි අපේ කටයුත්ත අවසන් කළෙමු" *(ජෙස් ඩාර්ට්, 2004 දී කරන ලද නිරීක්ෂණ).*

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් රැස් කරන්නට පෙර, හෝ අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් අරුත්බර කාණ්ඩවලට බෙදා වෙන් කිරීම මගින් (ඉහතින් දැක්වූ අදහස් බලන්න) පසුව හෝ බලපෑම් ක්ෂේත්‍ර හඳුනා ගත හැකි ය. දිගින් දිගට ම අතීත අත්දැකීම්වලින් මෙහෙයවෙනවා වෙනුවට, නව අත්දැකීම්වලට විවෘත වන්නට සංවිධානයට වුවමනා කරන තරම මත මෙය රඳා පවතී.

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමය සහ එහි ප්‍රතිඵල පිළිබඳව කෙරෙන කවර ප්‍රලේඛනය කිරීමක දී වුව ද, කෙටියෙන් හෝ, බලපෑම් ක්ෂේත්‍ර තෝරා ගත් ආකාරය පැහැදිලි කළ යුතු වේ. ප්‍රතිඵල පිළිබඳව හදාරන අනෙකුත් ජනයාට ඒවා අදාළ තත්ත්වය තුළ පිහිටුවා ගැනීමට මෙය උදව් වේ.

## 3 වන පියවරඃ වාර්තාකරණ කාල සීමාව අර්ථදැක්වීම

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය බෙහෙවින් ම යොදා ගෙන ඇත්තේ **නිරීක්ෂණ** ස්වරූපයක් ලෙසිනි. නිරීක්ෂණයට ඇතුළත් වන්නේ කලින් කලට තොරතුරු රැස් කිරීම යි. එහෙත් නිරීක්ෂණයේ නිරන්තර භාවය, වැඩ සටහන් සහ සංවිධාන අනුව වෙනස් වේ. ශිල්ප ක්‍රමය යොදා ගන්නා විවිධ ආකාරයන් සම්බන්ධයෙන් ද තත්ත්වය මෙය ම ය. අර්ථාන්විත කතා පුවත් රැස් කරන නිරන්තර භාවය, දෙසතියකට වරක් බැගින් සිදු වන තත්ත්වයේ සිට වාර්ෂිකව සිදු වන තත්ත්වය දක්වා විවිධ වී තිබේ. වඩාත් ම පොදුවේ දැකිය හැකි නිරන්තර භාවය වන්නට ඉඩ තිබෙන්නේ ත්‍රෛමාසිකව කතා පුවත් රැස් කිරීම යි. මෙය බොහෝ සංවිධාන තුළ ව්‍යාප්තව පවතින කාර්තුමය වාර්තාකරණය සමග සම්පාත වේ.

වීඑස්ඕ සංවිධානය යොදා ගන්නේ වාර්ෂික වාර්තාකරණයකි. එවැනි අඩු නිරන්තර භාවයකින් සිදු වන වාර්තාකරණය නිසා, ශිල්ප ක්‍රමය ක්‍රියාකාරී වන ආකාරය, හෝ එය යොදා ගනු ලබන්නේ ඇයි ද යන්න, කාර්ය මණ්ඩලයට සහ ව්‍යාපෘතියේ සහභාගිකයන්ට යන දෙකොට්ඨාසයට ම අමතකව යාමේ අවදානම ඇති වේ. අවම වශයෙන් ගත් විට පවා, ඉන් අදහස් වන්නේ, ශිල්ප ක්‍රමය යොදා ගන්නා ආකාරය ඉගෙනීමේ ක්‍රියා දාමය මන්දගාමී වන්නට ඉඩ ඇති බව යි. එමෙන් ම, ශිල්ප ක්‍රමය විසින් පොළඹවනු ලැබෙන සංවිධානීය ඉගෙනීම ද, ඒ හා සමාන ම මන්දගාමී ක්‍රියා දාමයක් වන්නට ඉඩ ඇති බව යි. අනෙක්

[1] http://www.carolla.com/wp-delph.htm වෙබ් පිටුවේ එන ඇලන් ක්ලයින්ගේ "Prioritization Process Using Delphi technique" ("ඩෙල්ෆි ශිල්ප ක්‍රමය යොදා ගන්නා ප්‍රමුඛතාකරණ ක්‍රියා දාමය") බලන්න

අතට, වාර්ෂික චක්‍රයකට අවශ්‍ය වනු ඇත්තේ අඩු කාලයක් සහ අඩු සම්පත් ප්‍රමාණයක් නිසා, සමහර තත්ත්වයන් තුළ දී එය සුදුසු විය හැකි ය.

ඉහළ මට්ටමක නිරන්තර භාවයකින් යුතු වාර්තාකරණයක් පවතින විට, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමය තුළ සිටින සියලු සහභාගිකයන්, ක්‍රියා දාමය හොඳින් ම යොදා ගන්නේ කෙසේ ද යන්න වඩා ඉක්මනින් ඉගෙන ගන්නට ඉඩ තිබේ. කෙසේ වුව ද, නිරන්තරව සිදු වන වාර්තාකරණය නිසා, වඩා දිගු කාලීන අර්ථාන්විත වෙනස් වීම්වලට සම්බන්ධිතව දැන සිටින උදාහරණ අවසන් වී, හඳුනා ගත හැකි වඩා කෙටි කාලීන අර්ථාන්විත වෙනස් වීම්වලට අවධානය යොමු වීමකට ඉක්මනින් ම මග පෑදෙනු ඇත. එමෙන් ම, ක්‍රියා දාමය විසින් සහභාගිකයන්ගේ කාලයෙන් කොපමණ ප්‍රමාණයක් යොදා ගන්නේ ද යන කරුණට සම්බන්ධිතව ගත් කල, නිරන්තර වාර්තාකරණය මගින් ක්‍රියා දාමයේ පිරිවැය ද වැඩි කෙරෙනු ඇත.

පිරිවැය සහ ප්‍රතිලාභ තුලනය කරමින් ද, දැනට පවතින කවර නිරීක්ෂණ සහ ඇගයීම් පද්ධතියක් විසින් වුව සැලකිල්ලට නොගන්නා වාර්තාකරණ පරතරයන් සැලකිල්ලට ගනිමින් ද, වඩාත් ම සුදුසු වාර්තාකරණ කාල සීමාව කුමක් ද යන්න සම්බන්ධයෙන් තමන්ගේ ම තීරණයක් ගන්නට, ශිල්ප ක්‍රමය යොදා ගන්නා සෑම සංවිධානයකට ම සිදු වේ.

අපගේ අත්දැකීමෙන් හැඟෙන්නේ, සංවිධාන වඩා නිරන්තර වාර්තාකරණයකින් යුක්තව ශිල්ප ක්‍රමය පටන් ගන්නට නැඹුරු වන බව යි. ක්‍රියා දාමය දිගින් දිගට කෙරී ගෙන යන විට නිරන්තර භාවය පහත වැටෙන බව යි. බංග්ලාදේශ (සීසීඩීබී) උදාහරණයේ දී, පළමු මාස දෙකේ දී, සෑම දෙසතියකට වරක් ම අර්ථාන්විත කතා පුවත් තෝරා ගන්නා ලදි. අනතුරුව එය මාසික තේරීමක් බවට බවට පත් වූ අතර, පළමු වසර දෙක අවසානයේ දී ත්‍රෛමාසිකව සිදු වන තේරීමක් බවට වෙනස් විය. වික්ටෝරියානු (ටාගට් 10) උදාහරණයේ දී, ප්‍රාරම්භක වශයෙන් පැවති මාසික තේරීම් ක්‍රියා දාමය, අවසානයේ දී ත්‍රෛමාසික තේරීමක් බවට විකාශනය විය.

ඔබ පළමු වරට වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමය හඳුන්වා දෙන විට, වාර්තා කිරීමට ජනයා උනන්දුවක් දක්වන අර්ථාන්විත කතා පුවත් මුළුමනින් අතපසු වී ගිය තත්ත්වයක් පැවතිය හැකි ය. ක්‍රියාත්මක කිරීම පෙරට යන විට, මෙම ඓතිහාසික කතා පුවත් අවසන් වන අතර, අනතුරුව එන අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් වඩා මෑත කාලීන සිදුවීම්වලට අදාළ වීමේ නැඹුරුවක් පෙන්වයි. මෙම වෙනස සමගින්, මතු වී එන කතා පුවත් සංඛ්‍යාවේ ප්‍රමාණාත්මක පහත වැටීමක් සිදු විය හැකි ය.

**සානාව - වර්තමාන කතා පුවත් සඳහා පවතින අවශ්‍යතාව**
"... කතා පුවත් රචනා කිරීම සහ ඒවා සමාලෝචනය කිරීම අතර විවිධ කාල පමා වීම් පැවතිණ. ඇතැම් විට ඉන් අදහස් වූයේ, ඇතැම් වෙනස් වීම් අතුරුදන්ව යන ක්ෂණිකතාව යි. බොහෝ විට ඒ වෙද්දීත් කාර්තුමය වාර්තා තුළට කතා පුවත් හසු කර ගෙන තිබූ නිසා, මෙම ව්‍යායාමයේ අරමුණු වෙනුවෙන් සමාලෝචනය කිරීමේ දී ඒවා තරමක් පිලුනු වූ බවක් පෙනී ගියේ ය" *(ජොන්ස්ටන්. 2002).*

# 4 වන පියවර: අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් රැස් කිරීම

## අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් මතු කර ගැනීම

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමයේ කේන්ද්‍රීය කොටස වන්නේ, සහභාගිකයන් වෙත මෙවැනි විවෘත ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීම යි:

*'පසු ගිය මාසය මුල සිට අග දක්වා මෙනෙහි කිරීමෙන්,*
*මේ ප්‍රජාව තුළ දිවි ගෙවන ජනයාගේ ජීවිතවල ගුණාත්මක භාවය සම්බන්ධයෙන් සිදු වූ*
*වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම යැයි ඔබ සිතන්නේ කුමක් ද?'*

මෙම උදාහරණය ගනු ලබන්නේ, 1994 දී, බංග්ලාදේශයේ රාජ්ෂාහි ප්‍රදේශයේ දී, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති නිරීක්ෂණය යොදා ගත් මුල් ම සංවිධානය වූ සීසීඩීබීයෙනි. ප්‍රශ්නයට කොටස් හයක් තිබේ:

1. *'පසු ගිය මාසය මුල සිට අග දක්වා මෙනෙහි කිරීමෙන්...'* - එය සුවිශේෂ කාල සීමාවකට අදාළ වෙයි.

2. *'...සිදු වූ ... යැයි ඔබ සිතන්නේ කුමක් ද?...'* - තමන්ගේ ම විනිශ්චයන් ඇති කර ගැනීමෙහි යෙදෙන ලෙස එය ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටී.

3. *'...වඩාත් ම අර්ථාන්විත...'* - වරණාත්මක වන ලෙස (තෝරා ගැනීමක් කරන ලෙස), සෑම දෙයක් ගැන ම අදහස් දැක්වීමට උත්සාහ නොදරන ලෙස, එක් දෙයක් ගැන අවධානය යොමු කර වාර්තා කරන ලෙස, එය ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටී.

4. *'...වෙනස් වීම...'* - වඩා වරණාත්මක වන ලෙස, තත්ත්වයට සම්බන්ධිත ස්ථාවර පැතිකඩවල් වෙනුවට, පූර්ව වාර්තාකරණ කාල සීමාව තුළ දී පැවති යම් දෙයක් වෙනුවට, වෙනස් වීමක් වාර්තා කරන ලෙස එය ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටී.

5. *'...ජනයාගේ ජීවිතවල ගුණාත්මක භාවය සම්බන්ධයෙන්...'* - වඩාත් වරණාත්මක වන ලෙස, මොන යම් හෝ වෙනස් වීමක් නො ව, ජනයාගේ ජීවිතවල ගුණාත්මක භාවය සම්බන්ධයෙන් ඇති වූ වෙනස් වීමක් වාර්තා කරන ලෙස එය ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටී. මෙම වාක්‍යාංශයෙන් විස්තර වන්නේ වෙනස් වීම බලපෑ ක්ෂේත්‍රයකි. වෙනස් වීම බලපෑ අනෙකුත් ක්ෂේත්‍රවලට ගැළපෙන ලෙස එය නවීකරණය කළ හැකි ය. නිදසුනක් ලෙස, සීසීඩීබීයේ වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ ප්‍රශ්න අතුරින් තවෙකක්, 'මහජනයාගේ සහභාගිත්වයට සම්බන්ධිතව' සිදු වූ වෙනස් වීමකට අදාළ විය.

6. *'...මෙම ප්‍රජාව තුළ දිවි ගෙවන...'* - වාක්‍යයේ මුල් කොටස මෙන් මෙය ද යම් සීමාවන් පිහිටුවයි. මෙම විශේෂිත උදාහරණයේ දී අප අසා සිටින්නේ, නිව් යෝකයේ හෝ ඇලස්කාවේ ජනයාගේ ජීවිත ගැන නො ව, රාජ්ෂාහි ප්‍රදේශයේ ජනයාගේ ජීවිත ගැන යි. මෙම කොටසෙහි යම් සීරුමාරු කිරීම් කරන්නට ද හැකියාව තිබේ.

## අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් හසු කර ගන්නා ආකාරය

අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවත් හඳුනා ගෙන ප්‍රලේඛනය කළ හැකි ක්‍රම කීපයක් තිබේ. ප්‍රත්‍යවලෝකනාත්මක විමර්ශනය ඔස්සේ තමන්ගේ ක්ෂේත්‍ර ක්‍රියාකාරකයන් සතුව දැනට පවතින අවබෝධය යොදා ගන්නට සංවිධානයට අවශ්‍ය විය හැකි ය. විධික්‍රමය සම්බන්ධයෙන් කරන තෝරා ගැනීම එක් අතකින් රඳා පවතින්නේ, එම අවශ්‍යතාවට එදිරිව, කොතරම් ක්‍රියාශීලී භාවයකින් යුතුව අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ නව කතා පුවත් සොයා යන්නට, සංවිධානයට වුවමනා කරන්නේ ද යන්න මත ය. සහභාගිකයන් යෙදිය යුතු වන කාල ප්‍රමාණයට සම්බන්ධිතව ගත් විට, ක්‍රියාශීලී සොයා යාම වැඩි දුෂ්කරතා මතු කරන්නක් විය හැකි ය. එසේ නැත් නම්, කොටස්කරුවන්ගේ සහභාගිත්වය ලබා ගන්නා දැනට පවතින ක්‍රියා දාමයන් මගින්, සහභාගිකයන්ගේ කාලය දැනට මත් ප්‍රයෝජනයට ගනිමින් තිබෙනවා විය හැකි ය (පහතින් දැක්වෙන කරුණු බලන්න). අරමුණු සහගත සම්මුඛ සාකච්ඡා යොදා ගනිමින් කරන ක්‍රියාශීලී සොයා යාම මගින් ද, ප්‍රතිචාර දක්වන්නන් වෙනස් වීම් පිළිබඳ 'අපේක්ෂිත' කතා පුවත් ඉදිරිපත් කිරීමේ අවදානම ඇති කෙරේ.

### *ක්ෂේත්‍ර සේවකයෝ, ඉල්ලීමකින් තොරව තමන්ට අසන්නට ලැබුණු කතා පුවත් ලියා ගනිති*

මෙම උදාහරණයේ දී, ක්ෂේත්‍ර ක්‍රියාකාරකයෝ, තමන්ගේ වැඩ කටයුතු තුළ දී ඉල්ලීමකින් තොරව තමන්ට අසන්නට ලැබුණු කතා පුවත් ප්‍රලේඛනය කරති. සීසීඩීබී උදාහරණයේ දී මෙම ශිල්ප ක්‍රමය යොදා ගැනිණ. මෙහි පවතින නිසැක උපකල්පනය වූයේ, යහපත් සීසීඩීබී

ක්ෂේත්‍ර ක්‍රියාකාරකයන් වෙනස් වීම පිළිබඳ කතා පුවත් ගැන ඉගෙන ගන්නට පටන් ගත යුත්තේ, තමන්ගේ සාමාන්‍ය වැඩ කටයුතු අතරතුර දී ය යන්න යි. ඊට හේතුව වන්නේ, ඔවුන්ට තමන්ගේ ප්‍රතිලාභීන් සමග දෛනික වූත් සමීප වූත් සබඳතා පැවතීම යි. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ එවැනි කතා පුවත් සොයා ගන්නට ඔවුන්ට නොහැකි නම්, එයින් මත් ඔවුන්ගේ වැඩ කටයුතුවල ගුණාත්මක භාවය පිළිබඳ යම් සංඥාවක් නිකුත් වනවා විය හැකි ය. මෙතැන දී, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය, සංවිධානයේ ප්‍රතිලාභීන්ගේ ජීවිත පිළිබඳව මෙන් ම කාර්ය මණ්ඩලය පිළිබඳ අහම්බ නිරීක්ෂණයක ද යෙදෙයි (පහත දැක්වෙන පසු නිරීක්ෂණය පිළිබඳ කොටස බලන්න).

### සම්මුඛ සාකච්ඡාවලින් සහ සටහන් තබා ගැනීමෙන්

සමහර සංවිධාන, ප්‍රතිලාභීන් 'සම්මුඛ සාකච්ඡාවන්ට ලක් කොට' විස්තරාත්මක සටහන් අතින් ලියා ගන්නා ලෙස, ඒ වෙනුවෙන් පත් කළ පුද්ගලයන් දිරිමත් කරයි. මෙම විධික්‍රමය ශක්තිමත් කිරීම සඳහා, සම්මුඛ සාකච්ඡාකරුවෝ තමන්ගේ සටහන් කතන්දර කියන්නා හමුවේ යළි කියවති. එමගින් බලාපොරොත්තු වන්නේ, තමන් කතා පුවතේ සාරය හසු කර ගෙන තිබෙන්නේ ද යන්න පරීක්ෂා කර ගැනීම යි. කතා පුවත වාර්තා කොට ඇත්තේ කතන්දර කියන්නාගේ වචනවලින් ම නම්, ඊට වැඩි වලංගුතාවක් හිමි වේ. **දෙවන උපග්‍රන්ථයෙහි** සම්පාදනය කොට ඇති ආකාරයේ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මාර්ගෝපදේශකයක් යොදා ගැනීමෙන්, මෙම ශිල්ප ක්‍රමය වැඩි දියුණු කළ හැකි ය. මෙම කටයුත්ත සඳහා කැප වී ගත් පුද්ගලයන් කණ්ඩායමකගේ උත්සාහයන් තුළින්, කෙටි කාලයක් තුළ දී, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් බොහෝ ගණනක් මතු කර ගැනීම සඳහා, එවන් සම්මුඛ සාකච්ඡා ප්‍රයෝජනවත් මගක් විය හැකි ය. පටිගත කිරීමේ යන්ත්‍රයක් යොදා ගැනීමෙන් කතා පුවත් හසු කර ගෙන, අනතුරුව ඒවා අත් අකුරෙන් පිටපත් කිරීම ද කළ හැකි ය. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් හඳුනා ගැනීමේ මෙම ප්‍රාරම්භක විධික්‍රමය, නිරීක්ෂණ ක්‍රියා දාමයන්ට නො ව ඇගයීම් ක්‍රියා දාමයන්ට වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යොදා ගැනීමේ දී, විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකි ය (හත් වන පරිච්ඡේදය බලන්න).

### කණ්ඩායම් සාකච්ඡාව අතරතුර

එක් පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකු සම්මුඛ සාකච්ඡාවට ලක් කිරීමේ දී මෙන් නො ව, පුද්ගලයන් කණ්ඩායමක් එකට එක් වූ විට, ඔවුන්ට අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ තමන්ගේ කතා පුවත් බෙදාහදා ගැනීමට හැකියාව ලැබේ. ටාගට් 10 පිළිබඳ උදාහරණයේ දී, කම්ටු රැස්වීම්වල දී කතා පුවත් බෙදාහදා ගැනීම නිසා, බොහෝ විට පැමිණ සිටි අනෙකුත් ගොවි කොටස්කරුවන්ගෙන් අමතර කතා පුවත් මතු වී ආවේ ය. කතා පුවතක් කී විට ඊට දෙවන කතා පුවතකින් ප්‍රතිචාර දැක්වීම අතිශය මානුෂ වූ සංසිද්ධියකි! ඒ නිසා, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳව නිසගයෙන් පැන නගින කතා පුවත් පටිගත කර ගැනීම සඳහා, මෙම රැස්වීම්වල දී පටිගත කිරීමේ යන්ත්‍රයක් යොදා ගැනුණි. මෙය කතා පුවත් රැස් කිරීමේ ඉතා ම සාරවත් වූත් සන්තුෂ්ටිදායක වූත් ක්‍රමයක් විය හැකි ය. පෑන් සහ කොළ යොදා ගනිමින් ද කණ්ඩායම්කව රැස් කරන ලද කතා පුවත් ප්‍රලේඛනය කළ හැකි ය.

### ප්‍රතිලාභියා සෘජුව ම කතා පුවත රචනා කරයි

තවත් ශිල්ප ක්‍රමයක් වන්නේ ප්‍රතිලාභියා ම තමන්ගේ කතා පුවත් ප්‍රලේඛනය කිරීම යි. ටාගට් 10 වැඩ සටහනේ අවස්ථා කීපයක දී, ගොවීහු කලින් ලියන ලද කතා පුවත් රැස්වීම්වලට රැගෙන ආහ. කෙසේ වුව ද, ගොවීන් සම්බන්ධයෙන් ගත් කල වඩා පොදු දෙය වූයේ, රැස්වීම අතරතුර දී ප්‍රලේඛනය කිරීම සඳහා කතා පුවත් සිය සිත්හි දරා ගෙන පැමිණීම යි. කණ්ඩායම්ක සාකච්ඡාව යොදා ගැනීමේ දී, මෙම විධික්‍රමය උපයෝගි කර ගන්නේ ද නැද්ද යන්න තීරණය වූයේ, නිරීක්ෂණ ක්‍රියා දාමයට කොටස්කරුවාගේ සහභාගිත්වය ඇති කිරීමට කලින් සිට පැවත එන වෙනත් යන්ත්‍රණයක් තිබෙන්නේ ද නැද්ද යන්න මත යි.

**නිකරගුවාව - කතා පුවත් වෙනුවට වාචික සාක්ෂ්‍ය**
"ඉංග්‍රීසියේ දී යොදා ගන්නේ කතා පුවත යන අර්ථය දෙන "story" යන වචනය යි. එනම්, ස්පාඤ්ඤ භාෂාවෙන් cuento හෝ historia යන වචනවලින් අදහස් කරන දෙය යි. ස්පාඤ්ඤ සහ ඉංග්‍රීසි යන භාෂා දෙකේ දී ම, වචනයෙන් ඇඟවෙන්නේ අලුතින් නිර්මාණය කළ යමක් පිළිබඳ හැඟීමකි. එය යථාර්ථයට වඩා ප්‍රබන්ධයට සම්බන්ධ ය. මෙය, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති විධික්‍රමය යොදා ගැනීම සම්බන්ධයෙන් ව්‍යාකූලතාවක් ඇති වන්නට හේතු විය හැකි ය. සැබෑ ජීවිතයෙන් ගන්නා කතා පුවතක් වෙනුවට, සම්මුඛ සාකච්ඡාකරුවා සොයා යන වෙනස් වීම විදහා පාමින් කතා පුවතක් අලුතින් නිර්මාණය කරන්නට, ජනයා උත්සාහ දැරිය හැකිව තිබිණ. මේ නිසා, වාචික සාක්ෂ්‍යය (testimony)/ආඛ්‍යානය (narrative) යන වචනය යොදා ගන්නට මම තීරණය කළෙමි. ඊට හේතුව, එය සැබෑ ලෝකයෙන් එන අත්දුටු සිදුවීමක් පිළිබඳ හැඟීමක් ඇඟවීම යි " *(ගිල් හොල්මිස්, ලිස්බෙත් පීටර්සන්, කාර්ස්ටන් කර්කිගාර්ඩ්, ඩෙන්මාර්කයේ අයිබිස්, 2003).*

## ප්‍රලේඛනය කළ යුත්තේ කුමන තොරතුරු ද?

ප්‍රලේඛනය කළ යුතු තොරතුරු අතරට පහත දැක්වෙන ඒවා ඇතුළත් විය යුතු යඃ

1. කතා පුවත රැස් කළේ කවුද යන්න සහ සිදුවීම් සිද්ධ වූයේ කවදා ද යන්න පිළිබඳ **තොරතුරු**

2. කතා පුවත පිළිබඳව, එනම් සිදු වූයේ කුමක් ද යන්න පිළිබඳව කෙරෙන **විස්තර කිරීම**

3. කතා පුවත තුළ විස්තර කොට ඇති සිදුවීම්වල (කතන්දර කියන්නාට ඇති) **අර්ථාන්විත භාවය**

**කතා පුවත රැස් කළේ කවුරුන් ද, කවදා ද** යන්න ප්‍රලේඛනය කිරීම, කතා පුවත අදාළ තත්ත්වය තුළ පිහිටුවා ගැනීමට පාඨකයාට උදව් වේ. එමෙන් ම, අවශ්‍ය වුව හොත් කතා පුවත පිළිබඳව මොන යම් හෝ පසු විපරමක් කරන්නට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙයි.

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් ප්‍රලේඛනය කළ යුත්තේ ඒවා පවසනු ලබන ආකාරයෙනි. වඩාත් ම අර්ථාන්විත යැයි හඳුනා ගත් වෙනස් වීම පිළිබඳව කෙරෙන **විස්තර කිරීම** තුළට, සම්බන්ධ වූයේ කවුරුන් ද, සිදු වූයේ කුමක් ද, කොහේ දී ද සහ කවදා ද යන්න පැහැදිලි කෙරෙන සැබෑ තොරතුරු ඇතුළත් කළ යුතු ය. හැකි තැන්වල දී, සිදු වූ සිද්ධීන්වල අනුපිළිවෙළ විස්තර කෙරෙන සරල ආඛ්‍යානයක් ලෙසින් කතා පුවත රචනා කළ යුතු ය.

ඔවුන්ගේ දෘෂ්ටි කෝණයෙන් කතා පුවතේ ඇති **අර්ථාන්විත භාවය** පැහැදිලි කරන ලෙස ද කතන්දර කියන්නාගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙය වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමයේ ප්‍රධාන අංගයකි. සමහර කතන්දර කියන්නන් ස්වභාවයෙන් ම තමන්ගේ කතා මෙලෙස අවසන් කරනු ඇත. එහෙත්, අනෙකුන් පෙළඹවිය යුතු ය. මෙම කොටස නොමැති වුව හොත්, කතා පුවත කියවන සහ සාකච්ඡා කරන ජනයා, කතා පුවත කතන්දර කියන්නාට වැදගත් වූයේ ඇයි දැයි අවබෝධ කර නොගන්නට ඉඩ තිබේ. නිදසුනක් ලෙස, ප්‍රජා රැස්වීමකට ගොස්, පසුපසට වන්නට අසුන් ගෙන සිටිමින් ප්‍රශ්නයක් ඇසීම ගැන, කාන්තාවක් කතා පුවතක් කියන්නට පිළිවන. 'ඉතින් මොක ද?' යි සමහර විට ඔබට සිතේවි. ප්‍රජා රැස්වීමකට යන්නට තරම් කලින් තමන්ට පැහැදීමක් නොතිබූ නිසාත්, පළමු වතාවට ගමේ වැඩිහිටියන් ඉදිරියේ තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්නට අවශ්‍ය කරන විශ්වාසය ඇති කර ගන්නට වැඩ සටහන උදව් වූ නිසාත්, මෙම කතා පුවත වැදගත් වී යැයි එවිට ඇය ඔබට කියාවි.

### *ප්‍රලේඛනය කළ යුතු විකල්ප දෑ*

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවතකට මීට අමතරව එක් කළ හැකි ප්‍රයෝජනවත් දෙයක් වන්නේ, ඇතැම් විට පුවත්පතක දී යොදා ගන්නා ආකාරයට සමාන, ශීර්ෂ පාඨයක් නො වේ නම් මාතෘකාවකි. මෙය, කතා පුවත අනෙකුත් කතා පුවත් සමග සැසඳීමේ දී, කතා පුවත ගැන සඳහන් කරන්නට සහභාගිකයන්ට යොදා ගත හැකි පහසු අත්වැලක් විය හැකි ය. එමෙන් ම, සිදු වූ දෙයෙහි සාරය පෙරා ගන්නට සහ සන්නිවේදනය කරන්නට රචකයාට උදව් වන්නට ද ඊට හැකියාව තිබේ.

සීසීඩීබීය පිළිබඳ උදාහරණයේ දී, *'මෙය ඔබට අර්ථාන්විත වන්නේ ඇයි?'* යන ප්‍රශ්නයට අනතුරුව, *'මෙමගින් දැන් ඇති කරනු ලැබ තිබෙන වෙනස, හෝ මෙමගින් අනාගතයේ දී ඇති කරනු ලබන වෙනස කුමක් ද?'* යන අමතර ප්‍රශ්නයක් මතු විය.

කතා පුවත අවසානයේ දී නිර්දේශ හෝ ඉගෙන ගත් පාඩම් කවරේ දැයි දක්වන ලෙස ඉල්ලා සිටීම, කතා පුවතේ ඇඟවුම් උකහා ගැනීමට උදව් විය හැකි ය. මෙම අමතර ප්‍රශ්නවලට දක්වන ප්‍රතිචාර, කතා පුවතේ අර්ථාන්විත භාවය පිළිබඳව විස්තර කෙරෙන කොටස තුළ බහා ලිය හැකි ය.

### *කතා පුවත් කොතරම් දීර්ඝ විය යුතු ද?*

අප දැක ඇති වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවත් බොහොමයක් පිටුවක හෝ ඊට අඩු ප්‍රමාණයේ දිගකින් යුක්ත ය. ඒ අතරවාරයේ, ඇතැම් කතා පුවත් පිටු දෙකක් දක්වා දීර්ඝ වේ. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කෙටි කතා පුවත් වඩා ඉක්මනිනුත් පහසුවෙනුත් කියවිය හැකි ය. එහෙත්, ඉතා වැදගත් තොරතුරු අත හැරී යන තරමට ඒවා කෙටි නො විය යුතු ය. තම සංස්කෘතිය අනුව, විවිධ සංවිධාන විවිධ දිග ප්‍රමාණයන්ගෙන් යුතු කතා පුවත්වලට ප්‍රසාදය පළ කරන්නට නැඹුරු වෙයි. සමහර සංවිධාන, වෙනස් වීම් පිළිබඳ, කෙටි වුත් වඩාත් ම වැදගත් කරුණු ප්‍රකාශයට පත් කරන්නා වූත් කතා පුවත් අගය කරයි. ඒ අතර අනෙක්වා, සිත් ඇද ගන්නාසුලු අයුරින් කියන වීර කතාවලට ප්‍රසාදය පළ කරයි. තෝරා ගැනීමේ ක්‍රියා දාමය ප්‍රසාදය පළ කරනු ඇත්තේ සංවිධානීය වටිනාකම්වලට ගැළපෙන කතා පුවත්වලට යි. මීට අනුබල දිය යුත්තේ, යම් ආකාරයක සත්‍යාසත්‍යතා පරීක්ෂාවකට ඉඩ ලැබෙන පරිදි කතා පුවත් ප්‍රමාණවත් ලෙස විස්තර වන තත්ත්වයක් පවතින තාක් පමණි.

## වාර්තාකරණ ආකෘති පත්‍ර

සංවිධාන කීපයක්, කතා පුවත් ප්‍රලේඛනය කිරීම සඳහා සම්මත ආකෘතියක් වර්ධනය කොට ගෙන තිබේ. උපග්‍රන්ථ තුළ මේ පිළිබඳ සමහර උදාහරණ සපයා තිබේ. වැදගත් තොරතුරු අත නොහැරෙන බව සහතික කරන්නට මෙය උපකාර වේ. කෙසේ වුව ද, ආකෘති පත්‍ර බෙහෙවින් සංකීර්ණ ස්වරූපයක් නොගැනීම වැදගත් ය. ආකෘති පත්‍රය වඩාත් සංකීර්ණ වන තරමට, ශිල්ප ක්‍රමය යොදා ගන්නට සහ අගය කරන්නට ජනයා පෙළඹවීම දුෂ්කර වේ. ශිල්ප ක්‍රමයේ සාරය වන්නේ, කල් තබා නියම කොට නොගත් සරල ප්‍රශ්න කීපයක් ඇසීම යි. ඔබට ව්‍යුහගත ප්‍රශ්නාවලියක් අවශ්‍ය නො වේ.

ප්‍රමාණවත් අයුරින් තොරතුරු හසු කර ගැනීමට වුව ද එය වැදගත් ය. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවත් කියන ජනයා බොහෝ විට උපකල්පනය කරන්නේ, තමන්ගේ කතා පුවත් කියවන අනෙකුත් ජනයාට ඒ සම්බන්ධ සියලු පසුබිම් දැනුම තිබෙනු ඇතැයි කියා යි. පසුබිම් දැනුම ගැන තිබෙන උපකල්පන පිළිබඳව පරීක්ෂාකාරී වන්න. එය වඩා පැහැදිලිව සකස් කරන්නට රචකයා දිරිමත් කරන්න. මහජනයා නොපැහැදිලි හෝ අවිනිශ්චිත පිළිතුරු ලබා දෙන විට, ඇතැම් විට, ඔවුන්ගේ පාඨකයන් සියලු පසුබිම් තොරතුරු දැන සිටිනු ඇතැයි ඔවුන් සිතන නිසා එසේ විය හැකි ය. නැති නම්, ඔවුන් සතුව සියලු තොරතුරු නැති නිසා එසේ විය හැකි ය. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවතක් වඩා සුවිශේෂිත සහ විස්තරාත්මක වන තරමට, එය වඩා විශ්වසනීය වේ. මීට එක් හේතුවක් වන්නේ එහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම වඩා පහසු වීම යි.

වාසනාවට, මහජනයා නොපැහැදිලි ලෙස, අසම්පූර්ණ අයුරින් හෝ මුළුමනින් පිට පනිමින් කතා පුවත් කියන විට පවා, යළි යළිත් භාවිතයට ගැනීම, තේරීම සහ ප්‍රතිපෝෂණය තුළින්

ක්‍රියා දාමය ස්වයං වර්ධනයක් අත් කර ගනී. ඔබට නොපැහැදිලි කතා පුවතක් හමු වන්නේ නම්, කතා පුවත තෝරා නොගන්නට තීරණය කොට, කතා පුවත් වඩා සුවිශේෂිත අයුරින් ඉදිරිපත් කළ යුතු යැයි කතන්දර කියන්නන්ට කියා සිටින්නට ඔබට හැකියාව තිබේ. මෙමගින්, අවශ්‍ය වන්නේ කුමක් ද යන්න ගැන වඩා හොඳ අදහසක් කතන්දර කියන්නන්ට ලැබෙනු ඇත. මෙම ක්‍රමයෙන්, තේරීමේ සහ ප්‍රතිපෝෂණයේ එක් එක් වටයත් සමග, කතා පුවත් වඩා පැහැදිලි සහ වඩා කේන්ද්‍රගත වූ තත්ත්වයට පත් විය හැකි ය.

**පැපුවා නිව් ගිනියාව - කාගේ හඬවල් ද?**

"පැපුවා නිව් ගිනියානු සංස්කෘතිය මුඛ පරම්පරාගත සංස්කෘතියකි. එමෙන් ම, බොහෝ පැපුවා නිව් ගිනියානුවන්, ලිඛිත අදහස් ප්‍රකාශනයට වඩා බෙහෙවින් වැඩි සුවපහසුවක් වාචික අදහස් ප්‍රකාශනය තුළින් භුක්ති විඳිති. එවන් කතා පුවත් බැරෑරුම්ව සැලකිල්ලට ගැනීමට නම්, සහ සංස්කෘතික වාතාවරණයට ගරු කිරීමට නම්, කථකයාගේ විශ්වසනීය ආඛ්‍යානමය ප්‍රකාශනය ආරක්ෂා කෙරෙන බව සහතික කරන්නට සෑම ප්‍රයත්නයක් ම දැරිය යුතු වේ. ඉංග්‍රීසි (හෝ ඕස්ට්‍රේලියානු) කථකයෙකු පැපුවා නිව් ගිනියානුවෙකු කී කතා අත් අකුරින් පිටපත් කර ගන්නා විට, පදගතාර්ථ වූත් නිවැරදි වූත් පිටපත්කරණයක් සිදු වන බව සහතික කරන්නට දැවැන්ත ප්‍රයත්නයක් නො දැරුව හොත්, අදහස් දැක්වීම තුළ පවතින විශ්වසනීය භාවය පහසුවෙන් ම නැති වී යා හැකි ය. මෙලෙස ම, කොටස්වලින් යුතු (නිදසුන් සඳහා, රෝලන්ඩ්ස් 2002; ඩාර්ට් සහ ඩේවිස් 2003 බලන්න), හෝ අන් ආකාරයක ආකෘති පත්‍ර යොදා ගැනීමේ දී ද, සංස්කරණ ක්‍රියා දාමයේ දී කී කතාව ඇද ගස්සන්නට අඩුවෙන් ම හැකියාව ලැබෙන පරිදි එම ආකෘති පත්‍ර සකසන්නට ප්‍රයත්න දැරිය යුතු ය" *(එලිසබෙත් රීඩ්, 2004 දෙසැම්බර්).*

## රැස් කළ යුත්තේ කාගේ කතා පුවත් ද?

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් කියන ලෙස ඉල්ලා සිටිය යුත්තේ කුමන ජනයාගෙන් ද යන්න තීරණය කිරීම, සංවිධානීය තත්ත්වය සහ බලපෑම් ක්ෂේත්‍රවලට විෂය වන කරුණු මත රඳා පවතී. නිදසුනක් ලෙස, ජනතාවගේ ජීවිත තුළ සිදු වන වෙනස් වීම් සැලකිල්ලට ගන්නා බලපෑම් ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් ගත් විට, කතා පුවත් විමසා සිටීමට සුදුසු ජනයා ප්‍රතිලාභීන් ම වනු ඇත. එසේ නැත් නම්, ප්‍රජාමූල ක්‍රියාකාරකයන් වැනි, ඔවුන් සමග අන්තර් ක්‍රියාවන්හි යෙදෙන ජනයා වනු ඇත.

කෙසේ වෙතත්, 'අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන සමග පවත්නා හවුල්කාරිත්වයන් සහ ජාලගත වීම් තුළ සිදු වන වෙනස් වීම්' පිළිබඳ බලපෑම් ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් ගත් විට, හොඳ ම කතන්දර කියන්නන් බවට පත් විය හැක්කේ, වැඩ සටහන් කාර්ය මණ්ඩලය සහ හවුල්කාර සංවිධානවලින් එන, අදහස් පළ කළ හැකි තත්ත්වයක සිටින කාර්ය මණ්ඩලය යි.

රැස් කළ යුත්තේ කාගේ කතා පුවත් ද යන්න කෙරෙහි ව්‍යාපෘතියේ හෝ වැඩ සටහනේ තත්ත්වය ද බලපායි. සංවිධානය ප්‍රජාමූල වූවක් සහ අරමුදල් සපයන්නන්ට වගකිව යුතු වූවක් නම්, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් බෙදාහදා ගනිමින්, වඩාත් ම අර්ථාන්විත කතා පුවත් තෝරා ගනිමින්, සහ තමන්ගේ තේරීමට හේතු වූ කරුණු ද සහිතව ඒවා ප්‍රලේඛනය කරමින්, ඒවායේ සාමාජිකයන් ම වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමය කර ගෙන යාම බෙහෙවින් සුදුසු විය හැකි ය.

අත්දැකීමෙන් හැඟී යන්නේ, ප්‍රතිලාභීන් කියන කතා පුවත්වල විශේෂ වටිනාකමක් ඇති මුත්, බොහෝ විට ඒවා මතු කර ගැනීම ඉතා දුෂ්කර වන බව යි. නියම වශයෙන් නම් සිදු විය යුත්තේ, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් බෙදාහදා ගැනීම සහ තෝරා ගැනීම සම්බන්ධයෙන් ප්‍රතිලාභීන්ගේ කණ්ඩායම්වලට පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව, ඔවුන් තමන්ගේ තේරීමට හේතු වූ කරුණු ද සහිතව තෝරා ගත් කතා පුවත් වාර්තා කිරීම යි. කෙසේ වුව ද, සමහර තත්ත්වයන් තුළ දී මෙය ප්‍රායෝගික නො වේ. ආයාචනය කරන්නට නොහැකි වීම නිසා, ක්ෂේත්‍ර ක්‍රියාකාරකයන් කැමැත්තෙන් ම කතන්දර කියන්නන් බවට පත් වනු ඇත (ප්‍රතිපෝෂණ සැපයීමේ ක්‍රියා දාමයේ දී, ප්‍රතිලාභීන් ඊට සම්බන්ධ කර ගැනීමෙන් ඇති වන ප්‍රතිලාභ සහ අවදානම් පිළිබඳව සාකච්ඡාවක් මතු කර ගැනීම සඳහා, හය වන පියවර බලන්න).

කතා පුවත් සෘජුව ම ප්‍රජාවන් තුළින් ළඟා වන විට පවා, පළමුව ක්ෂේත්‍ර ක්‍රියාකාරකයන් වෙතින් කතා පුවත් රැස් කර ගැනීමෙන් පටන් ගැනීම බොහෝ විට උදව්වක් වෙයි. අනෙකුන්ට හඳුන්වා දීමට කලින්, කාර්ය මණ්ඩලය ක්‍රියා දාමය අවබෝධ කර ගන්නා බව සහතික කරන්නට මෙය උදව් වෙයි.

### *තත්ත්වය මත පදනම් වූ කතා පුවත්වලට එදිරිව පුද්ගල කතා පුවත්*

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය තුළ දී අවසර ලැබෙන්නේ තත්ත්වය මත පදනම් වූ කතා පුවත්වලට ද පුද්ගල කතා පුවත්වලට ද යන්න, අපෙන් නිතර ම අසනු ලැබේ. තත්ත්වය මත පදනම් වූ කතා පුවතකින් අවධානය යොමු කෙරෙන්නේ පුද්ගලයෙකු කෙරෙහි නො වේ. එමගින් විස්තර කෙරෙන්නේ ප්‍රජාවක් තුළ හෝ කණ්ඩායමක් තුළ සිදු වූ වෙනස් වීමකි. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමය තුළ දී, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ ඕනෑ ම ආකාරයක කතා පුවතකට අවසර ලැබේ. තෝරා ගැනීම රඳා පවතින්නේ, ශිල්ප ක්‍රමය යොදා ගන්නා සංවිධානය සොයා බලමින් සිටින්නේ කුමක් ගැන ද යන්න මත යි: එනම්, සොයා බලන්නේ පුද්ගල වෙනස් වීම්, කණ්ඩායමික වෙනස් වීම් හෝ ආයතනික වෙනස් වීම් ද යන්න මත යි. බලපෑම් ක්ෂේත්‍ර තෝරා ගැනීමට සම්බන්ධිතව ඉහත දැක්වූ දෙවන පියවරේ දී, මෙම විකල්ප ගැන සාකච්ඡා විය. එකකට වැඩි ස්ථාන ගණනක සිදු වෙමින් පවතින වෙනස් වීම් ගැන ප්‍රතිලාභීන් නොදැන සිටින්නට ඉඩ තිබේ. එනිසා, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයෙන් ද කතා පුවත් ලබා ගන්නට උත්සාහ කිරීම ද ප්‍රයෝජනවත් වේ.

එක්සත් රාජධානියේ එක් ආධාර සපයන සංවිධානයක දී, තමන්ගේ ම කතා පුවත් ඉදිරිපත් කරන්නට මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ට ඉඩ දෙන ලදි. එනම්, වඩා විශාල පරිමාණයෙන් සහ වැඩ සටහන් මට්ටමෙන් සිදු විය හැකි වෙනස් වීම්වලට අදාළ විය හැකි අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳව, තමන්ගේ ම කතා පුවත් ඉදිරිපත් කරන්නට යි. කෙසේ වුව ද, සමාලෝචනයකින් අනතුරුව අවබෝධ වූයේ, තවත් වාර්තාකරණ ක්‍රමයක් ලෙස ශිල්ප ක්‍රමය යොදා ගන්නට මෙම කාර්ය මණ්ඩලය නැඹුරු වූ බව යි. තමන්ගේ සාමාන්‍ය වාර්තාවල දී කරන ආකාරයට ම කතා පුවත් රචනා කළ ඔවුන්, කිසිදු අර්ථාන්විත සිදුවීමක් සවිස්තරාත්මකව විස්තර කළේ හෝ පැහැදිලි කළේ නැත. ඔවුන් වැඩි කැමැත්තක් දැක්වූයේ, සිදු වෙමින් පවත්නා වෙනස් වීම් පිළිබඳව තිත් යොදමින් කරුණු ඉදිරිපත් කරන්නට සහ සාමාන්‍ය සාකච්ඡා ඉදිරිපත් කරන්නට යි. මින් ලැබෙන පාඩම වන්නේ, වෙනස් වීම් සිදු වෙමින් පවත්නා ස්ථානයට සමීපයෙන් ම සිටින්නවුන්ට, හෝ වැඩ සටහන තුළ කුලුපග අයුරින් සම්බන්ධ වී සිටින්නවුන්ට, අප දැනට නොදන්නා දේවල් අපට කියන ප්‍රයෝජනවත් කතා පුවත් කියන්නට හැකියාව තිබිය හැකි ය යන්න යි.

## කතා පුවත් රැස් කිරීම හා සම්බන්ධ ආචාර ධර්ම

තනි පුද්ගලයන්ගෙන් කතා පුවත් රැස් කර ගැනීම හා සම්බන්ධ ආචාර ධර්ම පිළිබඳව අවධානය යොමු වීම අවශ්‍ය ය. ඔබ මුල පටන් ම, පුද්ගලයන් එකඟ වන්නේ ද නැද්ද යන්න සොයා බැලීමේ ක්‍රියා දාමයන් වර්ධනය කර ගත යුතු යැයි අපි යෝජනා කරමු. කතන්දර කියන්නෙකු කතා පුවතක් කියන විට, කතා පුවත රැස් කරන්නා එම කතා පුවත ප්‍රයෝජනයට ගන්නා ආකාරය පැහැදිලි කළ යුතු ය. කතා පුවත ප්‍රයෝජනයට ගැනීම ගැන කතන්දර කියන්නා සතුටට පත් වන්නේ ද යන්න විමසා බැලිය යුතු ය. කතා පුවත සමග ඔවුන්ගේ නම් පළ කරනවාට කැමති ද යන්නත් කතන්දර කියන්නාගෙන් විමසිය යුතු ය. අකමැති නම්, එතැන් පටන් කතා පුවතින් ඔවුන්ගේ නම් මකා හළ යුතු ය.

යම් පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් නොකියූ කතා පුවතක ඔවුන් ගැන සඳහන් කෙරෙන්නේ නම්, හෝ ඒ තුළින් ඔවුන් කවුරුන් ද යන්න හඳුනා ගත හැකි නම්, කතා පුවත තුළ ඔවුන්ගේ නම් සඳහන් වනවාට ඔවුන් සතුටු ද නැද්ද යන්න ගැන තුන් වන පාර්ශ්වයේ උපදෙස් ලබා ගන්නා ලෙස කතන්දර කියන්නාගෙන් ඉල්ලා සිටින්න. තුන් වන පාර්ශ්වය කවුරුන් ද යන්න නම් නො කොට එම පුද්ගලයා ගැන කතා පුවතක් කියන්නට කතන්දර කියන්නාට වුවමනා කරන්නේ නම්, එම තුන් වන පාර්ශ්වයේ අනන්‍යතාව ආරක්ෂා කළ යුතු වේ.

එමෙන් ම, ඕස්ට්‍රේලියාව ද ඇතුළු සමහර රටවල දී, දෙමව්පියන්ගේ අනුමැතිය නැතිව ඇතැම් වයස් සීමාවන්හි පසු වන ළමුන් සම්මුඛ සාකච්ඡාවන්ට ලක් කළ නොහැකි බව ද සටහන් කර ගැනීම ප්‍රයෝජනවත් ය.

තමන්ගේ කතා පුවත යොදා ගන්නට යන්නේ නිරීක්ෂණ සහ ඇගයීම් අරමුණු සඳහා පමණක් යැයි කතන්දර කියන්නෙකු විශ්වාස කරන්නේ නම්, කතන්දර කියන්නාගේ උපදෙස් නො විමසා කතා පුවත දේශීය පුවත්පත්වල පළ කිරීම ආචාර ධර්මවලට පටහැණි ය. අනුමැතිය ලැබී ඇති විට පවා, යහපත් භාවිතය වන්නේ, පුවත්පත් වැනි පිටස්තර මාධ්‍යයක පළ කරන්නට පෙර කතන්දර කියන්නා විමසා බැලීම යි.

ආචාර විද්‍යාත්මක උත්සුකතාවන් පිළිපදින්නේ ද නැද්ද යන්න සහතික කර ගැනීමේ එක් ක්‍රමයක් වන්නේ, කතන්දර කියන්නාගේ අනුමැතිය විමසා බැලීමට කතා පුවතක් වාර්තා කරන පුද්ගලයාට සිහිපත් කිරීම සඳහා, වාර්තාකරණ ආකෘති පත්‍රයෙහි 'හරි ලකුණක් යෙදිය හැකි කොටුවක්' ඇතුළත් කිරීම යි. **දෙවන වන උපග්‍රන්ථය** මෙම කාරණාවට අදාළ උදාහරණයක් ලබා දෙයි.

## 5 වන පියවරඃ කතා පුවත් අතුරින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත තේරීම

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති පිවිසුම, තේරීම් ක්‍රියා දාමය සම්බන්ධ ධුරාවලියක් යොදා ගනියි. ජනයා අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් ගැන තම ප්‍රදේශය තුළ සාකච්ඡා කොට, අනතුරුව ඒවා අතුරින් වඩාත් ම අර්ථාන්විත වූ කතා පුවත් ඊට ඉහළින් පිහිටි තලය වෙත ඉදිරිපත් කරයි. එහි දී, පහළ තලවලින් ඉදිරිපත් කරන ලද අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ සියලු කතා පුවත් අතුරින් වඩාත් ම අර්ථාන්විත ඒවා තෝරා, ඊළඟ තලයට ඉදිරිපත් කරනු ලබයි. පහත දැක්වෙන රූප සටහන (2 වන රූප සටහන) මෙම ක්‍රියා දාමය විදහා දක්වයි.

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීමේ සහ රැස් කිරීමේ ක්‍රියා දාමය යළි යළිත් සිදු කිරීම, ප්‍රාදේශීය වශයෙන් වැදගත් වූ කතා පුවත් විශාල ප්‍රමාණයක්, වඩා පුළුල්ව අගය කරනු ලබන කතා පුවත් කුඩා සංඛ්‍යාවකට අඩු කරන්නට උදව් වෙයි. තේරීම සඳහා බහුවිධ තල යොදා ගැනීම, කවර පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට වුව ඕනෑවට වඩා වැඩ කටයුතුවල යෙදෙන්නට සිදු වීමේ බරට කර නො ගසා මෙය සිදු කර ගන්නට හැකියාව ලබා දෙයි. මෙම ක්‍රියා දාමය 'තේරීම තුළින් සම්පිණ්ඩනය කිරීම' යැයි හඳුන්වා තිබේ.

*2 වන රූප සටහන. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමය තුළ සිදු වන කතා පුවත්වල සහ ප්‍රතිපෝෂණවල ගලා යාම*




මෙම ධුරාවලිගත ක්‍රියා දාමය විවිධ ක්‍රමවලට සැකසිය හැකි ය. එක් ක්‍රමයක් වන්නේ, ක්‍රියා දාමයේ ව්‍යුහය පවත්නා සංවිධානීය ව්‍යුහය 'පසුපසින් ගමන් කිරීම' යි. තවත් ක්‍රමයක්

වන්නේ, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තෝරා ගැනීම සඳහා විශේෂ ව්‍යුහයන් ඇති කිරීම යි.

බොහෝ සංවිධානවල තිබෙන්නේ, ක්ෂේත්‍ර කාර්ය මාණ්ඩලිකයන් රැසක් සහ එක් ප්‍රධාන විධායකයෙක් සහිත ධුරාවලිගත ව්‍යුහයකි. එමගින්, තේරීම් ක්‍රියා දාමය සංවිධානය කිරීම සඳහා, මෙම පවතින සංවිධානීය ව්‍යුහය යොදා ගත හැකි ය යන ප්‍රායෝගික හැඟීමක් ඇති කෙරේ. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් විශ්ලේෂණය කිරීම සඳහා ම විශේෂ උත්සව සැලසුම් කරනවා වෙනුවට, (ප්‍රාදේශීය සහ මූලස්ථාන කාර්යාලවල පැවැත්වෙන කාර්තුමය හෝ වාර්ෂික සමාලෝචන රැස්වීම් වැනි) අදාළ අරමුණු උදෙසා දැනට මත් න්‍යාය පත්‍රයට ඇතුළත් කොට ඇති රැස්වීම් තුළ දී, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් පරීක්ෂාවට ලක් කළ හැකි ය. සංවිධානයේ සියලු තලවලට අයත් කාර්ය මණ්ඩලය, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් විශ්ලේෂණය කිරීමට සම්බන්ධ වන බව සහතික කරන්නට ද මෙය උදව් වේ. අනෙකුත් කොටස්කරුවන් සම්බන්ධ කර ගැනීම සඳහා, කලින් සිට පැවත එන යන්ත්‍රණයන් යොදා ගන්නට ද ශිල්ප ක්‍රමයට හැකියාව තිබේ. නිදසුනක් ලෙස ටාගට් 10හි වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ ක්‍රියා දාමය, ප්‍රාදේශීය සහ ජාතික පරිමාණ තලවල දී, කලින් සිට පැවත ආ කොටස්කරුවන්ගේ මෙහෙයුම් කමිටු යොදා ගැනීම දැක්විය හැකි ය.

පවත්නා ව්‍යුහයන් යොදා ගැනීම සඳහා බලපාන දෙවන හේතුවක් වන්නේ, සංවිධානයේ අධිකාර ව්‍යුහය තුළ සිටින්නවුන් සතු වටිනාකම් එළිදරව් කර ගැනීමට උදව් වන්නට, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීමේ ක්‍රියා දාමයට පුළුවන්කම තිබීම යි. එමෙන් ම, එම වටිනාකම් සාකච්ඡාවට සහ වෙනස් වීමට විවෘත කිරීමට උදව් වන්නට තේරීමේ ක්‍රියා දාමයට පුළුවන්කම තිබීම යි.

අනෙක් අතට, වඩා පුළුල් ඉදිරි දැක්මක් අවශ්‍ය කරන තැන්වල දී හෝ කොටස්කරුවන්ගේ විවිධ කණ්ඩායම්වල ඉදිරි දැක්මවල් ඉස්මත්තට ගැනීමට අවශ්‍ය කරන තැන්වල දී, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීම සඳහා නව ව්‍යුහයන් නිර්මාණය කිරීම ප්‍රයෝජනවත් විය හැකි ය. වීඑස්ඕ සංවිධානය, විවිධ අංශවලට අයත් ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලවල සාමාජිකයන් (නිදසුනක් ලෙස, වෙළඳ, මූල්‍ය, වැඩ සටහන්), අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීමේ තනි කණ්ඩායමක් තුළ එක්තැන් කළේ ය. සීසීඩීබීයේ දී, ආධාර දෙන්නන් සමග පැවැත්වූ වාර්ෂික වටමේස සාකච්ඡාව, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීමේ වෙනස් කණ්ඩායම් පහක් යොදා ගත්තේ ය. එනම්, ප්‍රතිලාභීන්, කනිෂ්ඨ කාර්ය මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය, සහ ආධාර දෙන්නන්ගේ කණ්ඩායම් දෙකක් නියෝජනය කළ කණ්ඩායම් පහක් යොදා ගත්තේ ය.

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීමේ සංකීර්ණ ක්‍රියා දාමයක් සැලසුම් කරන්නට පෙර, සරල ක්‍රමයකින් ශිල්ප ක්‍රමය අත්හදා බලන ලෙස අපි ඔබ උනන්දු කරන්නෙමු. ශිල්ප ක්‍රමය අත්හදා බලා, සංවිධානීය මට්ටමේ ව්‍යුහයක් සැලසුම් කිරීමේ සූදානම ඇති කර ගත් විට, ඔබ විසින් සැලකිල්ලට ගත යුතු විය හැකි දෑ කීපයක් තිබේ.

- ප්‍රාරම්භක වශයෙන් අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් ප්‍රලේඛනය කරන ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට ඉහළින්, තේරීම් තල කීයක් තිබිය යුතු ද? සංවිධානය තුළ දැනට පවතින කළමනාකරණ ස්තර සංඛ්‍යාව මත මෙය සාමාන්‍යයෙන් රඳා පවතී.

- මෙම එක් එක් තලයේ දී, වෙන් වෙන් තේරීම් ක්‍රියා දාමයන් කීයක් තිබිය යුතු ද? (තනතුර හෝ විශේෂඥ භාවය මත පදනම්ව ගත් කල) එක් එක් තලය තුළ සිටින තනි තනි නිලධාරීන් සංඛ්‍යාව මත මෙය රඳා පවතී.

- මෙම එක් එක් තලයේ දී, ඊට සම්බන්ධ වන කාර්ය මණ්ඩලයට, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් කීයක් හසුරුවා ගත හැකි වේ ද? එකට මුණ ගැසී, පැය දෙකකට නොවැඩි උපරිම කාල සීමාවක් තුළ දී, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීමේ වැඩ කටයුතුවල යෙදිය යුතු යැයි කාර්ය මණ්ඩලයෙන් බලාපොරොත්තු වීම යථාර්ථවත් නො වේ. සමාලෝචනය කිරීම සඳහා වෙනස් වීම බලපෑ ක්ෂේත්‍ර හතරක් පවතින්නේ නම්, එහි තේරුම වන්නේ, එක් එක් ක්ෂේත්‍රයට ලැබෙන්නේ මිනිත්තු 30ක් බව යි. එක් එක් බලපෑම් ක්ෂේත්‍රයට අදාළව,

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් 10කට නොවැඩි ගණනක් කියවා සාකච්ඡා කරන්නට අරමුණු කෙරේ.

- එක් එක් තේරීම් ක්‍රියා දාමයේ දී සහභාගි විය යුත්තේ කවුරුන් ද? මෙම පැතිකඩ පිළිබඳව පහත දී වඩා සවිස්තරාත්මකව ආවරණය වේ.

- කොතරම් නිරන්තරව තේරීම සිදු කළ යුතු ද? අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් රැස් කරන නිරන්තර භාවය මත මෙම තීරණය සාමාන්‍යයෙන් රඳා පවතී (තුන් වන පියවර බලන්න).

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ මුල් කතා පුවත් හඳුනා ගැනීම තනි තනි ක්ෂේත්‍ර ක්‍රියාකාරකයන් අතින් සිදු විය හැකි ය. එහෙත්, ධුරාවලියෙහි එක් එක් තලයේ දී සිදු වන තේරීම් ක්‍රියා දාමයන්ට සම්බන්ධ වන්නේ තනි පුද්ගලයන් නො වේ. සාමාන්‍යයෙන් පුද්ගල කණ්ඩායම් ය. තේරීම් ක්‍රියා දාමයට ඇතුළත් විය යුත්තේ තනිව තීරණ ගැනීමක් නො වේ. විවෘත විවාදයකි.

## තේරීම් ක්‍රියා දාමයට සම්බන්ධ විය යුත්තේ කවුරුන් ද?

අවම වශයෙන්, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් ඉදිරිපත් කොට තිබෙන ජනයාට සම්බන්ධිතව රේඛීය කළමනාකරණ වගකීම් ඇති ජනයා විය යුතු ය. එම කාර්ය මණ්ඩලයට මත්, සාමාන්‍යයෙන් කතා පුවත් ඉදිරිපත් කළ ජනයාගෙන් ලැබෙන තොරතුරු යොදා ගන්නා අනෙකුන්ටත් සම්බන්ධිතව, උපදේශන සැපයීමේ වගකීම දරන පුද්ගලයන් ද ඇතුළත් කර ගැනීම වඩා යහපත් විය හැකි ය. සැබවින් සිදු වන ආකාරය අනුව ගත් විට, ඉහළින් ම පිහිටි තලයට සම්බන්ධ වනු ඇත්තේ, ආධාර දෙන්නන්, ආයෝජකයන් සහ කොටස්කරුවන්ගේ වෙනත් නියෝජිතයන් ය.

තේරීම් සහ ප්‍රතිපෝෂණ ක්‍රියා දාමයේ දී ප්‍රතිලාභීන් සම්බන්ධ කර ගැනීමට බොහෝ හේතු පැවතියත්, සැලකිල්ලට ගත යුතු ඇතැම් අවදානම් ද තිබේ. පළමුව, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට ගෙවීම් කරන ආකාරයෙන් ප්‍රතිලාභීන් යොදන කාලය වෙනුවෙන් ගෙවීම් නොකරනු ඇති නිසා, කතා පුවත් රැස් කොට තෝරන ලෙස ප්‍රතිලාභීන්ගෙන් ඉල්ලා සිටීම ආචාර ධර්ම විරෝධී බර පැටවීමක් ලෙස දැක ගන්නට ඉඩ තිබේ.

එමෙන් ම, තේරීම් ක්‍රියා දාමයට සම්බන්ධ කළ යුත්තේ කුමන ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය ද යන්න සැලකිල්ලට ගැනීම ද ප්‍රයෝජනවත් ය. ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය, බොහෝ දුරට තමන් විසින් ම රචනා කරන ලද කතා පුවත් තේරීමෙහි ලා තමන් ම සම්බන්ධ වන විට, අපහසු තත්ත්වයක් ඇති විය හැකි ය. විවිධ පුද්ගලයන් කතා පුවත් රචනා කොට තිබෙන විට තේරීම පහසු වන බවක් පෙනේ. ස්වයං තේරීම පිළිගන්නේ ද නැද්ද යන්න සංවිධානයේ නිපුණතාව මත රඳා පවතින බවක් පෙනී යයි. ඒ ගැන සැකයක් ඇති විට, රචනා කළ පුද්ගලයන් හැරුණු විට සිටින අනෙකුත් ජනයාට, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වලින් වැඩි ප්‍රමාණයක් තෝරන්නට ඉඩ ලැබෙන පරිදි ව්‍යුහයක් සැලසුම් කිරීම වඩා යහපත් වන්නට ඉඩ තිබේ.

සීසීඩීබීය ද ඇතුළු ඇතැම් උදාහරණවල දී, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් ප්‍රලේඛනය කිරීමට සම්බන්ධ වූ පුද්ගලයෝ ම, සිය කළමනාකරුවන් සමග එක්ව අනතුරුව සිදු වන දිස්ත්‍රික්ක මට්ටමේ තේරීම් ක්‍රියා දාමයට ද සම්බන්ධ වී සිටිති. එහෙත් ඩකා මට්ටමට යන විට, ඊළඟ තලය ඉහළට ගැනුණි. තේරීම් ක්‍රියා දාමයට සම්බන්ධ වූයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය පමණකි.

**සානාවඃ කතා පුවත් තේරීම සමග බැඳී පැවති අපහසුතා**

"කතා පුවත්වල කතුවරුන් ද ඇතුළත් කර ගනිමින් සංසදයක දී කතා පුවත් පිළිබඳව සාකච්ඡා කිරීම, යම් ආකාරයක අපහසුතාවක් ඇති කරන බව ඔප්පු විය. පහසුකම් සපයන්නන්ගේ වැඩ කටයුතු (නැත් නම් තමන්ගේ දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් ඔවුන් කරන යෙදවුම්වල ඵලදායකත්වය) පරීක්ෂණයට ලක් වන බවක් පෙනී ගියේ ය. කෙසේ වෙතත්, මෙම අපහසුතාව ජය ගන්නට අපි උත්සාහ දැරුවෙමු. තත්ත්වය කුමක් වුව ද, ව්‍යායාමය මුදුන් පමුණුවා ගත්තෙමු. එහෙත් කිසි විටෙකත්, නිසි පරිදි එම අපහසුතාව ආමන්ත්‍රණය නොකෙරුණි. තමන්ට අදාළ තත්ත්වයට නො ව, ව්‍යාපෘතියට වඩාත් ම අර්ථාන්විත වන කතා පුවත් හඳුනා ගැනීම උදෙසා, තමන්ගේ අවබෝධයන්ගෙන් මඳක් ඈත් වී, වඩා පුළුල් ඉදිරි දැක්මකින් යුතුව සියලු කතා පුවත් පිරික්සා බලන ලෙස කතා පුවත්වල කතුවරුන්ගෙන් ඉල්ලා සිටීම, අසාධාරණ බව පෙනී යයි. තේරීම් කණ්ඩායම වඩා කුඩා වූ විට, සහ තමන්ගේ කතා පුවත්වලට සගයන් 'කැමති කරවා ගන්නට' හෝ සගයන් කෙරෙහි ත්‍යාගශීලී වී තමන්ගේ ම දිස්ත්‍රික්කය පහත හෙළීම වෙනුවෙන් පෙනී සිටින්නට කතුවරුන්ට බල කෙරුණු විට, මෙය විශේෂයෙන් ම නොගැළපෙනසුලු තත්ත්වයකට පත් විය!" *(ජොන්ස්ටන්, 2002:8).*

## කතා පුවත් තෝරා ගත යුතු ආකාරය

කතා පුවත් තේරීමට සාමාන්‍යයෙන් සම්බන්ධ වන්නේ, බලපෑම් ක්ෂේත්‍රවලට වෙන් කළ හෝ නොකළ ප්‍රලේඛනය කරන ලද කතා පුවත් ගොන්නක් සහිතව එකට වාඩි ගත් පුද්ගලයන් කණ්ඩායමකි. කටයුත්ත වන්නේ, එක් බලපෑම් ක්ෂේත්‍රයක් සඳහා එක් කතා පුවතක් වන සේ කතා පුවත් ගොන්න අඩු කිරීම යි. කණ්ඩායම, එක් එක් බලපෑම් ක්ෂේත්‍රයට සම්බන්ධිතව, සියලු වෙනස් වීම් අතුරින් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම වන්නේ යැයි තමන් විශ්වාස කරන කතා පුවතක් තෝරා ගනු ඇත. කතා පුවත් බලපෑම් ක්ෂේත්‍රවලට වෙන් කොට නැත් නම්, පළමුවෙන් ම කළ යුතු එක් කටයුත්තක් වන්නේ එය යි.

තේරීම් ක්‍රියා දාමය අනිවාර්යයෙන් ම ආරම්භ වන්නේ, කතා පුවත් සමහරක් හෝ සියල්ල ම, හඬ නගා හෝ තනි තනිව කියවීමෙනි. කතා පුවත් හඬ නගා කීමෙන් ඒවාට ජීවමාන බවක් ලැබෙන නිසා ඊට කැමති වන්නට අපි නැඹුරු වෙමු. එහෙත්, මෙහි ඵලදායකත්වය සහ ප්‍රායෝගිකත්වය අදාළ තත්ත්වය මත රඳා පැවතිය හැකි ය. කතා පුවත් දැනට මත් බලපෑම් ක්ෂේත්‍ර අනුව වෙන් කොට ඇත් නම්, එක් බලපෑම් ක්ෂේත්‍රයකින් එන සියලු කතා පුවත් එකට ගෙන සලකා බලනු ලැබේ. කතා පුවත් අතුරින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත තෝරා ගැනීම සඳහා කණ්ඩායම්වලට උදව් වන්නට, පහසුකම් සැපයෙන හෝ නොසැපයෙන විවිධ ක්‍රියා දාමයන් යොදා ගත හැකි ය. අනතුරුව, තෝරා ගැනීම සඳහා බලපෑ හේතු ප්‍රලේඛනය කරනු ලැබේ. ඔබේ සංස්කෘතික තත්ත්වයට හොඳින් ම ගැළපෙන තේරීම් ක්‍රියා දාමය සොයා ගැනීම සඳහා, විවිධ තේරීම් ක්‍රියා දාමයන් අත්හදා බලන ලෙස අපි ඔබ දිරිමත් කරන්නෙමු.

කතා පුවත් තේරීමේ දී විවිධ ක්‍රියා දාමයන් යොදා ගත හැකි ය. එහෙත්, කතා පුවත් තේරීමේ මූලික අංගෝපාංග වන්නේ මේවා යඃ

- සෑම කෙනෙක් ම කතා පුවත් කියවයි
- තෝරා ගත යුත්තේ කුමන කතා පුවත් ද යන්න ගැන කණ්ඩායම සවිස්තරාත්මක සාකච්ඡාවක් පවත්වයි
- වඩාත් ම අර්ථාන්විත යැයි හැඟෙන්නේ කුමන කතා පුවත් දැයි කණ්ඩායම තීරණය කරයි
- කණ්ඩායමේ තේරීම(ම්) සඳහා බලපෑ හේතු ප්‍රලේඛනය කෙරේ.

## අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීමේ මිනුම් දණ්ඩ

කළ යුතුව තිබෙන එක් තෝරා ගැනීමක් නම්, කතා පුවත් තේරීම සඳහා මිනුම් දණ්ඩක් හඳුනා ගත යුත්තේ ඒවා කියවන්නට පෙර ද පසු ද යන්න යි. මිනුම් දණ්ඩ සම්බන්ධයෙන් කල් තබා එකඟතාවකට පැමිණ ඇත් නම්, දැන සිටින්නේ යැයි සංවිධානය දැනට මත් සිතා ගෙන සිටින දේවල් මගින්, (අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීම තුළින්) ඉගෙනීමේ ක්‍රියා දාමය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති වනු ඇත. කතා පුවත් කියවා හමාර කරන තෙක්, තේරීමේ මිනුම් දණ්ඩ විය යුත්තේ කුමක් දැයි සාකච්ඡාවට ලක් නොවන විට, ක්‍රියා දාමය නව අත්දැකීම්වලට වඩාත් විවෘත වන තත්ත්වයට පත් වෙයි. මෙහි දී, පුද්ගල පක්ෂපාතී භාවයන් ද අදාළ විය හැකි ය. කල් තබා අර්ථදැක්වීමක් කළ හෝ නොකළ මිනුම් දණ්ඩක් යොදා ගනිමින් විනිශ්චයක් සිදු කරන විට, පුද්ගලයන් තුළ බලපවත්වන සුවපහසුවේ තරම පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් ය. මෙහි තෝරා ගැනීමක් පවතියි. එහෙත්, ශිල්ප ක්‍රමය යොදා ගනු ලබන්නේ සංවිධානීය ඉගෙනීමට ආධාර කරන්නට නම්, තේරීමේ මිනුම් දණ්ඩ කල් තබා තීරණය නො කළ යුතු යැයි ද, වාර්තාගතව ඇති වෙනස් වීම් පිළිබඳව කෙරෙන සාකච්ඡාව තුළින් එය මතු වී ආ යුතු යැයි ද, අපි විශ්වාස කරමු.

තෝරා ගත යුත්තේ කුමන කතා පුවත් ද යන්න ගැන තීරණයකට ළඟා වීමේ ක්‍රම කීපයක් තිබේ.

### *බහුතර ක්‍රමය*

තීරණයකට ළඟා වීමේ සරල මගක් වන්නේ, කතා පුවත් කියවා, ඒවා සෑම දෙනාට ම අවබෝධ වූයේ ද යන්න සහතික කොට ගෙන, අනතුරුව අත් ඔසොවා ඡන්දය දීම යි. මෙහි පවතින ප්‍රධාන අවදානම නම්, කවරාකාරයේ හෝ සැලකිය යුතු සාකච්ඡාවක් ඇති නො වී තෝරා ගැනීමක් කෙරෙනු ඇත යන්න යි. ජනයාගේ තෝරා ගැනීම් පිටුපස පවතින වටිනාකම් සහ උපකල්පනයන් හෙළි කර ගන්නට උදව් වන නිසා, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ විවිධ කතා පුවත්වල පවතින වටිනාකම් පිළිබඳව ඉදිරිපත් වන තර්ක වැදගත් වේ. සැබෑ වටිනාකම පවතින්නේ කුමක ද යන්න ගැන වඩා දැනුවත් තෝරා ගැනීමක් කරන්නට සහභාගිකයන්ට හැකි වන්නේ, මෙම තර්ක කිරීම් සිදු වන විට පමණකි.

### *නැවත නැවතත් ඡන්දය ප්‍රකාශ කිරීම*

පළමු වරට ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව නැවත නැවතත් ඡන්දය ප්‍රකාශ කිරීමේ දී, තමන් එලෙස ඡන්දය ප්‍රකාශ කළේ ඇයි ද යන්න ගැන ජනයා තුළ සාකච්ඡාවක් ඇති වේ. ඒකමතික භාවයක් ඇති කර ගැනීම කරා වූ යම් පෙළඹවීමක් ද සහිතව, අනතුරුව දෙවන, සහ ඊළඟට තෙවන ඡන්දයක් පැවැත්වේ. ඇතැම් අවස්ථාවල දී, බහුතරයේ අදහසට එකඟ නොවූ සහභාගිකයන්, අවසානයේ එකඟ වන්නට තීරණය කරනු ඇත. එසේ කරන්නට ඔවුන් අකමැති තැන්වල දී, කණ්ඩායමේ ප්‍රධාන විනිශ්චය සම්බන්ධයෙන් කළ වැදගත් අනතුරු ඇඟවීමක් හැටියට, ඔවුන්ගේ විරුද්ධ අදහස් වාර්තා කොට ගත හැකි යː නිදසුනක් ලෙස, කතා පුවතේ ප්‍රධාන අරමුණ ව්‍යාකූල කළ හෝ ප්‍රධාන අරමුණට ප්‍රතිවිරුද්ධ වූ පැතිකඩක් සම්බන්ධයෙන් එසේ කළ හැකි ය. තමන්ගේ අදහස් සම්බන්ධයෙන් කණ්ඩායම් වඩාත් සමාන ලෙස භේද වී සිටින තැන්වල දී කතා පුවත් දෙකක් තෝරා ගත යුතු ය. නැවත නැවතත් ඡන්දය ප්‍රකාශ කිරීම කාලය කා දමන්නක් විය හැකි මුත්, එය හොඳ ගුණාත්මක බවකින් යුතු විනිශ්චයන් පෝෂණය කරයි.

### *ලකුණු දීම*

ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවට, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ යම් කතා පුවතක පවතින වටිනාකම කුමක් ද යන්න ගැන තක්සේරුවක් කරන්නට සහභාගිකයන්ට පුළුවන්කම තිබේ. අනතුරුව, එක් එක් කතා පුවත සම්බන්ධයෙන් කළ තක්සේරු කිරීම් එක්රැස් කොට, ඉහළ ම තක්සේරු කිරීමක් ලද කතා පුවත වඩාත් ම අර්ථාන්විත කතා පුවත ලෙස තෝරා ගනු ලැබේ. කඩිනමින් විනිශ්චයන්ට එළඹීමේ අවශ්‍යතාව ගැන කතා කරන්නේ නම්, මෙය නිකම් ම අත් එසවීමකට වඩා විචක්ෂණ ක්‍රමයක් වේ. එමෙන් ම, එය මුහුණට මුහුණ ලා පැවැත්වෙන රැස්වීම්වල දී මෙන් ම, දුරස්ථ රැස්වීම්වල දී ද යොදා ගත හැකි විධික්‍රමයකි. තක්සේරු කිරීම් කරන ගමන් ම ඒ සඳහා හේතු පැහැදිලි කිරීම් ද කළ හැකි මුත්, එහි පවතින දුර්වල පැතිකඩ වන්නේ, සංවාදය සඳහා ලැබෙන අවස්ථාව සීමිත වී යාම යි. යම්

සහභාගිකයෙකු, අනෙකුත් සහභාගිකයන්ට වඩා බෙහෙවින් ඉහළ මට්ටමකින් හෝ පහළ මට්ටමකින් අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවතක් තක්සේරු කරන විට, පැහැදිලි කිරීම් විශේෂයෙන් ම වැදගත් වේ.

### *කලින් ලකුණු දී අනතුරුව කණ්ඩායමක් ලෙස ඡන්දය ප්‍රකාශ කිරීම*

මෙය, රැස්වීම සඳහා අවශ්‍ය කරන කාලය පිළිබඳ හිඟපාඩුවක් ඇති කණ්ඩායම්වලට ගැළපෙන විධික්‍රමයකි. රැස්වීමට පෙර අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් කියවා ඒවායේ අර්ථාන්විත භාවය තක්සේරු කරන ලෙස සහභාගිකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අනතුරුව මෙම තක්සේරු කිරීම් වගුවක් තුළට හකුළුවා, මුහුණට මුහුණ ලා මුණ ගැසෙන අවස්ථාවේ දී සහභාගිකයන්ට ඉදිරිපත් කරනු ලැබේ. සහභාගිකයෝ ලකුණු පිළිබඳව සාකච්ඡාවක යෙදී, ඉන් පසුව තමන්ගේ ඡන්දය ප්‍රකාශ කරති. කලින් ලකුණු දීම මගින්, සහභාගිකයන් රැස්වීමට පෙර කතා පුවත් කියවා තිබේ ය යන්න සහතික වේ. එය, රැස්වීමේ දී කෙටි වූත් වඩා කේන්ද්‍රගත වූත් කණ්ඩායම් සාකච්ඡාවක් ඇති වන්නට හේතු විය හැකි ය. අවාසිය නම්, රැස්වීමට යම් කලකට පෙර සියලු කතා පුවත් සහභාගිකයන් වෙත යවන්නට සිදු වීම යි.

### *රහස් ඡන්දය*

නිර්ණාමිකව ඡන්දය ප්‍රකාශ කරන්නට ද හැකියාව තිබේ. එක් එක් පුද්ගලයා අර්ථාන්විත කතා පුවත් පිළිබඳ තමන්ගේ තේරීම කඩදාසි තීරුවක ලියයි. අනතුරුව මුළු ඡන්ද ප්‍රමාණය ඉදිරිපත් කරනු ලැබේ. ඉන් පසුව, තේරීම සඳහා බලපෑ හේතු පිළිබඳ විවෘත සාකච්ඡාවක් කළ යුතු ය. මෙම ක්‍රියා දාමය අනපේක්ෂිත අයුරින් ප්‍රයෝජනවත් වන්නට ඉඩ තිබේ. කණ්ඩායම තුළ බලය අතින් අසමානතාවන් පවතී නම්, හෝ ජනයා මුලින් සිය ඡන්දය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට නොකැමති වූයේ නම්, මෙය විශේෂයෙන් ම ප්‍රයෝජනවත් විය හැකි ය.

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය තුළ දී, විනිවිද භාවය යනු ආත්මීය වශයෙන් (මනෝමූලික වශයෙන් - subjectively) වගකිව යුතු තත්ත්වයක් ඇති කිරීමේ වැදගත් ක්‍රමයක් බව මතක තබා ගැනීම වැදගත් ය. එම නිසා, තෝරා ගැනීම සඳහා බලපෑ හේතු හසු කර ගෙන සාකච්ඡාවට ලක් කරන දෙවන පියවරක් එක් කිරීම ඉතා වැදගත් වේ.

## පහසුකම් සැපයිය යුතු ද නැද්ද?

කතා පුවත් රැස් කිරීමේ ක්‍රියා දාමය වේගවත් කරන්නටත්, කණ්ඩායම් සාමාජිකයන් එක හා සමානව සහභාගිත්වයක් ලබා දෙන බව සහතික කරන්නටත්, පහසුකම් සැපයීමට හැකියාව තිබේ. ඇතැම් තත්ත්වයන් තුළ දී, පිටස්තර පහසුකම් සපයන්නෙක් යොදා ගැනීම ඉතා ප්‍රයෝජනවත් විය හැකි ය. ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කළ ටාගට් 10 උදාහරණයේ දී, කතා පුවත් සම්බන්ධ සියලු සැසි හැසිරවූයේ පුහුණු වූ පහසුකම් සපයන්නන් විසිනි. ටාගට් 10 වැඩ සටහනේ දී යොදා ගත් පහසුකම් සැපයීමේ ක්‍රියා දාමය, **හතර වන උපග්‍රන්ථයෙහි** විස්තර වේ.

කතා පුවත් තේරීම සඳහා හැම විට ම පහසුකම් සැපයිය නොහැකි විය හැකි ය. නොඑසේ නම්, එසේ කිරීම උචිත නො විය හැකි ය. කුඩා, අවිධිමත් කණ්ඩායම් තුළ දී එය අවශ්‍ය නො විය හැකි ය.

## තේරීම් ක්‍රියා දාමයේ ප්‍රතිඵල ප්‍රලේඛනය කිරීම

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ යම් කතා පුවතක් වඩාත් ම අර්ථාන්විත කතා පුවත ලෙස තෝරා ගැනීමට බලපෑ හේතු ප්‍රලේඛනය කළ යුතු ය. ඉන් පසුව ඒවා, ප්‍රාරම්භකව කතා පුවත ප්‍රලේඛනය කළ ජනයා කළ පැහැදිලි කිරීම් ළඟින් කතා පුවතට ඈඳිය යුතු ය. අනතුරුව, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත ද, එය තෝරා ගැනීමට බලපෑ හේතු පිළිබඳ පැහැදිලි කිරීම් ද, තේරීම් ක්‍රියා දාමයේ ඊළඟ තලයක් පවතී නම් ඒ වෙත යවනු ලැබේ. සමාලෝචනය සඳහා අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් සම්පාදනය කළ සියලු ජනයා වෙත, තේරීම් ක්‍රියා දාමයේ ප්‍රතිඵල පිළිබඳව ප්‍රතිපෝෂණ සැපයිය යුතු වේ.

තමන් යොමු කළ කතා පුවත්වලට නොඇඳන ලද පැහැදිලි කිරීම්වලින් පාඨකයාට සැපයෙන්නේ අඩු අවබෝධයකි.

තේරීම සඳහා බලපෑ හේතු ප්‍රලේඛනය කිරීම, සාමාන්‍යයෙන් තේරීම් රැස්වීමක අවසන් කටයුත්ත යි. එනිසා, එය ඉතා කඩිනමින් සිදු කිරීමේත්, රචනා කරන දෙයින් සාකච්ඡාවේ ගැඹුර කෙරෙහි හෝ කළ විනිශ්චයන්හි ගුණාත්මක භාවය කෙරෙහි සාධාරණයක් ඉටු නොවීමේත් අවදානමක් පවතියි. පැහැදිලි කිරීම්, ‘වඩා තිරසර’ හෝ ‘ස්ත්‍රී-පුරුෂ සමානතාව’ වැනි මූලික වචන කීපයකට වඩා වැඩි යමක් විය යුතු ය. තෝරා ගත් අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තුළ පවතින අර්ථාන්විත යැයි දුටු දේ ප්‍රකාශයට පත් කිරීම සඳහා සම්පූර්ණ වාක්‍ය යොදා ගත යුතු ය. කතා පුවතක් තෝරා ගැනීම සාධාරණීකරණය කරන්නට බහුවිධ මිනුම් දඬු යොදා ගත්තේ නම්, ඒවා ලැයිස්තුගත කළ යුත්තේ ඒවායේ සාපේක්ෂ වැදගත්කම පිළිබඳව කෙරෙන පැහැදිලි කිරීමක් ද සමග ය.

> **මියැන්මාරය - තේරීම් සඳහා බලපෑ හේතු වාර්තා කිරීමට අමතක වීම**
> “කුඩා කණ්ඩායම් කතා පුවත් කියවන විට සහ ඒවායේ අර්ථාන්විත භාවය සාකච්ඡා කරන විට, ඔවුන් සමග වාඩි ගන්නා ලෙස මා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයෙන් ඉල්ලා තිබුණි. එහෙත්, මෙය ගැන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ලියූ සටහන්/ප්‍රතිපෝෂණ තිබුණේ ඉතා ම ස්වල්පයක් පමණකි. ඔවුන් කතා පුවත්වලට සවන් දීමට ඕනෑවට වඩා හසු වී සිටි නිසා, ඉන් මඳක් ඈත් වී ඒවායේ වටිනාකම් හඳුනා ගැනීමේ හැකියාව ඔවුන්ට නැති විය” *(ගිලියන් ෆ්ලෙචර්, 2004, කෙයාර්හි එච්අයිවී/ඒඩ්ස් වැඩ සටහනේ උපදේශිකාවකි).*

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ වඩාත් ම අර්ථාන්විත කතා පුවත්වලට ඈඳා ඇති ප්‍රලේඛනය මගින්, කතා පුවත් තෝරා ගැනීමට යොදා ගත් ක්‍රියා දාමය ද වාර්තා විය යුතු ය. මෙමගින්, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් යොදා ගන්නා අනෙකුන් වෙත, අදාළ තත්ත්වය පිළිබඳව වැදගත් අවබෝධයක් සම්පාදනය වේ. තමන් කියවමින් සිටින අර්ථාන්විත වෙනස් වීමේ මූලයන් මොනවා ද යන්න ඔවුන්ට පැහැදිලි වේ.

## තෝරා ගැනීමේ දී තෝරා ඉවත් කළ කතා පුවත්වලට සිදු වන්නේ කුමක් ද?

තෝරා ගැනීමේ දී තෝරා ඉවත් කළ කතා පුවත් අපතේ නො හැරිය යුතු ය. ශිල්ප ක්‍රමය යොදා ගන්නා තාක් දුරට ද, තර්කානුකූලව ගත හොත් ඉන් අනතුරුව කෙටි කලක් ගත වන තුරු පවා ද, ශිල්ප ක්‍රමය යොදා ගන්නා සංවිධානය තුළ සිටින අනෙකුන්ට ප්‍රවේශ විය හැකි වන අයුරින් ඒවා ලිපි ගොනුවල බහා තැබිය යුතු වේ. මෙය, ප්‍රලේඛනය කළ අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ මුළු කතා පුවත් කට්ටලය පිළිබඳව ම යම් විධිමත් විශ්ලේෂණයක් කිරීමට හැකියාව ගෙන දෙයි (මෙම පරිච්ඡේදයෙහි එන නව වන පියවර බලන්න).

සංවිධානයේ ඉහළ මට්ටම්වල දී තෝරා නොගත් අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වලට, ප්‍රාදේශීය වශයෙන් ගත් විට තව මත් යම් වටිනාකමක් පවතින බව සටහන් කර ගැනීම ප්‍රයෝජනවත් ය. අවසානයේ දී වෙනස් අර්ථාන්විත වෙනස් වීමක් වඩාත් අර්ථාන්විත යැයි තීරණය කරනු ලැබුණ ද, හැම කතා පුවතක් ම ඒවා මුලින් ප්‍රලේඛනය කළ පුද්ගලයාට වැදගත් වන අතර, ඉහළ තලවල සිටින අනෙකුන්ට ද ඒවා වැදගත් විය හැකි ය. එවන් කතා පුවත් යොදා ගත් ආකාරය, හෝ ජනයා කළ දේ කෙරෙහි ඒවායින් මොන යම් හෝ බලපෑමක් ඇති වුණා ද නැද්ද යන්න තේරුම් ගැනීම සඳහා, පසු දිනෙක එවන් කතා පුවත් සියල්ල විපරම් කොට බැලීම ප්‍රයෝජනවත් විය හැකි ය.

## 6 වන පියවර: තේරීම් ක්‍රියා දාමයේ ප්‍රතිඵල පිළිබඳව ප්‍රතිපෝෂණ සැපයීම

### ශිල්ප ක්‍රමය තුළ දී ප්‍රතිපෝෂණය ඉටු කරන කාර්ය භාරය

නිරීක්ෂණ, ඇගයීම් සහ ඉගෙනීමේ නැඹුරුවක් ඇති පද්ධති හැමෙකක දී ම ප්‍රතිපෝෂණය වැදගත් වේ. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය ද ඉන් බැහැර නො වේ. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් සම්පාදනය කළවුන් වෙත තේරීම් ක්‍රියා දාමයේ ප්‍රතිඵල ප්‍රතිපෝෂණය කළ යුතු ය. අඩු ම ගණනේ, වඩාත් ම අර්ථාන්විත යැයි තෝරා ගත්තේ අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කුමන කතා පුවත ද, ඒ ඇයි ද යන්න මෙම ප්‍රතිපෝෂණය මගින් පැහැදිලි විය යුතු ය. තේරීම් ක්‍රියා දාමය සංවිධානය කළ ආකාරය පිළිබඳ තොරතුරු සැපයීම ද උදව්වක් වනු ඇත. සීසීඩීබීය ද ඇතුළු ඇතැම් උදාහරණවල දී, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කවර කතා පුවතට, කවුරුන් කුමන තක්සේරුවක් ලබා දුන්නේ ද යන්න පෙන්නුම් කරමින්, සහභාගිකයෝ වගුවල ස්වරූපයෙන් වඩා පුළුල් ප්‍රතිපෝෂණයක් සම්පාදනය කළහ.

ප්‍රතිපෝෂණය ප්‍රයෝජනවත් වන්නේ ඇයි ද යන්නට හේතු කීපයක් දැක්විය හැකි ය. තෝරා ගත්තේ අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කුමන කතා පුවත ද යන්න ගැන සැපයෙන තොරතුරුවලට, ඊළඟ වාර්තාකරණ කාල සීමාවේ දී අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් සඳහා සහභාගිකයන් කරන සොයා යාමට ආධාර කළ හැකි ය. හේතු අතුරින් වඩාත් ම වැදගත් හේතුව වන්නේ එය යි. යම් විශේෂ ස්වරූපයක වෙනස් වීමක් අගය කරනු ලබන්නේ යැයි දැන ගැනීම, ප්‍රදේශය තුළ සිදු වන ඒ හා සමාන වෙනස් වීම් තව දුරටත් සොයා යාමට තුඩු දිය හැකි ය. අතිශයින් ම අවශ්‍ය යැයි පෙනී යන තැනට, සොයා යාමේ අවධානය මාරු කළ හැකි ය. යම් තේරීමක් කළේ ඇයි ද යන්න ගැන සැපයෙන ප්‍රතිපෝෂණයකට, වැදගත් වන්නේ කුමක් ද යන්න සම්බන්ධයෙන් සහභාගිකයන් තුළ පවත්නා අදහස් පුළුල් කරන්නට හෝ ඒවාට අභියෝග කරන්නට හැකියාව තිබේ. තමන් සාමූහිකව කළ විනිශ්චයන්හි ගුණාත්මක භාවය කවරේ ද යන්න තක්සේරු කිරීම සඳහා සහභාගිකයන්ට උදව් වන්නට, තේරීම් ක්‍රියා දාමය පිළිබඳව සපයනු ලබන ප්‍රතිපෝෂණයට පුළුවන්කම තිබේ. එමෙන් ම, නිකම් ම ලිපිගොනු තුළ බහා තැබීම, නිරීක්ෂණ දත්ත විශාල ප්‍රමාණයකට අත් විය හැකි අවාසනාවන්ත ඉරණමකි. ඒ වෙනුවට, අනෙකුන් අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් කියවා ඇති බව සහ ඒවා සම්බන්ධ වැඩ කටයුතුවල යෙදී ඇති බව ප්‍රතිපෝෂණයෙන් පෙන්නුම් කෙරේ.

තෝරා ගත්තේ කුමක් ද, ඇයි ද, කෙසේ ද යන්න ගැන ප්‍රතිපෝෂණ සම්පාදනය කිරීම මගින්, සංවිධානයක් තුළ සිටින විවිධ තලවලට අයත් සහභාගිකයන් අතර සන්නිවේදන දාමයේ පුරුක් සම්පූර්ණ කිරීමේ හැකියාව ඇති විය හැකි ය. එසේ කිරීමෙන්, අර්ථාන්විත වෙනස් වීම යනු කුමක් ද යන්න ගැන ක්‍රියාකාරී සාකච්ඡාවක් ඇති කරන්නට ඊට හැකියාව තිබේ.

**ඩෙන්මාර්කයේ අයිබිස් සංවිධානය - ප්‍රතිපෝෂණය ද නැත් නම් යටි අතට ක්‍රියාත්මක වන වගකීම් සහගත භාවය ද?**

2004 ඔක්තෝබරයේ දී පැවැත්වූ වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය පිළිබඳ පුහුණු වැඩ මුළුවක දී, අයිබිස් කාර්ය මණ්ඩල සාමාජිකයෙක් මෙසේ අදහස් දැක්වී ය: "ප්‍රතිපෝෂණය කියල හැඳින්වෙන්නෙ යටි අතට ක්‍රියාත්මක වන වගකීම් සහගත භාවය. ඒක ලබා ගන්න පුළුවන් වුණොත් ඔබ වාසනාවන්ත යි." මෙම ගැටලුව වඩා සෘජුව ආමන්ත්‍රණය කිරීමට පවතින එක් මගක් විය හැක්කේ, 'ප්‍රතිපෝෂණය' විකල්ප අංගයක් ලෙස සැලකිල්ලට නොගැනීම යි. ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළ පවතින මෙම අදියර, "යටි අතට ක්‍රියාත්මක වන වගකීම් සහගත භාවය" ලෙස නම් කිරීම යි, එමගින්, අනෙකුන් විසින් (ශිල්ප ක්‍රමය පිළිබඳව) ගන්නා ලද තීරණ ගැන දැනුවත් වන්නට තිබෙන අයිතිය ඇති කොට තහවුරු කළ හැකි වේ *(රික් ඩේවිස්, 2004)*.

## ප්‍රතිපෝෂණ සැපයිය හැකි විවිධ ක්‍රම

වාචිකව හෝ විද්‍යුත් තැපැල, පුවත් හසුන් සහ නිල වාර්තා මාර්ගයෙන් ප්‍රතිපෝෂණ සම්පාදනය කළ හැකි ය. සීසීඩීබීය පිළිබඳ උදාහරණයේ දී, හැම තේරීම් රැස්වීමකට පසුව ම නිල වාර්තා සම්පාදනය විය. වාගට් 10 උදාහරණයේ දී, ප්‍රාදේශීය තලයට වාචිකවත් වැඩ සටහන් කාර්ය මණ්ඩලයට විද්‍යුත් තැපැල මගිනුත් ප්‍රතිපෝෂණ සම්පාදනය වූ අතර, වසරකට පසුව, අරමුදල් සපයන්නන්ගේ ප්‍රතිපෝෂණ ද ඇතුළත් වූ නිල වාර්තාවක් ඉදිරිපත් කෙරිණ. ශිල්ප ක්‍රමය යොදා ගන්නා සමහර සංවිධාන, තෝරා ගත් කතා පුවත් සහ තමන්ගේ තේරීම් කෙරෙහි බලපෑ හේතු, සියලු සහභාගිකයන් වෙත බෙදා හැරෙන ප්‍රජා පුවත් හසුන්වල පළ කොට තිබේ. එමෙන් ම, සංයුක්ත තැටි, අන්තර් ජාලය හෝ ඡායාරූප, විඩියෝ පට, හෝ නාට්‍යමය ප්‍රතිරූපණ බඳු කලාමය ක්‍රියාකාරකම් මගින් ද තේරීම් ක්‍රියා දාමයේ ප්‍රතිඵල පතළ කළ හැකි ය.

### *ප්‍රතිපෝෂණයෙන් ප්‍රජාවට අත් වන ප්‍රතිලාභ*

ප්‍රජා පුවත් හසුන් වැනි පුළුල් සංසදයන් තුළ ප්‍රතිපෝෂණ පළ කිරීමෙන් බොහෝ ප්‍රතිලාභ ඇති වේ. සාර්ථකත්වය පිළිබඳ කතා පුවත් කියවීමට සැලැස්වීම මගින් ජනයා තුළ පෙළඹවීමක් ඇති කළ හැකි අතර, තමන්ට තමන්ගේ අරමුණු කරා ළඟා විය හැකි වනු ඇත්තේ කෙසේ ද යන්න ගැන එමගින් සහභාගිකයන්ට අදහස් ලබා ගත හැකි වේ. මුදුන් පමුණුවා ගත් දේ සම්බන්ධයෙන් පැවැත්වෙන ප්‍රීති උත්සවයක ස්වරූපයෙන්, කාර්ය මණ්ඩලයේ සහ සහභාගිකයන්ගේ චිත්ත ධෛර්යය ඉහළ නංවන්නට ඊට හැකියාව තිබේ. එමෙන් ම, ක්‍රියා දාමය වඩා විනිවිද පෙනෙන තත්ත්වයට පත් කරන්නට ද ඊට පුළුවන. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ මෙම කතා පුවත් තෝරා ගැනීම කෙරෙහි බලපෑ හේතු සමග මෙම කතා පුවත් පුවත් හසුන් තුළ පළ කෙරෙන්නේ නම්, මෙම විනිවිද පෙනෙන තත්ත්වය විශේෂයෙන් ම ඇති කළ හැකි වේ.

### *ප්‍රජාවට ප්‍රතිපෝෂණ ලබා දීමෙන් මතු විය හැකි අවදානම්*

වැඩ සටහනක ප්‍රකාශිත අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා ප්‍රයත්න දැරීමේ වගකීමක් ක්ෂේත්‍ර ක්‍රියාකාරකයන්ට පැවතුණ ද, ප්‍රතිලාභීන්ට එවන් වගකීමක් නො පැවතිය හැකි ය. වැඩ සටහන් කණ්ඩායම විසින් අගය කරනු ලබන්නේ සහ නොකරනු ලබන්නේ කුමන වෙනස් වීම් ද යන්න ගැන ප්‍රජාවට ප්‍රතිපෝෂණ ලබා දීම, පුද්ගලයන් සහ ප්‍රජාවන් වර්ධනය විය යුතු ආකාරය ඔවුන්ට කීමට වැඩ සටහන ගන්නා උත්සාහයක් ලෙස අර්ථදැක්වෙන්නට ඉඩ තිබේ.

මෙම අවදානම ජය ගත හැකි එක් ක්‍රමයක් වන්නේ, අවසන් කතා පුවත් තේරීමේ දී ප්‍රතිලාභීන් කීප දෙනෙකු ඊට සම්බන්ධ කර ගැනීම යි. එවිට වැඩ සටහන් කාර්ය මණ්ඩලයෙන් මෙන් ම ප්‍රතිලාභීන්ගේ නියෝජිතයන්ගෙන් ද, තෝරා ගත් කතා පුවත් පිළිබඳ ප්‍රතිපෝෂණ මතු වී එන්නේ ය. නිදසුනක් ලෙස, සීසීඩීබීය පිළිබඳ උදාහරණයේ දී, 'ජයග්‍රාහී' කතා පුවත් තේරූ අරමුදල් සපයන්නන්ගේ මණ්ඩලය සමග එක පෙළට, එම කතා පුවත් ම පරීක්ෂාවට ලක් කොට වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම් යැයි තමන්ට හැඟුණු වෙනස් වීම් තේරූ ප්‍රතිලාභීන්ගේ මණ්ඩලයක් ද පැවතුණි. අනතුරුව මණ්ඩල දෙක තමන්ගේ තීරණ හුවමාරු කර ගත්තේ ය. මෙලෙස ම වාගට් 10 උදාහරණයේ දී ද, අරමුදල් සපයන්නන්ට සමාන්තරව හිඳිමින් ගොවීන්ගේ මණ්ඩලයක් කතා පුවත් තේරී ය.

# 7 වන පියවරඃ කතා පුවත්වල සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම

## සත්‍යාසත්‍යතාව පරීක්ෂා කළ යුත්තේ ඇයි?

නිසි තත්ත්වය තුළ දී, සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම අතිශයින් ප්‍රයෝජනවත් විය හැකි ය. විශේෂයෙන් ම විශාල සංවිධාන තුළ, වාර්තා වූ වෙනස් වීම් තුළින් සැබවින් ම සිදු වූ දේ පිළිබිඹු නොවී, ඒ වෙනුවට පහත දැක්වෙන දෑ පිළිබිඹු වීමේ අවදානමක් හැම විට ම පවතියිඃ

- කාලය ඉතිරි කර ගැනීම සඳහා හෝ පිළිගැනීම ලබා ගැනීම සඳහා, හිතාමතා ප්‍රබන්ධ කළ කතා පුවත් ඉදිරිපත් කිරීම

- වැරදි ලෙස අවබෝධ කොට ගත් සැබෑ සිදුවීම් විස්තර කිරීම

- සිදුවීම්වල අර්ථාන්විත භාවය අතිශයෝක්තියට නැංවීම.

වෙනස් වීමක් ප්‍රලේඛනය කෙරුණු ආකාරය අනුව, වාර්තා වූ යම් වෙනස් වීමක් මුලින් ප්‍රකට වන විට තිබුණාට වඩා වැඩි වැදගත්කමක් ඊට අත් විය හැකි ය. වාර්තා වූ සිදුවීම පිළිබඳව වැඩි දුර පරීක්ෂා කිරීමක් කරන තෙක්, ඊට අදාළ වැදගත් විස්තර සහ ඒවායේ පුළුල් ඇඟවුම් සැඟවී තිබිය හැකි ය.

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වල සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රියා පටිපාටි පවතින බව සහභාගිකයන් දැන සිටින විට, ප්‍රතිවිපාක කීපයක් අත් විය හැකි ය. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් සැපයීමට දායක වන්නන්, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ තමන්ගේ කතා පුවත් ප්‍රලේඛනය කරන ආකාරය පිළිබඳව වඩා පරෙස්සම් සහගත විය හැකි ය. මෙය, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වල සමස්ත ගුණාත්මක භාවය වැඩි දියුණු වීමට උදව් විය හැකි ය. සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ ක්‍රියා දාමයක් පැවතීමෙන්, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති පිවිසුම යොදා ගෙන කරනු ලබන සොයා ගැනීම්වල අර්ථාන්විත භාවය පිළිබඳව පිටස්තර පාර්ශ්වයන්ට වැඩි විශ්වාසයක් ගෙන දෙන්නට ද ඉඩ තිබේ.

අනෙක් අතට, විධිමත් අයුරින් කළමනාකරණය නො කළ හොත්, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් පිළිබඳ යම් ආකාරයක සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමක් ආරම්භ කිරීම මගින් සෘණාත්මක ප්‍රතිවිපාක අත් වන්නට ඉඩ තිබේ. තමන් ගැන විශ්වාස නොකරන බවක් සහභාගිකයන්ට හැඟී යා හැකි ය. තමන්ගෙන් බලාපොරොත්තු වන්නේ යැයි ඔවුන් සිතන දේ විනා අන් යමක් වාර්තා කරන්නට ඔවුන්ට ධෛර්යයක් නැතිව යා හැකි ය. 'විමසා බැලීම' යන්න හෝ වෙනත් අඩු හානිකර බවකින් යුතු යෙදුමක් යොදා ගනිමින් පසු විපරම් කිරීම් විස්තර කිරීම ප්‍රයෝජනවත් විය හැකි ය. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති පිවිසුම පැහැදිලි කිරීම සඳහා පුවත්පත් පිළිබඳ උපමාව යොදා ගැනීමෙන්, සතියේ (මාසයේ, කාර්තුවේ) වඩාත් ම අර්ථාන්විත පුවත් කතාව පිළිබඳ 'විශේෂාංග ලිපියක්' රචනා කිරීමක් ලෙසට පසු විපරම් කිරීම් පහදා දිය හැකි වේ.

## සත්‍යාසත්‍යතාව පරීක්ෂා නොකිරීමට තීරණය කිරීම

සමහර උදාහරණවල දී, සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම අනවශ්‍ය විය හැකි ය. කතා පුවත් තෝරා ගැනෙන විට, යම් ප්‍රමාණයක නිරවද්‍යතාවක් අත් කර ගැනීම සඳහා, තෝරා ගන්නවුන් විසින් ඒවා පරෙස්සම් සහගත පරීක්ෂාවකට ලක් කරනු ලැබේ. කතා පුවත් තෝරන බොහෝ පුද්ගලයන්ට, කතා පුවත් තුළ විස්තර වන සිදුවීම් පිළිබඳ පසුබිම් දැනුමක් පවතින අතර, ඔවුන්ගේ 'පරෙස්සම් සහගත පරීක්ෂාව' සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමක් යැයි පිළිගන්නට ප්‍රමාණවත් විය හැකි ය. කුඩා පරිමාණ ව්‍යාපෘතීන්හි දී හෝ ප්‍රතිලාභීන් තේරීම් ක්‍රියා දාමය තුළ නියෝජනය වන විශාල වැඩ සටහන්වල දී මෙම තත්ත්වය පැන නැගිය හැකි ය.

## කතා පුවත්වල සත්‍යාසත්‍යතාව සොයා බලන්නේ කවුරුන් ද?

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ යම් කතා පුවතක් වඩාත් ම අර්ථාන්විත කතා පුවත යැයි තෝරන පුද්ගලයාට පවතින එක් ඕනෑකමක් වන්නේ, කතා පුවත් සහ ඒ පිළිබඳව කළ අර්ථදැක්වීම් යන දෙකෙහි ම නිරවද්‍යතාව සම්බන්ධයෙන් තමන්ට විශ්වාසයක් දැනෙන බව සහතික කර ගැනීම යි. සාමාන්‍යයෙන් ඔවුන්ගේ විනිශ්චයන්, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත ගැන කෙරෙන ප්‍රලේඛනය තුළ ඇතුළත් කරනු ලැබේ. ක්‍රියා දාමය තුළ සිටින අනෙකුත් සහභාගිකයන්ටත් ක්‍රියා දාමයේ ප්‍රතිඵල යොදා ගන්නන්ටත් ඒවා කියවා බැලිය හැකි තත්ත්වයක් ඇති කරනු ලැබේ.

එමෙන් ම, සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම යන්න, ශිල්ප ක්‍රමය යොදා ගන්නා ඕනෑ ම සංවිධානයක වඩාත් ම ජ්‍යෙෂ්ඨ තලවල සිටින්නවුන්ගෙන් මතු වන උත්සුකතාවක් විය හැකි ය. වඩාත් ම අර්ථාන්විත යැයි ඔවුන් තෝරා ගන්නා අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා

පුවත්, කාර්ය මණ්ඩලය සහ අරමුදල් සපයන්නන් යන දෙකොට්ඨාසයේ ම අවධානයට ලක් වන විෂය වනු ඇත. ඩකා මූලස්ථාන මට්ටමේ දී තෝරා ගත් අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් පසු විපරමකට ලක් කිරීම සඳහා ත්‍රෛමාසික ක්ෂේත්‍ර චාරිකාවල යෙදෙන්නට, සීසීඩීබිය තම නිරීක්ෂණ සහ ඇගයීම් ඒකකයේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට භාර කළේ ය. ලාඕසයේ ඒඩීආර්ඒ සංවිධානය, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් සහ ඒවා මතු කර ගත් ක්‍රියා දාමය තක්සේරු කිරීම සඳහා පිටස්තර තක්සේරුකරුවෙකු සමග කොන්ත්‍රාත්තුවක් ඇති කර ගත්තේ ය.

## සත්‍යාසත්‍යතාව පරීක්ෂා කළ යුත්තේ වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කවර ස්වරූපයේ කතා පුවත් සම්බන්ධයෙන් ද?

වාර්තා කරන ලද වෙනස් වීම්වල සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ විධික්‍රමයක් ලෙස, හිටි හැටියේ කරන අහඹු හරිවැරදි බැලීම් අපි නිර්දේශ නො කරමු. එමෙන් ම, හිටි හැටියේ කරන අහඹු හරිවැරදි බැලීම් යොදා ගන්නා මොන යම් හෝ සංවිධානයක් ගැන ද අපි නොදන්නෙමු.

සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ හොඳ ම විධික්‍රමය වන්නේ, වඩාත් ම අර්ථාන්විත යැයි තෝරා ගෙන ඇති වෙනස් වීම් පිළිබඳව, ක්ෂේත්‍ර තලයේ දී සහ මධ්‍යම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලවල දී යන හැම තලයක දී ම හරිවැරදි බැලීම යි. වාර්තා කරන ලද මෙම වෙනස් වීම්වලට ඇඳී ඇති අදහස්වල පවතින බැරෑරුම් බව සලකන කල, පදනම් සුරක්ෂිත බව, එනම් මූලික කරුණු නිවැරදි බව සහතික කිරීම නුවණට හුරු ය.

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමය තුළ දී, සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමට ඉහළ ප්‍රමුඛතාවක් දෙන අවස්ථා පවතියි. එකක් නම්, කතා පුවතක් පළමු වරට සංවිධානයට පිළිගැන්වෙන අවස්ථාව යිඃ නිදසුනක් ලෙස, ක්ෂේත්‍ර ක්‍රියාකාරකයෙකු ඔවුන්ට වාර්තා වූ වෙනස් වීමක් ප්‍රලේඛනය කරන අවස්ථාව ගත හැකි ය. තවෙකක් වන්නේ, කතා පුවතක් සංවිධානයෙන් ඔබ්බට සන්නිවේදනය කෙරෙන අවස්ථාව යිඃ නිදසුනක් ලෙස, ආධාර දෙන්නන් හෝ පොදු මහජනතාව වෙත සන්නිවේදනය කෙරෙන අවස්ථාව ගත හැකි ය. සංවිධානයක ප්‍රතිපත්ති හෝ ක්‍රියා පටිපාටි තුළ වැදගත් වෙනස් වීම් ඇති කිරීමට නිර්දේශ කිරීම සඳහා වූ පදනමක් ලෙස කතා පුවතක් යොදා ගන්නා අවස්ථාව, වැඩි දුර උදාහරණයක් ලෙස දැක්විය හැකි ය. ශිල්ප ක්‍රමය යොදා ගන්නා සංවිධානයක ඕනෑ ම තලයක මෙය සිදු විය හැකි ය. නමුත් වැඩි වශයෙන් සිදු වන්නට ඉඩ තිබෙන්නේ ජ්‍යෙෂ්ඨ තලවල දී ය.

## සත්‍යාසත්‍යතාව පරීක්ෂා කළ යුත්තේ වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වල කුමන පැතිකඩවල් පිළිබඳව ද?

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වල, විස්තර කිරීම සහ අර්ථදැක්වීම යන පැතිකඩ දෙකට ම සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමෙන් ප්‍රයෝජන ලද හැකි ය. කතා පුවතක විස්තර කරන කොටස සම්බන්ධයෙන් ගත් කල, මොන යම් හෝ තොරතුරක් ගිළිහී ගියේ ද යන්න සලකා බැලීමටත්, කරුණු කොතරම් දුරට නිරවද්‍ය ද යන්න විමසා බැලීමටත් එය ප්‍රයෝජනවත් වේ. සිදු වූයේ කුමක් ද, කවදා ද, කොහේ දී ද, සම්බන්ධ වූයේ කවුරුන් ද යන්න ගැන සොයා බැලීම සඳහා ස්වාධීන තුන් වන පාර්ශ්වයකට ශක්තිය ලබා දෙන්නට තරම් ප්‍රමාණවත් තොරතුරු එහි තිබේ ද?

බොහෝ කතා පුවත් තුළ ඇතැම් කරුණුමය වැරදි අඩංගු විය හැකි ය. ප්‍රශ්නය වන්නේ, සම්බන්ධ වූ ජනයා හෝ සිදුවීම වාර්තා කරන නිරීක්ෂකයා විසින් සිදුවීම්වලට ලබා දෙන අර්ථාන්විත භාවය කෙරෙහි, මෙම වැරදි කොතරම් දුරකට බලපාන්නේ ද යන්න යි.

කතා පුවතක අර්ථදක්වන කොටස සම්බන්ධයෙන් ගත් කල, සිදුවීම්වලට ලබා දුන් අර්ථදැක්වීම යුක්ති සහගත ද නැද්ද යන්න විමසා බලන්නට එය ප්‍රයෝජනවත් වේ. බොහෝ විට අර්ථදැක්වීමක් අසත්‍ය බව ඔප්පු කළ නොහැකි වේ. විශේෂයෙන් සමහර තොරතුරු, වෙසෙසින් ම අනාගතයේ ඇති විය හැකි ප්‍රතිවිපාක පිළිබඳ තොරතුරු, ලබා ගත නොහැකි විය හැකි අවස්ථාවල මෙය සිදු විය හැකි ය. එදිනෙදා ජීවිතයේ දී මෙන්, කතා පුවත තුළ

හෝ ඒ සිදුවීම පිළිබඳව ම වාර්තා කළ අනෙකුත් කතා පුවත් තුළ පවතින ප්‍රතිවිරෝධතාවන් කවරේ දැයි සොයා බලන්නට අපට පුළුවන. කතා පුවත ප්‍රලේඛනය කිරීමෙන් පසු වාර්තාකරු කළ දෑ, කතා පුවතේ අන්තර්ගතය සමග ගැළපෙන්නේ ද නැද්ද යන්න විමසා බැලීම ද ප්‍රයෝජනවත් ය.

> **මොසැම්බික් රාජ්‍යය - පසු විපරම ඉදිරිපත් වේ**
> "නියමු අධ්‍යයනය තුළ දී, කතා පුවත්වල සත්‍යාසත්‍යතාව පරීක්ෂා නොකරන ලදි. කෙසේ වුව ද, වැඩි දුර පරීක්ෂණයක් වහා ඉල්ලා සිටින ස්වභාවයක් බොහෝ කතා පුවත් තුළ පැවතුණි. එම්එස් සංවිධානයේ වැඩ සටහන් නිලධාරීන්ගේ කුතුහලය පිබිදුණි. පසු විපරමක් කරන්නට අපේක්ෂා කෙරුණි. පිටස්තරට කෙරෙන සන්නිවේදනයන්හි දී, එවන් වැඩි දුර පරීක්ෂා කිරීම් පිළිබඳව සඳහන් කිරීමට 'සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම' යන යෙදුම යොදා නො ගත යුතු යැයි අපි තීන්දු කළෙමු. එම යෙදුම පාලනය යන වචනය සමග බෙහෙවින් සම්බන්ධ විය" *(සිස්ගාර්ඩ්, 2002:11).*

*උදාහරණය*

1990 ගණන්වල අග භාගයේ දී, බලපෑම් තක්සේරු ඒකකයේ සාමාජිකයෙක්, සීසීඩීබීය මෙතෙක් යෙදී ගත් ප්‍රධාන ම සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ කටයුත්ත භාර ගත්තේ ය. මෙය සිදු වූයේ, ඩකා මූලස්ථානයෙහි වඩාත් ම ජ්‍යෙෂ්ඨ තේරීම් කමිටුවේ මග පෙන්වීම යටතේ ය. ක්ෂේත්‍ර චාරිකා මත පදනම්ව වාර්තාවක් රචනා කෙරුණු අතර, සහභාගි වූ සීසීඩීබී කාර්ය මාණ්ඩලිකයන් සියලු දෙනා වෙත ම එය බෙදා දෙන ලදි.

## 8 වන පියවර: ප්‍රමාණාත්මකව ප්‍රකාශයට පත් කිරීම

සිදු වෙමින් පවතින්නේ කුමක් ද යන්න සන්නිවේදනය කිරීම සඳහා ඉලක්කම් වෙනුවට කතා පුවත් යොදා ගනිමින්, වෙනස් වීම පිළිබඳ ගුණාත්මක තොරතුරු වාර්තා කිරීම කෙරෙහි, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය බලගතු අවධාරණයක් යොදයි. කෙසේ වුව ද, වෙනස් වීම් ප්‍රමාණාත්මකව ප්‍රකාශයට පත් කිරීම සඳහා ද එහි ඉඩකඩක් තිබේ.

ශිල්ප ක්‍රමය තුළ, ප්‍රමාණාත්මක තොරතුරු රැස් කොට විශ්ලේෂණය කළ හැකි ක්‍රම තුනක් තිබේ. පළමු වැන්න පවතින්නේ පුද්ගල කතා පුවත් තුළ ය. කවර පුවත් කතාවක දී වුව ද, ඊට කී දෙනෙකු සම්බන්ධ වූයේ ද, ක්‍රියාකාරකම් කීයක් සිදු වූයේ ද යන්න පෙන්වා දෙන්නට මෙන් ම, විවිධ වර්ගයේ බලපෑම් ප්‍රමාණාත්මකව ප්‍රකාශයට පත් කරන්නට ද හැකියාව තිබේ.

සියලු කතා පුවත් අතුරින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත තෝරා ගැනීමෙන් පසු, සමහර විට ප්‍රතිපෝෂණ අදියරට සම්බන්ධ කොට, දෙවන විධික්‍රමය යොදා ගත හැකි ය. නිදසුනක් ලෙස, සියලු කතා පුවත් අතර පැවති වඩාත් ම අර්ථාන්විත කතා පුවතෙහි සඳහන් වූයේ, (බංග්ලාදේශයේ දී සිදු වූවාක් මෙන්) ස්ත්‍රියක් තමන්ගේ නමට ඉඩමක් මිල දී ගැනීම පිළිබඳව විය හැකි ය. එසේ නම්, තමන් දැන සිටින මෙම වර්ගයේ වෙනස් වීම් පිළිබඳ අනෙකුත් සියලු උදාහරණ ගැන තොරතුරු ලබා දෙන ලෙස සියලු සහභාගිකයන්ගෙන් ඉල්ලා සිටිය හැකි ය. වරක් සිදු කළ මෙම විපරම, අනතුරුව එන වාර්තාකරණ කාල සීමාවල දී නැවත නැවතත් සිදු කිරීම අවශ්‍ය නො වේ.

ප්‍රමාණාත්මකව ප්‍රකාශයට පත් කිරීමේ තෙවන උපක්‍රමය නව වන පියවර අතරතුර දී යොදා ගත හැකි ය. සංවිධානයේ ඉහළ තලවල දී තෝරා නොගත් කතා පුවත් ද ඇතුළුව, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳව රැස් කර ගත් මුළු කතා පුවත් කට්ටලය ම පරීක්ෂාවට ලක් කිරීමත්, යම් සුවිශේෂ වෙනස් වීමක් සටහන් වූ වාර ගණන ගණන් කිරීමත් මීට ඇතුළත් ය.

# 9 වන පියවර: දෙවන විශ්ලේෂණය සහ පසු නිරීක්ෂණය

දෙවන විශ්ලේෂණය සහ පසු නිරීක්ෂණය යන දෙක ම අදාළ වන්නේ, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීමේ සහභාගී ක්‍රියා දාමය පූර්ණත්වයට පත් කරන අතිරේක තලයකට යි. නව වන පියවර ශිල්ප ක්‍රමය තුළ පවතින තීරණාත්මක පියවරක් නො වේ. එහෙත් අපගේ අත්දැකීම අනුව, එය ඉතා ප්‍රයෝජනවත් විය හැකි ය. එය ක්‍රියා දාමයට තව දුර නීත්‍යනුකූල භාවයක් සහ තර්කානුකූල පරිපූර්ණත්වයක් එක් කරයි.

දෙවන විශ්ලේෂණයට ඇතුළත් වන්නේ, පරීක්ෂාව, වර්ග කිරීම, සහ අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් කට්ටලයක **අන්තර්ගතය (නැත් නම් තේමාවන්)** පිළිබඳව කෙරෙන **හරස්කඩ** විශ්ලේෂණයකි. එහෙත් පසු නිරීක්ෂණය, **කතා පුවත්වල පවතින විශේෂතා** ගැන වැඩි අවධානයක් යොමු කරනු ඇත. නිදසුනක් ලෙස, ඒවා හඳුනා ගත්තේ කවුරුන් ද, ඒවා තෝරා ගත්තේ කවුරුන් ද යනාදිය ද ඇතුළත්ව, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වල මූලයන් සහ ඉරණම ගැන වැඩි අවධානයක් යොමු කරනු ඇත. පසු නිරීක්ෂණය නොකඩවා හෝ කලින් කලට සිදු කළ හැකි ය. දෙවන විශ්ලේෂණය කතා පුවත් සියල්ලේ ම අන්තර්ගතය වඩා සවිස්තරාත්මකව විමසා බලන්නක් වන නිසා, එය සිදු කරන්නට නැඹුරු වනු ඇත්තේ වසරකට වරක් වැනි අඩු නිරන්තර භාවයකින් යුතුව ය.

ඉහළ තලවල දී තෝරා නොගත් කතා පුවත් ද ඇතුළුව, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ සම්පූර්ණ කතා පුවත් කට්ටලයක් ම විශ්ලේෂණය කරන්නට ශිල්ප ක්‍රම දෙක ම සම්බන්ධ වේ. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය තුළ පවත්නා තේරීම් ක්‍රියා දාමය මෙන් නො ව, නව වන පියවර සාමාන්‍යයෙන් සිදු කෙරෙන්නේ අඩු සහභාගිත්වයකින් යුතු ක්‍රමයකට ය. එනම්, බොහෝ විට, නිරීක්ෂණය සහ ඇගයීම භාරව සිටින පුද්ගලයා හෝ විශේෂඥයෙකු විසිනි.

## වාර්තා තබා ගැනීම

පසු නිරීක්ෂණය හෝ දෙවන විශ්ලේෂණය යන දෙකෙන් කොයික සිදු කරන්නටත්, ප්‍රලේඛනය කරන ලද අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් සියල්ල ලිපි ගොනුවල බහා ලීම අවශ්‍ය ය. එක් එක් කතා පුවත, තේරීම් ක්‍රියා දාමවල ධුරාවලීන්හි කවර ඉහළ මට්ටමක් දක්වා ඉදිරියට ගියේ ද යන්න නො තකා එය කළ යුතු ය. අපගේ අත්දැකීම අනුව, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තැබිය යුතු හොඳ ම තැන, සංවිධානය තුළ පළමු වතාවට ඒවා ප්‍රලේඛනය කෙරෙන ස්ථානය විය හැකි ය. එනම්, ප්‍රතිලාභීන් සමග අන්තර් ක්‍රියාවන්හි නිරත වන ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය පදනම්ව සිටින්නා වූ සංවිධානයක ක්ෂේත්‍ර කාර්යාලයන් ය. ඩෙන්මාර්කයේ එම්එස් වැනි සමහර සංවිධාන, වැඩි දුර පියවරක් ඉදිරියට ගොස්, තමන්ගේ අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් ලිපිලේඛන දත්ත ගබඩාවකට ඇතුළු කොට තිබේ. පසු අදියරක දී දෙවන විශ්ලේෂණයක් සිදු කිරීමට සැලසුම් කරන්නන්ට, හෝ තම සංවිධානය තුළ සිටින්නවුන්ට අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් වෙත පුළුල්ව ප්‍රවේශ විය හැකි තත්ත්වයක් ඇති කරන්නට වුවමනා කරන්නවුන්ට මෙය ප්‍රයෝජනවත් වනු ඇත. එහෙත් එය අවශ්‍ය ම දෙයක් නො වේ.

පසු නිරීක්ෂණය සහ දෙවන විශ්ලේෂණය යන දෙකට ම සූදානම් වීමේ දී, එක පෙළකට එකක් බැගින් වන පරිදි අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ එක් එක් කතා පුවත පිළිබඳ දත්ත අඩංගු වන, සහායක විහිදුම් පතක් සකසා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. එක් එක් තීරුවලට අදාළ ප්‍රවේශය මගින් පහත දැක්වෙන ආකාරයේ තොරතුරු සැපයිය හැකි ය:

- එක් එක් කතා පුවත සඳහා අනුක්‍රමික අංකයක්
- එක් එක් කතා පුවතේ මාතෘකාව
- එය වාර්තා කර ගත් දිනය
- කතා පුවත ප්‍රලේඛනය කළ පුද්ගලයාගේ නම

- කතන්දර කියන්නා පිළිබඳ සමහර තොරතුරුඃ රැකියාව, ස්ත්‍රී-පුරුෂ භාවය, ප්‍රදේශය යනාදිය

- පළමු තේරීම් ක්‍රියා දාමය සිදු කළ දිනය

- තේරීම් ක්‍රියා දාමයේ ප්‍රතිඵලය

- දෙවන තේරීම් ක්‍රියා දාමය සිදු කළ දිනය

- පසු විපරම් පියවරයන් සඳහා කළ නිර්දේශ

- කළ නිර්දේශ මත පදනම් වී ගත් පියවර කුමක් ද යන්න.

## පසු නිරීක්ෂණය

පසු නිරීක්ෂණය සාපේක්ෂ වශයෙන් සරල වූවකි. ඊට විශේෂඥ දැනුම අවශ්‍ය නො කරයි. අපි එය බලගතු ලෙස නිර්දේශ කරමු. නිරීක්ෂණයට ලක් කළ හැකි ප්‍රධාන ක්‍රියා පිළිවෙත් ස්වරූප හතරක් පවතියි.

- **එක් එක් වාර්තාකරණ කාල සීමාව තුළ දී රචනා කෙරුණු අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් සංඛ්‍යාව, සහ කාලයත් සමග එම සංඛ්‍යාව වෙනස් වන ආකාරය.** සහභාගිකයන් තමන්ට මතකයට නගා ගත හැකි අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ සියලු කතා පුවත් 'හාරා පාදා ගන්නා' නිසා, ශිල්ප ක්‍රමය යොදා ගැනීමේ ආරම්භයේ දී, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් විශාල සංඛ්‍යාවක් ලැබෙතැයි අපේක්ෂා කළ හැකි ය. දිගු කාල පරිච්ඡේදයක් තිස්සේ සිදු වන කතා පුවත් අඩු වී යාමේ නැඹුරුවකින්, ශිල්ප ක්‍රමය යොදා ගැනීමෙන් ඉවතට යොමු වීමක් පිළිබිඹු වනවා විය හැකි ය. එසේ නැත් නම්, වාර්තා කළ යුත්තේ සැබවින් ම විශාල වෙනස් වීම් පමණකි යි යන වැරදි අදහසක් ඇති වී තිබෙන බව පිළිබිඹු වනවා විය හැකි ය (තුන් වන පරිච්ඡේදයඃ ගැටලු සමථයකට පත් කිරීම බලන්න).

- **කතා පුවත් රචනා කරන්නේ සහ නොකරන්නේ කවුරුන් ද යන්න, සහ කාලයත් සමග මෙම කණ්ඩායම්වල සාමාජිකත්වය වෙනස් වන ආකාරය.** ස්ත්‍රීන්ට එදිරිව පිරිමින්, තරුණ සහභාගිකයන්ට එදිරිව වැඩිහිටි සහභාගිකයන්, විවිධ ජනවාර්ගික කණ්ඩායම්වලට හෝ පන්තිවලට සහ විවිධ ස්ථානවලට අයත් වන්නන් වැනි වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කිරීම මෙම විශ්ලේෂණයට ඇතුළත් කළ හැකි ය. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමය තුළ සහභාගි වීමටත් වටිනා ප්‍රතිඵල අත් කර ගැනීමටත් සම්බන්ධිතව ව්‍යාපෘතියේ විවිධ කොටස් ක්‍රියාත්මක වන ආකාරය ගැන, මෙමගින් අපට අන්තර්ඥානයක් සැපයෙන්නට ඉඩ තිබේ. නිදසුනක් ලෙස, සමහර ප්‍රදේශ තුළ පවතින පහළ සංඛ්‍යා මගින්, ශිල්ප ක්‍රමය පිළිබඳ අවබෝධය අඩුකමක් හෝ එය යොදා ගැනීම කෙරෙහි දක්වන ප්‍රතිරෝධයක් පිළිබිඹු වනවා විය හැකි ය. එහෙත්, එමගින් භූමි ප්‍රදේශය තුළ මුදුන් පමුණුවා ගෙන ඇති දෑ (සංවිධානයේ ක්‍රියාකාරකම්වලින් ඇති කළ බලපෑම) තුළ සැබවින් පවතින වෙනස්කම් පිළිබිඹු වනවා ද විය හැකි ය. කාර්ය මාණ්ඩලික වැඩ මුළු තුළ දී ප්‍රයෝජනවත් අයුරින් සාකච්ඡාවට ලක් කළ හැක්කේ, මෙම පැහැදිලි කිරීම් අතුරින් කුමන පැහැදිලි කිරීම හොඳින් ම යොදා ගැනීම සම්බන්ධයෙන් ද?

- **තෝරා ගන්නේ සහ තෝරා නොගන්නේ කාගේ කතා පුවත් ද යන්න.** නැවතත්, ප්‍රාදේශීය උත්සුකතාවන් මත පදනම් වෙමින්, ස්ත්‍රී-පුරුෂ භාවයට, වයස් මට්ටමට, ජනවාර්ගිකත්වයට, පන්තියට සහ ස්ථානයට සම්බන්ධිතව මෙම විශ්ලේෂණය සිදු කළ හැකි ය.

- **අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ එම කතා පුවත්වලට සිදු වී ඇත්තේ කුමක් ද යන්න.** නිර්දේශ කීයක් මතු වී ආවා ද, අනතුරුව මෙම නිර්දේශ අතුරින් කීයක් ක්‍රියාත්මක වූයේ ද යන්න. නැවතත්, ප්‍රාදේශීය උත්සුකතාවන් මත පදනම් වෙමින්,

ස්ත්‍රී-පුරුෂ භාවයට, වයස් මට්ටමට, ජනවාර්ගිකත්වයට, පන්තියට සහ ස්ථානයට සම්බන්ධිතව මෙම විශ්ලේෂණය සිදු කළ හැකි ය.

### *මෙම විශ්ලේෂණය යොදා ගන්නට සැරසෙන්නේ කවුරුන් ද?*

යොදා ගන්නන් කණ්ඩායම් දෙකක් සිටිය හැකි ය. එකක් නම්, තම සංවිධානය තුළ ශිල්ප ක්‍රමය යොදා ගැනීම කළමනාකරණය කිරීම සම්බන්ධ වගකීම භාරව සිටින කාර්ය මණ්ඩල සාමාජිකයා (සාමාජිකයන්) ය. මෙම කාර්ය භාරය ඉටු කරන්නට යම් කෙනෙකු සිටීම ප්‍රයෝජනවත් විය හැකි ය. ශිල්ප ක්‍රමයේ භාරකාරත්වය නිල වශයෙන් පුද්ගලයෙකුට පැවරූ සීසීඩීබීය, 1990 ගණන් පුරා, යට කී කාර්ය භාරය ඉටු කිරීම සඳහා පුද්ගලයෙකු තබා ගෙන සිටියේ ය. මධ්‍යම සහ ජ්‍යෙෂ්ඨ තලවල තේරීම් ක්‍රියා දාමයන් තුළින් තෝරා ගෙන තිබූ අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්, පසු විපරමකට ලක් කිරීම සඳහා ක්ෂේත්‍ර කාර්යාල වෙත සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ සංචාර සංවිධානය කිරීම, ඔවුන්ගේ වගකීම් අතරට ඇතුළත්ව තිබිණ.

යොදා ගන්නා වෙනත් කණ්ඩායම් විය හැක්කේ, තේරීම් ක්‍රියා දාමයේ මුදුනතට එළඹෙන අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් භාර ගන්නා භාරකාර මණ්ඩල සහ සංවිධානවලට ආධාර දෙන්නන් ය. කතා පුවත් ලැබෙන්නේ කොතැනකින් ද යන්න එළිදරව් කර ගත හැකි වන, තත්ත්වය පිළිබඳ තොරතුරු මෙම කණ්ඩායම්වලට අවශ්‍ය ය. මෙය ආකාර දෙකකින් සිදු විය හැකි ය. එකක් නම්, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ ක්‍රියා දාමය ක්‍රියාත්මක වන ආකාරය ගැන සංක්ෂිප්ත කෙටි වාර්තාවක් ඉදිරිපත් කිරීම යි. භාවිතයේ දී වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ ක්‍රියා දාමය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ සමහර තොරතුරු ඉදිරිපත් කිරීම අනෙක යි- එනම්, කතා පුවත් කීයක් රැස් කළේ ද, අපේක්ෂා කළ සහභාගිකයන්ගෙන් කවර ප්‍රතිශතයක් ඒ සඳහා සහභාගි වුණා ද, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් හඳුනා ගැනීමේ දී සහ අනතුරුව තේරීමේ දී සම්බන්ධ කර ගත්තේ කවුරුන් ද යන තොරතුරු යි. පසු නිරීක්ෂණ දත්ත ඉතා ප්‍රයෝජනවත් තත්ත්වයට පත් විය හැක්කේ මෙතැන දී ය. සීසීඩීබීය සහ ටාගට් 10 යන යොදා ගැනීම් දෙකේ දී ම, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් සම්බන්ධයෙන් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලද සම්පිණ්ඩනයන් යොදා ගනු ලැබිණ. කතා පුවත් සහ සහභාගිකයන් ගණන පිළිබඳ පසු නිරීක්ෂණ දත්ත සමහරක් ඒවායෙහි ඇතුළත් විය.

## දෙවන විශ්ලේෂණය

ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඔබ යම් අත්දැකීමක් ලබා ගැනීමෙන් අනතුරුව, සියලු කතා පුවත් එකට ගෙන යම් ආකාරයක වඩා ගැඹුරු විශ්ලේෂණයක් කරන්නට ඔබට වුවමනා විය හැකි ය. මෙය සම්පිණ්ඩනාත්මක[2] ඇගයීමේ අංගයක් ලෙස ශිල්ප ක්‍රමය යොදා ගැනීමේ එක් උපායකි. කෙසේ වුව ද, දෙවන විශ්ලේෂණයක් නැති විට පවා, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ ක්‍රියා දාමය බැරෑරුම් හා ප්‍රයෝජනවත් යැයි අපි විශ්වාස කරමු.

ඔබට දැනට මත් පර්යේෂණ සහ විශ්ලේෂණ නිපුණතාවන් පවතී නම් දෙවන විශ්ලේෂණය වඩා පහසු වේ. රික් සහ ජෙස්, දෙවන විශ්ලේෂණයේ විවිධාකාර ස්වරූපයන් ගැන අත්හදා බැලීම් කර තිබේ. එය පර්යේෂණ කටයුතුවල යෙදෙන සිසුන් සඳහා සරුසාර බිම්කඩක් වේ. දෙවන විශ්ලේෂණය සාමාන්‍යයෙන් සිදු කරනු ලබන්නේ සහභාගිත්වයෙන් තොර ක්‍රමයකට, එනම් පර්යේෂකයෙකු හෝ නිරීක්ෂණ සහ ඇගයීම් පිළිබඳ විශේෂඥයෙකු විසිනි. සමහර මෑත කාලීන නවීකරණයන් නව වන පරිච්ඡේදයේ විස්තර වේ.

---

[2] සම්පිණ්ඩනාත්මක (summative) ඇගයීම යනු, වැඩ සටහන සම්පූර්ණ කිරීමෙන් පසු (හෝ වැඩ සටහන ස්ථාවර වූ පසු) ඒ පිළිබඳව සමස්තයක් වශයෙන් සලකා සිදු කරනු ලබන්නකි. එමෙන් ම එය, යම් පිටස්තර ශ්‍රාවක පිරිසකගේ හෝ තීරණ ගන්නන් පිරිසකගේ ප්‍රයෝජනය තකා සිදු කරනු ලබන්නකි. වැඩ සටහන පෙරට ගෙන යනවා ද නැද්ද යන්න තීරණය කරන්නට, හෝ වැඩ සටහන සඳහා යෙදවූ පිරිවැය සාධාරණීකරණය කරන්නට සම්පිණ්ඩනාත්මක ඇගයීමක තීන්දු යොදා ගත හැකි ය. නියමානුකූල (formative) ඇගයීම සිදු කරනු ලබන්නේ, වැඩ සටහන වැඩි දියුණු කරන්නට ප්‍රයෝජනවත් වන තීන්දු වැඩ සටහන් කාර්ය මණ්ඩලය වෙත සම්පාදනය කරන්නට ය. සම්පිණ්ඩනාත්මක ඇගයීමක අරමුණ වන්නේ වැඩ සටහන පිළිබඳව වාර්තා කිරීම යි. එහෙත් නියමානුකූල ඇගයීම වැඩ සටහන වෙත වාර්තා කරයි *(ස්ක්‍රිවන්, 1994).*

## අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තුළ විස්තර වී ඇති වෙනස් වීම් මාලාව විශ්ලේෂණය කිරීම

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් කට්ටලයක් තුළ ගැබ් වන වෙනස් වීම් හෝ තේමාවන් මාලාව විශ්ලේෂණය කිරීම සහ විස්තර කිරීම සඳහා, බොහෝ සේ විවිධ වූ ක්‍රම පවතී. ගුණාත්මක විශ්ලේෂණ සිදු කළ යුතු ආකාරය පැහැදිලි කරන ප්‍රකාශන තුළින් ඔබට මෙම විකල්පයන් පිළිබඳව වැඩි දුර තොරතුරු සොයා ගත හැකි ය. ඉදිරියේ එන ඡේදවල දී අපි, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් කට්ටලයක් සම්බන්ධයෙන් දෙවන විශ්ලේෂණයක් සිදු කරන ආකාරයන් සමහරක් ගැන සංක්ෂිප්ත දළ විශ්ලේෂණයක් සම්පාදනය කරන්නෙමු.

### *තේමාත්මක කේත යෙදීම*

තේමාත්මක කේත යෙදීම පිළිබඳ එක් මූලික විධික්‍රමයක් වන්නේ, විවිධ වර්ගවල වෙනස් වීම්වලට අදාළ සියලු කතා පුවත් සොයා යාම යි. නව ස්වරූපයේ සෑම වෙනස් වීමක් ම කොළ කැබැල්ලක සටහන් කොට ගෙන, කතා පුවත අදාළ වන්නේ කවර වර්ගයක වෙනස් වීමකට ද යන්න ඔබට සිහිපත් වීම සඳහා එය කතා පුවතට ඇඳන්න. ඔබ සියලු කතා පුවත් පරීක්ෂාවට ලක් කොට අවසන් වී තවත් නව ස්වරූපයේ වෙනස් වීම් නොමැති අවස්ථාවට ළඟා වූ විට, සටහන් ඉවත් කොට, එක හා සමාන ස්වරූපවල වෙනස් වීම් නියෝජනය කරන ප්‍රභේදවලට ඒවා වෙන් කරන්න. ඉන් අනතුරුව ඔබට, සියලු කතා පුවත් නැවත පරීක්ෂා කොට, එක් එක් ස්වරූපයේ වෙනස් වීම්වලට අදාළ වන්නේ කුමන කතා පුවත් ද යන්න සොයා ගත හැකි ය. මෙය, තරමක් දුරට බලපෑම් ක්ෂේත්‍ර වැනි වුවත් ඊට වඩා බෙහෙවින් සුවිශේෂිත ය. ඔබ සමහර විට, වෙනස් වීමේ ස්වරූප 30ක් හෝ ඊට වැඩි ගණනක් ලැයිස්තුගත කර තිබෙන්නට පුළුවන. තීරු ශීර්ෂ පාඨ ලෙස වෙනස් වීමේ ප්‍රභේදය දක්වා, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ එක් එක් කතා පුවත සඳහා එක් පේළිය බැගින් වෙන් කොට, ඔබේ ප්‍රතිඵල වගුවක් තුළ ප්‍රලේඛනය කරන්නට ඔබට පුළුවන. එක් එක් කුටිය තුළ, සාමාන්‍ය ඔව් හෝ නැහැ යන්නක් (1 හෝ 0; හරි හෝ වැරදි ලකුණක්) අඩංගු වේ. අනතුරුව, මේවා මුළු ගණන් සහ ප්‍රතිශත තුළට රාශිගත කළ හැකි ය.

### *ධනාත්මක සහ සෘණාත්මක වෙනස් වීම්වලට සම්බන්ධිත අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් විශ්ලේෂණය කිරීම*

ධනාත්මක වෙනස් වීම්වලට එදිරිව සෘණාත්මක වෙනස් වීම් ඇති වීම, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යොදා ගන්නා බොහෝ සංවිධාන විසින් ඉහළ විශ්ලේෂණ ප්‍රමුඛතාවක් දීමට ඉඩ ඇති එක් ගැටලුවකි. සෘණාත්මක අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් හඳුනා ගැනීමට සහ සලකා බැලීමට පහසු නිසා, පළමු වර දකින විට මෙය පසු නිරීක්ෂණ කටයුත්තක් ලෙස තේරුම් ගන්නට ඉඩ තිබේ. එහෙත් පළමු බැල්මේ දී දකිනවාට වඩා මෙම කටයුත්ත සංකීර්ණ විය හැකි ය. එමෙන් ම, වැඩි පරෙස්සම් සහගත භාවයකින් යුතුව තේරුම් ගත යුතු වේ. ධනාත්මක ලෙස පෙනී යන අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තුළ සෘණාත්මක ලක්ෂණ අඩංගු වී තිබෙන්නට පුළුවන. එසේ ම, මෙය අනෙක් අතට ද සිදු විය හැකි ය. විටින් විට නැවත නැවතත් දක්නට ලැබෙන, ණය ආපසු ගෙවීම පිළිබඳ ගැටලු සාර්ථකව නිරාකරණය කිරීම පිළිබඳ පුද්ගල කතා පුවත් ද, සෘණාත්මක වර්ධනයන් සංඥා කරන බවක් පෙනේ. එනම්, එවන් ගැටලු ඇති වීම වැඩි වෙමින් තිබීම යි. සහභාගිකයන් සමහර විට, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ තමන්ගේ කතා පුවත් තුළට ඉතා සියුම් ආකාරවලින් සෘණාත්මක අදහස් රුවා ලන්නට ඉඩ තිබේ. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්, භාෂාවන් සහ සංස්කෘතීන් හරහා පරිවර්තනය කිරීමට සම්බන්ධ වන ශිල්ප ක්‍රමයේ යොදා ගැනීම් තුළ දී, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ සෘණාත්මක කතා පුවත් හඳුනා ගැනීම විශේෂයෙන් දුෂ්කර විය හැකි ය.

### *තර්කන ආකෘතියක් යොදා ගනිමින් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවත් තුළ සඳහන් වන වෙනස් වීම් විශ්ලේෂණය කිරීම*

අපේක්ෂිත ප්‍රතිඵලවල ධුරාවලියක් යොදා ගැනීමෙන් (එනම්, වැඩ සටහනේ තර්කනයට අදාළ ආකෘතියක් (logic model) යොදා ගැනීමෙන්) ද, කතා පුවත තුළ සඳහන් වන ධුරාවලියේ ඉහළ ම තලය යොදා ගෙන එක් එක් කතා පුවතට ලකුණු ලබා දීමෙන් ද, කතා පුවත් විශ්ලේෂණය කළ හැකි ය.

පියවර හතකින් ස්වේච්ඡාමය හැසිරීම්වල සිදු වන වෙනස් වීම් පිළිබඳ න්‍යායක් විස්තර කළ බෙනට්ගේ ධූරාවලිය (බෙනට්, 1976), වර්ගීය ප්‍රතිඵල ධූරාවලියක් පිළිබඳ උදාහරණයක් වේ. පළමු වන තලය යෙදවුම් (1) ය, එනම්, ව්‍යාපෘතිය විසින් වැය කළ සම්පත් ය. යෙදවුම් ක්‍රියාකාරකම් (2) තුළ දී යොදා ගැනේ. එම ක්‍රියාකාරකම්වලට, යම් යම් විශේෂ ගුණාංග ඇති ජනයා (3) සම්බන්ධ වෙති. හතර වන තලය, මෙම ජනයා තම අත්දැකීම්වලට ප්‍රතික්‍රියා කරන හෝ ප්‍රතිචාර දක්වන (4) ආකාරයට සම්බන්ධ ය. මෙය, ඔවුන්ගේ දැනුමෙහි (**k**nowledge), ආකල්පවල (**a**ttitudes), නිපුණතාවන්හි (**s**kills), ප්‍රාර්ථනාවන්හි (**a**spirations) සහ විශ්වාසයේ (**c**onfidence) වෙනස් වීම් (5) ඇති වීමට හේතු විය හැකි ය. පස් වන පියවර බොහෝ විට *KASAC* යන කෙටි නමින් හැඳින්වේ. මෙම වෙනස් වීම් සිදු වන්නේ නම්, භාවිතයේ වෙනස් වීමක් (6) ඇති කර ගැනීමට ජනයා අනතුරුව පෙළඹෙති. එමගින්, සාමාජීය, ආර්ථික හෝ පාරිසරික වෙනස් වීම්වලට (**s**ocial, **e**conomic or **e**nvironmental **c**hange) සම්බන්ධිතව අවසන් ප්‍රතිඵලයක් (7) මුදුන් පමුණුවා ගනු ලැබේ. හත් වන තලය බොහෝ විට *SEEC* යන කෙටි නාමයෙන් හඳුන්වනු ලැබේ. හය වන තලය නියෝජනය කරන්නේ ව්‍යාපෘතියක කෙටි කාලීන බලපෑම් ය. හත් වන තලය දිගු කාලීන ප්‍රතිඵල නියෝජනය කරයි.

සංවර්ධන සහ ආධාර වැඩ සටහන් සැලසුම් කිරීමේ දී යොදා ගනු ලබන 'තාර්කික සැකැස්ම', බෙනට්ගේ ධූරාවලියට ලුහුඬු සමානකමක් දක්වයි.

කණ්ඩායමිකව අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීමේ යෙදී සිටින සහභාගිකයන්, සැලසුමකින් තොර පදනමක් මත අවිධිමත් ධූරාවලීන් යොදා ගන්නට නැඹුරු වන බව අප සොයා ගෙන තිබේ. නිදසුනක් ලෙස, ජනයාගේ ජීවිත කෙරෙහි ඇති වූ බලපෑම් පිළිබඳ කතා පුවත්, එම බලපෑම්වලට පූර්ව නිමිත්ත වන වැඩ සටහන් ක්‍රියාකාරකම් පිළිබඳ කතා පුවත්වලට වඩා ඉහළින් තක්සේරු කරන්නට නැඹුරු වීම ගත හැකි ය.

ඔබ මෙම පිවිසුම සම්බන්ධයෙන් ඇල්මක් දක්වන්නේ නම්, වැඩ සටහනේ තර්කනය සහ ප්‍රතිඵලවල ධූරාවලීන් පිළිබඳව ඔබ යම් පර්යේෂණයක යෙදීම අවශ්‍ය විය හැකි ය. ටාගට් 10 ව්‍යාපෘතිය සඳහා ජෙස් මෙම විශ්ලේෂණ ආකෘතිය යොදා ගත්තේ ය (ඩාර්ට්, 2000).

### *මාදිලිය විශ්ලේෂණය කිරීම*

අන්තර්ගතය පිළිබඳව කරන විශ්ලේෂණයට, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවත් රචනා කිරීමට ජනයා යොදා ගන්නා මාදිලිය කෙරෙහි ද අවධානය යොමු කළ හැකි ය. මාදිලිය යනු අත්දැකීම පිළිබඳ විශාල පරිමාණයේ ප්‍රභේදකරණයකි. නාට්‍යය, ශෝකාන්තය, සුඛාන්තය, සැටයර් (උපහාස නාට්‍යය), ෆාස් (විකට නාට්‍යය) සහ වීර කාව්‍යය වැනි ස්වරූප ඊට ඇතුළත් වේ. ශිල්ප ක්‍රමය යොදා ගන්නා සංවිධානයේ ප්‍රධාන විශ්වාසයන් පිළිබඳව සහ එහි වැඩ කරන ජනයාගේ චිත්ත ධෛර්යය පිළිබඳව යමක් අපට කියන්නට, මෙම ස්වරූපවලට හැකියාව තිබේ. සිය ආචාර්ය උපාධි නිබන්ධයේ දී, රික් මාදිලිය පිළිබඳ යම් විශ්ලේෂණයක් කළේ ය. [http://www.mande.co.uk/docs/thesis.htm](http://www.mande.co.uk/docs/thesis.htm) වෙබ් පිටුවෙන් එය ලබා ගත හැකි ය.

**මොසැම්බික් රාජ්‍යය - සංස්කෘතික බලපෑම්**

"ආරම්භයේ දී, ප්‍රතිචාර දක්වන්නන් බොහෝ විට තම කතා පුවත් කීවේ, ඉතා අලංකාර, චාරිත්‍රානුකූල සහ වක්‍ර ක්‍රමයකිනි. විශේෂයෙන් ම, මොසැම්බික්හි දී මෙය සටහන් විය. සමහර විට, පෘතුගීසි භාෂාව එවැනි විනෝදජනක ක්‍රියාවන්ට ආරාධනා කරන්නක් වන නිසා එය සිදු වන්නට ඇත. නිලධාරීන් හෝ වෙනත් එවන් පුද්ගලයන් වෙත වාර්තා කරන විට ඉතා 'චාරිත්‍රානුකූල' වීමේ සම්ප්‍රදායක් නිසා එය සිදු වනවා ද විය හැකි ය" *(පීටර් සිස්ගාර්ඩ්, 2002:11).*

## *තෝරා ගත් සහ තෝරා නොගත් කතා පුවත් අතර පවතින වෙනස්කම් විශ්ලේෂණය කිරීම*

තෝරා ගත් තෝරා නොගත් කතා පුවත් අතර පවතින වෙනස්කම් පරීක්ෂාවට ලක් කිරීමෙන් සමහර සිත් ගන්නාසුලු තීන්දුවලට එළඹිය හැකි ය. ඔබට බොහෝ පැතිකඩවලින් වෙනස්කම් පරීක්ෂාවට ලක් කළ හැකි ය. ඒ පැතිකඩ අතරට මේවා ඇතුළත් වේ:

- වෙනස් වීම්වල ස්වරූප
- කතන්දර කියන්නන්
- කතා පුවත තුළ විස්තර කර ඇති වෙනස් වීම්වල දිගු කාලීන හෝ කෙටි කාලීන ස්වභාවය.

යම් විශේෂිත ප්‍රදේශයකින් නියෝජනාත්මක නොවූ කතා පුවත් ප්‍රමාණයක් තෝරා ගෙන තිබීම (හෝ නොතිබීම) වැනි දේ එළිදරව් කරන්නට මෙම ආකාරයේ විශ්ලේෂණයකට හැකියාව තිබේ. විශේෂයෙන් ම, මෙම අනුපාතය කලක් තිස්සේ ස්ථාවරව පවතී නම්, ඉන් වෙනස් ජනයාගෙන් සහ වෙනස් ස්ථානවලින් එන අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වල පවතින ගුණාත්මක වෙනස්කම් පිළිබිඹු වනවා විය හැකි ය. ප්‍රදේශය තුළ සිදු වෙමින් පවතින සැබෑ වෙනස්කම් පෙන්වා දෙන්නට ද ඊට පුළුවන්කම තිබේ. එමෙන් ම, ඊට සංවිධානයේ විවිධ කොටස්වල සන්සන්දනාත්මක ක්‍රියාකාරිත්වය ද පිළිබිඹු කළ හැකි ය. සමහර විට ඊට, සංවිධානය අගයන්නේ මොනවා ද යන්න ගැන අන්තර්ඥානය සම්පාදනය කිරීම ද කළ හැකි ය.

> **වික්ටෝරියාව - දෙවන විශ්ලේෂණය එළිදරව් කළ දේ**
> "නිදසුනක් ලෙස, ටාගට් 10 උදාහරණයේ දී, තෝරා ගත් සහ තෝරා නොගත් කතා පුවත් අතර පැවති වෙනස්කම් කීපයක් දෙවන විශ්ලේෂණයෙන් එළිදරව් කෙරුණි. ප්‍රතිලාභියෙකු විසින් විස්තර කරන ලද කතා පුවත් තෝරා ගන්නටත් (තර්කන ආකෘතිය යොදා ගනිමින්) වඩා ඉහළ මට්ටමේ ප්‍රතිඵල පිළිබඳව උත්සුක වූ කතා පුවත් තෝරා ගන්නටත් වැඩි ඉඩකඩක් තිබුණි" *(ජෙස් ඩාර්ට්, 2000).*

මෙලෙස ම, කොටස්කරුවන්ගේ විවිධ කණ්ඩායම් විසින් තෝරා ගන්නා ලද කතා පුවත් අතර පවතින වෙනස්කම් පරීක්ෂාවට ලක් කිරීමෙන් ද, අපේක්ෂිත ප්‍රතිඵල සහ වටිනාකම් අතර පවතින වෙනස්කම් එළිදරව් කර ගත හැකි ය.

> **බංග්ලාදේශය - දිගු කාලීන වෙනස් වීම් සඳහා පැවති වැඩි කැමැත්ත**
> "සීසීඩීබීයේ දී, අවසන් තේරීම් ක්‍රියා දාමයේ දී (මෙය ආධාර දෙන්නන් සමග පැවැත්වූ වාර්ෂික වටමේස සාකච්ඡාවකි) තෝරා ගන්නා ලද අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වලට ඇතුළත් වූයේ, දිගු කාල පරිච්ඡේදයක් තිස්සේ සිදු වී තිබූ වෙනස් වීම් ය. මෙය, දිගු කාලීන බලපෑම පිළිබඳ සාක්ෂ්‍ය තහවුරු කර ගන්නට සීසීඩීබීයට සහ ආධාර දෙන්නන්ට පැවති උත්සුකතාව සමග සම්බන්ධ වන බවක් පෙනී ගියේ ය. මෙය තේරුම් ගත හැක්කක් නමුත්, සංවිධානයට ඉක්මනින් ප්‍රතිචාර දක්වා ඇති කළ හැකි කෙටි කාලීන වෙනස් වීම් නොදැකීමේ අවාසිය විඳ ගනිමින් එය සිදු වන්නට ඉඩ තිබේ" *(රික් ඩේවිස්, 1998c).*

## *කතා පුවත් තුළ සඳහන් වන ක්‍රියාකාරකම් හෝ කණ්ඩායම් විශ්ලේෂණය කිරීම*

සමස්ත කතා පුවත් කට්ටලය තුළ විවිධ ස්වරූපවලට අයත් ප්‍රතිලාභීන් කොතරම් නිරන්තර භාවයකින් යුතුව නියෝජනය වන්නේ ද යන්න සොයා බැලීම සඳහා, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් විශ්ලේෂණය කරන්නට ඔබට පුළුවන්කම තිබේ. සියලු ස්වරූපවල ප්‍රතිලාභීන් මැනවින් ආවරණය වන්නේ නම්, සොයා ගැනීම් මගින් සමස්ත ජනගහනය ම නියෝජනය වන බවට ඔබට වැඩි විශ්වාසයක් ඇති කර ගත හැකි ය. සීසීඩීබීය පිළිබඳ උදාහරණයේ දී, කතා පුවත්වල සඳහන් වූ මුළු ප්‍රතිලාභී කණ්ඩායම් ගණන මාසයෙන්

මාසයට වර්ධනය විය. ඒ අනුව දස මසක් ගත වන විට, ගමේ සිටින සියලු කණ්ඩායම්වලින් සියයට 70කට වැඩි ගණනක්, අඩු ගණනේ එක කතා පුවතකට වත් විෂය වී තිබුණි.

### *සහභාගිකයන් ව්‍යාපෘතියෙහි නියැළී සිටි කාල ප්‍රමාණය විශ්ලේෂණය කිරීම*

කතා පුවත තුළ විස්තර වන වෙනස් වීම් අත්දකින ප්‍රතිලාභීන් (හෝ ප්‍රජාවන්) කොතරම් නම් කාලයක් වැඩ සටහනට සහභාගි වී තිබේ ද යන්න විශ්ලේෂණය කිරීමෙන්, වැඩි දුර අන්තර්ඥානයක් මතු වී ආ හැකි ය. ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන් බොහොමයක දී, ධනාත්මක බලපෑම් වැඩිපුර ඇති වීම සමග දිගු කාලීන සහභාගිත්වය සම්බන්ධ ය යන පෙරදැක්මක් පවතී. අනෙක් අතට, ජනයාගේ ජීවිත කෙරෙහි වඩාත් ම විස්මිත බලපෑම ඇති වන්නේ, ඔවුන් වැඩ සටහනට සම්බන්ධ වී කෙටි කලක් ගත වූවාට පසුව බවට, සමහර ඉතිරි කිරීම් සහ ණය වැඩ සටහන් තුළ සාක්ෂ්‍ය තිබේ.

### *තේරීමේ මිනුම් දණ්ඩ විශ්ලේෂණය කිරීම*

කතා පුවත විශ්ලේෂණය කරන්නාක් මෙන් ම, විවිධ කණ්ඩායම් අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීමට යොදා ගන්නා මිනුම් දණ්ඩ ද විශ්ලේෂණය කළ හැකි ය. ඇසිය යුතු ප්‍රශ්න අතරට මේවා ඇතුළත් වේ: එනම්, *'කාලයත් සමග මිනුම් දණ්ඩ වෙනස් වෙනවා ද?'* යන්න සහ *'කතා පුවත් විනිශ්චය කිරීම සඳහා කොටස්කරුවන්ගේ විවිධ කණ්ඩායම් විවිධ මිනුම් දඬු යොදා ගන්නේ ද?'* යන්න යි. එක් කතා පුවතකට වඩා ඉහළින් තවත් කතා පුවතක් උසස් යැයි තෝරා ගැනීම සඳහා කණ්ඩායම් විසින් යොදා ගනු ලබන මිනුම් දණ්ඩ, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ ක්‍රියා දාමය මගින් ප්‍රලේඛනය කෙරෙන නිසා, දෙන ලද කාල පරිච්ඡේදයක් තුළ දී සංවිධානය අගයන්නේ කුමක් ද යන්න පිළිබඳව ඉන් අන්තර්ඥානයක් සම්පාදනය වේ. එමෙන් ම, විවිධ සංවිධාන යොදා ගත් මිනුම් දඬු සසඳා බැලීම ද ප්‍රයෝජනවත් විය හැකි ය. නිදසුනක් ලෙස, ජනයාගේ ජීවිත කෙරෙහි යම් බලපෑමක් ඇති කිරීම ගැන උත්සුක වීමත්, බලපෑම ඇති කරන්නා වූ සේවාවන්හි ස්ථාවර භාවය තහවුරු කිරීමත් අතර හට ගත් ආතතියක් බොහෝ සංවිධාන තුළ පවතියි. එමෙන් ම, වැඩ සටහන්වල සාමාජීය සහ ආර්ථික බලපෑම්වල සාපේක්ෂ වැදගත්කම පිළිබඳව විවිධ අදහස් පවතින විට ද ආතතිය මතු වී ආ හැකි ය.

## 10 වන පියවර: පද්ධතිය සංශෝධනය කිරීම

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යොදා ගන්නා හැම සංවිධානයක් ම වාගේ, හඳුන්වා දීමේ අදියර අතරතුර දී සහ පසුව, ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා දාමය යම් ආකාරයකින් වෙනස් කරයි. මෙය, යම් සංවිධානීය ඉගෙනීමක් සිදු වෙමින් පවතින්නේ ය යන්න හැඟවෙන යහපත් ලකුණක් වේ. කිසිදු සංශෝධනයක් සිදු නොකිරීම වැඩි කනස්සල්ලක් වනු ඇත. ඉන් හැඟෙන්නේ, චාරිත්‍රානුකූල සහ කල්පනාන්විත නොවූ ආකාරයකින් ශිල්ප ක්‍රමය යොදා ගන්නා බව යි.

එක සිට නවය දක්වා වූ පියවරයන්හි දී සිදු කළ විස්තර කිරීම් තුළ, මෙම වෙනස් වීම් සමහරක් දැනට මත් සඳහන් කොට තිබේ. හට ගන්නා පිළිවෙළ අනුව ගත් කල, වඩාත් ම පොදුවේ දැක ගත හැකි වෙනස් වීම් මේවා ය:

- යොදා ගනු ලබන වෙනස් වීම බලපෑ ක්ෂේත්‍රවල නමෙහි සිදු වන වෙනස් වීම්: නිදසුනක් ලෙස, සෘණාත්මක වෙනස් වීම් හසු කර ගන්නා බලපෑම් ක්ෂේත්‍ර හෝ 'ඉගෙන ගත් පාඩම්' නමැති බලපෑම් ක්ෂේත්‍රය එක් කිරීම

- වාර්තාකරණයේ නිරන්තර භාවයෙහි සිදු වන වෙනස් වීම්: නිදසුනක් ලෙස, සීසීඩීබීයේ දී මෙය, දෙසතියකට වරක් සිට මසකට වරක් දක්වා හෝ මසකට වරක් සිට තෙමසකට වරක් දක්වා වෙනස් විය

- සහභාගිකයන්ගේ ස්වරූපවල සිදු වන වෙනස් වීම්: නිදසුනක් ලෙස වීඑස්ඕ සංවිධානය, තමන්ගේ ම අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් ඉදිරිපත් කරන්නට මධ්‍යම කළමනාකාරිත්වයට ඉඩ සලසා දුන්නේ ය

- වඩාත් ම අර්ථාන්විත කතා පුවත් තේරීමට කැඳවනු ලබන රැස්වීම්වල ව්‍යුහයෙහි සිදු වන වෙනස් වීම්.

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යොදා ගන්නා සංවිධාන විසින් සිදු කරන බොහෝ වෙනස් වීම් මතු වී එන්නේ, භාවිතය පිළිබඳව එදිනෙදා සිදු කරන කල්පනාව තුළිනි. උදාහරණ කීපයක දී, සංවිධාන විසින් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ ක්‍රියා දාමය සම්බන්ධ පසු ඇගයීම් කරන්නට භාර ගෙන තිබුණි. එසේ නැත් නම්, පසු ඇගයීම් කරන්නට සංවිධානවලට පැවරී තිබුණි. මෙය පිළිබඳ මෑත කාලීන උදාහරණයක් වන්නේ, නිව් සවුත් වේල්සයේ සිඩ්නිහි තාක්ෂණය පිළිබඳ විශ්වවිද්‍යාලයේ, තිරසර අනාගතයක් සඳහා වූ ආයතනයෙහි ජුලියට් විලට්ස් විසින්, ලාඕසයේ ඒඩීආර්ඒ සංවිධානය ශිල්ප ක්‍රමය යොදා ගත් ආකාරය පිළිබඳව කළ පසු ඇගයීම යි. ජුලියට්ගේ පසු ඇගයීම, ශිල්ප ක්‍රමය යොදා ගැනීම පිළිබඳ පහත විස්තර කෙරෙන ආකාරයේ පැතිකඩ හතරක් පරීක්ෂාවට ලක් කළේ යः

- කාර්යක්ෂමතාවः පවත්නා සම්පත් සහ කාලය යොදා ගනිමින් ශිල්ප ක්‍රමය කොතරම් හොඳින් ක්‍රියාත්මක කෙරුණේ ද යන්න, සහ ශිල්ප ක්‍රමයේ ප්‍රතිලාභ පිරිවැය සමග සැසඳෙන්නේ ද නැද්ද යන්න

- සාඵල්‍යතාවः ශිල්ප ක්‍රමය යොදා ගැනීමේ අරමුණු මුදුන් පමුණුවා ගත්තේ කොතරම් දුරකට ද යන්න

- ඵලදායකත්වයः ශිල්ප ක්‍රමය යොදා ගැනීමෙන්, වැඩ සටහන වැඩි දියුණු කිරීමට පහසුකම් සැපයීම සඳහා ලාඕසයේ ඒඩීආර්ඒ සංවිධානයට කොතරම් ශක්තියක් සැපයුණේ ද යන්න

- ප්‍රතිගුණන හැකියාව (replicability)ः අදාළ තත්ත්වය, කාර්ය මණ්ඩලය, වැඩ සටහන්, සහ ආධාර දෙන්නන් අතින් පවතින වෙනස්කම් මගින්, ලාඕසයේ ඒඩීආර්ඒ සංවිධානය ශිල්ප ක්‍රමය යොදා ගත් ආකාරය ප්‍රතිගුණනය කරන්නට (ඒ අයුරින් ම සිදු කරන්නට) අනෙකුත් සංවිධානවලට පවතින හැකියාව සීමා වන්නට ඉඩ තිබෙන්නේ කොතරම් දුරකට ද යන්න.

ශිල්ප ක්‍රමය යොදා ගැනීම පිළිබඳව කෙරෙන පසු ඇගයීම්වලට අතිරේක පිරිවැය දරන්නට සිදු වේ. මේවා වඩාත් ම සාධාරණීකරණය කළ හැකි වන්නේ, සාර්ථක යැයි සනාථ වුව හොත් වඩා පුළුල් පරිමාණයකින් ශිල්ප ක්‍රමය යොදා ගැනීම ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇතිව, නියමු පදනමක් මත ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක වී තිබෙන තැන්වල ය. ලාඕසයේ ඒඩීආර්ඒ සංවිධානයේ පසු ඇගයීම සම්බන්ධයෙන් පැවති තත්ත්වය වූයේ මෙය යි.

# තුන් වන පරිච්ඡේදය: ගැටලු සමථයකට පත් කිරීම

එඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය හඳුන්වා දීමේ දී සහ යොදා ගැනීමේ දී ජනයා මුහුණ දෙන වඩාත් ම පොදු ගැටලු සහ උත්සුකතාවන්, මෙම පරිච්ඡේදය තුළ ලැයිස්තුගත කරනු ලැබේ. මින් සමහරක් මෙම මාර්ගෝපදේශකයේ වෙනත් කොටස්වල දී ද ආමන්ත්‍රණය කෙරේ. හය වන පරිච්ඡේදය වලංගුතාව ආමන්ත්‍රණය කිරීම එවැන්නකි.

## සහභාගිකයන් වෙතින් ප්‍රකාශයට පත් වන උත්සුකතා

### ප්‍රශ්නය සමග බැඳී පවතින ගැටලු

හොඳ කතා පුවත් අනාවරණය කර ගැනීමේ දුෂ්කරතාව පිළිබඳව බොහෝ ජනයා අදහස් දක්වා තිබේ. ප්‍රශ්නය පරිවර්තනය කොට ඇත්තේ කෙසේ ද යන්න, විශේෂයෙන් ම 'අර්ථාන්විත භාවය' යන වචනය පරිවර්තනය කොට ඇත්තේ කෙසේ ද යන්න, බොහෝ විට මීට සම්බන්ධ ය.

ප්‍රජා සංවර්ධන වැඩ කටයුතු තුළ පොදුවේ බලපවත්වන්නාක් මෙන්, හොඳ කතා පුවත් අනාවරණය කර ගැනීමේ දී ද යම් පර්යේෂණ නිපුණතාවන් අවශ්‍ය ය. ජනයා සමග සම්බන්ධ වන්නට සහ ඔවුන්ගේ අදහස් අනාවරණය කර ගන්නට ඔබට හැකි විය යුතු ය. ප්‍රශ්නය ප්‍රතිඵල ගෙන දෙන්නේ නැත් නම් ඔබ පරෙස්සම් සහගතව එය නැවත පදගත කිරීම අවශ්‍ය විය හැකි ය. ඔබ ප්‍රාදේශීය භාෂාවෙන් ප්‍රශ්නය පදගත කිරීමේ යහපත් ක්‍රමයක් සොයා ගත් පසු එහි එල්බී ගන්න. බෝගේන්විල්හි දී, පහත උදාහරණයෙන් පෙන්නුම් කෙරෙන ආකාරයේ පියවරෙන් පියවර සිදු වන ප්‍රශ්න කිරීමේ ක්‍රියා දාමයක් යොදා ගැනීම උදව්වක් විය හැකි බව ජෙස් වටහා ගත්තේ ය.

**බෝගේන්විල් ප්‍රදේශය - ප්‍රශ්නය පදගත කළ යුත්තේ කෙසේ ද යන්න සමග බැඳී පවතින ගැටලු**

"ශිල්ප ක්‍රමය තුළ පවතින ප්‍රශ්න කිරීමේ ශිල්ප ක්‍රමය යොදා ගනිමින් කතා පුවත් රැස් කිරීම, පහසු දෙයක් යැයි මට දැනුණේ නැත. මා ලබා ගන්නට උත්සාහ කරමින් සිටියේ කුමක් දැයි ජනයා සැණෙකින් අවබෝධ කර ගත්තේ නැත. ටොක් පිසින් භාෂාව යොදා ගත්තේ නම් මෙය බෙහෙවින් පහසු වන්නට ඉඩ තිබුණි. එහෙත් ඉංග්‍රීසි බස යොදා ගත් විට, සවිස්තරාත්මක පිළිතුරක් ලබා ගැනීම සඳහා වැඩි පෙළඹවීම් අවශ්‍ය විය.
අවසානයේ දී, මම ශිල්ප ක්‍රමයේ මඳක් වෙනස් කළ පිටපතක් යොදා ගත්තෙමි. මා පහත දැක්වෙන ප්‍රශ්න හතර ඇසුවේ එම තත්ත්වය තුළ දී ය.

- ඔබ ව්‍යාපෘතිය හා සම්බන්ධ වී සිටින්නේ කවර ආකාරයකට ද?
- මෙම ව්‍යාපෘතිය ඔබ සම්බන්ධයෙන් ඇති කර තිබෙන වැදගත් වෙනස් වීම් මොනවා ද?
- මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රජාව තුළ ඇති වී තිබෙන වැදගත් වෙනස් වීම් මොනවා ද?
- එහි පැවති ගැටලු මොනවා ද?

සහභාගිකයන් සතු අත්දැකීම් පදනම් කර ගනිමින්, මෙම ප්‍රශ්න හතරෙන් ඕනෑ ම එකකින් කතා පුවත මතු වී ආ හැකි බවක් පෙනී ගියේ ය" *(ජෙස් ඩාර්ට්, නව සීලන්ත ඔක්ස්ෆෑම් සංවිධානය වෙනුවෙන් වැඩ කිරීම, 2004).*

### *කිසිවක් වෙනස් වී නැහැ, ඉතින් අප වාර්තා කරන්නේ කුමක් ද?*

ප්‍රතිචාර දක්වන්නන් කිසි යම් ආකාරයක පරිපූර්ණ අර්ථයකින් අර්ථාන්විත යැයි අර්ථදැක්විය හැකි වෙනස් වීමක් බලාපොරොත්තු වන බවක්, ඇතැම් විට මෙම ප්‍රතිචාරයෙන් හැඟේ. සියලු ආකාරවල වෙනස් වීම් සොයා යන ලෙසත්, අනතුරුව සටහන් කර ගත් සියලු වෙනස් වීම් අතුරින්, තමන් සාපේක්ෂ වශයෙන් වඩාත් ම අර්ථාන්විත යැයි සිතන ඒවා හඳුනා ගන්නා ලෙසත් ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින්නට එය උදව් වේ. වඩා දාර්ශනික නැඹුරුවක් ඇති අය හෙරක්ලිටස්ගේ අදහස්වලින් උපුටා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැකි ය. 'එක ම ගඟකට දෙවරක් පය තබන්නට නොහැකි ය' යි ඔහු කියා ඇති බව වාර්තා වේ. එහි තේරුම නම්, වෙනස් වීම් සැම විට ම සිදු වෙමින් පවතින්නේ ය යන්න යි. එබැවින්, කිසිවක් වෙනස් වී නැතැයි පැවසීම කිසි විටෙකත් සත්‍යයක් නොවන්නේ ය යන්න යි. මෙහි අදහස වන්නේ, කිසි ම වෙනස් වීමක් දකින්නට නැත් නම්, ඒ පිළිබඳව උත්සුකතාවක් දක්වන තැනැත්තා වඩා සමීපව බැලිය යුතු බව යි.

### *අර්ථාන්විත යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?*
### *ඒ කුමකට සාපේක්ෂව ද?*

ඔව්, යම් කණ්ඩායමක් වඩාත් ම අර්ථාන්විත යැයි තමන් සිතන දේ පිළිබඳව තීන්දුවකට එළඹෙන්නට නම්, එය යම් පොදු උත්සුකතාවකට අදාළ වන්නක් විය යුතු ය. ශිල්ප ක්‍රමයේ බොහෝ යොදා ගැනීම් හා බැඳී පවතින පොදු උත්සුකතාව වනු ඇත්තේ වැඩ සටහනේ අරමුණු ය. දැනට සිටින අදියරේ දී, තව මත් ඒවා එතරම් පැහැදිලිව අර්ථදැක්වී නොතිබෙන්නට ඉඩ තිබුණ ද, එය ප්‍රශ්නයක් නො වේ.

> **සානාව - කාගේ ඉදිරි දැක්ම ද?**
>
> "III වන කාල පරිච්ඡේදය අතරතුර දී, 'වඩාත් ම' අර්ථාන්විත වෙනස් වීම් මොනවා ද යන්න ගැන එකඟතාවකට ඒමට උත්සාහ දරන විට, එක් දිස්ත්‍රික්කයක සිදු වූ, එහෙත් තවත් තැනක දී අර්ථාන්විත නොවනු ඇති වෙනස් වීම් පිළිබඳ උදාහරණ දෙකක් ලබා දෙන ලදි. ජමාන්හි දී සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රම දෙකක් හඳුන්වා දීම, එවන් යෝජනා ක්‍රම දැනට මත් පවතින අසුනාගෝහි දී අර්ථාන්විත නොවනු ඇත (අවසානයේ දී, මෙම යෝජනා ක්‍රමය හඳුන්වා දීම, ග්‍රාමීය ජීවනෝපායන් සම්බන්ධයෙන් සිදු වූ වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම යැයි තෝරා ගැනුණි). මෙලෙසින් ම, අසුනාගෝහි සේවා බෙදා හැරීම සම්බන්ධයෙන් ගත් කල වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම යැයි හඳුනා ගන්නා ලද 'සුසු' බැංකු යෝජනා ක්‍රමය, දැනට මත් එය ක්‍රියාත්මකව පවතින ජමාන්හි දී අර්ථාන්විත නොවනු ඇත. අප වෙනස් වීම්වල ප්‍රතිලාභීන්ට ඇති සාපේක්ෂ අර්ථාන්විත භාවය සසඳා නො බැලිය යුතු ය, ඒ වෙනුවට කළ යුත්තේ, අපගේ ඉදිරි දැක්මට අනුව ගත් විට ඇති සාපේක්ෂ අර්ථාන්විත භාවය සසඳා බැලීම ය යන නිගමනය ඇති කර ගන්නට මෙම සාකච්ඡාව හේතු විය. කොයි යම් තරමේ සාකච්ඡාවකට වුව ද, 'සුසු' යෝජනා ක්‍රමය හෝ සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රම, ඒවා හඳුන්වා දී තිබූ එක් එක් දිස්ත්‍රික්කවල දී දැවැන්ත අර්ථාන්විත භාවයක් අත් කර ගෙන තිබුණේ ය යන මුළුමනින් ම වලංගු ප්‍රකාශ වෙනස් කළ නොහැකි ය. එක් එක් යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන තර්ක කොතරම් ඒත්තු ගන්වනසුලු වුව ද, මෙය 'සම්මුති ගැස්විය' හැකි යමක් නො වී ය. අපි වැරදි මිනුම් දණ්ඩක් සිතේ තබා ගෙන, 'වඩාත් ම' අර්ථාන්විත වෙනස් වීම තේරීමට පිවිසෙමින් සිටියෙමු ද?" *(ජොන්ස්ටන්, 2002:9).*

### *මෙය මුළුමනින් ම ආත්මීය ය!*

කල් තබා අර්ථදක්වන ලද සහ එකඟ වූ නියමයන්ට අනුව තේරීම් කරනවා වෙනුවට, අර්ථාන්විත වෙනස් වීමක් යනු කුමක් ද යන්න ගැන තමන්ගේ ම විනිශ්චයක් යොදා ගන්නට සිදු වන්නේ ය යන අදහස, සමහර සහභාගිකයන්ට සුවපහසුවක් ගෙන නොදෙන්නට ඉඩ තිබේ.

මෙම උත්සුකතාවට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රම දෙකක් අපි යෝජනා කරන්නෙමු. එකක් නම්, වඩාත් ම අර්ථාන්විත වන්නේ කුමක් ද යන්න පිළිබඳව තමන් කළ තේරීම් සම්බන්ධයෙන්, තමන්ගේ පැහැදිලි කිරීම් ලියා දක්වන ලෙස ජනයාගෙන් ඉල්ලා සිටීමෙන්, අපි ඔවුන්

ආත්මීය වශයෙන් වගකිව යුතු තත්ත්වයට පත් කරන්නෙමු ය යන්න යි. ඔවුන්ගේ විනිශ්චයන්, අනෙකුත් සහභාගිකයන්ගේ සියුම් පරීක්ෂාවට විවර කෙරේ. මෙම කරුණ දැන ගැනීම මගින් ද, තමන්ගේ තේරීම් පිළිබඳව තමන් පැහැදිලි කරන ආකාරය ගැන පරෙස්සම් සහගතව සිතා බලන්නට සහභාගිකයන් තුළ පෙළඹවීමක් ඇති කෙරෙන්නට පුළුවන. අනෙක් අතට, මෙය සිදු වන්නට බෙහෙවින් ම ඉඩ තිබේ ය යන්න කාංසාවක් පැන නංවන්නට හේතු විය හැකි ය. විශේෂයෙන් ම, 'විනිශ්චයන් ඉදිරිපත් කරන ලෙස' ජනයාගෙන් සාමාන්‍යයෙන් ඉල්ලා නොසිටින තැනක දී, මෙම තත්ත්වය ඇති විය හැකි ය.

දෙවන ප්‍රතිචාරය නම්, විනිශ්චයක් සිදු කිරීමේ දී, වෛෂයික වශයෙන් (විෂයමූලික වශයෙන් - objectively) ගත් විට නිවැරදි හෝ වැරදි යැයි කිව හැකි, කිසිදු ප්‍රතිචාරයක් නොපවතින්නේ ය යන්න යි. අපි මහජනයාගේ අර්ථදැක්වීම් ඉල්ලා සිටින්නෙමු. එම අර්ථදැක්වීම් බවට පත් වන්නේ, දෙන ලද තත්ත්වයක් තුළ දී වැදගත් වන්නේ කුමන වටිනාකම් ද යන්න ගැන ඉදිරිපත් වන තර්කයන් ය. එක් පුද්ගලයෙකු, ස්ථාවර භාවය සම්බන්ධයෙන් යම් සුවිශේෂ වෙනස් වීමක් කිරීමේ වැදගත්කම වෙනුවෙන් තර්ක කරන්නට පිළිවන. තවෙකෙකු ස්ත්‍රී-පුරුෂ සමානතාව සම්බන්ධයෙන් සිදු වී ඇති වැඩි දියුණු වීම් නිසා තර්ක කළ හැකි ය. මෙම අර්ථදැක්වීම් අතරින් යම් තෝරා ගැනීම් කරන්නේ ය යන්නෙන් අදහස් වන්නේ, විවිධ වටිනාකම්වලට දෙනු ලබන ප්‍රමුඛතාව කුමක් ද යන්න සම්බන්ධයෙන් තෝරා ගැනීම් සිදු වන බව යි. මෙය සත්‍යය පිළිබඳව කරන ගණන් බැලීමක් නො වේ. සාකච්ඡාව තුළින් එකඟතාවකට එළඹීම පිළිබඳ කාරණාවකි.

> **සානාව - අර්ථාන්විත භාවය යනු කුමක් ද?**
> "අර්ථාන්විත භාවය යන්න 'ආත්මීය' ය. ක්‍රියා දාමය පිළිබඳව අනුක්‍රමයෙන් කෙරෙන 'තෝරා ගැනීම්' මගින්, කලින් කළ තෝරා ගැනීම් අවලංගු වීමක් අදහස් නො වේ. ඉන් සිදු වන්නේ, කතා පුවත් අර්ථදක්වන 'තේරීම් කරන්නන්ගෙන්' මතු වී එන විවිධ ඉදිරි දැක්මවල් පිළිබිඹු වීම පමණකි" *(ජොන්ස්ටන්, 2002:9).*

## *අපට අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ එක් කතා පුවතක් පමණක් තෝරා ගන්නට සිදු වන්නේ ඇයි?*

බොහෝ විවිධ වූ හේතු නිසා, තමන් ඉදිරියේ පවතින අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ බොහෝ කතා පුවත් අතුරින්, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ එක් කතා පුවතක් තෝරා ගැනීමට සිදු වීම ගැන, සහභාගිකයන් වෙතින් උත්සුකතාවන් හෝ අකමැත්ත පවා පළ වන්නට ඉඩ තිබේ. ඔවුන්ට වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය අවබෝධ වන්නේ නැත් නම්, තෝරා ගැනීමක් කරන්නට සිදු වීමේ ක්‍රියා දාමය ඊට උදව්වක් විය හැකි බව පහදා දෙන්නට ඔබට පුළුවන. එනම්, විශේෂයෙන් ම කණ්ඩායමික සැකැස්මක දී, විවාදය ඇවිස්සීමටත්, එක් එක් කතා පුවත තුළ ඇතුළත් වී තිබෙන දේ ගැන වඩා ගැඹුරින් සිතීම සඳහා මහජනයා පෙළඹවීමටත්, තෝරා ගැනීමක් කරන්නට සිදු වීමේ ක්‍රියා දාමයට හැකියාව තිබෙන බව පහදා දෙන්නට ඔබට පුළුවන. තෝරා ගැනීමට ඇති නොකැමැත්ත ද, වැඩි සාමාජීය සහ සංස්කෘතික පදනමක් අත් කර ගනිමින් වැඩි දියුණු විය හැකි ය. ගැටුම මග හැර යන්නට, හෝ අනෙකුන් විවේචනයට ලක් කිරීමක් ලෙස තේරුම් ගන්නට, සහභාගිකයන්ට වුවමනා විය හැකි ය. තත්ත්වය මෙය නම්, තේරීම් ක්‍රියා දාමය ව්‍යුහගත කළ හැකි විවිධ ක්‍රම ගැන සලකා බලන්න. රහස් ඡන්දය මගින් කැමැත්ත ප්‍රකාශ කිරීම ඇතුළු ඇතැම් විකල්පයන්, පස් වන පියවරෙහි දළ වශයෙන් විස්තර කර තිබේ. සමහර විට, එක් කතා පුවතකට වඩා තෝරා ගන්නට සහභාගිකයන්ට ඉඩ දීම අවශ්‍ය විය හැකි ය. වෙනත් දුෂ්කර සැකසුම් තුළ දී, ඉවත් කළ හැකි අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් හඳුනා ගන්නා ලෙස, එනම් වඩාත් ම අර්ථාන්විත කතා පුවත වෙනුවට, අඩුවෙන් ම අර්ථාන්විත කතා පුවත තෝරා ගන්නා ලෙස, සහභාගිකයන්ගෙන් ඉල්ලා තිබේ. යම් ආකාරයක තේරීම් ක්‍රියා දාමයක් යොදා ගත නොහැකි කිසි ම තත්ත්වයක් අප අත්දැක නැත.

## *මෙය ඕනෑවට වඩා කාලය කා දමන්නකි!*

ප්‍රතිලාභීන් සහ කාර්ය මණ්ඩලය විශාල සංඛ්‍යාවක් සිටින විශාල සංවිධාන තුළ දී, කාලය සැලකිය යුතු ගැටලුවක් විය හැකි ය. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීම සඳහා කැඳවනු ලබන කිසි ම රැස්වීමකට හෝරා දෙකකට වඩා වැය නොවන අයුරින්, තේරීම් ක්‍රියා දාමය ව්‍යුහගත කළ යුතු ය. රැස්වීම්වලට පෙර කියවිය හැකි වන අයුරින් කතා

පුවත් බෙදා හරින්නට හෝ තේරීම් රැස්වීම්වලට පහසුකම් සපයන්නෙකු ලබා ගන්නට උත්සාහ ගන්න. කියවීම, සාකච්ඡා කිරීම, ලකුණු දීම හෝ ඡන්දය දීම, සහ අනතුරුව එකඟ වූ තීරණ ප්‍රලේඛනය කිරීම සඳහා ස්ථාපනය කොට ඇති ක්‍රියා පටිපාටීන් ද උදව් කර ගත හැකි ය. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් වාර්තා කිරීමේ නිරන්තර භාවය සම්බන්ධයෙන් යම් වෙනසක් සිදු කරන්නට සංවිධානවලට හැකියාව තිබේ. සංවිධාන කීපයක් පමණක් දෙසතියකට වරක් එය සිදු කරයි. බොහෝ සංවිධාන එය මාසිකව සිදු කරන අතර, සමහර සංවිධාන එය ත්‍රෛමාසික වාර්තාකරණය බවට වෙනස් කොට ඇත.

හේතු ගණනාවක් නිසා, තනි පුද්ගල සහභාගිකයන්, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් ප්‍රලේඛනය කිරීම කා දමන්නක් ලෙස සලකන්නට ඉඩ තිබේ. ක්‍රියා දාමය අලුත් එකක් හෝ හුරුපුරුදු නොවූවක් විය හැකි ය. එසේ නැත් නම්, සහභාගිකයන් ආඛ්‍යානමය වාර්තාකරණයට හුරුපුරුදු නැතුවා විය හැකි ය. මෙම තත්ත්වය තුළ දී, කතා පුවත් රැස් කිරීම සම්බන්ධ මහජනයාගේ හැකියාවන් ගොඩ නැගීම සඳහා කාලය ගැනීම අවශ්‍ය ය. නිදසුන් ලෙස, යහපත් භාවිතය පිළිබඳ ධනාත්මක ප්‍රතිපෝෂණ සැපයීම, යහපත් භාවිතය පිළිබඳව අන් තැනකින් උදාහරණ ලබා දීම, සහ (සීසීඩීබීය විසින් සිදු කර ඇත්තාක් මෙන්) සංස්කරණය පිළිබඳ පුහුණුවක් ලබා දීම ගත හැකි ය.

කාරණා දෙකක් නිසා, කතා පුවත් ප්‍රලේඛනය කාලය කා දමන්නක් වන්නට ඉඩ තිබේ. එකක් නම්, ක්ෂේත්‍රය තුළ සිදු වෙමින් පවත්නා දේ පිළිබඳව කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් අවබෝධයක් නොතිබීම යි. අනෙක නම්, කතා පුවත් අනාවරණය කර ගැනීම සඳහා ප්‍රජාවන් වෙත විශේෂ සංචාරවල යෙදෙන්නට සිදු වීම යි. මෙය සංවිධානය තුළ මතුව එන වඩා පුළුල් ගැටලුවල නිමිත්තක් විය හැකි ය. කළමනාකරුවන්ගේ අවධානය ඊට යොමු විය යුතු ය.

ශිල්ප ක්‍රමය කාලය කා දමන්නක් යැයි පැමිණිලි කිරීම, ඉහළ මට්ටමේ පෙළඹීමක් නැතිකම සමග ද සම්බන්ධ වී තිබිය හැකි ය. ශිල්ප ක්‍රමය වෙනුවෙන් තමන් වැය කරන කාලයෙන් ප්‍රමාණවත් ප්‍රයෝජනයක් ලැබෙන බවක් සහභාගිකයන්ට නොපෙනෙන්නට පුළුවන. එසේ නැත් නම්, ඔවුන් තම කාලය හා සම්බන්ධ වෙනත් පීඩනයන් අත්දකිමින් සිටිනවා වන්නට පුළුවන. සහභාගිකයන් ප්‍රතිලාභ නොදකින්නේ නම්, ප්‍රතිපෝෂණය යැව්වා ද ලැබුණා ද යන්න සොයා බලන්න. මෙම සහභාගිකයන් විසින් නම් කරන ලද කතා පුවත් අතුරින් කවරක් හෝ, ඉහළ තලවල දී තෝරා ගෙන තිබේ ද? එසේ තෝරා ගැනීමක් සිදු වී නැත් නම්, ඒ ඇයි? ඒවා තෝරා නොගැනෙන්නේ ඇයි ද යන්න ගැන හේතු සැපයීම ප්‍රයෝජනවත් කල්පනාවක් විය හැකි ද? සහභාගිකයන්ගේ කාලය කෙරෙහි බලපාන වෙනත් පීඩනයන් පවතී නම්, ඔවුන්ගේ කළමනාකරුවන් විසින් මේවා හඳුනා ගෙන ආමන්ත්‍රණය කළ යුතු ය.

### *මෙය ඕනෑවට වඩා තරගකාරී ය!*

සමහර සංවිධාන සහ සංස්කෘතීන් තුළ පවත්නා ආචාර ධර්ම මගින් තරගකාරිත්වය පිළිබඳ පෙළඹවීම් ඇති නො වේ. එවැනි තැනක දී, වඩාත් ම අර්ථාන්විත කතා පුවත සොයමින් කරන තේරීම, එම තරගකාරී නොවන ආචාර විධිවලට එරෙහිව යාමක් බවට පත් විය හැකි ය. තේරීම් ක්‍රියා දාමයේ තරගකාරී ස්වභාවය පිළිබඳව ඉදිරිපත් වන පැමිණිලි මගින්, තමන්ගේ පෞද්ගලික ක්‍රියාකාරිත්වය ගැන තිබෙන පුද්ගල කාංසාවන් පිළිබිඹු වනවා ද විය හැකි ය. තරගකාරිත්වය පිළිබඳ හැඟීමක් පැවතීම බොහෝ විට හිතකර විය හැකි අතර, මෙම උත්සුකතාවන්ට ප්‍රතිචාර දැක්විය හැකි එක් ක්‍රමයක් වන්නේ, පුද්ගලයන් අතර නො ව කතා පුවත් අතර යම් තරගකාරිත්වයක් ඇති වන පරිදි අවධානය මාරු කිරීම යි. එසේ නැත් නම්, කතා පුවත් අතර නො ව, කතා පුවත් තේරීමේ ක්‍රියා දාමය පිටුපස පවතින වටිනාකම් අතර යම් තරගකාරිත්වයක් ඇති වන පරිදි අවධානය මාරු කිරීම යි.

තරගකාරී ආතතීන් පාලනය කිරීමට ද තේරීම් ක්‍රියා දාමයන් සැලසුම් කළ හැකි ය. නිදසුනක් ලෙස, එක් ඕස්ට්‍රේලියානු ක්‍රියාත්මක කිරීමක දී, තේරීම් ක්‍රියා දාමය කාර්ය මණ්ඩලය අතර තරගකාරිත්වය ඇති කරන බව ඇතැම් සහභාගිකයන්ට හැඟී ගියේ ය. සමහර කාර්ය මණ්ඩල මෙමගින් ඇති වූ පීඩනයට නොකැමති විය. කාර්ය මණ්ඩලය තව දුරටත් කතා පුවත් සඳහා ඡන්දය ප්‍රකාශ නොකරන අයුරින්, සහ කොටස්කරුවන්ගේ මෙහෙයුම් කණ්ඩායමක් තේරීම් සිදු කරන අයුරින්, තේරීම් ක්‍රියා දාමය වෙනස් කෙරිණ. මෙය ගැටලුව විසඳූ බවක් පෙනී ගියේ ය.

## *අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කිසිදු කතා පුවතකින් අප කරමින් සිටින දේ සැබවින් නියෝජනය වන්නේ නැහැ!*

ඇතැම් විට මින් පිළිබිඹු වනවා ඇත්තේ, අපේක්ෂාවන් සහ යථාර්ථය අතර කනස්සල්ල දනවන පරතරයක් තිබෙන බව ගැන දැනුවත් වීමකි. එසේ නැත් නම්, යථාර්ථය පිළිබඳ මූලස්ථානයේ සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ අදහස් අතර, කනස්සල්ල දනවන පරතරයක් තිබෙන බව ගැන දැනුවත් වීමකි. වඩා යථාර්ථවාදී වූ යමක් වාර්තා කරනවා වෙනුවට, අපේක්ෂා කරනු ලබන්නේ යැයි තමන් සිතන දේ වාර්තා කරන කාර්ය මණ්ඩලයක් ඉන් පිළිබිඹු වනවා ද විය හැකි ය. කල් තබා මෙම තත්ත්වය දුරු කර ගැනීමට ප්‍රතිචාර දැක්විය හැකි එක් ක්‍රමයක් වන්නේ, ශිල්ප ක්‍රමය සම්බන්ධ ආරම්භක පුහුණුව අතරතුර දී ඊට ප්‍රතිචාර දැක්වීම යි. අපේක්ෂා කෙරෙන සහ නොකෙරෙන යන දෙවර්ගයට ම අයත් අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ සත්‍ය කතා පුවත් අවශ්‍ය කරන බව ගැන පැහැදිලි පණිවුඩයක් ලබා දෙන්න. එමෙන් ම, අනුක්‍රමයෙන් එන එක් එක් වාර්තාකරණ කාල සීමාව තුළ දී, නැවත නැවතත් ඉදිරිපත් වන එක ම වර්ගයකට අයත් අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ උදාහරණ තෝරා නොගන්නට ඉඩ ඇති බව ගැන පැහැදිලි පණිවුඩයක් ලබා දෙන්න. ප්‍රතිචාර දැක්විය හැකි තවත් ක්‍රමයක් වන්නේ, වඩාත් ම අර්ථාන්විත යැයි තෝරා ගැනෙන කතා පුවත්වලට ඈඳන ලද, තොරතුරු විස්තර කෙරෙන ප්‍රතිපෝෂණයක් තුළින් එය සිදු කිරීම යි. කතා පුවතේ ධනාත්මක ලක්ෂණ පෙන්වා දෙන්නට මෙන් ම, තව මත් දකින්නට නැත්තේ මොනවා ද යන්න අඟවන්නට ද ඊට හැකියාව තිබේ. අපේක්ෂා භංගත්වය ප්‍රකාශයට පත් වන්නේ, මධ්‍යම හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගෙන් නො ව ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයෙන් නම්, දකින්නට නැතැයි තමන් සිතන දේ විස්තරාත්මකව පැහැදිලි කරන්නට ජනයා පොළඹවා, කතා පුවතකට පෙරළිය හැකි උදාහරණයක් ලබා දෙන්න.

## *විනිශ්චයක් සිදු කරන්නට තරම් ප්‍රමාණවත් තොරතුරු කතා පුවත තුළ නැහැ!*

මුහුණත වටිනාකම සැලකිල්ලට ගත් විට මින් ඇඟෙන්නේ, ප්‍රශ්නයට බඳුන් වී ඇති කතා පුවත, සියලු කතා පුවත් අතුරින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත ලෙස තෝරා නො ගත යුතු බව යි. එසේ නැත් නම්, වැඩි විස්තර ඇතුළත් කරනු පිණිස එය සම්පාදකයා වෙත ආපසු යැවිය යුතු බව යි. මෙහි දී, මෙම කොටසේ දී කලින් ආමන්ත්‍රණය කරන ලද ගැටලුවක් වන පැමිණිල්ල ම, තෝරා ගැනීම් පිළිබඳව වූ කාංසාවන්හි ස්වරූපයෙන් වසං වී සිටිනවා ද විය හැකි ය.

## *අපගේ කතා පුවත සියලු කතා පුවත් අතුරින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත ලෙස තෝරා ගෙන නැත්තේ ඇයි?*

බොහෝ අවස්ථාවල දී, තෝරා ගැනීමට විෂය වූ සියලු කතා පුවත්වල පවතින වටිනාකම් පිළිබඳ ප්‍රතිපෝෂණයක් සම්පාදනය කරන්නට දිගු කලක් ගත වේ. මෙවැනි තත්ත්වයන්හි දී, වඩාත් ම අර්ථාන්විත යැයි තෝරා ගන්නා ලද අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත සමග ඔවුන්ට සම්පාදනය කරන ලද ප්‍රතිපෝෂණය පදනම් කොට ගෙන, තමන්ගේ කතා පුවත් විනිශ්චයට ලක් වූ ආකාරය අනුමාන කරන්නට සහභාගිකයන්ට සිදු වේ. මෙය සිදු කිරීමේ දී, සමහර සහභාගිකයන් අනෙකුන්ට වඩා හොඳින් එය ඉටු කරන්නට ඉඩ තිබේ. වඩාත් ම අර්ථාන්විත කතා පුවත පිළිබඳව සම්පාදනය කරන ලද ප්‍රතිපෝෂණයේ ගුණාත්මක භාවය, තිබිය යුතු තරම් හොඳ මට්ටමක නොතිබෙන්නට පුළුවන. තනි උදාහරණයක් පිළිබඳ ප්‍රතිපෝෂණයක් යොදා ගැනීමේ දී, විවිධ ගැටලු මතු වේ. මෙම ගැටලු ආමන්ත්‍රණය කළ හැකි එක් මගක් වන්නේ, මෙම කතා පුවත පිළිබඳ අදහස් දක්වා ඇත්තේ සන්සන්දනාත්මක ස්වරූපයකින් ය යන්න සහතික කිරීම යි. අවශ්‍ය නම් මෙහි දී අනෙකුත් කතා පුවත් අදාළ කර ගැනීම ද කළ හැකි ය. තවත් ප්‍රතිචාරයක් වන්නේ, අතෘප්තිකර භාවය පළ කරන අදහස්වලට ඇහුම්කන් දී, ප්‍රයෝජනවත් වේ යැයි පෙනී යන තැන්වල දී, උදාහරණයෙන් උදාහරණයට ගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීම යි.

තේරීම් ක්‍රියා දාමයේ ප්‍රතිඵල පිළිබඳ පැමිණිලි, සමහර විට ක්‍රියා දාමය තුළ පවතින බව දැනෙන පක්ෂපාතීකම්වලට සම්බන්ධ වී තිබිය හැකි ය. නිදසුනක් ලෙස, කතා පුවත් තෝරා ගනු ලබන්නේ, කතා පුවතක අන්තර්ගතය අනුව නො ව කතා පුවත සම්පාදනය කළ තැනැත්තා කවුරුන් ද යන පදනම මත යැයි සහභාගිකයන්ට හැඟෙන්නට ඉඩ තිබේ. විශේෂයෙන් ම, වඩා විශාල සංවිධාන තුළ දී මෙය සැබෑ අවදානමක් වන්නේ ය. තේරීම් ක්‍රියා දාමය හැකි තරම් විනිවිද පෙනෙන තත්ත්වයට පත් කිරීම මගින් මීට ප්‍රතිචාර දක්වන්නඃ නිදසුනක් ලෙස, පරීක්ෂාවට ලක් කරන ලද එක් එක් කතා පුවතට සම්බන්ධිතව

සහභාගිකයන් කළ තක්සේරු කිරීම් ප්‍රදර්ශනය කිරීම මගින් මෙය කළ හැකි ය. පසු විශ්ලේෂණය මගින් ද මෙම අවදානම ආමන්ත්‍රණය කළ හැකි වේ. සීසීඩීබීයේ දී, ඩකා මූලස්ථානයේ තනි පුද්ගල සහභාගිකයන් කළ තේරීම්, කතා පුවත්වල මූලාශ්‍රයට (කතා පුවත් ලබා ගත් ස්ථානයට සහ කතා පුවත ලබා දුන් කාර්ය මණ්ඩල සාමාජිකයාට) සම්බන්ධ ද නැද්ද යන්න රික් පුළුල්ව විශ්ලේෂණය කළේ ය. කිසිදු සහසම්බන්ධයක් සොයා නොගැනුණු අතර, ඉන් ඇඟවුණේ කිසිදු සුවිශේෂ මූලාශ්‍රයක් කෙරෙහි කිසිදු පෞද්ගලික පක්ෂපාතීකමක් නොවූයේ ය යන්න යි.

යම් ප්‍රදේශයක්, තමන්ගේ ප්‍රදේශයට විශේෂයෙන් ම අදාළ යැයි තමන් විශ්වාස කරන වෙනස් වීමක් නියෝජනය කරන කතා පුවතක් හඳුනා ගත් නමුත්, සංවිධානයේ ඊළඟ තලයේ දී එම කතා පුවත තෝරා නොගැනෙන විට ද මෙම හැඟීම මතු වී ආ හැකි ය. ඕස්ට්‍රේලියාවේ එක් උදාහරණයක දී මෙය සිදු වූ අතර, ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ ප්‍රමුඛතාවන් අතර පවතින සබඳතාව සැලකිල්ලට ගත් සාකච්ඡා මතු වී ඒමට එය හේතු විය.

### *සෘණාත්මක වෙනස් වීම් ගැන කියන්නේ කුමක් ද? මේවා ගැන තැකීමක් කෙරෙන්නේ නැහැ!*

ශිල්ප ක්‍රමයේ යොදා ගැනීම් බොහොමයක් සම්බන්ධයෙන් මෙම ප්‍රකාශය වලංගු වේ. දෙවන පරිච්ඡේදයේ දෙවන පියවරේ දී, බලපෑම් ක්ෂේත්‍ර යොදා ගනිමින් මෙම උත්සුකතාවට ප්‍රතිචාර දැක්විය හැකි විවිධ ක්‍රම සමහරක් අපි දළ වශයෙන් විස්තර කරන්නෙමු.

## අනෙකුන් වෙතින් ප්‍රකාශයට පත් වන උත්සුකතා

**නිකරගුවාව - කාල පරිච්ඡේදයක් තිස්සේ සිදු වූ වැදගත් වෙනස් වීම්**

"ක්‍රියාකාරකම්වල නියැළී සිටි සහභාගිකයන්ට, කාල පරිච්ඡේදයක් තිස්සේ සිදු වූ නොපැහැදිලි හෝ සාමාන්‍ය වෙනස් වීම් හඳුනා ගත හැකි විය. එහෙත්, විශාල විධිමත් සිදුවීමක දී හැර, වෙනස් වීම සිදු වන මොහොත ක්ෂණිකව නිශ්චිතව පවසන්නට ඔවුන්ට නොහැකි විය (Grupo Consultivo, 2003 ඔක්තෝබර්, නිකරගුවාව). සාමාන්‍ය තත්ත්වයක් හෝ සාමාන්‍ය වෙනස් වීමක් ඉදිරිපත් කිරීම, පහත දැක්වෙන දෑ ගැන පුද්ගලයාගෙන් විමසා බලන්නට උදව් වන බව මම තේරුම් ගතිමි: එනම්, එතැන වෙනස් වීමක් සිදු වී පැවති බව ඔවුන් අවබෝධ කර ගත් පළමු වතාව ගැන, එවිට ඔවුන් සිටියේ කොහේ ද, ඔවුන් කරමින් සිටියේ කුමක් ද, දිනය කවදා ද යන්න ගැන විමසා බලන්නට එය උදව් වන බව මම තේරුම් ගතිමි" *(ගිලියන් හොල්මස්, අයිබිස්, 2004).*

### *කතා පුවත් සම්බන්ධයෙන් තමන් කළ තෝරා ගැනීම් ගැන සහභාගිකයන් කරන පැහැදිලි කිරීම් පිළිබඳව තැකීමක් කෙරෙන්නේ නැහැ*

අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ තේරීම් ක්‍රියා දාමයන්හි දී අප ලද අත්දැකීම අනුව, බොහෝ සහභාගිකයන් අවධානය යොමු කරන්නේ අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවතේ **විස්තර කිරීම** වෙත යි. තමන් අදාළ අර්ථාන්විත වෙනස් වීම පිළිබඳව වූ එම විශේෂිත කතා පුවත තෝරා ගත්තේ ඇයි ද යන්න ගැන රචකයා විසින් කරනු ලබන **පැහැදිලි කිරීම** විමසා බලනු ලබන්නේ උඩින්මත්තෙන් පමණකි (නැත් නම්, සමහර උදාහරණවල දී ඒවා නො තකා හැරේ). තේරීම් තල ගණනාවක් තුළින් කතා පුවත ඉදිරියට යන විට, එම කතා පුවතට ම පසුව ඇඳෙන, තේරීම් පිළිබඳ අනෙකුත් පැහැදිලි කිරීම් සම්බන්ධයෙන් ද බොහෝ විට සිදු වන්නේ මෙය ම යි.

කාරණා දෙකක් නිසා මෙය කනස්සල්ලට හේතු වේ. පළමුව, ඉන් දෙවන ගණයේ ඉගෙනීමකට ලැබෙන සුවිශේෂ අවස්ථාවක් පැහැර හැරෙයි (බේට්සන්, 1979): එනම්, මෙම අවස්ථාව, අරමුණක් වඩා හොඳින් මුදුන් පමුණුවා ගන්නේ කෙසේ ද යන්න ගැන ඉගෙනීමට ලැබෙන අවස්ථාවක් නො වේ. ලුහුබැඳ යන අරමුණු ප්‍රශ්නයට ලක් කරන්නට සහ සීරුමාරු කරන්නට ලැබෙන අවස්ථාවකි. තේරීම් ක්‍රියා දාමයේ දී, ඉදිරිපත් වී ඇති අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් සහ ඒවා තෝරා ගැනීමට බලපෑ හේතු ගැන කරනු ලබන සජීවී සාකච්ඡා අතරතුර දී, මෙම ප්‍රශ්න කිරීම සහභාගිකයන්ගෙන් බොහෝ විට සිදු වේ. එහෙත් බොහෝ අවස්ථාවල දී, ඒවා මැනවින් ප්‍රලේඛනය වීමක් සිදු නො වේ. ඇඳන ලද පැහැදිලි කිරීම් නො තකා හැරීම, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් රචනා කළවුන්

විවාදයෙන් ඉවත් කිරීමක් සහ ඔවුන් සතුව කිසි ම වැදගත් අදහසක් නො වී යැයි පිළිගැනීමක් හා සමාන ය.

උත්සුක විය යුතු දෙවන කාරණාව මෙය යි: එනම්, අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ විස්තර කිරීම කෙරෙහි යොමු කරන අවධානය මගින්, **සිදු වූයේ කුමක් ද** යන්න ගැන අවධානය යොමු කිරීමක් ඇඟවේ ය යන්න යි. එනම්, සිදු වූයේ කුමක් දැයි **දැන සිටියේ කවුරුන් ද** යන්න සහ සිදු වූ දේ ගැන **ඔවුන් සිතුවේ කුමක් ද** යන්න සොයා යාමට සීමා නො වී, ඉන් ඔබ්බට අවධානය යොමු වීමක් සිදු වන්නේ ය යන්න යි. විමධ්‍යගත තීරණ ගැනීමේ බලයක් සහිත සංවිධානයක දී, ප්‍රාදේශීය ක්‍රියාකාරකයන්ට වැඩි ස්වාධීනත්වයක් තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, සිදු වූයේ කුමක් ද යන්න පිළිබඳව ඔවුන් සතු අවබෝධයට සහ ආකල්පවලට ප්‍රධාන වැදගත්කමක් හිමි වේ. සාර්ථකත්වයන් ස්ථාවර වීමට සහ ප්‍රතිගුණනය වීමට ද, අසාර්ථකත්වයන් සම්බන්ධයෙන් ඔවුන් වෙත දෝෂාරෝපණ එල්ල වීමට ද එය බලපෑ හැකි ය.

එම නිසා, මෙම පැහැදිලි කිරීම්වලට සැබවින් ම **විශේෂ අවධානයක්** යොමු කළ යුතු යැයි අපි තර්ක කරමු. වැදගත් වෙනස් වීමක් හඳුනා ගත් නමුත් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය විසින් එය අර්ථදැක්වෙන්නේ වැරදි ලෙස නම්, ඉන් සංවිධානයට වඩා බලගතු ප්‍රතිවිපාක අත් විය හැකි ය. විශාල පරිමාණයේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා, අධිකාර බලය සැලකිය යුතු මට්ටමකින් විමධ්‍යගත කිරීමක් සහ පවරා දීමක් අවශ්‍ය වේ. මෙහි දී, පවරා දුන් බලය හිමි කර ගත්තවුන් කරන විනිශ්චයන්හි ගුණාත්මක භාවය නිරීක්ෂණය කිරීම වැදගත් වේ. උපකොන්ත්‍රාත්තු යටතේ වෙනත් සංවිධාන සමග ඇති කර ගත් හවුල්කාරිත්වයන් තුළින් ක්‍රියාත්මක වන වැඩ සටහන් සම්බන්ධයෙන් ද, මීට සමාන උත්සුකතා අදාළ වේ. සහභාගිකයන්ගේ අදහස් අපගේ අදහස් සමග කොතරම් මැනවින් පෙළ ගැසී තිබෙන්නේ ද යන්න අපට කියනු ලබන්නේ, ඔවුන් කරන **පැහැදිලි කිරීම්** මගිනි. අදහස් මැනවින් එකට පෙළ ගැසී නැත් නම්, ඒකාබද්ධව ඇති කර ගත් අරමුණු සපුරා ගන්නේ නැතිව හවුල්කාරිත්වය ඇද වැටිය හැකි ය. එසේ නැත් නම්, මුළුමනින් ම අසාර්ථක විය හැකි ය.

මෙම ගැටලුවට පහසු විසඳුමක් නැත. සංවිධානයකට වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය හඳුන්වා දෙන ජනයා, මෙම ස්වභාවයේ ගැටලු මතු වී ඒමට ඉඩකඩ පවතින බව ඉස්මතු කර දැක්වීම සඳහා යොදා ගත හැකි වඩා මුල් ම අවස්ථාව ඩැහැ ගත යුතු ය. එමෙන් ම, ක්‍රියාත්මක වන අතරතුර දී එවන් අවස්ථාවන් ගැන සෝදිසියෙන් සිටිය යුතු ය. නායකත්වය ආදර්ශනය කිරීම ද වැදගත් ය. විශේෂයෙන් ම, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ ක්‍රියා දාමය තුළ සහභාගි වන කාර්ය මණ්ඩලය තුළ සිටින ජ්‍යෙෂ්ඨතමයා සම්බන්ධ වීම වැදගත් ය.

## *ප්‍රතිපෝෂණය අමතක කෙරෙනවා*

බොහෝ නිරීක්ෂණ සහ ඇගයීම් පද්ධති තුළ දී, විශ්ලේෂණය සහ නිර්දේශ පිළිබඳ ප්‍රතිපෝෂණ සැපයීම යනු දෙවනුව සිතට එන අදහසකි. නැත් නම් මුළුමනින් ම නො තකා හැරෙන්නකි. මෙම තත්ත්වයෙන් පිළිබිඹු වන්නේ, නිරීක්ෂණ සහ ඇගයීම් දත්ත සපයනු ලබන සහ යොදා ගනු ලබන ජනයා අතර බලය අතින් පවතින වෙනස්කම් ය. දත්ත සපයන ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට, තමන්ගේ උසස් නිලධාරීන් එම දත්ත අර්ථදක්වන සහ ඒවාට ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳ, තොරතුරු ඉල්ලා සිටීමේ හැකියාවක් නැති වන්නට පිළිවන. මෙය, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමය තුළ පවතින, සමීපව සෝදිසි කර බැලිය යුතු පැතිකඩක් වේ.

දෙවන පරිච්ඡේදයේ හය වන පියවරේ දී අපි, හොඳ ගුණාත්මක බවකින් යුතු ප්‍රතිපෝෂණයක පවත්නා ආවේණික ලක්ෂණ විස්තර කරන්නෙමු: ඒවා නම්, කර ඇති තෝරා ගැනීම් පිළිබඳ නිශ්චිත පැහැදිලි කිරීම් සහ විනිවිද පෙනෙන තේරීම් ක්‍රියා දාමය යි.

විකල්පයක් ලෙස ක්‍රියාවට නැංවිය හැකි පසු නිරීක්ෂණ අදියරට (දෙවන පරිච්ඡේදයේ නව වන පියවර බලන්න), සහභාගිකයන් ප්‍රතිපෝෂණය ලැබුණු බව වාර්තා කළ වාර ගණන, සහ එම ප්‍රතිපෝෂණයේ ගුණාත්මක භාවය ගැන ඔවුන් සිතුවේ කුමක් ද යන්න පරීක්ෂා කර බැලීම ඇතුළත් කළ හැකි ය.

ප්‍රතිපෝෂණ යන්ත්‍රණයන්හි සිදු කළ හැකි නවීකරණයන් ගැන වැඩි දුර පර්යේෂණය කිරීම සඳහා පවතින සමහර ඉඩප්‍රස්තාවන් පිළිබඳව, නව වන පරිච්ඡේදයේ දී විස්තර වේ.

## *ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටලු ගැන කියන්නේ කුමක් ද?*

සීසීඩීබීය ශිල්ප ක්‍රමය යොදා ගත් ආකාරය ගැන රික් පළමුවෙන් ලියූ තැන් පටන්, ශිල්ප ක්‍රමය ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටලු සැලකිල්ලට ගන්නේ කෙසේ ද යන්න ගැන ප්‍රශ්න මතු වී තිබේ. සීසීඩීබීය සඳහා සැකසූ වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ ක්‍රියා දාමයේ සැලසුම තුළ, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටලු ගැන කුමන හෝ විශේෂ අවධානයක් යොමු කිරීම යෝජනා කළ හෝ ඒ ගැන උත්සුකතාවක් පළ කළ කිසිවක් නො වී ය. නිදසුනක් ලෙස, ස්ත්‍රී-පුරුෂ සමානතාවට සම්බන්ධිතව සිදු වන වෙනස් වීම්වලට අදාළ එක ද බලපෑම් ක්ෂේත්‍රයක් වත් නො වී ය. මෙම තත්ත්වය පවතිද්දී ම, සීසීඩීබීයේ ආධාර දෙන්නන් සමග 1994 අග භාගයේ දී පැවැත්වූ වාර්ෂික වටමේස රැස්වීමට රැගෙන ආ කතා පුවත්වල, වඩාත් ම ක්‍රියාශීලීව විවාදයට බඳුන් කළ පැතිකඩ වූයේ, සාර්ථක කුඩා ව්‍යවසාය සංවර්ධන වැඩ සටහනක් පිළිබඳ කතා පුවතක සිටි පුරුෂයෙකු සහ ඔහුගේ බිරිඳ අතර පැවති සබඳතාවේ ස්වභාවය යි. වැඩියෙන් ම දායක වූයේ කවුරුන් ද, වැඩියෙන් ම ප්‍රතිලාභ ලැබුවේ කවුරුන් ද? ඩෙන්මාර්කයේ එම්එස් සංවිධානය, ටැන්සානියාව තුළ දී ශිල්ප ක්‍රමය යොදා ගන්නා අතරතුර සිදු වූ මීට සමාන වර්ධනයක්, පීටර් සිස්ගාර්ඩ් (පහත) උපුටා දක්වයි.

> **මොසැම්බික් රාජ්‍යය**
> "... තමන්ගේ ප්‍රකාශකයා (එනම්, මුදල්) තෘප්තිමත් කළ හැකි, ආදායම් උත්පාදනය පිළිබඳ අරමුණු ආදර්ශනය කළ හැකි ක්‍රියා පිළිවෙත් පිළිබඳව, සමාලෝචන කණ්ඩායම පැහැදිලිව ම සොයා බලමින් සිටියේ ය. (තමන්ට ලබා දුන් අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවත ඔස්සේ සිතා බලමින්) කණ්ඩායම ඇති කර ගත් වැටහීම වූයේ, මෙම අරමුණ නිෂ්පාදන කණ්ඩායමට එතරම් වැදගත් නැත යන්න යි. එහෙත්, ස්ත්‍රී-පුරුෂ සමානතාව පිළිබඳ ගැටලුව කෙරෙහි අවධානය යොමු වී තිබුණි. සංවර්ධන මැදිහත් වීමක් මගින් ඊට පහසුකම් සැපයී තිබුණි" *(පීටර් සිස්ගාර්ඩ්, 2002:9).*

ශිල්ප ක්‍රමය යොදා ගෙන වැඩ සටහන්වල වර්ධනයන් පිළිබඳව සිදු කරන සමස්ත නිරීක්ෂණය තුළ දී, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටලු ප්‍රධාන ප්‍රවාහයට එක් කළ හැකි ආකාරය මෙම උදාහරණවලින් පෙන්නුම් කෙරේ. බලපෑම් ක්ෂේත්‍ර හෝ දර්ශක යොදා ගෙන, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටලු විශේෂ අවධානයකට ලක් කරන්නට යාමේ අවශ්‍යතාවක් නැත. කෙසේ වුව ද, ශිල්ප ක්‍රමය යොදා ගන්නා විට දී, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටලු **ස්වයංක්‍රියව** ප්‍රලේඛනය වේ යැයි හෝ ප්‍රලේඛනය කෙරෙන විට **ස්වයංක්‍රියව** හඳුනා ගනු ලැබේ යැයි උපකල්පනය කළ නොහැකි ය. සහභාගිකයන් තුළ පවත්නා වටිනාකම් ද තේරීම් ක්‍රියා දාමයන් තුළින් එන ප්‍රතිපෝෂණ ද මත මෙය රඳා පවතී.

අත්හදා බලා ඇති වඩාත් ම මැදිහත්කරණවාදී විකල්පයක් වන්නේ, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීමේ ක්‍රියා දාමය තුළ දී පුරුෂ සහ ස්ත්‍රී කණ්ඩායම් වෙන වෙන ම යොදා ගැනීම යි. එවිට, පුරුෂයන්ගේ සහ ස්ත්‍රීන්ගේ තේරීම්වල සහ ඔවුන් සතු වටිනාකම්වල වෙනස්කම් (සහ එකඟ වන ක්ෂේත්‍ර) ද පැහැදිලිව දැක ගත හැකි වනු ඇත. තමන් සහාය දෙන ප්‍රජාවන් තුළ හෝ අන් තැනක පවතින ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටලු ගැන සුවිශේෂව විමසා බලන බලපෑම් ක්ෂේත්‍ර සකසා ගැනීම ද කළ හැකි ය.

පසු නිරීක්ෂණය සහ අන්තර්ගතය විශ්ලේෂණය කිරීම පිළිබඳ තලයේ දී, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටලු කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු කළ හැකි තැනක් පවතින්නේ යැයි අපි විශ්වාස කරමු. ස්ත්‍රී-පුරුෂ සහභාගිකයන් මුසු කිරීම ගැන ද, තේරීම් ක්‍රියා දාමය තුළ දී ඔවුන්ට විෂය වූ කතා පුවත් සැලකිල්ලට ගන්නේ කෙසේ ද යන්න ගැන ද අවධානය යොමු කළ යුතු අදියර එය යි. ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳව ඉස්මතු වන ගැටලුවල විවිධ ස්වරූප කේතගත කිරීමත්, තේරීම් ක්‍රියා දාමයන්හි දී මෙම ගැටලු සැලකිල්ලට ගනු ලබන ආකාරයත්, කතා පුවත්වල අන්තර්ගතය පිළිබඳව කෙරෙන විශ්ලේෂණයට ඇතුළත් කළ හැකි ය. ඒවා නො තකා හැරුණා ද, නැත් නම්, ඒවා ගැන සිත යොමු කළා ද? නිර්දේශ සකස් කළා ද, එසේ නම්, ඒ නිර්දේශ සුදුසු වූයේ ද? මෙම විශ්ලේෂණය සහභාගිකයන් වෙත ප්‍රතිපෝෂණය කළ යුතු ය. එමගින් ඔවුන්, ඔවුන් ලබා දිය යුතු ඊළඟ දායකත්වයන් ගැන දැනුවත් කළ හැකි වේ.

## *දුර්වල අයුරින් රචිත කතා පුවත්*

පරීක්ෂාවට සහ සසඳා බැලීමට ලක් කරනු ලබන අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වල, ගුණාත්මක භාවය අතින් පවතින වෙනස්කම් ගැන, තේරීම් ක්‍රියා දාමයන් තුළ සිටින සහභාගිකයන් උත්සුක වීම දුර්ලභ දෙයක් නො වේ. ඇතැම් ඒවා අනෙක්වාට වඩා හොඳින් රචනා කොට තිබේ. ඇතැම් ඒවා අනෙක්වාට වඩා සිත් ඇද ගනී. මෙවැනි සැලකිය යුතු වෙනස්කම් පවතින්නේ නම්, ඒවා විවෘතව පිළිගැනීම වැදගත් වේ. අනතුරුව, මෙම වෙනස්කම් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කෙසේ ද යන්න ගැන කණ්ඩායමට තීරණයක් ගත හැකි ය. අපගේ අත්දැකීම අනුව, අර්ථාන්විත වෙනස් වීමක් පිළිබඳ කතා පුවතක් ප්‍රතික්ෂේප කිරීම හෝ තෝරා ගැනීම කෙරෙහි බලපාන ප්‍රධාන හේතුව බවට, කතා පුවතේ ගුණාත්මක භාවය පත් වන්නේ කලාතුරකිනි. ගුණාත්මක භාවය ප්‍රධාන හේතුව බවට පත් වන්නේ, අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවත මුළුමනින් ම වාගේ තොරතුරු හිඟකමින් පෙළෙන නිසා, එය තව දුර ගෙන යාමට යොදා ගත හැකි යමක් ඒ තුළ නැති වුව හොත් ය. එහෙත් සහභාගිකයන් නැඹුරු වන්නේ, කතා පුවතේ අන්තර්ගතයේ පෙනෙන වැදගත්කම කියා පා, කතා පුවතේ ගුණාත්මක භාවය පිළිබඳ තමන්ගේ විනිශ්චය පොහොසත් කරන්නට යි. මෙලෙසින්, වැදගත් වර්ධනයන් පිළිබඳව දුර්වල අයුරින් රචිත කතා පුවතක් තේරෙන්නට ඉඩ තිබේ. එහෙත්, ඉතා දුක්මුසු අයුරින් රචිත කතා පුවතක් නොතේරෙන්නට ඉඩ තිබේ.

මෙහි ලා පවතින එක් විකල්පයක් වන්නේ, කේන්ද්‍රීය උත්සුකතාවක් උසුලන වෙනස් වීම් වඩා හොඳින් ඉදිරිපත් වන අයුරින් කතා පුවත යළි රචනා කරන ලෙස, එය ප්‍රලේඛනය කළ පුද්ගලයාගෙන් ඉල්ලා සිටීම යි. යම් වැදගත් සිදුවීමක් පිළිබඳ සාක්ෂ්‍ය පවතින මුත් ප්‍රමාණවත් තොරතුරු නොමැති තැන්වල දී, මෙය සිදු කර තිබේ. කෙසේ වෙතත්, මෙහි දී පරෙස්සම් සහගත විය යුතු ය. යළි රචනා කිරීම, සැබවින් ම ඒ කතාව කාගේ ද යන ව්‍යාකුලත්වය ඇති වන්නට පහසුවෙන් ම තුඩු දිය හැකි ය.

# හතර වන පරිච්ඡේදය: ක්‍රියා දාමය ඵලදායී තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය වන හැකියාවන් ගොඩ නැගීම

මෙම පරිච්ඡේදයේ දී, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධානයකට අවශ්‍ය විය හැකි සම්පත් කවරේ ද යන්න විමසා බැලේ.

අපි පහත දැක්වෙන ක්‍රමෝපායන් ගැන සැලකිලිමත් වෙමු:

- නායකයන්ගේ හැකියාවන් ගොඩ නැගීම
- කාර්ය මණ්ඩලයේ හැකියාවන් ගොඩ නැගීම
- පිරිවැය සහ කාලය පිළිබඳව බැරෑරුම්ව සිතා බැලීම.

## වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමයේ 'නායකයන්ගේ' හැකියාවන් ගොඩ නැගීම

සංවිධානයක් තුළ, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමයට ක්‍රියාශීලීව නායකත්වය දිය හැකි හෝ එය ප්‍රවර්ධනය කළ හැකි ජනයා සිටීමෙන් අත් වන ප්‍රතිලාභ ගැන, දෙවන පරිච්ඡේදයේ පළමු වන පියවරේ දී (පටන් ගන්නා සහ ඕනෑකම මතු කර ගන්නා ආකාරය) අපි සාකච්ඡා කළෙමු. මෙම නායකයන්ට පහත දැක්වෙන දෑ කළ හැකි ය:

- ආරම්භයේ දී මහජනයා උනන්දු කිරීම සහ පෙළඹවීම
- ශිල්ප ක්‍රමය ගැන අසන ප්‍රශ්නවලට පිළිතුරු දීම
- අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීම සඳහා පහසුකම් සැපයීම
- කතා පුවත් රැස් කිරීමට ජනයා දිරි ගැන්වීම
- ප්‍රතිපෝෂණ සිදු වන බව තහවුරු කිරීම
- කතා පුවත් රැස් කෙරෙන බව, ඒවා සංවිධානය කෙරෙන බව සහ සමාලෝචන රැස්වීම් වෙත යැවෙන බව සහතික කිරීම
- අවශ්‍ය තැන්වල දී තොරතුරු සපයන්නන්ගේ රහස්‍ය භාවය සහතික කිරීම සඳහා වූ විධිමත් ප්‍රකාශ නිකුත් කිරීම
- දෙවන විශ්ලේෂණය මෙහෙයවීම.

ගුණාත්මක විධික්‍රම සහ සහභාගී ශිල්ප ක්‍රම පිළිබඳව නායකයන්ට දැනට මත් යම් අවබෝධයක් පවතී නම් එය උදව්වක් විය හැකි ය. එහෙත්, අපගේ අත්දැකීමෙන් හැඟෙන පරිදි, නායකයන් සතු විය යුතු වඩාත් ම වැදගත් ගුණය වන්නේ ශිල්ප ක්‍රමය සම්බන්ධයෙන් උද්‍යෝගයක් සහ ඕනෑකමක් පැවතීම යි. පහසුකම් සැපයීම පිළිබඳ මනා නිපුණතා පැවතීම ද ප්‍රයෝජනවත් වේ.

නායකයන් ශිල්ප ක්‍රමය පිළිබඳව පරිපූර්ණ අවබෝධයක් වර්ධනය කර ගැනීම අවශ්‍ය ය. එවිට, නො වැළැක්විය හැකි ලෙස මතු වන ප්‍රශ්න ආමන්ත්‍රණය කරන්නට ඔවුන්ට හැකියාව

ලැබේ. මෙම අවබෝධය විවිධ ක්‍රමවලින් අත් කර ගත හැකි ය. අඩු මිලක් වැය වන පිවිසුමක් වන්නේ, ශිල්ප ක්‍රමය සම්බන්ධයෙන් පවත්නා (මෙම අත්පොත වැනි) ලිපිලේඛන කියවීම සහ සුලු පරිමාණයෙන් ශිල්ප ක්‍රමය අත්හදා බැලීම යි. දැන් ශිල්ප ක්‍රමය යොදා ගන්නා සංවිධානවලින් බොහොමයක් පටන් ගත්තේ මෙම ක්‍රමයට යි. ශිල්ප ක්‍රමය සම්බන්ධයෙන් යම් ආකාරයක මූලික පුහුණුවක් ලබා ගැනීමෙන් මෙම ඉගෙනීම වේගවත් කළ හැකි ය. රික් සහ ජෙස් දැන්, ශිල්ප ක්‍රමය සඳහා 'පුහුණුකරුවන් පුහුණු කිරීමේ' පාඨමාලාවක් සැලසුම් කරමින් සිටිති (දින සහ ස්ථාන දැන ගැනීමට, http://groups.yahoo.com/group/MostSignificantChange/ යන ලිපිනයැති වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ වෙබ් අඩවිය බලන්න).

තවත් විකල්පයක් නම්, සංවිධානයට ශිල්ප ක්‍රමය හඳුන්වා දීම සඳහා වැඩ සටහන් කාර්යාලය වෙත උපදේශකයෙකු යවා, නායකයන් සමග වැඩ කිරීමට සැලැස්වීම සහ තමන්ගේ දැනුම් ගබඩාව ගොඩ නගා ගන්නට නායකයන්ට උදව් වීම යි. ශිල්ප ක්‍රමය යොදා ගැනීම සම්බන්ධයෙන් වැඩි අත්දැකීමක් සහිත වෙනත් සංවිධානවලට කාර්ය මණ්ඩලය තාවකාලිකව අනුයුක්ත කිරීම, වෙනත් විකල්පයන් අතරට ඇතුළත් වේ.

යම් සංවිධානයක් තුළ, ක්‍රියා දාමයේ නායකත්වය එක් පුද්ගලයෙකු විසින් භාර ගෙන තිබේ නම්, දෙවන හෝ තුන් වන පුද්ගලයෙකුගේ ද ශිල්ප ක්‍රමය සම්බන්ධ හැකියාවන් ගොඩ නැගිය යුතු යැයි අපි බලගතු ලෙස නිර්දේශ කරමු. නායකයෙකු වෙනත් රැකියාවක් කරා මාරු වූ විට ශිල්ප ක්‍රමයේ ක්‍රියාත්මක වීම නිෂ්ඵල තත්ත්වයට පත් වූ අවස්ථා කීපයක් අපි දනිමු.

# ක්‍රියා දාමය තුළ පූර්ණ වශයෙන් සහභාගි විය හැකි වන පරිදි කාර්ය මණ්ඩලයේ හැකියාවන් ගොඩ නැගීම

ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ශිල්ප ක්‍රමය අවබෝධ කර ගැනීමට පොළඹවා ලීම නිරන්තර දුෂ්කරතාවන් ඇති කරන්නකි. සාපේක්ෂ වශයෙන් ගත් විට, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය භාවිතයට ගැනීම පහසු ය. බොහෝ ජනයා සලකන්නේ, එය නිරීක්ෂණය සහ ඇගයීම උදෙසා පවතින මුළුමනින් ම වෙනස් ක්‍රමයක් බව යි. සරලතම දේවල් පිළිබඳ අදහස් හුවමාරුව අභියෝගයක් බවට පත් විය හැකි, සංස්කෘතීන් මිශ්‍ර වූ සහ ද්විභාෂීය තත්ත්වයන් තුළ දී, එය බොහෝ විට ක්‍රියාත්මක කෙරේ. මෙම බාධාව ජය ගනු පිණිස, ඔබේ වැඩ සටහනට අදාළ තත්ත්වය තුළ දී ශිල්ප ක්‍රමය හොඳින් ම සන්නිවේදනය කළ හැකි වනු ඇත්තේ කෙසේ ද, සහභාගි වීම සඳහා ප්‍රමාණවත් දැනුමක් සහ නිපුණතාවන් අත් කර ගැනීමට සහභාගිකයන්ට හැකි වනු ඇත්තේ කෙසේ ද යන්න ගැන යම් තරමකට සිතා බලන්න. ශිල්ප ක්‍රමයේ කාර්ය භාරය විස්තර කරන්නට උදව් විය හැකි උපමා කතා කීපයක් දෙවන පරිච්ඡේදයේ පළමු වන පියවරෙහි ලැයිස්තුගත කොට ඇත.

ශිල්ප ක්‍රමය සම්බන්ධයෙන් වැඩ සටහන් කණ්ඩායම්වල හැකියාවන් ගොඩ නැගීමට යොදා ගත හැකි ප්‍රධාන විකල්ප දෙකක් පවතීඃ එකක් නම්, පුහුණුව තුළින් එය ඉටු කර ගැනීම යි. අනෙක නම්, උපදේශනය සහ භාවිතය තුළින් එය ඉටු කර ගැනීම යි. බොහෝ උදාහරණවල දී, සංවිධානය පුරා ශිල්ප ක්‍රමය පතුරවා හැරීමේ ක්‍රියාකාරී කාර්ය භාරය එක් පුද්ගලයෙකු විසින් භාර ගනු ලැබ තිබේ. එම පුද්ගලයා වැඩ සටහන් කාර්ය මණ්ඩලය පුහුණු කිරීම, මීට ඇතුළත් වන්නට හෝ නොවන්නට පිළිවන.

### *ශිල්ප ක්‍රමය සම්බන්ධයෙන් ජනයා පුහුණු කළ යුතු ආකාරය*

අපගේ අත්දැකීම අනුව පුහුණුවට සාමාන්‍යයෙන් අඩංගු වන්නේ, පිටස්තර උපදේශකයෙකු විසින් හෝ නිරීක්ෂණය සහ ඇගයීම පිළිබඳ අභ්‍යන්තර විශේෂඥයෙකු විසින් මෙහෙයවනු ලබන, දිනක සිට දින තුනක් දක්වා වූ නේවාසික පුහුණුවකි. ශිල්ප ක්‍රමය සම්බන්ධයෙන් ජනයා පුහුණු කළ යුතු ආකාරය පිළිබඳ සරල වට්ටෝරුවක් නොමැති නමුත්, ඔබට යම් උපදෙස් පිළිගන්වන්නට අපට පුළුවන්කම තිබේ.

1. බොහෝ දෙනා සහභාගි වන අභ්‍යාස යොදා ගන්න. පුහුණු සැසියේ මුල හරියේ දී, භූමිකා නිරූපණ අභ්‍යාසයකට සහභාගි වන ලෙස ජෙස් නිතර ම කණ්ඩායම්වලට ආරාධනා කරයි. එහි දී ඔවුහු, වෙනස් වැඩ සටහන් තත්ත්වයකින් ගත් කතා පුවත්

මුල සිට අගට කියවා, වඩාත් ම අර්ථාන්විත යැයි ඔවුන් සිතන ඒවා තෝරති. ක්‍රියා දාමය වෙනස් තත්ත්වයක දී යොදා ගත් ආකාරය දකින විට, බොහෝ ජනයා එය පහසුවෙන් අවබෝධ කර ගනිති. එසේ නොවුණ හොත්, ජනයා කතා පුවත්වල අන්තර්ගතය වෙත වැඩි අවධානයක් යොමු කරන්නට නැඹුරු වෙති. ජනයාට ම කතා පුවත් තේරීම සඳහා ඉඩ ලබා දීම ශිල්ප ක්‍රමය පිළිබඳ හැඟීමක් ඇති කර ගන්නට ඔවුන්ට උදව් වේ.

2. පුහුණු සැසියේ දී, තමන්ගේ ම කතා පුවත් ප්‍රලේඛනය කරන ලෙස සහභාගිකයන්ගෙන් ඉල්ලා සිටින්න. එලදායී පුහුණු ශිල්ප ක්‍රමයක් වන්නේ, සහභාගිකයන් යුගල වශයෙන් තබා, තමන්ගේ වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවත් අනාවරණය කර ගැනීම සඳහා එකිනෙකා සම්මුඛ සාකච්ඡාවන්ට ලක් කර ගැනීමට ඔවුන් දිරි ගැන්වීම යි. 'ප්‍රතිලාභීන්ගේ ජීවිත තුළ සිදු වූ වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම' වැනි, සැම දෙනාට ම අදාළ වන මාතෘකාවක් තෝරා ගන්න.

3. සහභාගිකයන්ට වෙනස්කම් අවබෝධ කර ගැනීමට උදව් වීම සඳහා, සිද්ධි අධ්‍යයන සහ සම්මත නිරීක්ෂණ පද්ධති වැනි වෙනත් ශිල්ප ක්‍රම සමග, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය සන්සන්දනය කරන්න.

4. ව්‍යාපෘතියේ හෝ සංවිධානයේ නිරීක්ෂණ සහ ඇගයීම් සැකැස්මට ශිල්ප ක්‍රමය ගැළපෙන සැටි පහදා දෙන්න. එය තනිව යොදා ගත හැකි ශිල්ප ක්‍රමයක් නොවන බවත්, ආධාර දෙන්නන්ට පවතින වගකීම් සහගත භාවය සමග බැඳී පවත්නා සියලු අවශ්‍යතාවන් සපුරන්නට ඊට නොහැකි විය හැකි බවත් පහදා දෙන්න.

5. ප්‍රශ්න කිරීම සඳහාත් සාකච්ඡාව සඳහාත් බොහෝ අවස්ථා පිරිනමන්න. ශිල්ප ක්‍රමය උකහා ගැනීම සඳහා, ජනයාට බොහෝ විට කාලය අවශ්‍ය ය.

6. හැකි නම්, සහභාගිකයන් තේරුම් ගන්නා ආකාරය කෙරෙහි අවධානය යොමු කළ හැකි පහසුකම් සපයන්නෙකු යොදා ගනිමින් පුහුණුව සිදු කරන්න.

7. මූලික පුහුණුව පවත්වා අවසන් කිරීමෙන් අනතුරුව, මුල් කතා පුවත් රැස් කර ගැනීමෙන් සහ තෝරා ගැනීමෙන් පසුව, සංස්කරණ සැසියක් පැවැත්වීම උදව්වක් වන්නට ඉඩ තිබේ. මෙයට ඇතැම් විට පැය කීපයක් ගත විය හැකි ය.

**ලාඕසය - පුහුණුව අත්‍යවශ්‍ය යි**
"ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ සම්මුඛ සාකච්ඡාමය නිපුණතාවන් වර්ධනය කිරීම, ශිල්ප ක්‍රමය යොදා ගැනීමේ අරමුණුවල කොටසක් නො වී ය. එහෙත්, එය අංග සම්පූර්ණ ක්‍රියා දාමයක් සඳහා පූර්ව අවශ්‍යතාවක් වන අතර, මෙය වැඩි දුර අවධානය යොමු කළ යුතු පැතිකඩක් වේ" *(ජූලියට් විලට්ස්, ඒඩීආර්ඒ සංවිධානය විසින් යොදා ගන්නා වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය පිළිබඳ පිටස්තර ඇගයීම, 2002).*

## *භාවිතය තුළින් වැඩි දියුණු කිරීම*

පුහුණුව විකල්පයක් නොවන්නේ නම්, අත්හදා බලමින් සහ වරද්දමින් ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කිරීම කළ හැකි ය. නිදසුනක් ලෙස, කතා පුවත් ප්‍රලේඛනය කොට, උදාහරණ ද සමග, එනම් තෝරා ගත් කතා පුවත් ද සමග, තමන් එය සිදු කළ ආකාරය පිළිබඳ ප්‍රතිපෝෂණයක් ද සහිතව සපයන ලෙස, කාර්ය මණ්ඩලයෙන් ඉල්ලා සිටීම ගත හැකි ය. මෙමගින්, පෙරට යා යුතු ආකාරය පිළිබඳව ඔවුන්ට හොඳ අදහසක් ලබා දෙනු ඇත. ශිල්ප ක්‍රමය සතුව ඇතුළතින් ගොඩ නැගෙන වැඩි දියුණු වීමේ චක්‍රයක් පවතින නිසා, පුහුණුවකින් තොරව ඊට ක්‍රියා කළ හැකි ය. කෙසේ වුව ද, පූර්ණ නැඹුරු කිරීමකින් තොරව ශිල්ප ක්‍රමය තුළට ඇද දැමූ විට වැඩ සටහන් කාර්ය මණ්ඩලයට ඇතැම් විට දැනෙන ව්‍යාකුල භාවයෙන් සහ අපේක්ෂා භංගයෙන් බොහොමයක් මග හරවන්නට, මූලික පුහුණුවට හැකියාව තිබේ.

ඔබ පුහුණුව වෙනුවට භාවිතය තුළින් වැඩි දියුණු කිරීමේ මග තෝරා ගන්නේ නම්, ප්‍රශ්නවලට පිළිතුරු දිය හැකි, මොන යම් හෝ ව්‍යාකූල භාවයක් වුව ආමන්ත්‍රණය කළ හැකි, සහ අපේක්ෂා භංගත්වය අවම කිරීම සඳහා අවශ්‍ය කරන පද්ධති සැලසුම් කළ හැකි, ශිල්ප ක්‍රමය පිළිබඳ මනා අවබෝධයක් ඇති, යම් අයෙකු සිටීම උදව්වක් වනු ඇත.

**වික්ටෝරියාව, ඕස්ට්‍රේලියාව - කාලයත් සමග කතා පුවත් ක්‍රමයෙන් වැඩි දියුණු විය**
"ශිල්ප ක්‍රමය පිළිබඳව කාර්ය මණ්ඩලයට කිසිදු පුහුණුවක් ලබා නොදෙන ලදි. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යනු කුමක් දැයි අවබෝධ කර ගත හැකි වන පරිදි, අපි කාර්ය මණ්ඩලය සඳහා කෙටි ඉදිරිපත් කිරීම් ගණනාවක් සිදු කළෙමු, නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළෙමු. නමුත්, නියමු ව්‍යාපෘතියේ දී කිසිවෙකු පුහුණු නොකෙරිණ. මුල් කතා පුවත් එතරම් හොඳ තත්ත්වයක නොපැවතුණි. බොහෝ ඒවා වැඩි වශයෙන් චරිත සහතිකවලට සමාන විය. එහෙත් කල් ගත වන විට, එය සිදු වන්නේ කුමක් සම්බන්ධයෙන් ද යන්න ගැන වඩා පැහැදිලි අදහසක් ලබා ගැනීම සඳහා, කාර්ය මණ්ඩලයට ප්‍රතිපෝෂණ උදව් විය. කතා පුවත් සියල්ලේ ම අවධානය වෙනසකට ලක් වන තෙක් කතා පුවත් ක්‍රමයෙන් වැඩි දියුණු විය" *(ජෙස් ඩාර්ට්, 2000).*

## අවශ්‍ය වන සම්පත් සහ කාලය පිළිබඳව බැරෑරුම්ව සිතා බැලීම

ශිල්ප ක්‍රමය කාලය කා දමන්නක් ය යන්න ගැන කිසිදු සැකයක් නැත. එසේ ම, කතා පුවත් රැස් කිරීමට ද කාලය අවශ්‍ය ය. වඩාත් ම අර්ථාන්විත කතා පුවත් තේරීම සඳහා නිතිපතා රැස්වීම් පැවැත්වීම ද කළ යුතු ය. ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමේ දී, වඩාත් ම නිරන්තරව ප්‍රකාශයට පත් වන උත්සුකතාව වන්නේ මෙය යි. ශිල්ප ක්‍රමය ප්‍රිය උපදවන අයුරින් පෙරට යන්නට පටන් ගත් විට, එය වඩා ඉක්මනින් ක්‍රියාත්මක වන තත්ත්වයට පත් කළ යුතු ය. බාධකවලට ඔරොත්තු දෙන අයුරින් හැඩ ගැස්විය යුතු ය. සංවිධාන විසින් වාර්තාකරණ කාල සීමාව දික් කිරීමට තීරණය කරන්නේ, බොහෝ විට වසරක් හමාරක් ගත වූවාට පසුව ය. මෙය ද, ක්‍රියා දාමය විසින් කා දැමෙන කාල ප්‍රමාණය අඩු කරන්නකි.

2004 දී, ශිල්ප ක්‍රමය ක්‍රියාවට නැංවීම සඳහා ගත් කාල ප්‍රමාණය විශ්ලේෂණය කළ ප්‍රථම සංවිධානය බවට, ලාඕසයේ ඒඩීආර්ඒ සංවිධානය පත් විය. පහත දැක්වෙන කොටුව සහ වගු දෙක, කාලාධික වීමේ අවදානම දැරූ ව්‍යාපාරයක් පිළිබඳ චිත්‍රයක් ඉදිරිපත් කරයි. කෙසේ වුව ද, අපගේ අත්දැකීම වන්නේ, ශිල්ප ක්‍රමය හැම විට ම එතරම් අධික කාලයක් නොගන්නේ ය යන්න යි. වැඩ සටහනේ ස්වභාවය සහ ක්‍රියා දාමයේ අපේක්ෂිත යොදා ගැනීම් මත, ගන්නා කාලය රඳා පවතී.

**ලාඕසය - ක්‍රියා දාමය සඳහා වැය කළ කාලය පිළිබඳ තක්සේරුව**
"ක්‍රියා දාමයේ කාල පිරිවැය මූලික වශයෙන් පැවතියේ, කාර්ය මණ්ඩලය සඳහා වූ පුහුණු ව්‍යාපාරය තුළ ය. දෙවනුව, මාසික රැස්වීම් සහ පරිවර්තන කටයුතු තුළ ය. සැබවින් ම, කතා පුවත් රැස් කිරීම යනු විශේෂයෙන් අධික කාලයක් වැය වන කටයුත්තක් නො වේ. නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ කාල පරිච්ඡේදය අතරතුර දී පරිභෝජනය කළ කාල සම්පත් ප්‍රමාණය පහත දැක්වෙන වගුවෙන් පෙන්නුම් කෙරේ. එය, වියෙන්ටියන්හි කාර්යාල කාර්ය මණ්ඩලය සහ ක්ෂේත්‍රයෙහි ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වැය කළ, මුළු පුද්ගල දින සහ පුද්ගල පැය ගණන ප්‍රලේඛනය කරයි. පහත ප්‍රලේඛනය කොට ඇති කාලයට අමතර වශයෙන් ගත් විට, ඕස්ට්‍රේලියාවේ ඒඩීආර්ඒ සංවිධානයේ කාර්ය මණ්ඩලයෙහි බොහෝ දෙනෙකු, පැයක තේරීම් රැස්වීමකට සහභාගි වී කතා පුවත් කට්ටලය කියවීම සඳහා කාලය වැය කළ බව කිව යුතු වේ" *(ජූලියා විලට්ස්, 2004).*

*1 වන වගුව. නියමු ව්‍යාපෘතියක දී වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමයේ ක්‍රියාකාරකම් සඳහා වැය වූ කාල පිරිවැය. මුළු පුද්ගල පැය හෝ පුද්ගල දින ලෙසින් ප්‍රකාශිත ය (මුල් ආකෘතිය මඳක් නවීකරණය කොට සකසා ගන්නා ලදි)*

| **ශිල්ප ක්‍රමයේ පැතිකඩ** | **වියෙන්ටියන්හි ඒඩීආර්ඒ කාර්යාල කාර්ය මණ්ඩලය** | **ලුආන්නම්තාහි ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය** | **අතාපේහි ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය** |
|---|---|---|---|
| ක්‍රියා දාමය කළමනාකරණය කිරීම (මාස 9ක නියමු ව්‍යාපෘතියේ දී වැය කළ දින ගණන) | දින 60 | දින 6 | දින 6 |
| පුහුණුව [ඇගයීම් වැඩ මුළුවක් ද ඇතුළත් ය] (මාස 9ක නියමු ව්‍යාපෘතියේ දී වැය කළ දින ගණන) | දින 46 | දින 45 | දින 31 |
| පුහුණුව සඳහා ගමන් කිරීම (මාස 9ක නියමු ව්‍යාපෘතියේ දී වැය කළ දින ගණන) | දින 8 | දින 9 | දින 9 |
| **මුළු දින ගණන** | දින 114 | දින 60 | දින 46 |
| **මාසික ක්‍රියාකාරකම් (මාස හයක් තිස්සේ කර ගෙන යන ලදි)** | | | |
| කතා පුවත් රැස් කිරීම (පැය/මාස) | පැය 0 | පැය 24 | පැය 12 |
| කතා පුවත් පරිවර්තනය කිරීම සහ යතුරු ලියනය කිරීම (පැය/මාස) | පැය 3 | පැය 10.5 | පැය 12 |
| කතා පුවත් තේරීම (පැය/මාස) | පැය 22 | පැය 42 | පැය 28 |
| **මුළු මාසික ක්‍රියාකාරකම් (මාස හයක දී වැය කළ දින ගණන)** | දින 19 | දින 57 | දින 40 |
| **මුළු නියමු ව්‍යාපෘතිය සඳහා වැය කළ මුළු දින ගණන** | දින 133 | දින 117 | දින 86 |

# පස් වන පරිච්ඡේදය: නිරීක්ෂණ සහ ඇගයීම් සැකැස්මක් තුළ දී ශිල්ප ක්‍රමය යොදා ගැනීම

## වැඩ සටහන් චක්‍රය තුළ දී ශිල්ප ක්‍රමය යොදා ගැනීම

බොහෝ සංවිධාන තුළ, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය සහ සංශෝධනය පිළිබඳ චක්‍රීය ක්‍රියා දාම පවතියි. මෙය බොහෝ විට වැඩ සටහන් හෝ සැලසුම්කරණ චක්‍රය ලෙස හඳුන්වනු ලැබේ. ඇතැම් විට මෙම චක්‍රය තුළ, නිරීක්ෂණය සහ ඇගයීම අතර තව දුර වෙන් කොට දැක්වීමක් කරනු ලැබේ. එමෙන් ම, නිරීක්ෂණයේ විවිධ ස්වරූප සහ ඇගයීමේ විවිධ ස්වරූප අතර පවතින වෙනස්කම් ද ගෙන හැර පෑ හැකි ය. නිරීක්ෂණය සඳහා සහ ඇගයීම සඳහාත්, නිරීක්ෂණයේ විවිධ ස්වරූපයන් සඳහාත්, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යොදා ගන්නට පිළිවන. මෙම සියලු විකල්පයන් මෙම පරිච්ඡේදයේ දී සමාලෝචනයට ලක් කෙරේ.

## ශිල්ප ක්‍රමය නිරීක්ෂණය සහ ඇගයීම ලෙස

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය, නිරීක්ෂණ මෙවලමක් ලෙසත් ඇගයීම් මෙවලමක් ලෙසත් සංකල්පගත කොට තිබේ. නිරීක්ෂණය සහ ඇගයීම අතර පවතින වෙනස්කම් නොපැහැදිලි වන අතර, සංකල්ප දෙක විවිධ ක්‍රමවලින් අර්ථදැක්විය හැකි ය. මෙම මාර්ගෝපදේශකයේ දී, අපි නිරීක්ෂණය හඳුන්වන්නේ, මූලික වශයෙන් ම වැඩ සටහන කළමනාකරණය කිරීමේ අරමුණ උදෙසා තොරතුරු රැස් කිරීමේ යෙදෙන ක්‍රියාත්මක ක්‍රියා දාමයක් ලෙසිනි. ඒ නිසා ම, ක්‍රියාකාරකම් සහ ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරන්නට නිරීක්ෂණය නැඹුරු වේ. අප ඇගයීම හඳුන්වන්නේ, ප්‍රතිඵල සහ බලපෑම් පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීමට නැඹුරු වන, අඩු නිරන්තර භාවයකින් සිදු වන තොරතුරු රැස් කිරීමේ ක්‍රියා දාමයක් ලෙසිනි. ක්‍රියා දාමයන් දෙකට ම, මුදුන් පමුණුවා ගත් දේවල් පිළිබඳ විනිශ්චයන් සිදු කිරීම සම්බන්ධ වන නමුත්, ඇගයීම සමස්ත වැඩ සටහනක් පිළිබඳ පුළුල් දැක්මක් ඇති කර ගැනීමට නැඹුරු වේ. එමෙන් ම, වඩා දිගු කාල පරිච්ඡේදයක්, එනම් බොහෝ විට වැඩ සටහන ආරම්භයේ පටන් වර්තමානය දක්වා වූ කාල පරිච්ඡේදය හසු කර ගනී.

අපගේ දැක්ම අනුව, ශිල්ප ක්‍රමය ස්ථානගත වී තිබෙන්නේ, නිරීක්ෂණය සහ ඇගයීම වෙන් කොට දැක්වෙන රේඛාව මත යි. එය විස්තර කිරීම එතරම් ම දුෂ්කර වන්නේ ඇයි ද යන්න පහදා දෙන්නට මෙය උදව් විය හැකි ය. නිරීක්ෂණය මෙන් ම වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය ද, වැඩ සටහන් කළමනාකරණයට සහාය වන, වැඩ සටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ වර්තමාන දත්ත සම්පාදනය කරයි. එහෙත්, ශිල්ප ක්‍රමය නිරීක්ෂණයේ වඩාත් ම සම්මත ස්වරූපයන්ට වඩා වැඩි දුරක් ගමන් කරයි. එහි දී එය, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වල ස්වරූපයෙන් විවිධ ප්‍රතිඵලවල සාපේක්ෂ වටිනාකම පිළිබඳව විනිශ්චයන් සිදු කරන ජනයා සම්බන්ධ කර ගනිමින්, ප්‍රතිඵල සහ බලපෑම් පිළිබඳව ද අවධානය යොමු කරයි. මෙලෙසින්, ශිල්ප ක්‍රමය නිරීක්ෂණය සහ ඇගයීම යන දෙකට ම දායක වෙයි.

## ශිල්ප ක්‍රමය සුවිශේෂ නිරීක්ෂණ ස්වරූපයක් ලෙස

රික් පළමුව ශිල්ප ක්‍රමය ප්‍රලේඛනය කළ අවස්ථාවේ දී, ඔහු නිරීක්ෂණයට ලක් කළ හැකි ප්‍රතිඵල ස්වරූප පිළිබඳව විමසා බැලූ අතර, එම විවිධ ප්‍රතිඵල ස්වරූප පරීක්ෂාවට ලක් කිරීම සඳහා විවිධ නිරීක්ෂණ ස්වරූප අවශ්‍ය වූ සැටි සටහන් කළේ ය. පහත දැක්වෙන වගුවේ මෙම සාධක සාරාංශගත කෙරේ.

| ප්‍රතිඵල | අපේක්ෂා කළ | අපේක්ෂා නොකළ |
|---|---|---|
| අර්ථාන්විත භාවය පිළිබඳ එකඟතාවක් පැවති | කල් තබා අර්ථදැක්වූ දර්ශක වඩාත් ම ප්‍රයෝජනවත් ය | වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය ප්‍රයෝජනවත් ය |
| අර්ථාන්විත භාවය පිළිබඳ එකඟතාවක් නොපැවති | දර්ශක ප්‍රයෝජනවත් ය, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය ප්‍රයෝජනවත් ය | වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය වඩාත් ම ප්‍රයෝජනවත් ය |

වැඩ සටහනක් තුළ දී පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව හෝ වැඩ සටහනක් තුළ සිටි සහභාගිකයන් සංඛ්‍යාව වැනි දර්ශක, කල් තබා අර්ථදැක්වූ දර්ශක වෙයි. ශිල්ප ක්‍රමය ඒවාට එරෙහිව යමින්, ක්‍රියාකාරකම් සහ ප්‍රතිඵල පිළිබඳ වඩා සම්මත වූ නිරීක්ෂණයට ආදේශකයක් විය යුතු යැයි අපි කල්පනා නො කරමු. ඒ වෙනුවට ශිල්ප ක්‍රමයෙන් සම්පාදනය වන්නේ, නිරීක්ෂණය පූර්ණත්වයට පත් කරන සහ වැදගත් පරතරයක් පියවන ස්වරූපයකි. නිරීක්ෂණ සහ ඇගයීම් සැකැස්මක දී, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය එක ම ශිල්ප ක්‍රමය ලෙස යොදා ගත යුතු යැයි අපි විශ්වාස නො කරමු. කෙසේ වුව ද, ප්‍රතිඵල හසු කර ගැනීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයේ හැකියාවන් ගොඩ නගන නිසා, විද්‍යමාන සැකැස්මක් නැති තැනක් යනු ශිල්ප ක්‍රමය පටන් ගන්නට අනගි තැනක් වන්නේ ය.

ශිල්ප ක්‍රමය නිරීක්ෂණය පූර්ණත්වයට පත් කරන ස්වරූපයක් බවට පත් වන ආකාරයත්, එය පියවන පරතරයන් මොනවා ද යන්නත් මීළඟ කොටසින් සාරාංශගත කෙරේ.

## *ශිල්ප ක්‍රමය අපට අනපේක්ෂිත ප්‍රතිඵල ගැන දැනුම් දෙයි*

කල් තබා තීරණය කර ගත් දර්ශක යොදා ගෙන කරන සම්මත ප්‍රමාණාත්මක නිරීක්ෂණයෙන් අපට දැනුම් දෙනු ලබන්නේ, අප දැන ගත යුතු යැයි අප සිතන දේ පමණකි. අප දැන ගත යුතු යැයි අප තේරුම් නොගත් දෑ පිළිබඳ ක්ෂේත්‍රය තුළට එය අප යොමු නො කරයි. මෙහි පවත්නා වෙනස වන්නේ, නිගමනාත්මක (deductive) සහ අනුමානාත්මක (inductive) පිවිසුම් අතර පවතින වෙනස යි. දර්ශක බොහෝ විට උපත ලබන්නේ, සිදු විය යුතු යැයි සිතන දේ (නිගමනාත්මක) පිළිබඳව කලින් ගොඩ නැගී තිබූ යම් සංකල්පයකින් හෝ න්‍යායකිනි. මීට වෙනස් අයුරින්, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය, සිදුවීම් සිදු වූ පසුව ඒ පිළිබඳව තේරුම් ගන්නා සහභාගිකයන්ගේ මාර්ගයෙන් අනුමානාත්මක පිවිසුමක් යොදා ගනී. මෙලෙස, නිරීක්ෂණ සහ ඇගයීම් සැකැස්මක් තුළ දී ශිල්ප ක්‍රමය විසින් පියවනු ලබන ප්‍රධාන පරතරයක් වන්නේ, අපගේ වැඩ කටයුතුවල අනපේක්ෂිත ප්‍රතිඵල, ග්‍රහණය කර ගැනීමට දුෂ්කර සහ වක්‍ර ප්‍රතිවිපාක ඇතුළු අපගේ වැඩ කටයුතුවල 'අවුල් සහගත' බලපෑම් නිරීක්ෂණය කරන්නට එය අපට උදව් වීම යි. නිතිපතා පදනමකින් මෙම තොරතුරු ලබා ගැනීමෙන් සහ ඉන් අදහස් වන්නේ කුමක් දැයි සිතා බලන්නට කාලය යෙදවීමෙන්, තමන් අගය කරන ප්‍රතිඵල වැඩිපුර මුදුන් පමුණුවා ගත හැකි වන පරිදි තමන්ගේ උත්සාහයේ දිසාව වෙනස් කර ගන්නට ජන කණ්ඩායම්වලට පුළුවන්කම තිබේ.

> **සානාව - තාර්කික සැකැස්මෙන් පිටත සිදු වන වෙනස් වීම්**
> "ව්‍යාපෘතියේ තාර්කික සැකැස්ම තුළ පවතින දර්ශකවල ස්වරූපයෙන් කල් තබා අපේක්ෂා කළ වෙනස් වීම්වලට වෙනස් වූ වෙනස් වීම් සිදු වන්නේ ය යන්න ඒත්තු ගැනීම, වැදගත් වන බව පෙනී යයි. බීඒඩීඑස්පී සංවිධානය පිළිබඳ විශේෂිත උදාහරණයේ දී, බොහෝ දර්ශක සපුරා ගෙන තිබිය දීත්, තමන් ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක තුළ සැලකිය යුතු වෙනස් වීමක් සිදු වෙමින් පවතින බව ව්‍යාපෘතිය විසින් තේරුම් ගෙන තිබීම, සිතන්නට බෙහෙවින් ම අසීරු කාරණාවකි…" *(ජොන්ස්ටන්, 2002:11).*

## *ශිල්ප ක්‍රමය අදහස්වල විවිධත්වය ප්‍රයෝජනවත් අයුරින් යොදා ගනියි, අදහස්වල විවිධත්වයට අනුබල දෙයි*

බොහෝ නිරීක්ෂණ පද්ධති තුළ දී, උත්සුකතාව සහිත වැදගත් සිදුවීම් අර්ථදක්වනු ලබන්නේ, සිදුවීම් සිදු වන සහ නිරීක්ෂණය කරනු ලබන ස්ථානයට දුරින් සිටින ජනයා විසිනි. බොහෝ විට දර්ශක හඳුනා ගනු ලබන්නේ, ජ්‍යෙෂ්ඨ විධායක කාර්ය මණ්ඩලය හෝ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික විශේෂඥ පර්යේෂණ ඒකක විසිනි. දර්ශක හඳුනා ගැනීමේ ක්‍රියා දාමය ධුරාවලියේ පහළට ගෙන යාමෙන් තත්ත්වය වැඩි දියුණු කරන්නට සමහර සංවිධාන උත්සාහ කර තිබේ. ඇතැම් උදාහරණවල දී මින් අදහස් වී ඇත්තේ, ප්‍රතිලාභීන්ගේ අදහස් ලබා ගැනීම සඳහා, සහභාගී ග්‍රාමීය තක්සේරු (Participatory Rural Appraisal) විධික්‍රම යොදා ගැනීම යි. එවැනි එක් පිවිසුමක් සමග බැඳී පවතින ගැටලුව වන්නේ, ප්‍රාදේශීය වශයෙන් හඳුනා ගත් විවිධ දර්ශක මගින් ගෙන හැර පෑ තොරතුරු සාරාංශගත කිරීමේ දී, අනතුරුව සංවිධානය මුහුණ දෙන දුෂ්කරතාව යි.

ශිල්ප ක්‍රමය, අදාළ යැයි තමන් සිතන විවිධ කතා පුවත් හඳුනා ගැනීමේ අයිතිය, නිරීක්ෂණය කරන සිදුවීම් සමීපයෙහි වෙසෙන්නන්ට (නිදසුනක් ලෙස, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට සහ ප්‍රතිලාභීන්ට) ලබා දෙයි. අනෙකුත් සහභාගිකයන් විසින් වාර්තා වූ සියලු කතා පුවත් අතුරින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත් තෝරන විට, තේරීම මගින් මේවා සාරාංශ කරනු ලැබේ. මෙහි දී, තමන් යා යුත්තේ කුමන දිසාවට දැයි තීරණය කිරීම සඳහා සංවිධානයට සැපයෙන අවස්ථාවක් බවට විවිධත්වය පත් වේ.

## *ශිල්ප ක්‍රමය සහභාගිකයන් මෙහෙයවනවා වෙනුවට ඔවුන් ශක්තිමත් කරයි*

කල් තබා තීරණය කරන ලද දර්ශක යොදා ගන්නා නිරීක්ෂණ පද්ධතිවල දී, තොරතුරක ස්වභාවය සහ එහි අදහස බොහෝ දුරට ම අර්ථදක්වනු ලබන්නේ ආරම්භයේ දී ම ය. අනතුරුව, හැකි තාක් දුරට ප්‍රමිතිගත කළ ආකාරයකට දත්ත රැස් කළ යුතු වේ. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමයේ දී, කතා පුවත් හඳුනා ගැනීමේ දී සහ අනෙකුන් විසින් රැස් කරන ලද කතා පුවත් තේරීමේ දී තමන්ගේ ම විනිශ්චයන් යොදා ගැනීම සඳහා සහභාගිකයන් ක්‍රියාශීලීව දිරි ගන්වනු ලැබේ. මීට පහත දැක්වෙන ආකාරයේ කල් තබා නියම කර ගන්නා ලද ප්‍රශ්න යොදා ගැනීම ඇතුළත් වේ: එනම්, *"ඔබගේ දෘෂ්ටි කෝණය අනුව, මෙය තුළ සිටින ජනයාගේ ජීවිතවල ගුණාත්මක භාවය සම්බන්ධයෙන් සිදු වූ වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම වූයේ කුමක් ද?"* වැනි ප්‍රශ්න යි. ප්‍රතිලාභීන් සහ ක්ෂේත්‍ර ක්‍රියාකාරකයන් පිළිබඳ කාරණාවේ දී, මෙම නිදහස විශේෂයෙන් ම වැදගත් වේ. ඊට හේතුව නම්, දෛනික ක්‍රියා පටිපාටිවල ප්‍රතිඵලයක් ලෙස බොහෝ විට ඔවුන්ගේ අදහස් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත ළඟා නොවීම යි.

## *ශිල්ප ක්‍රමය පුළුල් සහභාගිත්වය ශක්තිමත් කරයි*

සංවිධානයක නිරීක්ෂණ පද්ධතියක් විසින් ප්‍රලේඛනය කරන ලද සිදුවීම් බොහෝ විට විශ්ලේෂණය කරනු ලබන්නේ, සංවිධානයේ ඉහළ තල වෙත කේන්ද්‍රගත වූ පදනමක් මත යි. නියම වශයෙන් සිදු වන ආකාරය අනුව ගත් කල, ක්ෂේත්‍ර තලයේ ක්‍රියාකාරකයෝ තමන් රැස් කළ දත්ත විශ්ලේෂණය නො කරති. ඔවුන් වෙනත් අයට විශ්ලේෂණය කිරීම සඳහා ධුරාවලියේ ඉහළට තොරතුරු යවනවා පමණකි. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමයේ දී, තොරතුරු මධ්‍යගතව ගබඩා කිරීමක් හෝ ක්‍රියා දාමගත කිරීමක් සිදු නො වේ. එහි දී කෙරෙන්නේ, ඒවා සංවිධානය පුරා බෙදා හැර ප්‍රාදේශීයව පිළියෙළ කිරීම යි. කාර්ය මණ්ඩලය සිදුවීම් පිළිබඳ තොරතුරු රැස් කරනවා පමණක් නො වේ. ඔවුහු තමන්ගේ ම ප්‍රාදේශීය ඉදිරි දැක්මට අනුව තොරතුරු ඇගයීම ද සිදු කරති.

> **සානාව - ශිල්ප ක්‍රමය වඩා සාරවත් චිත්‍රයක් විදහා පායි**
> "... අර්ථාන්විත වෙනස් වීම් නිරීක්ෂණය කිරීම සඳහා දැරූ පැහැදිලි උත්සාහය නො වී නම්, රැස් කරන ලද ද්‍රව්‍ය සම්භාරය එක්තැන් වීමක් කිසි විටෙකත් සිදු නොවනු ඇත. ඒ හැටියට ගත් කල, ඉන් බීඑඩීඑස්පී සංවිධානය ක්‍රියාත්මක වන තත්ත්වය පිළිබඳ චිත්‍රයක් සම්පාදනය වේ. එය, සාම්ප්‍රදායික ව්‍යාපෘති ප්‍රලේඛන කටයුතු තුළින් වර්ධනය වී ආ හැකි මොන යම් හෝ සන්දර්භයකට වඩා තරමක් වෙනස් ය" *(ජොන්ස්ටන්, 2002:11).*

### *ශිල්ප ක්‍රමය සිදුවීම් ඒවාට අදාළ තත්ත්වයෙහි පිහිටුවයි*

සාමාන්‍යයෙන් ප්‍රමාණාත්මක නිරීක්ෂණ දත්ත විශ්ලේෂණය කෙරෙන විට, ඒවා අදාළ තත්ත්වයෙන් උගුලා දමයි. ක්ෂේත්‍ර කාර්යාලවලින් එවන ලද සංඛ්‍යාන වගු විශ්ලේෂණය කරන මධ්‍යම කාර්යාල කාර්ය මණ්ඩලය සිටින්නේ, ක්ෂේත්‍ර අඩවියෙන් බොහෝ සේ ඉවත් කරනු ලැබ ය. නියම වශයෙන් සිදු වන අයුරින් ගත් විට, ක්ෂේත්‍ර ක්‍රියාකාරකයන් එවන සංඛ්‍යාවන් සමග ලිඛිත අදහස් කීපයක් ද පවතී. ශිල්ප ක්‍රමය විසින් යොදා ගනු ලබන්නේ 'පළල් විස්තර කිරීම' නමින් හඳුන්වනු ලැබ ඇති දෙය යිඃ එනම්, සිදුවීම් පිළිබඳ සවිස්තරාත්මක කතා පුවත්, ජනයා සහ සිදුවීම් පිළිබඳ ජනයාගේ අදහස් අවබෝධ කොට ගත හැකි අදාළ ප්‍රාදේශීය තත්ත්වයන් තුළ පිහිටුවනු ලැබේ. සාමාන්‍ය ජනයාගේ ලෝකය තුළ දී, මේවා බොහෝ විට කතා පුවත්වල හෝ උපාඛ්‍යානවල (කෙටි ප්‍රවෘත්තිවල) ස්වරූපය ගනියි. ශිල්ප ක්‍රමයේ නිරීක්ෂණ ක්‍රියා දාමය තුළ දී, අර්ථාන්විත භාවය කුමක් ද යන්න පිළිබඳ රචකයාගේ අර්ථදැක්වීම ද කතා පුවත සමග පවතියි.

### *වැදගත් වන්නේ කුමක් ද යන්න සම්බන්ධයෙන් යොමු කරන අවධානය වෙනස් කරන්නට ශිල්ප ක්‍රමය ශක්තිය ලබා දෙයි*

බොහෝ නිරීක්ෂණ පද්ධති තුළ දී, සෑම වාර්තාකරණ කාල සීමාවක් තුළ දී ම යොදා ගන්නා දර්ශක එක හා සමාන වේඃ ඉන් කියැවෙන්නේ, එක ම ප්‍රශ්න යළි යළිත් අසනු ලබන බව යි. අවධානය එකක් ම වන බව යි. ස්වාධීනව (ඵලදායක හෝ විනාශකාරී අයුරින්) නිරීක්ෂණ පද්ධතිය අනුවර්තනය කර ගන්නට කාර්ය මණ්ඩලයට පවතින ඉඩකඩ සීමිත ය. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමයේ දී, නිරීක්ෂණ පද්ධතියේ අන්තර්ගතය වඩාත් වෙනස් වනසුලු ය, අනුවර්තනය කර ගත හැකි ය. එහෙත් භාවිතයේ දී, සැබවින් ම මෙම තත්ත්වය සංවිධානයෙන් සංවිධානයට වෙනස් ය. සහභාගිකයන්, නියම කරන ලද බලපෑම් ක්ෂේත්‍රයේ සීමාව තුළ වාර්තා කළ යුත්තේ කුමක් දැයි තෝරන අතර, එහි දී, අඩු නිරන්තර භාවයකින් යුතුව බලපෑම් ක්ෂේත්‍ර වෙනස් කර ගන්නට ඔවුන්ට හැකියාව තිබේ. ලෝකය තුළ සිදු වන සැබෑ වෙනස් වීම් මෙන් ම, වැදගත් වන්නේ කුමක් ද යන්න සම්බන්ධයෙන් සංවිධානයක් තුළ පවතින අදහස්වල වෙනස් වීම ද පිළිබිඹු කරන්නට, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවත්වලට හැකියාව තිබේ.

## ශිල්ප ක්‍රමය වැඩ සටහන් ඇගයීම ලෙස

වැඩ සටහන් ඇගයීමේ තීන්දු මූලික අරමුණු තුනක් සඳහා ප්‍රයෝජනවත් විය හැකි යැයි පැටන් (1997) අඟවයිඃ එනම්, 'විනිශ්චයන් ඉදිරිපත් කිරීම, වැඩි දියුණු වීම්වලට පහසුකම් සැපයීම සහ/හෝ දැනුම ඉපිදවීම' යි. ශිල්ප ක්‍රමය අරමුණු තුනට ම යොදා ගත හැකි ය.

### *විනිශ්චයන් ඉදිරිපත් කිරීම*

අප දන්නා තරමට, වැඩ සටහනක සමස්ත සාර්ථකත්වය පිළිබඳව සංක්ෂිප්ත විනිශ්චයන් ඉදිරිපත් කිරීම සඳහා වූ එක ම ශිල්ප ක්‍රමය ලෙස, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යොදා ගෙන නැත. ශිල්ප ක්‍රමය එලෙස යොදා ගන්නට දරන උත්සාහය සම්බන්ධයෙන්, අපට බැරෑරුම් නියමයන් පැවතිය යුතු ය. බොහෝ ඇගයීම් ප්‍රයෝජන ලබන්නේ, විධික්‍රමවල මිශ්‍රණයක් (නිදසුන් ලෙස, සහභාගී සහ විශේෂඥ, නිගමනාත්මක සහ අනුමානාත්මක) යොදා ගැනීමෙනි.

සම්පිණ්ඩනාත්මක ඇගයීමක් බවට පත් වන ක්‍රියාකාරකමක් ලෙස හෝ සම්පිණ්ඩනාත්මක ඇගයීමට කලින් සිදු කරන ක්‍රියාකාරකමක් ලෙස ශිල්ප ක්‍රමය යොදා ගත හැකි ය. අවස්ථා දෙකේ දී ම, කුඩා පරිමාණ සිද්ධි අධ්‍යයනයන් සම්භාරයක් සම්පාදනය කරන්නට ශිල්ප ක්‍රමයට හැකියාව තිබේ. ඇගයීම අතරතුර දී වර්ධනය කර ගනු ලබන තර්කවලට සහායක් වශයෙන් ඒවා යොදා ගත හැකි වේ. එමෙන් ම, එම තර්ක සවිස්තරාත්මක කිරීම සඳහා ඒවා යොදා ගත හැකි වේ. එසේ ම, සාර්ථකත්වය පිළිබඳ මිනුම් දඬු සම්භාරයක් සම්පාදනය කරන්නට ද තේරීම් ක්‍රියා දාමයේ වාර්තාවලට පුළුවන්කම තිබේ. ඊට හේතුව, ඇගයීම්කරුවන් හෝ වෙනත් මොන යම් හෝ සහභාගිකයෙකු වුව ද, ඇගයීම් ක්‍රියා දාමයේ දී තමන් යොදා ගත් මිනුම් දණ්ඩ කුමක් දැයි දැනුම් දිය යුතු බැවිනි (ඩාර්ට් සහ ඩේවිස්, 2003).

මහා පරිමාණයකින් විවිධ කොටස්කරුවන්ගේ අදහස් හඳුනා ගැනීමේ සහ එක්රැස් කිරීමේ උපක්‍රමයක් ලෙසින් ද, ඇගයීම් ක්‍රියා දාමය තුළ දී ශිල්ප ක්‍රමයට වඩා කේන්ද්‍රීය කාර්ය භාරයක් ඉටු කළ හැකි ය. අප්‍රිකාව සහ ආසියාව තුළ, ඩීඑෆ්අයිඩී සංවිධානය විසින් අරමුදල් සපයන ලද රාජ්‍ය නොවන සංවිධානමය වැඩ සටහන් සම්බන්ධයෙන් සිදු කළ ඇගයීම් මාලාවක් තුළ දී, රික් මෙම අරමුණ උදෙසා ශිල්ප ක්‍රමය යොදා ගත්තේ ය. නිරීක්ෂණය සඳහා ශිල්ප ක්‍රමය යොදා ගැනීම සමග සසඳා බලන විට, මෙම කටයුත්ත සඳහා වඩා දිගු විමර්ශන කාල පරිච්ඡේදයක් ඇතුළත් විය (මෙහි දී සලකා බැලුණේ, පසු ගිය වසර තුන තුළ සිදු වූ වෙනස් වීම් පිළිබඳව ය). වෙනස් යැයි හඳුනා ගත හැකි කොටස්කරුවන්ගේ කණ්ඩායම්වලින් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවත් ලබා ගැනීම කෙරෙහි එය දැවැන්ත අවධානයක් යොමු කළේ ය.

ඇගයීම පිළිබඳව වූ න්‍යාය-මූලික (නිගමනාත්මක) පිවිසුමක් සමග සම්බන්ධ වන්නට ද ශිල්ප ක්‍රමයට හැකියාව තිබේ. වැඩ සටහන් ක්‍රියාකාරකම්වල වඩාත් ම අර්ථාන්විත බලපෑම් ඇති වන විට, ඒවා බෙහෙවින් පැහැදිලිව දැක ගත හැකි වනු ඇත යන අපේක්ෂාවක් (එනම්, න්‍යායක්) බොහෝ වැඩ සටහන්වලට තිබේ. වැඩ සටහන් බොහොමයක දී, වැඩි බලපෑමක් ඇති වේ යැයි අපේක්ෂා කෙරෙන්නේ වැඩ සටහන අවසානය කරා යොමු වන විට ය. එහි ආරම්භයේ දී නො වේ. කෙසේ වුව ද, ඉතිරි කිරීම් සහ ණය වැඩ සටහන් වැනි අනෙක් ඒවායේ දී, උපරිම බලපෑම විවිධ කාලවල දී ඇති විය හැකි ය. නිදසුනක් ලෙස, පළමු වතාවට ඉතිරි කිරීම් සහ ණය කණ්ඩායමට සම්බන්ධ වන සාමාජිකයන් සම්බන්ධයෙන් මෙය තුන් මසක් තුළ දී සිදු විය හැකි ය. කල් තබා තීරණය කර ගන්නා ලද දර්ශකයන් මත පදනම්ව දත්ත රැස් කිරීමෙන්, සහ වැඩ සටහනක ජීව කාලය පුරා රැස් කරන ලද අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තුළ පවත්නා නැඹුරුතාවන් විභාග කර බැලීමෙන්, මෙම පෙරදැකීම් පරීක්ෂාවට ලක් කළ හැකි ය. පසු ගිය දස මාසය පුරා තෝරා ගන්නා ලද කතා පුවත් විභාග කොට ඒ සියල්ල අතුරින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත හඳුනා ගන්නා ලෙස, සීසීඩීබී සංවිධානයේ සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබුණි. දිගු කාල පරිච්ඡේදයක් ආවරණය වන පරිද්දෙන් මෙය පුළුල් කොට, සරල ලෙස වඩාත් ම අර්ථාන්විත කතා පුවත තේරීමේ යෙදෙනවා වෙනුවට කතා පුවත් ශ්‍රේණිගත කිරීමෙහි යෙදෙන්නැයි සහභාගිකයන්ගෙන් ඉල්ලා සිටීමෙන්, මෙම ක්‍රියා දාමය ශක්තිමත් කළ හැකිව තිබුණි.

වැඩ සටහන්වලින් අපේක්ෂා කෙරෙන්නේ, ප්‍රතිලාභීන් විශාල සංඛ්‍යාවක් කෙරෙහි අපක්ෂපාතීව බලපෑමක් ඇති කිරීම ද, ප්‍රතිලාභීන් කුඩා සංඛ්‍යාවක් කෙරෙහි බලපෑමක් ඇති කිරීම ද යන්න මතත් වැඩ සටහන් විවිධත්වයට පත් වේ. සේවාවන් බෙදා හැරීම වැඩි දියුණු කර ලීමේ අරමුණින් යුතු බොහෝ වැඩ සටහන්, යම් පමණකට පුළුල් වූ සහ අපක්ෂපාතී වූ ආකාරයකින් ප්‍රතිලාභීන් ආවරණය කිරීමට අපේක්ෂා කරයි. මීට වෙනස් ලෙසින්, සහල් ඵලදාව වැඩි දියුණු කිරීම වැනි නව තාක්ෂණය පිළිබඳ පර්යේෂණයන්ට සම්බන්ධ වැඩ සටහන්වල දී, අසාර්ථක වීම් සැලකිය යුතු සංඛ්‍යාවක් ද විශිෂ්ට සාර්ථක වීම් කීපයක් ද අපේක්ෂා කෙරෙනු ඇත. ජාතික පරිමාණව ගොවීන් විසින් යොදා ගනු ලබන විට, විශිෂ්ටාකාරයෙන් සාර්ථක වූ එක් පර්යේෂණ ප්‍රතිඵලයකට, ප්‍රතිලාභීන් විශාල සංඛ්‍යාවක් කෙරෙහි බලපෑමේ හැකියාව ලැබෙනු ඇත. ශිල්ප ක්‍රමය 'අත්දැකීමේ තියුණු බව' කෙරෙහි යොමු කරන අවධානය සමග ගෙන සලකා බලන කල, ශිල්ප ක්‍රමය වඩා සුදුසු විය හැක්කේ සේවාවන් බෙදා හැරීම පිළිබඳ වැඩ සටහන්වලට නො ව ඇගයීම් වැඩ සටහන්වලට යි.

## *දැනුම ඉපදවීම*

පැටන්ගේ තුන් වන අරමුණ, ඇගයීම මගින් දැනුම ඉපදවීමට සම්බන්ධ ය. විශේෂයෙන් ම, උත්සුක වන වැඩ සටහනෙන් ඔබ්බෙහි සිටින, මෙම දැනුම යොදා ගැනීමේ හැකියාව තිබිය හැකි වෙනත් අය වෙත අපනයනය කළ හැකි දැනුම ඉපදවීමට සම්බන්ධ ය. මෙය, න්‍යාය-මූලික ඇගයීමේ, එනම්, පෝසන් සහ ටිලේ *යථාර්ථවාදී ඇගයීම* ("Realistic Evaluation") නමින් 1997 දී පළ කළ සිය කෘතියෙන් යෝජනා කරන ඇගයීම් වර්ගයේ, නියමානුකූල අරමුණකි. මතුපිටින් ගත් විට, ශිල්ප ක්‍රමය මෙම අරමුණට මැනවින් ගැළපෙන බවක් නො පෙනේ. එමෙන් ම එය මෙලෙස යොදා ගැනීම ද අප දැක නැත. කෙසේ වුව ද, අප වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් කුඩා සිද්ධි අධ්‍යයන හැටියට තේරුම් ගන්නේ නම්, කතා පුවත්වලට වැඩ සටහන් තුළ දී දේවල් සිදු වන ආකාරය පිළිබඳ සාරවත් උපකල්පන මූලාශ්‍රයක් විය හැකි ය යන්න, තරමක් දුරට සිතා ගත හැකි අදහසකි. කතා පුවත් තුළ පවතින එක් එක් විශේෂිත ක්‍රියාකාරකම් සහ ප්‍රතිඵල අතර පවතින හේතුප්‍රත්‍යමය

සබඳතා හඳුනා ගන්නට ද ශිල්ප ක්‍රමය යොදා ගත හැකි ය. එමෙන් ම අනතුරුව, මෙම ක්‍රියාකාරකම් සිදු වීමත් ප්‍රතිඵලවලට ඒවායේ පවතින සබඳතාවත් පිළිබඳව කළ යුතු විධිමත් අධ්‍යයනයන් නිර්දේශ කරන්නට ද ශිල්ප ක්‍රමය යොදා ගත හැකි ය. මෙම යොදා ගැනීම, ප්‍රමාණාත්මකව ප්‍රකාශයට පත් කිරීම නමැති අට වන පියවරේ දිගුවකි (දෙවන පරිච්ඡේදය බලන්න).

## *වැඩි දියුණු වීම්වලට පහසුකම් සැපයීම*

මුලින් ශිල්ප ක්‍රමය සැලසුම් කෙරුණේත්, එය වඩාත් ම නිසැක වශයෙන් ගැළපෙන බව පෙනෙන්නේත්, පැටන්ගේ දෙවන ඇගයීම් අරමුණට යි: එනම්, වැඩි දියුණු වීම්වලට පහසුකම් සැපයීමට යි. තමන්ගේ වැඩ කටයුතු පැහැදිලිව ම වටිනා දිසාවන්ට යොමු කරන්නටත්, අඩු වටිනාකමකින් යුතු දිසාවන්ගෙන් ඈත් වන්නටත් සංවිධානවලට ශක්තිය ලබා දෙන්නට, ශිල්ප ක්‍රමයට හැකියාව තිබේ. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ ධනාත්මක කතා පුවත් බොහොමයක් තුළ පවා, ප්‍රතිචාර දැක්විය යුත්තේ කුමන ඒවාට ද, තාවකාලිකව පසෙක තැබිය යුත්තේ කුමන ඒවා ද යන්න පිළිබඳව කළ යුතු තෝරා ගැනීම් පවතියි. සහභාගිකයන් විසින් හඳුනා ගනු ලබන කතා පුවත් විවිධ ය. එම විවිධත්වය පුරා මෙම තෝරා ගැනීම් ද පවතියි.

වැඩ සටහන් සැබවින් ම වැඩි දියුණු වීමට ශිල්ප ක්‍රමය කොයි තරම් දුරකට හේතු වන්නේ ද යන්න කෙරෙහි සාධක කීපයක් බලපායි. සමහර අවස්ථාවල දී, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවතක් සියලු කතා පුවත් අතුරින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත යැයි තෝරා ගනු ලබන්නේ, එමගින් සංවිධානය විසින් කළ යුතු දේ ගැන දැනට පවතින අදහස් තහවුරු වන බැවිනි. මේවා මොන යම් හෝ නිරීක්ෂණය කළ හැකි ආකාරයේ වැඩි දියුණු වීමකට හේතු නොවන්නට ඉඩ තිබේ. සමහර විට, තමන් ගමන් කරමින් සිටින්නේ කොතැනට ද යන්න ගැන සංවිධානයකට පවතින අදහස්වල, දැවැන්ත සංවිධානීය ඒකාබද්ධතාවක් සහ පැහැදිලිකමක් ඇති වීමේ ස්වරූපයෙන් නම්, එවැනි නිරීක්ෂණය කළ හැකි වැඩි දියුණු වීමක් ඇති විය හැකි ය. කෙසේ වුව ද, මෙම ස්වරූපයේ ප්‍රතිඵලයකින් පෙන්නුම් කෙරෙන්නේ, දුර්වල අයුරින් ක්‍රියාත්මක වන වඩාත් ම අර්ථාන්විත වෙනස් වීමේ ක්‍රියා දාමයක් විය හැකි ය: එනම්, අර්ථාන්විත වෙනස් වීමක්, වෙනස් වීමක් ඇති කරන්නා වූ වෙනස් වීමක්, හඳුනා ගන්නට ක්‍රියා දාමය අසමත් වී තිබේ. කතා පුවත් ඉතා කෙටි වන විට හෝ පැහැදිලි කිරීම් දුර්වල අයුරින් ප්‍රලේඛනය කෙරෙන විට, මෙය වඩාත් සිදු විය හැකි ය. නමුත් සමහර කතා පුවත්, වෙනස් වීමක් ඇති කරනු පිණිස ගත යුතු පසු පියවරයන් හඳුනා ගනියි, නැත් නම් අඟවයි. ශිල්ප ක්‍රමය යොදා ගන්නා සමහර සංවිධාන, වාර්තාකරණ ආකෘති පත්‍රයේ අගට නිර්දේශයන් පිළිබඳ කොටසක් ඇතුළත් කිරීමෙන් මේවා හසු කර ගන්නට උත්සාහ දරා තිබේ (නිදසුනක් ලෙස, ඝානාවේ බීඒඩීඑස්පී සංවිධානය ගත හැකි ය).

සහභාගිකයන් අවධානය යොමු කරන වෙනස් වීම් ස්වරූප ද වැදගත් විය හැකි ය. ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කරන අතරතුර දී, තේරීම් ක්‍රියා දාමය වුව ද, වඩාත් ම ප්‍රයෝජනවත් වන්නේ වෙනස් වීමේ කුමන කාලාවධිය ද යන්න ගැන තේරීම් සිදු කරයි. සුදුසු කතා පුවත් තේරීමෙන්, දිගු කාලීන වෙනස් වීම් කෙරෙහි සංවිධානයක් යොමු කරන අවධානය ශක්තිමත් කරන්නට ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයට පුළුවන්කම තිබේ. එසේ නැත් නම්, ඔවුන්ට කෙටි කාලීන වෙනස් වීම් තෝරා ගත හැකි ය. නිර්දේශවලට ප්‍රතිචාර දැක්වීම තුළින් දිගු කාලීන වෙනස් වීම් කෙරෙහි ඉක්මන් බලපෑමක් ඇති කිරීම, වඩා දුෂ්කර කටයුත්තක් විය හැකි බව පෙනේ. ඊට හේතුව ඒවා දිගු කාලීන වීම යි. අනෙක් අතට, කෙටි කාලීන වෙනස් වීම් කෙරෙහි බලපෑමක් ඇති කිරීම වඩා පහසු කටයුත්තක් විය යුතු ය. මෙය, ශිල්ප ක්‍රමය යොදා ගැනීම පිළිබඳව සිදු කරන වැඩි දුර ඇගයීම් තුළින් පරීක්ෂාවට ලක් කළ හැකි අදහසකි.

වැඩ සටහනේ වැඩි දියුණු වීම කෙරෙහි බලපෑමක් ඇති කරන්නට වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ ක්‍රියා දාමයට පවතින හැකියාව කෙරෙහි බලපාන තවත් සාධකයක් නම්, වාර්තාකරණයේ නිරන්තර භාවය යි. න්‍යායිකව ගත් කල, වඩා නිරන්තරව වෙනස් වීම් පසුපස ලුහුබැඳ යන තරමට, පසු පියවරයන් මගින් මොන යම් හෝ බලපෑමක් ඇති වෙමින් පවතින්නේ ද යන්න හඳුනා ගන්නට පවතින අවස්ථා වැඩි වේ. එමෙන් ම, අලුතින් මතු වෙමින් පවතින ගැටලු හඳුනා ගෙන ප්‍රතිචාර දක්වන්නට පවතින අවස්ථා ද වැඩි වේ. මීට සමාන වැදගත්කමකින් යුතු තවත් දෙයක් නම්, වඩා නිරන්තරව කතා පුවත් රැස් කිරීමෙන්, ශිල්ප ක්‍රමය හොඳින් ම යොදා ගන්නේ කෙසේ ද යන්න වඩා ඉක්මනින් ඉගෙන ගන්නට සහභාගිකයන්ට ශක්තිය සැපයෙන්නේ ය යන්න යි. වීඑස්ඕ සංවිධානය, මෙම ක්ෂේත්‍රය

සම්බන්ධ විශාලතම අභියෝගයට මුහුණ දී සිටී. එම සංවිධානය වාර්ෂික පදනමකින් කතා පුවත් රැස් කොට තෝරනවා පමණක් නො වේ. ඔවුන්ගේ කතා පුවත්වල ප්‍රධාන මූලාශ්‍රය වන්නේ, සාමාන්‍යයෙන් දැවුරුද්දක පදනමක් මත සංවර්ධනය වෙමින් පවතින රටවල් තුළ වැඩ කරන වීඑස්ඕ ස්වේච්ඡා සේවකයන් ය.

වැඩ සටහනේ වැඩි දියුණු වීම ඇති විය හැකි ආකාරය කෙරෙහි බලපාන තවත් සීරුමාරු කළ හැකි සැකැස්මක් වන්නේ, බලපෑම් ක්ෂේත්‍ර තේරීම යි. බලපෑම් ක්ෂේත්‍ර කල් තබා අර්ථදැක්විය හැකි ය. සියලු තලවල දී යොදා ගත හැකි ය. පවත්නා සංවිධානීය අරමුණු කෙරෙහි ඒවායේ අවධානය කේන්ද්‍රගත කළ හැකි ය. ඒවා වඩා නිදහසේ අර්ථදැක්වීම ද කළ හැකි ය. යොදා ගනු ලබන්නේ අර්ථාන්විත වෙනස් වීම් හඳුනා ගැනීමෙන් පසුව පමණකි. 'වෙනත් මොන යම් හෝ වෙනස් වීමක්' නමැති බලපෑම් ක්ෂේත්‍ර ද ඇතුළත් ය. ලාඕසයේ ඒඩීආර්ඒ සංවිධානය, අරමුණු කෙරෙහි අවධානය යොමු කරන බලපෑම් ක්ෂේත්‍රවල සිට, ධනාත්මක සහ සෘණාත්මක වෙනස් වීම්වලට සම්බන්ධිත වඩා පුළුල් ප්‍රභේදයන් කරා මාරු වෙමින් සිටිනවා වන්නට පිළිවන. එවැනි වෙනස් වීමක ප්‍රතිවිපාක සොයා බැලීම ප්‍රයෝජනවත් වනු ඇත.

අර්ථදැක්වීම කෙරෙහි බලපෑමක් කිරීම මගින් වැඩ සටහනේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑමක් ඇති කරන්නට ද ශිල්ප ක්‍රමයට පුළුවන්කම තිබේ. එමෙන් ම, වැඩ සටහනක අරමුණු මුදුන් පමුණුවා ගැනීමට සීමා නො වී, වැඩ සටහනක අරමුණු පිළිබඳව කෙරෙන තෝරා ගැනීම කෙරෙහි පවා බලපෑමක් කිරීම මගිනුත්, වැඩ සටහනේ ක්‍රියාකාරිත්වයට බලපෑමක් කරන්නට ශිල්ප ක්‍රමයට පුළුවන්කම තිබේ. බොහෝ වැඩ සටහන් ඇගයීම්, අනපේක්ෂිත ප්‍රතිඵල පරීක්ෂාවට ලක් කිරීමෙන් ප්‍රයෝජන ලබන්නට ඉඩ තිබේ. එසේ ම, අඩුවෙන් පෙරදකින ලද ප්‍රතිඵල සහිත ඇගයීම් වැඩ සටහන්වල දී, ශිල්ප ක්‍රමය ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරයි. නිදසුනක් ලෙස, සමහර දීර්ඝ කාලීන වැඩ සටහන්වලට, හිතාමතා නිදහසේ සකසා ගත් ප්‍රතිඵල සහ සහභාගී සැලසුම් තිබෙන අතර, ඒවා බොහෝ විට සංකීර්ණ සහ විවිධ ප්‍රතිඵල රැසක් අත් කර ගනියි. අර්ථාන්විත ප්‍රතිඵලවල වටිනාකම සොයා යන, ඒ ගැන කල්පනාකාරීව සිතා බලන ඇගයීම් ශිල්ප ක්‍රම සඳහා, මෙම ස්වරූපවල වැඩ සටහන් පරිසමාප්ත වශයෙන් ගැළපේ. එවැනි වැඩ සටහන්වල දී, අර්ධ වෛෂයික ප්‍රකාශවල ස්වරූපයෙන්, කාලයත් සමග වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ බලපෑම් ක්ෂේත්‍ර සංශෝධනය වනු දැකිය හැකි ය. මෙය තේරුම් ගත හැකි වන්නේ ක්‍රියා දාමයේ නිෂ්පාදිතයක් ලෙසිනි. ශිල්ප ක්‍රමයේ කොටසක් ලෙස නො වේ.

# ශිල්ප ක්‍රමය සහ සංවිධානීය ඉගෙනීම

වැඩ සටහන්වලට ම සුවිශේෂී වන ක්‍රියාකාරකම්වල සහ ක්‍රියාකාරිත්වයන්හි ක්ෂේත්‍රයෙන් ඔබ්බට ගොස්, සංවිධාන කෙරෙහි ඒවා හැඩ ගස්වන ආකාරයේ බලපෑමක් කරන්නට ශිල්ප ක්‍රමයට හැකියාව තිබේ. සමහර විට, වඩාත් ම වැදගත් දෙය විය හැක්කේ, සංවිධානයක සිටින කාර්ය මණ්ඩලය දරා සිටින, සහ ඇතැම් විට එහි සහායක කොටස්කාර සංවිධානවල පවා සිටින කාර්ය මණ්ඩලය දරා සිටින, 'වටිනාකම් ගහනය' යැයි හැඳින්විය හැකි දෙය කෙරෙහි බලපෑමක් කිරීමේ හැකියාව ශිල්ප ක්‍රමයට තිබීම යි. තේරීම් ක්‍රියා දාමයේ දී, අරමුදල් සපයන්නන්, වැඩ සටහන් කාර්ය මණ්ඩලය සහ කොටස්කරුවන්ගේ කමිටුවල සාමාජිකයන් වැනි පත් කරන ලද ජනයා, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ කතා පුවත් විනිශ්චය කළ යුතු ආකාරය ගැන පරෙස්සමෙන් සිතා බලති. ජයග්‍රාහී කතා පුවත් තෝරා ගන්නට යොදා ගත යුතු මිනුම් දණ්ඩ කුමක් ද යන්න පිළිබඳව ඇති වන සැලකිය යුතු සංවාදයක් මීට ඇතුළත් වේ. 'මෙය ස්ථාවර තත්ත්වයට පත් විය හැකි වෙනස් වීමක් ද?', 'මෙම ප්‍රතිඵලයෙන් ස්ත්‍රීන් යම් ප්‍රතිලාභයක් අත් කර ගත්තා ද?', 'මෙම ප්‍රතිඵලයට ආධාර දෙන්නන් කැමති වේ ද?' වැනි සියලු ප්‍රශ්නවලින් මූර්තිමත් වන්නේ, ප්‍රමුඛතා වටිනාකම් පිළිබඳ අදහස් ය. එක් කතා පුවතක් පසෙක තබා අනෙක් කතා පුවතක් තෝරා ගැනීම මගින් සිදු වන්නේ, යම් විශේෂිත වටිනාකම් සමූහයක පවතින වැදගත්කම සවිමත් වීම යි. කතා පුවත් තේරීම තුළ පවතින සාකච්ඡා ක්‍රියා දාමය, අඩු ම ගණනේ, අන්‍යෝන්‍ය වටිනාකම් ගැන දැනුවත් වී ඒවා අවබෝධ කර ගන්නට සහභාගිකයන්ට උදව් වෙයි. දෙවන පරිච්ඡේදයේ නව වන පියවරේ දී සාකච්ඡා කළ පරිදි, යම් විශේෂිත වටිනාකම් සමූහයක පැවැත්මෙහි සිදු වන වෙනස් වීම් සම්බන්ධයෙන් කොතරම් නම් සංවිධානීය ඉගෙනීමක් සිදු වෙමින් පවතින්නේ ද යන්න හඳුනා ගැනීම සඳහා උදව් වන්නට, තෝරා ගත් කතා පුවත්වල අන්තර්ගතය පිළිබඳව කරන විශ්ලේෂණයට හැකියාව තිබේ.

සාකච්ඡා ක්‍රියා දාමයට තිරස් සහ සිරස් පැතිකඩවල් තිබේ. තිරස් පැතිකඩ පවතින්නේ, සාකච්ඡාවට සම්බන්ධ වී, කතා පුවත් කට්ටලයක් අතුරින් වඩාත් ම අර්ථාන්විත කතා පුවත තෝරන සහභාගිකයන් කණ්ඩායමක් අතර ය. සිරස් සංවාදයට ඇතුළත් වන්නේ, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය, මධ්‍යම ගණයේ කළමනාකරුවන්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහ ආධාර දෙන්නන් වැනි, විවිධ තලවලට අයත් සහභාගිකයන්ගේ කණ්ඩායම් අතර සිදු වන අදහස් හුවමාරුව යි. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම පිළිබඳ ක්‍රියා දාමය පවත්වා ගෙන යන්නේ සංවිධානය පුරා සිදු වන සංවිධානීය ඉගෙනීමට ආධාර කරන්නට නම්, සිරස් පැතිකඩ ඉතා ම වැදගත් වේ. එසේ ම, එය ක්‍රියා දාමයන් දෙකෙන් වඩා මන්දගාමී මෙන් ම අසාර්ථක වීමට බෙහෙවින් ම ඉඩ තිබෙන ක්‍රියා දාමය ද වේ. එය රඳා පවතින්නේ, එක් කණ්ඩායමක් සිදු කළ සාකච්ඡාවේ ප්‍රතිඵල, කොතරම් මැනවින් ප්‍රලේඛනය කොට ඊළඟ කණ්ඩායම වෙත සන්නිවේදනය කෙරෙන්නේ ද යන්න මත ය. සංවිධානයක පහළ තලවල සිටින්නන්ට, ඉහතින් සඳහන් කළ දෑ සම්බන්ධයෙන් අධිකාරයක් පවතින්නේ කලාතුරකින් නිසා, වඩාත් ම අවදානමට ලක් වී තිබෙන්නේ පහළ අතට සිදු වන සම්බන්ධය යි.

## වැඩ සටහන් තුළ පවතින ශිල්ප ක්‍රමයේ වෙනත් යොදා ගැනීම්

සිය නිරීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාකාරිත්වයන්ට අමතරව, ශිල්ප ක්‍රමයට පහත සඳහන් දෑට ද සහාය විය හැකි යඃ

- වඩා පොදු දැක්මක් පෝෂණය කිරීම
- මග පෙන්වීම සඳහා කොටස්කරුවන්ගේ මෙහෙයුම් කමිටුවලට උදව් වීම
- ඇගයීම් සම්බන්ධ කාර්ය මණ්ඩල හැකියාවන් ගොඩ නැගීම
- ප්‍රචාරණයට සහ සන්නිවේදනයට අවශ්‍ය දෑ සැපයීම
- කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට අවශ්‍ය දෑ සැපයීම
- සාර්ථකත්වය නිමිත්තෙන් උත්සව පැවැත්වීම

### *වඩා පොදු දැක්මක් පෝෂණය කිරීම*

ශිල්ප ක්‍රමයට සම්බන්ධ වී සිටින්නන් (එනම්, කතා පුවත් රැස් කරන, තෝරන, ඒවා පිළිබඳ ප්‍රතිපෝෂණ ලබන ජනයා) අතර වඩා පොදු දැක්මක් ඇති කිරීම සඳහා දායක වන්නට සාකච්ඡාවට හැකියාව තිබේ. එනම්, මුදුන් පමුණුවා ගනිමින් සිටින්නේ කුමක් ද, එය අගය කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව නිතිපතා පැවැත්වෙන සාකච්ඡාවට එලෙස දායක වන්නට හැකියාව තිබේ. මෙම ආකාරයෙන්, තමන්ගේ මැදිහත් වීම හේතුවෙන් ඇති වන ගිනිය නොහැකි තරම් වූ බලපෑම් තේරුම් ගන්නටත්, තමන්ට මුදුන් පමුණුවා ගැනීමට වුවමනා වී ඇති දේ අර්ථදක්වන්නටත් ශිල්ප ක්‍රමය ජන කණ්ඩායම්වලට උදව් වෙයි. ශිල්ප ක්‍රමය හා බැඳී පවතින පොදු දැක්ම යනු අදහස් ප්‍රකාශයට පත් කිරීමකට සමාන වූ දෙයක් නො වේ. වෙනස් වනසුලු වූවකි. වෙනස් තත්ත්වයන්හි දී සහ වෙනස් කාල පරිච්ඡේදවල දී ප්‍රතිචාර දක්වන්නට ඊට හැකියාව තිබේ.

### *මග පෙන්වීම සඳහා කොටස්කරුවන්ගේ මෙහෙයුම් කමිටුවලට උදව් වීම*

විශේෂයෙන් ම සංවර්ධිත ආර්ථිකයන් තුළ දී, සාමාජීය වෙනස් වීම් ඇති කිරීම උදෙසා ක්‍රියාත්මක වන බොහෝ වැඩ සටහන්වලට කොටස්කරුවන්ගේ මෙහෙයුම් කමිටු තිබේ. කෙසේ වුව ද, කළමනාකරණ ගැටලු කෙරෙහි ඉතා ගැඹුරින් සිත යොමු නො කොට වැඩ සටහනකට මග පෙන්වීම අභියෝගයක් විය හැකි ය. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තුළින් නියෝජනය වන ප්‍රතිඵලවලට සම්බන්ධිතව ගත් කල, වැඩ සටහන් කණ්ඩායමක් තුළ සිටින පරීක්ෂක මණ්ඩලයක් ලෙස ක්‍රියා කරන්නට, ශිල්ප ක්‍රමය කොටස්කරුවන්ගේ කමිටුවලට ශක්තිය ලබා දෙයි. එනම්, වටී ය යනුවෙන් සහ එතරම්

නොවටී ය යනුවෙන් කමිටු සාමාජිකයන් සිතන දේ ගැන උපදෙස් දෙමින් පරීක්ෂක මණ්ඩලයක් ලෙස ක්‍රියා කරන්නට, එය කොටස්කරුවන්ගේ කමිටුවලට ශක්තිය ලබා දෙයි.

## ඇගයීම් සම්බන්ධ කාර්ය මණ්ඩල හැකියාවන් ගොඩ නැගීම

වැඩ සටහනෙන් ඇති වන බලපෑම් හඳුනා ගෙන, ඒවා තේරුම් ගන්නට වැඩ සටහන් කාර්ය මණ්ඩලයට පවතින හැකියාව ගොඩ නැගීම සඳහා උදව් වන්නට ශිල්ප ක්‍රමයට පුළුවන්කම තිබේ. දැනට මත් කර ඇති වැඩ කටයුතුවලින් ඇති වී තිබෙන බලපෑම් මොනවා දැයි සොයා බලනවාට වඩා, ඊළඟට කළ යුත්තේ කුමක් ද යන්න කෙරෙහි අවධානය යොමු කරන්නට කාර්ය බහුල සංවිධාන නැඹුරු වෙයි. බොහෝ සංවිධාන, තමන්ගේ වැඩ කටයුතුවල බලපෑම පෙන්නුම් කිරීමේ දී දුෂ්කරතාවට පත් වේ. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යනු, තමන්ගේ වැඩ කටයුතුවල බලපෑම  කෙරෙහි අවධානය යොමු කරන්නට ජන කණ්ඩායමක් දිරි ගැන්වීමට යොදා ගත හැකි අනගි ක්‍රියා මාර්ගයකි. අර්ථාන්විත බලපෑම් පිළිබඳ උදාහරණ පැහැදිලිව ප්‍රකාශයට පත් කිරීම ගැන ජනයා නොකඩවා ඉගෙනීමෙහි යෙදෙන බවත්, ඔවුන් ඒ සම්බන්ධ සිය නිපුණතාවන් වැඩි දියුණු කර ගනිමින් සිටින බවත් සහතික කරන්නට, ශිල්ප ක්‍රමය තුළ පවතින ප්‍රතිපෝෂණ පුරුක්වලට හැකියාව තිබේ.

## ප්‍රචාරණයට සහ සන්නිවේදනයට අවශ්‍ය දෑ සැපයීම

වට කීපයක් තුළින් තෝරා ගත් පසුව, තේරීම් ක්‍රියා දාමය තුළින් මතු වී එන කතා පුවත් සාමාන්‍යයෙන් ඉතා ශක්තිමත් ය. වැඩ සටහනේ බලපෑම පිළිබඳව කෙරෙන බලගතු අගය කිරීම් ය. ප්‍රචාරණ සහ සන්නිවේදන ක්‍රියාකාරකම් සඳහා මෙම කතා පුවත්වලින් අනර්ඝ අමුද්‍රව්‍ය සැපයේ. අතිරේක වාසියක් වන්නේ, මෙම කතා පුවත් සංවිධානය තුළට රැගෙන විත් තිබෙන්නේ සමස්ත ජන කණ්ඩායමක් විසින් වීම යි.

මෙය, කතා පුවත් යොදා ගැනීම සඳහා පවතින ඉතා ආකර්ෂණීය ක්‍රමයක් වුව ද, ප්‍රචාරණය මගින් වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමය පෙරට තල්ලු නොවන බව සැලකිල්ලට ගත යුතු වේ. ඉතා ම නරක අතට හැරුණු විට එය ප්‍රචාරකවාදී යන්ත්‍රණයක් බවට පත් විය හැකි ය. යම් සංවිධානයකට ප්‍රචාරණ අරමුණු සඳහා සාර්ථකත්වය පිළිබඳ කතා පුවත් වුවමනා කරන්නේ නම්, පිටතට ගොස් ඒවා රැස් කර ගෙන ඒමට වාර්තාකරුවෙකු කුලියට ගැනීම වඩාත් ඵලදායක වනු ඇත.

එමෙන් ම, ප්‍රචාරණ හෝ සන්නිවේදන අරමුණු උදෙසා කතා පුවත් යොදා ගැනීම හා බැඳී පවතින ආචාර ධර්ම ගැන සැලකිලිමත් වීම ද ප්‍රයෝජනවත් ය. යම් කතා පුවතක් සංවිධානයෙන් පිටත ප්‍රකාශයට පත් කරන්නට සූදානම් වන්නේ නම්, කතන්දර කියන්නා සහ කතා පුවත තුළ සඳහන් වී ඇති ජනයා එම යොදා ගැනීමට අනුමැතිය පළ කිරීම අවශ්‍ය ය.

## කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට අවශ්‍ය දෑ සැපයීම

වැඩ සටහන ක්‍රියාත්මක වන ආකාරය සහ අපේක්ෂිත ප්‍රතිඵල අත් කර දෙන්නේ කුමන දේවලින් ද යන්න අලුතින් එන කාර්ය මණ්ඩලයට පෙන්නුම් කර දීම සඳහා ද, කතා පුවත් ම යොදා ගත හැකි ය. සමහර ව්‍යාපාර කළමනාකරණ පාසල්වල, මූලික ඉගැන්වීම් උපකරණය ලෙසත්, ගැටලු විසඳා ලීමේ කටයුතුවල කේන්ද්‍රය ලෙසත් සිද්ධි අධ්‍යයන යොදා ගැනේ. සිද්ධි අධ්‍යයනයෙහි විස්තර කෙරෙන තත්ත්වය තුළ තමන් වැඩ කරමින් සිටියේ නම් තමන් ඊට ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද යන්න ගැන සිසුන්ගෙන් විමසිය හැකි ය. විශේෂයෙන් ම, කතා පුවත පිළිබඳ වැඩි විස්තර මතු කර දෙනු ඇති සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීමේ සංචාර මගින් ඒවා පසු විපරමකට ලක් කොට තිබුණේ නම්, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ බොහෝ කතා පුවත් සරල සිද්ධි අධ්‍යයන බවට පෙරළිය හැකි වනු ඇත.

## සාර්ථකත්වය නිමිත්තෙන් උත්සව පැවැත්වීම

සාර්ථකත්වය පිළිබඳ කතා පුවත් බෙදාහදා ගැනීම උත්සව ක්‍රියා දාමයේ එක් කොටසක් බවට පත් විය හැකි ය. සමහර වැඩ සටහන්වල දී, විශාල ප්‍රතිලාභී කණ්ඩායම් එකට එක් වී, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් බෙදාහදා ගෙන, තමන් මුදුන්පත් කර ගත් දේ උත්සවාකාරයෙන් සමරයි. හොඳ කතා පුවතක්, මවිත කරවනසුලු අයුරින් පෙළඹවීම් ඇති

කරන්නක් විය හැකි ය. මුදුන් පමුණුවා ගත් දේ ඒත්තු ගැනීමේ, මානුෂ වූත් සුබදායක වූත් ක්‍රමයක් හැඩ ගස්වන්නට ඊට හැකියාව තිබේ.

# හය වන පරිච්ඡේදය: ශිල්ප ක්‍රමය තුළ ගැබ් වන වලංගුතාව සහ හඬ

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙහි නියැළී සිටින ජනයා ඇතැම් විට වලංගුතාව පිළිබඳව උත්සුකතාවන් පළ කරති. බොහෝ ගුණාත්මක පිවිසුම්වල දී සිදු වන්නාක් මෙන්, ශිල්ප ක්‍රමය වෙනස්කම්වල අර්ථාන්විත භාවය තීරණය කිරීම සඳහා වලංගුතාව පිළිබඳ සම්මත මිනුම් දඬු ආධාර කර නො ගනියි. එනම්, සංඛ්‍යාන පරීක්ෂණ යොදා ගැනීම වැනි සම්මත මිනුම් දඬු ආධාර කර නො ගනියි. ශිල්ප ක්‍රමය, එවන් කටයුත්තක් පිළිබඳ නිගමනයන් උකහා ගැනීම සඳහා යොදා ගත හැකි වලංගු ක්‍රමයක් ලෙස සැලකිල්ලට ගත හැකි යැයි අප විශ්වාස කරන්නේ මන්ද යන්න, මෙම පරිච්ඡේදයෙන් පැහැදිලි කෙරේ. අනතුරුව, අපි ශිල්ප ක්‍රමයේ වඩාත් ම මතභේදකාරී පැතිකඩ දෙකක් සමග පොර බදන්නෙමු: එනම්, නියැදිකරණ ශිල්ප ක්‍රමය සහ පක්ෂපාතීකම පිළිබඳ ගැටලුව යි.

## වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය වලංගු ශිල්ප ක්‍රමයකි

වලංගුතාව සහතික කිරීමට ශිල්ප ක්‍රමය යොදා ගන්නා යන්ත්‍රණයන් අතරට මේවා ඇතුළත් වේ:

- පළල් විස්තර කිරීම
- තේරීමේ විධිමත් ක්‍රියා දාමය
- විනිවිද භාවය
- සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම
- සහභාගිත්වය
- සාමාජිකයන් යොදා ගනිමින් හරිවැරදි බැලීම

### *පළල් විස්තර කිරීම*

ගුණාත්මක පිවිසුම්වල දී වලංගුතාව සහතික කරනු ලබන්නේ, බලගතු සවිස්තරාත්මක දත්ත හෙවත් **පළල් විස්තර කිරීම්** ඉදිරිපත් කිරීමෙනි (ග්‍රීට්ස්, 1973). එවිට, අනෙකුන්ට තමන්ගේ ම අර්ථදැක්වීම් ඇඳිය හැකි වන අභ්‍යන්තර ගැළපීමකින් යුතු තොරතුරු, ප්‍රමාණවත් තරමින් නිසි පිළිවෙළට පවතියි. පළල් විස්තර කිරීම් තුළ අඩංගු වන්නේ, සිදුවීම් ඒවාට අදාළ ප්‍රාදේශීය තත්ත්වය තුළ පිහිටුවූ, සිදුවීම් පිළිබඳව හිඩැස්වලින් තොරව වියමන් කරන ලද කතා පුවත් ය. නිරීක්ෂකයාගේ කාර්ය භාරය සහ ආත්මීයත්වය විද්‍යමාන වන කතා පුවත් ය. සාමාන්‍ය ජනයාගේ ලෝකයේ දී, මෙම කතා පුවත් බොහෝ විට කතන්දරවල හෝ උපාඛ්‍යානවල ස්වරූපය ගනී. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් සමග, ඒවා තෝරා ගැනීම සම්බන්ධයෙන් සමාලෝචකයන් දක්වන හේතු මෙන් ම කතා පුවත කීම සම්බන්ධයෙන් කතන්දර කියන්නා දක්වන හේතු ද පවතියි. මෙය, කතා පුවතකට තමන්ගේ ම අර්ථදැක්වීම් ඇඳන්නටත්, අනෙකුන් කතා පුවත තෝරා ගැනීම කෙරෙහි බලපෑ හේතු අර්ථදක්වන්නටත් පාඨකයන්ට අවස්ථාවක් ලබා දෙන, විස්තර කිරීමේ වඩා පළල් තලයකි (ඇතැම් විට, මෙය පසුව එන තලයක් ද?).

### *තේරීමේ විධිමත් ක්‍රියා දාමය*

ශිල්ප ක්‍රමය තුළ දී, තේරීම පිළිබඳ විධිමත් ක්‍රියා දාමයක් ඔස්සේ වලංගුතාව වැඩි දියුණු කෙරේ. සියලු කතා පුවත් විශ්ලේෂණය කෙරෙන්නේ පත් කළ කොටස්කරුවන්ගේ මණ්ඩලයක් මගිනි. එහි දී ඔවුහු කතා පුවතට තමන්ගේ අර්ථදැක්වීම් ඇඳති. සමහර විට,

තේරූ කතා පුවත් තේරීම සඳහා තවත් කණ්ඩායමක් වෙත යැවෙනු ඇත. එම කණ්ඩායම ද, කතා පුවත්වලට සිය අර්ථදැක්වීම් ඇඳිය යුතු ය. සංවිධානයකින් බොහෝ තොරතුරු හසු කර ගන්නා ආකාරයට වඩා මෙම ක්‍රියා දාමය බෙහෙවින් ම විධිමත් සහ විනයගත (සහ විවෘත) ය.

## විනිවිද භාවය

මෙය බැරෑරුම් ගුණාත්මක විශ්ලේෂණයේ ප්‍රධාන අංගයකි. විශ්ලේෂණය සිදු කරන්නේ කෙසේ ද යන්න නො තකා, තමන්ගේ ම විශ්ලේෂණාත්මක ක්‍රියා පටිපාටීන් සහ ක්‍රියා දාමයන් හැකි තරම් පරිපූර්ණව සහ සත්‍යවාදීව නිරීක්ෂණය කරන්නටත් වාර්තා කරන්නටත්, ගුණාත්මක පිවිසුම් යොදා ගන්නා විශ්ලේෂකයන්ට වගකීමක් තිබේ. අර්ථදැක්වීම් විධිමත්ව සටහන් කිරීමෙන් සහ ඒවා සියලු දෙනාට ම පැහැදිලිව දැක ගත හැකි වන තත්ත්වයක් ඇති කිරීමෙන්, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ක්‍රියා දාමය විනිවිද භාවය අවධාරණය කරයි.

ශිල්ප ක්‍රමය සිද්ධි අධ්‍යයන පිවිසුමක් සමග සැසඳීමෙන් මෙම කරුණ ඉස්මතු කර දැක්විය හැකි ය. නියම සිද්ධි අධ්‍යයන පිවිසුමක දී, සිද්ධි අධ්‍යයනය තුළ ඉදිරිපත් කළ යුත්තේ කුමන තොරතුරු ද, ඉදිරිපත් නො කළ යුත්තේ කුමන තොරතුරු ද යන්න විශේෂඥ පර්යේෂකයෙකු විසින් තීරණය කෙරෙනු ඇත. ඔවුන් දත්ත හසු කර ගැනීම සඳහා යොදා ගන්නා විධික්‍රම සහ දත්ත අර්ථදැක්වීමේ ක්‍රියා දාමය විස්තර කරනු ඇත. එහෙත්, ඔවුන්ගේ අර්ථදැක්වීම්වලට ආධාර වන සාර්ථකත්වය පිළිබඳ මිනුම් දඬු සාමාන්‍යයෙන් පැහැදිලි නො කෙරේ. බොහෝ සිද්ධි අධ්‍යයනයන් සම්බන්ධයෙන් ගත් විට, ඒවා අරමුණකින් යුතුව කළ තෝරා ගැනීම් ද (එසේ නම්, කුමන පදනමක් මත ද), අහම්බ ලෙස කළ තෝරා ගැනීම් ද යන්න කීම අසීරු ය. මෙම තොරතුරුවලින් තොරව, පාඨකයෙකුට සිද්ධි අධ්‍යයනය තුළ පවතින සිදුවීම්වලට ආරෝපණය කළ යුත්තේ කුමන වටිනාකමක් ද යන්න හඳුනා ගැනීම අසීරු ය.

## සත්‍යාසත්‍යතාව පරීක්ෂා කිරීම

මෙය අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වල වලංගුතාව සහතික කිරීමේ ප්‍රධාන පියවරක් (දෙවන පරිච්ඡේදයේ හත් වන පියවර බලන්න) වේ. මෙය තල කිහිපයක දී සිදු විය හැකි ය. පළමුව, බොහෝ කතා පුවත් රැස් කරනු ලබන්නේ, ක්ෂේත්‍රය තුළ සිදු වෙමින් පවතින දේ නිතිපතා නිරීක්ෂණය කරන ක්ෂේත්‍ර ක්‍රියාකාරකයන් විසිනි. කතා පුවත අසත්‍ය හෝ සාවද්‍ය යැයි ඔවුන්ට සැකයක් පවතී නම්, එය වඩා පරිපූර්ණ ආකාරයෙන් පරීක්ෂාවට ලක් කරන්නට ඔවුන්ට තීරණය කළ හැකි ය. දෙවනුව, බොහෝ කතා පුවත්වල, සිද්ධියට සම්බන්ධ වූවන්ගේ නම් සහ සිද්ධිය සිදු වූ ස්ථානය තිබේ. ඒ නිසා, ඒවායේ මූලය ඉතා පැහැදිලි වෙයි. තුන් වනුව, තේරීම් ක්‍රියා දාමය අතරතුර දී, ව්‍යාපෘතිය පිළිබඳව බොහෝ විට පුළුල් අවබෝධයක් ඇති පත් කළ ජනයාගේ මණ්ඩල මගින් සියලු කතා පුවත් පිරික්සා බැලෙන අතර, කතා පුවත් සලකා බලන අතරවාරයේ මුල සිට අගට ඒවායේ නිරවද්‍යතාව පිළිබඳව සොයා බැලෙනු ඇත. විශ්වාස කළ නොහැකි සහ කරුණුමය වශයෙන් වැරදි බව පෙනෙන කතා පුවත් තෝරා නොගැනෙනු ඇත. අවසානයේ, කතා පුවත මුලින් කී තැන් පටන් එළිදරව් වී ඇති සිදුවීම් පසු විපරමකට ලක් කරනවාට අමතරව, කතා පුවත් නිරවද්‍ය ද නැද්ද යන්න තීරණය කර ගැනීම සඳහා ඒවා (එනම්, සාමාන්‍යයෙන් සංවිධානයක ඉහළ ම තලයේ දී තෝරා ගන්නා ලද 'ජයග්‍රාහී' කතා පුවත්) බාහිර වශයෙන් සත්‍යාසත්‍යතා පරීක්ෂාවකට ලක් කළ හැකි ය.

## සහභාගිත්වය

සහභාගී වැඩ සටහන් තත්ත්වයන්හි දී, ශිල්ප ක්‍රමය විශේෂයෙන් වලංගු වේ. එය බොහෝ විවිධ කොටස්කරුවන්ගේ සම්බන්ධ වීම ඇති කරයි. එක හා සමානව අදහස් ප්‍රකාශනයත් පාඩම් බෙදාහදා ගැනීමත් දිරි ගන්වන විධික්‍රම යොදා ගනියි.

පසු ගිය පසළොස් වසර තුළ දී ජාත්‍යන්තර සංවර්ධන ක්ෂේත්‍රය මුහුණ දෙන එක් ප්‍රධාන අභියෝගයක් වී තිබෙන්නේ, සහභාගී ව්‍යාපෘතිවල දර්ශනයට ඉනංගු වන ආකාරයකට, එම ව්‍යාපෘතිවල බලපෑම මනින්නේ කෙසේ ද යන්න යි (ඕක්ලි සහ තවත් අය, 1998). සියල්ලට ම ඉහළින් පවත්නා උත්සුකතාව වන්නේ, නිරීක්ෂණ සහ ඇගයීම් ක්‍රියා දාමය මගින් වැඩ සටහන් සහභාගිකයන්ගේ සහභාගිත්වය සහ බල ගැන්වී ගැනීම ශක්තිමත් කිරීම යි. ඊට

හේතුව, නිරීක්ෂණ සහ ඇගයීම් ක්‍රියා දාමය මගින් ඒවා වැළැක්වෙන්නට ඉඩ තිබීම යි. සාර්ථකත්වය ඇති කෙරෙන්නේ කුමකින් ද යන්න පිළිබඳව පිටස්තර වටිනාකම් මත පදනම්ව සිදු කෙරෙන පිටස්තර ඇගයීම, මෙම තත්ත්වයේ දී සුදුසු නො වේ. බොහෝ උදාහරණවල දී, සහභාගී ව්‍යාපෘති මගින් ඉල්ලා සිටිනු ලබන්නේ, වැදගත් වන්නේ කුමන වෙනස් වීම් ද මැන බැලිය යුත්තේ කුමන වෙනස් වීම් ද යන්න පිළිබඳ තමන්ගේ අදහස් පළ කරන්නට කොටස්කරුවන්ට සහ ප්‍රතිලාභීන්ට ඉඩ ලබා දෙන, සහභාගී නිරීක්ෂණ සහ ඇගයීම් පිවිසුම් ය.

### *සාමාජිකයන් යොදා ගනිමින් හරිවැරදි බැලීම*

මෙමගින්, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වලට වලංගුතාව සහ නිරවද්‍ය භාවය එක් කිරීමේ අමතර ක්‍රමයක් සම්පාදනය වේ. අර්ථාන්විත වෙනස් වීමේ ප්‍රලේඛනය කරන ලද පිටපත, මුල් කතන්දර කියන්නා සහ කතා පුවත තුළ නම් සඳහන් වන ජනයා ලවා මුල සිට අග දක්වා පරීක්ෂා කිරීම මීට ඇතුළත් ය. එක් පුද්ගලයෙකු වෙනත් පුද්ගලයෙකු 'සම්මුඛ සාකච්ඡාවට ලක් කිරීම' මගින් කතා පුවතක් රැස් කරන විට, තමන්ගේ සටහන් කතන්දර කියන්නා සමග බෙදාහදා ගන්නා ලෙසත්, තමන් මුදුන් පමුණුවා ගැනීමට උත්සාහ දරමින් සිටියේ කමක් ද යන්න කතා පුවත තුළින් පිළිබිඹු වන්නේ යැයි තෘප්තියට පත් වන තුරු, කතා පුවත සංස්කරණය කොට යළි කීමට කතන්දර කියන්නාට ඉඩ සලසා දෙන ලෙසත්, අපි කතා පුවත ප්‍රලේඛනය කරන පුද්ගලයා දිරි ගන්වන්නෙමු. මෙය, කතා පුවත ප්‍රලේඛනය කිරීමෙන් පසු යළි කියවීම පිළිබඳ කාරණාවක් විය හැකි ය.

# අර්ථවත් නියැදිකරණය

ශිල්ප ක්‍රමය තුළ පවතින නියැදිකරණ ශිල්ප ක්‍රමය විවෘත වූවක් නො වේ. වරණීය වූවකි. එය සහභාගිකයන්ගේ 'සාමාන්‍ය තත්ත්වය' පිළිබඳ තොරතුරු සම්පාදනය නො කරයි. ඒ වෙනුවට එය, විශේෂ තත්ත්වයන් පිළිබඳව, විශේෂයෙන් ම, සාර්ථක තත්ත්වයන් පිළිබඳව තොරතුරු සම්පාදනය කරයි. මෙය **අර්ථවත් නියැදිකරණය** යැයි හඳුන්වනු ලැබේ. මෙම නියැදිකරණ ශිල්ප ක්‍රමය මගින් ගෙන හැර පාන තොරතුරු, වැඩ සටහනක ක්‍රියාකාරිත්වය පිළිබඳව විනිශ්චයන් සිදු කිරීමට යොදා ගත හැකි විශ්වසනීය පදනමක් නො වේ යැයි සමහරුන් තර්ක කරනු ඇත.

එහෙත්, අර්ථවත් නියැදිකරණය (නැත් නම් අරමුණු සහගත නියැදිකරණය) යනු ගුණාත්මක පර්යේෂණයේ දී දත්ත සොයා ගැනීම සඳහා යොදා ගන්නා නීත්‍යනුකූල ස්වරූපයකි. එය ගුණාත්මක පර්යේෂණ තර්කනයේ ප්‍රධාන කොටසකි. පැටන් මෙසේ පවසයි: "අරමුණු සහගත නියැදිකරණයේ තර්කනය සහ බලය දිග හැරී තිබෙන්නේ, පුළුල්ව අධ්‍යයනය කිරීම සඳහා තොරතුරු සපිරි සිදුවීම් තෝරා ගැනීම තුළ ය. තොරතුරු සපිරි සිදුවීම් යනු පර්යේෂණයේ අරමුණට කේන්ද්‍රීය වැදගත්කමක් ඇති ගැටලු පිළිබඳව යමෙකුට දැවැන්ත ඉගෙනීමක් ලද හැකි සිදුවීම් ය. **අරමුණු සහගත නියැදිකරණය** යන යෙදුම යොදා ගනු ලබන්නේ එබැවිනි" (පැටන්, 1990: 169).

විශේෂිත ඇගයීම් අරමුණු සඳහා ප්‍රයෝජනවත් වන, අරමුණු සහගත නියැදිකරණයේ වෙනස් ක්‍රමෝපායන් කීපයක් පැටන් විස්තර කරයි. 'ආන්තික හෝ අපගාමී සිද්ධි නියැදිකරණය' නම් පිවිසුම අවධානය යොමු කරන්නේ තොරතුරු සපිරි සිදුවීම් කෙරෙහි ය. ඊට හේතුව, ඒවා යම් ආකාරයකින් අසාමාන්‍ය හෝ විශේෂ වීම යි. සාර්ථක හෝ අසාර්ථක අර්ථාන්විත උදාහරණ හසු කර ගැනීමේ දී, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමයේ නියැදිකරණ පද්ධතිය මෙම පිවිසුම යොදා ගනියි. එහි අරමුණ වන්නේ, මෙම ආන්තික කතා පුවත්වලින් ඉගෙනීමත්, අවසානයේ අසාර්ථකත්වයෙන් ඉවත් වී සාර්ථකත්වය කරා වූ පුළුල් භාවිතයන් වෙත වැඩියෙන් මාරු වී ගැනීමත් ය. එම නිසා ක්‍රමෝපාය වන්නේ, වඩාත් ම ඉගෙනීමක් ලද හැකි කතා පුවත් තෝරා ගැනීම යි.

නිරීක්ෂණයේ සහ ඇගයීමේ අරමුණ වන්නේ, ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් ලැබෙන ප්‍රතිඵල අතර ස්වභාවයෙන් ම පවතින වෙනස්කම් නිවැරදිව ප්‍රලේඛනය කිරීම නම්, නියෝජනාත්මක විය හැකි තරමට පුළුල් වූ අහඹු නියැදියක් ඔබට අවශ්‍ය වනු ඇත. එමෙන් ම, සියලු සහභාගිකයන් ලද අත්දැකීම් පිළිබඳ සාමාන්‍යකරණයන් ඇති කර ගැනීමේ හැකියාව ලබා ගන්නට ඔබට වුවමනා කරන්නේ නම්, එවිට ද නියෝජනාත්මක විය හැකි තරමට පුළුල් වූ අහඹු නියැදියක් ඔබට අවශ්‍ය වනු ඇත. කෙසේ වුව ද, පැටන් (1990: 170) යෝජනා

කරන්නේ, "... බොහෝ උදාහරණවල දී, සාමාන්‍ය සිදුවීම කුමන ස්වරූපයක් ගන්නේ ද යන්න පිළිබඳ සංඛ්‍යානමය විස්තර කිරීම්වලින් ඉගෙන ගත හැකි දේට වඩා, ආන්තික හෝ අසාමාන්‍ය සිදුවීම් පරිශ්‍රමයෙන් යුතුව අධ්‍යයනය කිරීමෙන් වැඩි ඉගෙනීමක් ලද හැකි ය" යන්න යි. තවත් ජනප්‍රිය විකල්පයක් වන්නේ, පිවිසුම් සංයෝග කිරීම යි. එවිට, ආන්තික සිදුවීම් පිළිබඳව මෙන් ම සහභාගිකයන්ගේ සාමාන්‍ය ව්‍යාප්තිය පිළිබඳව ද ඔබට අවබෝධයක් ලැබේ. සීසීඩීබීයේ දී සහ ටාගට් 10 දී, වැඩ සටහන්වලට සහභාගි වන ගොවීන්ගේ සාමාන්‍ය ව්‍යාප්තිය හසු කර ගන්නා වෙනත් පිවිසුම් සමග, වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය සංයෝග කෙරිණ.

වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය පුළුල්ව යොදා ගැනීම, අහඹු ලෙස නියැදිකරණය කළ අධ්‍යයනයක දීට වඩා බොහෝ විවිධ වූ සහභාගිකයන් පිරිසකගෙන් වාර්තා ලබා ගැනීමට හේතු විය හැකි බවට සමහර සාක්ෂ්‍ය පවතියි. සීසීඩීබීයේ දී, වාර්තා කිරීම සඳහා අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් සොයමින් කාර්ය මණ්ඩලය දිගින් දිගට ම කටයුතු කළ නිසා, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත්වල විෂය බවට පත් වූ *Shomities* (සහභාගිකයන්ගේ කණ්ඩායම්) සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි දියුණු විය. වසරක් ගත වන විට, ශිල්ප ක්‍රමයේ නියමු වැඩ සටහන ක්‍රියාත්මක වූ ප්‍රදේශය තුළ පැවති සහභාගිකයන්ගේ කණ්ඩායම්වලින් සියයට 70කට වැඩි ප්‍රමාණයක් කතා පුවතකට විෂය වී තිබුණි. එහෙත්, සාමාන්‍ය අහඹු නියැදි අධ්‍යයනයක්, උපරිම වශයෙන් සියයට 10කට වැඩි ප්‍රමාණයකට ළඟා වන්නට අරමුණු නො කළ හැකි ය. මින් ඇඟෙන්නේ, ශිල්ප ක්‍රමයේ මොන යම් යොදා ගැනීමක දී වුව ද, කුඩා උපජන සමූහයකට කේන්ද්‍රගත නො වී, වැඩි වන සම්පත් පරාසයකින් අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් නියැදිකරණය කරන්නට යොමු වන්නේ කොතරම් දුරකට ද යන්න සොයා යාම ප්‍රයෝජනවත් බව යි. පුළුල්ව පැතිර ගිය බලපෑමක් අත් කර ගන්නට යාමේ දී ඉහත කී නැඹුරුව වඩාත් ආධාර වනු ඇත. කෙසේ වුව ද, ඉහත සඳහන් කළ පරිදි කෘෂිකාර්මික පර්යේෂණ වැනි ඇතැම් වැඩ සටහන්වල දී, අරමුදල් සපයන ලද පර්යේෂණ ක්‍රියාකාරකම් මාලාවකින් ලැබෙන කුඩා පරිමාණ ජයග්‍රහණයන් බොහොමයකට වඩා, අරමුදල් සපයන ලද බොහෝ පර්යේෂණ ක්‍රියාකාරකම් අතුරින් එකකින් කෙරෙන විස්මිත සොයා ගැනීමක් දිගු කාලයේ දී වඩා වැදගත් විය හැකි ය.

## ශිල්ප ක්‍රමය තුළ පවත්නා පක්ෂපාතීකම

### *සාර්ථකත්වය කෙරෙහි වූ පක්ෂපාතීකම*

ශිල්ප ක්‍රමය බොහෝ විට අනුග්‍රහ දක්වන්නට නැඹුරු වන්නේ, සාර්ථකත්වය පිළිබඳ කතා පුවත්වලට ය. 'නරක ප්‍රවෘත්තිවලට' නො වේ. ටාගට් 10 දී, කතා පුවත්වලින් සියයට 90ක් ම උත්සුක වූයේ ධනාත්මක ප්‍රතිඵල ගැන ය. ලාඕසයේ ඒඩීආර්ඒහි අනුපාතය සියයට 80 සිට 90 දක්වා වූ පරාසයක පැවතුණි. කෙසේ වුව ද, වැඩ සටහන හොඳින් ම ක්‍රියාත්මක වන අවස්ථාවේ දී වැඩ සටහනට මුදුන් පමුණුවා ගත හැක්කේ කුමක් ද යන්න හඳුනා ගැනීම, මෙම ධනාත්මක ප්‍රතිඵලවලින් වැඩි ප්‍රමාණයක් මුදුන් පමුණුවා ගැනීම කරා වැඩ සටහන පෙරට තල්ලු කරන්නට උදව් විය යුතු ය. එබැවින්, මෙය අසාර්ථකකමක් ම නොවන්නේ ය. ඍණාත්මක කතා පුවත් හසු කර ගන්නට අදහස් කරන්නේ නම්, ඒ සඳහා සුවිශේෂ බලපෑම් ක්ෂේත්‍රයක් නියම කළ හැකි ය (දෙවන පරිච්ඡේදයේ දෙවන පියවර බලන්න).

### *තේරීම් ක්‍රියා දාමය තුළ පවතින ආත්මීයත්වය*

ශිල්ප ක්‍රමයේ තේරීම් ක්‍රියා දාමය ආත්මීය ය. ඒ අනුව ගත් විට, එය තේරීම් මණ්ඩලවල සිටින ජනයා තුළ ගැබ්ව පවතින වටිනාකම්වල ප්‍රකාශනයක් වෙයි. එම නිසා, තේරීම් මණ්ඩල තුළ නියෝජනය වන්නේ සහ නොවන්නේ කවුරුන් ද යන්න ගැන දැනුවත් වීම වැදගත් ය. කෙසේ වුව ද, අනෙකුත් පර්යේෂණ පිවිසුම්වල දී මෙන් නො ව, මෙම ආත්මීයත්වය යනු සංවිධානීය වටිනාකම් පිළිබඳ තවත් දත්ත මූලාශ්‍රයකි. අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් සමග ම, ඒවා තෝරා ගැනීම සඳහා බලපෑ හේතු වාර්තා කිරීමත් ප්‍රලේඛනය කිරීමත් කරනු ලැබේ. ඇගයීමට ලක් කළ හැකි තවත් දත්ත ස්වරූපයක් ලෙස මෙම අර්ථදැක්වීම් ඇතුළත් කිරීම මගින් ඉහළ මට්ටමේ විනිවිද භාවයක් සම්පාදනය වේ.

### *ජනප්‍රිය අදහස් කෙරෙහි වූ පක්ෂපාතීකම*

ශිල්ප ක්‍රමයේ තේරීම් ක්‍රියා දාමය (සහ ඒකමතික භාවයක් ඇති කර ගැනීමට පරිශ්‍රම දැරීමේ දී යොදා ගනු ලබන සියලු විධික්‍රම) පිළිබඳව ඉදිරිපත් වන තවත් විවේචනයක් වන්නේ,

බහුතරයේ කැමැත්ත මගින් අම්හිරි හෝ ජනප්‍රියත්වයක් නොමැති අදහස් නිහඬ කෙරෙන්නට ඉඩ තිබේ ය යන්න යි. මෙය සැලකිල්ලට ගත යුතු සැබෑ ගැටලුවකි. කෙසේ වුව ද, අපගේ අත්දැකීම අනුව, කතා පුවත් තේරීමේ අනුමානාත්මක ක්‍රියා දාමය (එනම්, පළමුව ඡන්දය දී අනතුරුව මිනුම් දණ්ඩ හඳුනා ගැනීම), නිරීක්ෂණය සහ ඇගයීම පිළිබඳ වෙනත් ශිල්ප ක්‍රමවලට වඩා, අඩු ජනප්‍රියත්වයක් සහිත අදහස් හඳුනා ගෙන වාර්තා කරන්නට ඉඩ තිබේ. එක් අර්ථාන්විත කතා පුවතකට ඉහළින් වෙනත් කතා පුවතක් තෝරා ගන්නා ලෙස ඉල්ලා සිටීම මගින්, මවිත කරවනසුලු අයුරින් විවෘත වූත් අවංක වූත් සාකච්ඡා දිරි ගැන්වෙන බව පෙනේ.

වඩා පුළුල් තලයේ දී, ඒකමතික භාවය සඳහා පරිශ්‍රම දරනවා වෙනුවට ශිල්ප ක්‍රමය අදහස්වල විවිධත්වයක් පවත්වා ගනී. සෑම තේරීම් තලයක දී ම වෙනත් මූලාශ්‍රවලින් එන වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ අලුත් කතා පුවත් හඳුන්වා දෙනු ලබන්නේ ය යන කරුණ මගින්, එක් කතා පුවත් ස්වරූපයක් ප්‍රධානත්වයට පත් වීමේ අවදානම අඩු වේ. වඩාත් ම ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය (නැත් නම් ආධාර දෙන්නන්) විසින්, එක් එක් බලපෑම් ක්ෂේත්‍රයෙන් එන වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම් තෝරනු ලැබීමෙන් පසුව පවා, සංවිධානයේ සමහර ශාඛා විසින් වෙනත් කතා පුවත් වඩා අර්ථාන්විත යැයි අදහස් කරනු ඇත. ශිල්ප ක්‍රමය පරිපූර්ණ ඒකමතික භාවයක් ඇති නො කරයි. එය පදනම් වන්නේ, පොර වදින කතා පුවත් සහ ඒවායේ පවතින වටිනාකම් ගැන සිදු වෙමින් පවතින විවාදය මත යි.

> **"සාමූහික ප්‍රඥාව"**
> "හොඳ ම සාමූහික තීරණ යනු ඒකමතික භාවයේ හෝ සම්මුතියේ නිෂ්පාදනයක් නො වේ. නොඑකඟතාවේ සහ තරගයේ නිෂ්පාදනයකි. ඒ නිසා, විවිධත්වය සහ ස්වාධීනත්වය වැදගත් ය ... ප්‍රතිවිරුද්ධ අයුරින් කිව හොත්, දක්ෂයන් බවට පත් වන්නට කණ්ඩායමකට පවතින හොඳ ම ක්‍රමය නම්, සෑම පුද්ගලයෙකු ම හැකි තරම් දුරට ස්වාධීනව සිතීම සහ ක්‍රියා කිරීම යි" *(සාමූහික ප්‍රඥාව ["The Wisdom of Crowds"], සුරෝවෙයිකි, 2004: xix).*

### *කතා පුවත් කීමේ දක්ෂයන්ගේ අදහස් කෙරෙහි වූ පක්ෂපාතීකම*

සියලු නිරීක්ෂණ සහ ඇගයීම් ශිල්ප ක්‍රම මෙන් ම වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය ද, අනෙක්වාට වැඩියෙන් සමහර දත්ත ස්වරූප කෙරෙහි අනුග්‍රහය දක්වයි. හොඳ කතා පුවතක් කිව හැකි ජනයාගේ අදහස්වලට අනුග්‍රහ දැක්වීමේ අසාමාන්‍ය පක්ෂපාතීකමක් ශිල්ප ක්‍රමයට තිබේ. නිරීක්ෂණය සහ ඇගයීම සඳහා තනිව යොදා ගත හැකි මෙවලමක් ලෙස ශිල්ප ක්‍රමය තේරුම් නොගන්නට මෙය තවත් හොඳ හේතුවක් වේ. කෙසේ වුව ද, කතන්දර කීමේ නිපුණතාවන්ට අයුතු බලපෑම් සහගත බවක් අත් කර ගන්නට හැකියාවක් පවතින බව ගැන දැනුම් තේරුම් ඇතිව සිටි තේරීම් ක්‍රියා දාමයේ සහභාගිකයන්, ඉක්බිතිව ඒ අනුව කතා පුවත් පිළිබඳ තමන්ගේ තක්සේරුව සීරුමාරු කොට ගත් උදාහරණ අපි දැක ඇත්තෙමු.

## ශිල්ප ක්‍රමය තුළ පවතින හඬ සහ බලය පිළිබඳ ගැටලු

ශිල්ප ක්‍රමය තුළ දී, බොහෝ කාර්ය මාණ්ඩලිකයන්ට, ආධාර දෙන්නන්ට සහ (සමහර උදාහරණවල දී සහභාගිකයන් ද ඇතුළුව) වෙනත් කොටස්කරුවන්ට, දත්ත රැස් කිරීමට සහ විශ්ලේෂණය කිරීමට ක්‍රියාකාරීව සම්බන්ධ විය හැකි ය. වඩාත් ම අර්ථාන්විත වෙනස් වීම නමැති ශිල්ප ක්‍රමය යනු නිරීක්ෂණ සහ ඇගයීම් ශිල්ප ක්‍රම අතර පවතින වඩාත් ම සහභාගී ශිල්ප ක්‍රමය යි. කෙසේ වුව ද, හඬ නගන්නට අවස්ථාව ලැබෙන්නේ කාට ද යන්න සම්බන්ධයෙන් ගත් විට, අනෙකුන්ට ඉහළින් සමහර කොටස්කරුවන් ඇතුළත් කර ගන්නට ශිල්ප ක්‍රමය අනුග්‍රහ දක්වන බවට තර්ක කළ හැකි ය.

කතා පුවත් තේරීමේ ක්‍රියා දාමය, කතා පුවත් සමාලෝචන සැසිවලට සහභාගි වන ජනයාට නිසගයෙන් ම පක්ෂපාතීකමක් දක්වයි. සමාලෝචන මණ්ඩලවලට සහභාගි වන ජනයාගෙන්, කාර්ය මණ්ඩලයේ හෝ ප්‍රතිලාභීන්ගේ වඩා පුළුල් හඬ මුළුමනින් නියෝජනය නොවන්නට ඉඩ තිබේ. කතා පුවත් තේරීමේ දී පැතිරුණු ජනතා නියෝජනයක් ඇති කර ගැනීමෙන්, හෝ ඇල්මක් දක්වන විවිධ කණ්ඩායම් නියෝජනය වන පරිදි සමාන්තර තේරීම් මණ්ඩල ඇති කර ගැනීමෙන්, මෙය තරමක් දුරට හිලව් කළ හැකි ය.

එහෙත්, ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ සහ තේරීම් මණ්ඩලවල සාමාජිකයන්ගේ විවරණ තුළ, ශිල්ප ක්‍රමය කා වැදී තිබේ. සහභාගි නොවන්නට තීරණය කළවුන්ගේ අදහස් හසු කර ගන්නට එය හිතාමතා උත්සාහ නො කරයි. විශේෂයෙන් ම, සම්පිණ්ඩනාත්මක ඇගයීම සඳහා ශිල්ප ක්‍රමය යොදා ගන්නා විට මෙය සැබෑ ගැටලුවක් බවට පත් වේ. එහෙත්, සහභාගි නොවන්නන්ගේ හෝ විවේචකයන්ගේ අදහස් සොයා යන, අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා වැනි වෙනත් ශිල්ප ක්‍රම සමග ශිල්ප ක්‍රමය සංයෝග කිරීම මගින්, අපි මෙම ගැටලුව සමග ගනුදෙනු කරන්නෙමු. කළ හැකි තවත් දෙයක් නම්, පර්යේෂකයෙකු විසින් එදිරිවාදීන්ගෙන් කතා පුවත් සොයා ගෙන, ඒවා ශිල්ප ක්‍රමයේ සමාලෝචන ක්‍රියා දාමයට ඇතුළත් කිරීම යි.

කෙසේ වුව ද, සංවිධාන තුළ පවතින අසමාන හඬ තුලනය කිරීම සඳහා ශිල්ප ක්‍රමය ඇතැම් යන්ත්‍රණයන් යොදා ගනියි. සාමාන්‍යයෙන්, ක්‍රියා දාමය ඉහළින් ම පැහැදිලිව පෙනෙන බල ව්‍යුහයක් තුළ පවතින නිසා, සියලු විනිශ්චයන් සිදු කරනු ලබන්නේ බෙහෙවින් ප්‍රසිද්ධියේ ය. ක්‍රියා දාමය පැවතියේ එවැනි බල ව්‍යුහයක් තුළ නො වේ නම්, එය එතරම් ප්‍රසිද්ධියේ සිදු නො වන්නට ඉඩ තිබේ. ධුරාවලියේ මුදුනත සිටින්නන්ට, තමන්ට පහළින් සිටින්නන් විසින් නිර්මාණය කරන ලද විකල්පයන් පිළිබඳ මෙනු පතකින් තෝරා ගැනීමක් කරන්නට සිදු වේ. අවසානයේ, ‘වෙනත් මොන යම් හෝ වෙනස් වීම්’ නමැති බලපෑම් ක්ෂේත්‍රය මගින්, මෙනු පත තුළ බහා ලිය හැකි වෙනස් වීම්වල පුළුල් බව වැඩි වේ. සංවිධානීය තත්ත්වයක් තුළ සිදු වන නිසා තේරීම් කිසි විටෙකත් මුළුමනින් ම නිදහස් නො වේ. එහෙත්, බොහෝ නිරීක්ෂණ සහ ඇගයීම් පද්ධති තුළ පවතින තත්ත්වයන්ට වඩා දැවැන්ත හඬක්, ශිල්ප ක්‍රමය සංවිධානීය ධුරාවලියේ පහළ සිටින්නන්ට ලබා දෙයි.

වීඑස්ඕ සංවිධානයේ දී, ස්වේච්ඡා සේවකයෙකු කතා පුවත රචනා කරනවාට අමතරව අනෙකුත් පාර්ශ්වයන් විසින් ඇතුළත් කර ගෙන වලංගු බවට ද පත් කොට ඇති අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් වඩා අර්ථාන්විත යැයි නිරන්තරව තක්සේරු කරනු ලැබේ. එනම්, අනෙකුත් කොටස්කරුවන්ගේ අදහස් අදාළ කර නොගෙන ස්වේච්ඡා සේවකයෙකු විසින් රචනා කරන ලද ඒවාට වඩා අර්ථාන්විත යැයි නිරන්තරව තක්සේරු කරනු ලැබේ. මින් හැඟෙන්නේ, විධිමත් අයුරින් හසුරුවා ගන්නේ නම්, සහභාගී වන කාර්ය මණ්ඩලය අපේක්ෂිතව හෝ අනපේක්ෂිතව ස්වයං ප්‍රයෝජනයක් ලැබෙන කතා පුවත් වාර්තා කිරීමේ අවදානම ආමන්ත්‍රණය කරන්නට, අර්ථාන්විත වෙනස් වීම් පිළිබඳ කතා පුවත් තේරීමේ ක්‍රියා දාමය උදව් විය හැකි බව යි.